

# විශුද්ධි දීපිකා

# විශුද්ධි දීපිකා.

සණෙතාදය පිරිවෙණේ උපාචාර්‍ය;

දූදිගම රාජමහා විහාරාධිපති

මාකුරේ

## ගුණරතන ස්වාමිපාදයන්

වහන්සේ විසින්

සංගෘහිතයි.

කෑගල්ලේ පදිංචි

**ආර්. වී. දූදිගම නීතිඥතුමාණන්**

විසින්

සමාරධිතයි.

**එච්. ඇම්. ඇම්. ධර්මදාස වෙදමහත්මයා**

විසින්

ඩබ්ලිව්. ඊ. බැස්ටියන් සහ සමාගමේ මුද්‍රිතයි.

ශ්‍රී. බු. ව. 2474.

ක්‍රි. ව. 1931.

To

# The Ven'ble Hettimulle Dhammapala Thero

Principal of Santhodaya Pirivena

AT MINUWANGODA,

A Scholar of

## Many Languages and Tripitaka,

This work is dedicated.

*Author :*

**M. GUNARATANA THERO.**

---

මිණුවන්ගොඩ සන්තෝදය පිරිවෙණාධිපති

**පිටකත්‍රය සහිත නානා භාෂා ශාස්ත්‍රයන්හි හසල බුද්ධිමත්**

**ගෞරවාර්හ**

**හෙට්ටිමුල්ලේ ධම්මපාලාභිධාන මහා ස්වාමී**

**පාදයාණන් වහන්සේට**

මේ කෘතිය සමර්පණය කරනලදී.

කර්තෘ,

**මාකුරේ, ගුණරතන ස්ථවිර.**

පරලෝ සැපත්

## රෙජිනා බැස්ටියන්

## මැතිණියට

පින් අයිති වේවා!

සාධු! සාධු!!

කොළඹ කැම්බල් පේල්ස්හි
"රිකාර්ටන්" නම් නිවසේ දිය.

4. 11. 38.

# PREFACE.

This book, entitled Visuddhidipika, as its name implies, is an introduction to the teachings of the Buddha, in as truth as the mode and practice of self-purification, the fundamental doctrine of Buddhism is here discussed in detail.

The fruit, the practice of self-purification brings forth, is the perfect emancipation, the bliss of Nirvana, to seek which goal the Buddhist devotees are ever so zealous and keen. The Blessed One, having himself first attained enlightenment by virtue of his superhuman insight has preached to the world the practical methods of self-purification, the sum and substance which is embodied in the following stanza.

" Sabba pāpassa akaranam
Kusalassa upasampadā
Sacitta pariodapanam
Etan Buddhānasāsanam "

whose meaning is

" Refrain from all evil
Accomplish all virtue
Purify your soul
This is the message of the Buddha's."

The teachings of the Buddha, accordingly, are classified into three " Pitakas " or baskets in each of which is described in detail one or other of the three broad divisions of doctrine as mentioned in this stanza, viz :, abstention from all evil is dealt with in the Vinaya, accomplishment of all *virtue* in the Sutra and purification of mind in the Abhidharma Pitaka, and as a book of this nature, by which even a bird's-eye view of the world of Buddhism can be had been a long-felt want. We have carefully compiled this Visuddhi deepika, with the kind invitation of R. V. Dedigama Esquire, Proctor, S. C., Kegalle.

The book is made up of nine chapters. The first of these is devoted to an account of the virtue of Buddha. The second entitled Seela-Visuddhi or purification by morality is a treatise on the sensation of evil.

In the third chapter is discussed in detail the accomplishment of all virtue The next five chapters are devoted to the principles and methods of purifying the mind. The ninth and last is a chapter on the importance of self-purification.

As a general knowledge of Buddhism can easily be acquired by reading over these chapters, written in mother language, we invite all those virtuous gentlemen, who desire to be free from the bonds of existence to make use of this little book on doctrine.

We have also added here a historical scenery of Dedigama, which we have compiled with the kind invitation of P. C. Dedigama Esquire, R. M. of Beligal Korale.

Our thanks are due to Rev. Vimalaratana Thero and Mr. Satyanatha Weerasingha for aiding in the compilation and to Mr. E. P. Atapattu of Dedigama A. V. B. School, for writing a preface in English.

*Author:-*

M. Gunaratana Thero

Dedigama Rajamaha-Viharaya,
Nelundeniya, P. O.

Dedigama,
31st Jany., 1931.

# සාංක්ෂේපනය.

මේ මැ ධර්ම පුස්තකය විශුද්ධිදීපිකා නම්. මෙහි සත්වයෙක් පවිත්‍රවීමට ඉවහල් කරුණු සඳහන් වෙත්. බුද්ධාගමේ පිණ්ඩාර්ථය ද සත්වයාගේ පිරිසුදුභාවය ඉගැන්වීමයි. ඒ මේ පාරිශුද්ධියගේ අන්තිම කෙළවර නිර්වාණ යයි. එය මැ බුද්ධාගමේ නිෂ්ඨාව ය'යි දතයුත්තාහ.

තව ද මේ පවිත්‍රක්‍රමය උගන්වාවදාළ සර්වඥයන්වහන්සේ පළමුවෙන් පවිත්‍රවූසේක. දෙවනු වැ ඒ පවිත්‍ර ක්‍රමය ලෝකයාට ද ප්‍රකාශකළහ. හෙද අතිසංක්ෂේපමුඛයෙන් දක්වන සර්වඥයන් වහන්සේ:– "සබ්බපාපස්ස අකරණං – කුසලස්ස උපසම්පදා; සචිත්තපරියොදපනං – එතං බුද්ධාන'සාසනං" යනු වදාළසේක. සියලු පව් නොකිරීම, සියලු කුශල් කිරීම, සිය සිත පිරිසිදු කිරීම, යන මේ බුද්ධානුශාසනා නමු. මේ අනුශාසනාත්‍රය විස්තර කිරීම පිණිසැ සූත්‍රා'භිධර්ම විනය සංඛ්‍යාත පිටකත්‍රයක් වදාළහ. බුදුහු;

i සියලු පව් නොකටයුතුය යන්නෙහි විස්තරය = විනය පිටකයෙහිද;
ii සියලු කුශල් කටයුතුය යන්නෙහි විස්තරය = සූත්‍ර පිටකයෙහිද;
iii සියසිත පවිත්‍ර කටයුතුය යන්නෙහි විස්තරය = අභිධර්ම පිටකයෙහිද; වෙති.

මෙතීතාක් විස්තෘතවූ බුද්ධාගම සැකෙවින් දත ගැණීම පිණිසැ මේ දක්වා මැ එකම පොතක් සුලභ නොවීම රටවාසීන්ට මහත් පාඩුවක් ය යි සැලකූ අප හිතවත් (කෑගල්ලේ) ආර්. වී. ඇදිරිගම නීතිඥතුමාණන්විසින් ආරාධිතවූ අපි මේ විශුද්ධිදීපිකා නම් ග්‍රන්ථසම්පාදනයෙහි යථාශක්තීන් ව්‍යාපෘත වීමු.

මෙහි අධ්‍යාය නවයෙකි. සර්වඥයන් වහන්සේගේ පවිත්‍රතාවය භගවත්නුවස් උද්දෙශ පරිකථා නම් ප්‍රථම පරිච්ඡේදය ද, සියලු පව් නොකටයුතු ක්‍රමය සඳහා ශීලවිශුද්ධි නම් ද්විතීය පරිච්ඡේදය ද, සියලු කුශල් කටයුතු ක්‍රමය සඳහා චිත්තවිශුද්ධි නම් තෘතීය පරිච්ඡේදය ද, සිත පවිත්‍ර කටයුතු ක්‍රමය සඳහා දිට්ඨිවිශුද්ධ්‍යාදි විශුද්ධි පඤ්චකයක් ඇතුළත් පරිච්ඡේද පසක් ද, පවිත්‍රවීමේ ශ්‍රේෂ්ඨත්වය සඳහා පරිශිෂ්ටාධිකාර නම් පරිච්ඡේදයක් ද'යි මෙසේ පරිච්ඡේද නවයකින් සම්පූර්ණකර තිබේ.

The book is made up of nine chapters. The first of these is devoted to an account of the virtue of Buddha. The second entitled Seela-Visuddhi or purification by morality is a treatise on the sensation of evil.

In the third chapter is discussed in detail the accomplishment of all virtue The next five chapters are devoted to the principles and methods of purifying the mind. The ninth and last is a chapter on the importance of self-purification.

As a general knowledge of Buddhism can easily be acquired by reading over these chapters, written in mother language, we invite all those virtuous gentlemen, who desire to be free from the bonds of existence to make use of this little book on doctrine.

We have also added here a historical scenery of Dedigama, which we have compiled with the kind invitation of P. C. Dedigama Esquire, R. M. of Beligal Korale.

Our thanks are due to Rev. Vimalaratana Thero and Mr. Satyanatha Weerasingha for aiding in the compilation and to Mr. E. P. Atapattu of Dedigama A. V. B. School, for writing a preface in English.

*Author:-*

M. Gunaratana Thero

Dedigama Rajamaha-Viharaya,
Nelundeniya, P. O.

Dedigama,
31st Jany., 1931.

# සංඥාපනය.

මෙ මැ ධර්ම පුස්තකය විශුද්ධිදීපිකා නම්. මෙහි සත්වයෙක් පවිත්‍රවීමට උවහල් කරුණු සඳහන් වෙත්. බුද්ධාගමේ පිණ්ඩාර්ථය ද සත්වයාගේ පිරිසුදුභාවය ඉෂැත්වීමයි. ඒ මේ පාරිශුද්ධියගේ අන්තිම කෙළවර නිර්වාණ යයි. එය මැ බුද්ධාගමේ නිෂ්ඨාවය'යි දතයුත්තාහ.

තව ද මේ පවිත්‍රක්‍රමය උගන්වාවදාළ සර්වඥයන්වහන්සේ පළමුවෙන් පවිත්‍රවූසේක. දෙවනු වැ ඒ පවිත්‍ර ක්‍රමය ලෝකයාට ද ප්‍රකාශකළහ. හෙද අතිසංක්ෂෙපමුඛයෙන් දක්වන සර්වඥයන් වහන්සේ:- "සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා; සචිත්තපරියෝදපනං - එතං බුද්ධාන'සාසනං" යනු වදාළ සේක. සියලු පව් නොකිරීම, සියලු කුශල් කිරීම, සිය සිත පිරිසිදු කිරීම, යන මේ බුද්ධානුශාසනා නම්. මේ අනුශාසනාත්‍රය විස්තර කිරීම පිණිසැ සූත්‍රා'භිධර්ම විනය සංඛ්‍යාත පිටකත්‍රයක් වදාළහ. බුදුහු;

i සියලු පව් නොකටයුතුය යන්නෙහි විස්තරය = විනය පිටකයෙහිද;
ii සියලු කුශල් කටයුතුය යන්නෙහි විස්තරය = සූත්‍ර පිටකයෙහිද;
iii සියසිත පවිත්‍ර කටයුතුය යන්නෙහි විස්තරය = අභිධර්ම පිටකයෙහිද; වෙති.

මෙකීතාක් විස්තෘතවූ බුද්ධාගම සැකෙවින් දැන ගැනීම පිණිසැ මේ දක්වා මැ එකම පොතක් සුලභ නොවීම රටවාසීන්ට මහත් පාඩුවක් ය යි සැලකූ අප හිතවත් (කෑගල්ලේ) ආර්. වී. ඇදිණම නීතිඥතුමාණන්විසින් ආරාධිතවූ අපි මේ විශුද්ධිදීපිකා නම් ග්‍රන්ථසම්පාදනයෙහි යථාශක්තීන් ව්‍යාපෘත වීමු.

මෙහි අධ්‍යාය නවයෙකි. සර්වඥයන් වහන්සේගේ පවිත්‍රතාවය භගවනුවස් උද්දේශ පරිකථා නම් ප්‍රථම පරිච්ඡේදය ද, සියලු පව් නොකටයුතු ක්‍රමය සඳහා ශීලවිශුද්ධි නම් ද්විතීය පරිච්ඡේදය ද, සියලු කුශල් කටයුතු ක්‍රමය සඳහා චිත්තවිශුද්ධි නම් තෘතීය පරිච්ඡේදය ද, සිත පවිත්‍ර කටයුතු ක්‍රමය සඳහා දිට්ඨිවිශුද්ධ්‍යාදි විශුද්ධි පඤ්චකයක් ඇතුළත් පරිච්ඡේද පසක් ද, පවිත්‍රවීමේ ශ්‍රෙෂ්ඨත්වය සඳහා පරිශිෂ්ටාධිකාර නම් පරිච්ඡේදයක් ද'යි මෙසේ පරිච්ඡේද නවයකින් සම්පූර්ණකර තිබේ.

සිය බසින් ලියනලද යථොක්ත පරිච්ඡේදයන් කියවීමෙන් විශුද්ධබුද්ධාගම පිළිබඳ සාමාන්‍යදැනීම ඇතිවන හෙයින් සසරබිය නුරුස්නා සාධුජන සත්පුරුෂයෝ මෙයින් ප්‍රයොජන ගනිත්වා'යි සමාරාධනය කරම්හ.

තවද බෙලිගල්කෝරළේ රට ලැබී කරවන පී. සී. දූදිගම දිසාපති මන්ත්‍රීශ්වරයාණන්ගේ අයදුම් පරිදි දූදිගම ගැන ඓතිහාසික ප්‍රස්තාවනාවක්ද මෙහි මුලට යොදලීමු. ඒ සඳහා බොහෝ වෙහෙසුනු නමුදු සම්පූර්ණ විස්තරයක් ලිවීම උගහට විය.

අපේ මේ කෘතිය සඳහා සත්‍යනාථ වීරසිංහ මහතාණන්ගෙන්ද, අප සහෝදර පිටිහුම විමලරතන ස්ථවිරයන් වහන්සේගෙන්ද, ඉංග්‍රීසි ලියවිලි සම්පාදනය කරදීමෙන් දූදිගම පාඨශාලාවේ ජේ. පී. අතපත්තු මහතාණන්ගෙන්ද විශේෂාධාර ලැබුණු බව සතුති පූර්වක වැ සඳහන් කරමු.

මේවගට,
මාකුරේ-ගුණරතන ස්ථවිර.

---

# ඓතිහාසික ප්‍රස්තාවනා.

## ජාතිග්‍රාමය හෙවත් දූදිගම.

සොත්ථිඩීභූපතිමහා විබුධමධුකරං සෙවනප්පබන්ධකජමහා
නානාභෙහාගාකරමහා වණ්ණජමුද්දපණ්ණ නාපනොසාකුලම්භා
භූමිත්ථි සෙඛරමහා විපුලසිරිධනී රාජමනතිස්සරමහා
විජ්ජාසින්ධුදධිමහා මනුජසුරදුමා ජාතිගාමප්පුරමහා.

සොභන රාජවිභූතිමත් භූපතීශ්වරයන් ඇත්තාවූ සුධීජන නැමති භෘඞ්ගයන්ගේ නිරන්තර සෙවනයට විකාශිත පද්මයක් බඳුවූ අනෙක සම්පත්තින්ම උත්පත්තිස්ථානවූ කාකීශ නොවූ යහපත් වෛශ්‍යෙන්ද්‍රන් ඇති සල්පිල් සමූහයෙන් ගැවසීගත්තාවූ මහීකාන්තාවට මුදුන්මල්කඩක් බඳුවූ මහඉසුරු සැපතින් යුත් රජමහ ඇමතියන් ඇත්තාවූ විද්‍යා නැමති නදීන්ට සාගරප්‍රතිමවූ ප්‍රවෘත්තිජනයනට කල්පපාදපසංකාශවූ ජාතිග්‍රාම නම් පුරයෙක්

වීද, ඒ මේ ජාතිග්‍රාමය හෙවත් දෑදිගම් වනාහි සතරකෝරළයට අයත් බෙලිගල්කෝරළේ කීරවැලිපත්තුවේ පිහිටා තිබෙන ඓතිහාසික සිද්ධීන්ගේ සමාශෙවනයෙන් විඛ්‍යාතවූ යශඃ ප්‍රබන්ධ ඇති අතිවිශාල ග්‍රාමවරයෙකි.

සමූහාර්ථ Racial Intermixture පර්‍යායවූ හෝ අවයවාර්ථ Compositive පර්‍යායවූ ජාති ශබ්දය ග්‍රාම ශබ්දය හා සමාසවීමෙන් ජාතිග්‍රාම ශබ්දය නිෂ්පන්නවිය. එය සියබසට දෑතිගම කියා බිඳී පසුව දෑදිගම'යි ව්‍යවහාර ප්‍රාප්තවිය. මේ ග්‍රාමයෙහි මූලු Corners පසක් හා දෙණි Valleys අටළොසක් ඇත්තාහ. 'ඉහලමුල්ල-ගොඩමුල්ල-අස්සැලිමුල්ල-උග්ගහමුල්ල-දුරමුල්ල" යනු මූලු පසයි. අවරදෙණිය- ඉළුක්දෙණිය- උඩදෙණිය- බටදෙණිය- පිටදෙණිය- තොරාමලදෙණිය- රිටිගහදෙණිය- අරඹදෙණිය- තොටදෙණිය- දෙහිවද්දෙණිය- හුලවාලිදෙණිය- මලංදෙණිය- දීක්දෙණිය- හෝරන්දෙණිය- පාතාදෙණිය- පල්කඩදෙණිය- දික්මල්දෙණිය- වැකඩදෙණිය- යනු දෙණි අටළොසයි. මේකී සියල්ල ඇතුලත්වන පරිදි නමක් තබන්නාහු:- වාසභූමිසමූහයක් Collection of Habitable areas යන අර්ථ ඇති ජාති ශබ්දය මුල්කොට "ජාති එව ගාමො= ජාති ගාමො" යි අවධාරණ පූර්ව පද කර්මධාරය සමාස විධීන් ජාතිග්‍රාමයයි කිහු. කුඩා කොටස් සමූහයක් ඇති ගමක් A Village Having Sub-Divisions යනු දෑදිගම යන්නෙහි අර්ථයි.

තවද මෙ මැ ජාතිශබ්දයෙහි අවයවාර්ථයක්ද ඇත. "අවයවෙ ව්‍යඞ්ග සත්වාත් ප්‍රදෙශ ව්‍යඞ්ග ච ධර්මභෙදෙ" යනු ශබ්දකොෂයි. තුරියජාති යන තන්හි තූර්‍ය්‍ය අවයව Musical Instruments යනාර්ථයක් වාච්‍යවේ. ග්‍රාමයනු "විප්‍රාශ්ච විප්‍රභෘත්‍යාශ්ච යත්‍ර නිවසන්ති සතු ග්‍රාම ඉති ප්‍රොක්තඃ" යී විග්‍රහ බැවින් විප්‍රාදීන්ගේ නිවාසස්ථානය Abode ග්‍රාම නම්වේ. මේ නයින් සලකනවිට අවයවාර්ථවාචී ජාති ශබ්දයත් නිවාසභූම්‍යර්ථවාචී ග්‍රාම ශබ්දයයත් අවයවාවයවී භාවසම්බන්ධාර්ථයෙහි "ජාතීනං ගාමො= ජාති ගාමො" යී සමාස විධීන් සිද්ධයයි නැගේ. එසේ සලකත් හොත් "අවයව සමූහයක් අඩංගු(අවයවී)ග්‍රාමයක්" A Village Possessing Characteristic Features යනු දෑදිගම් යන්නෙහි අර්ථයි.

නිකාය සන්ධි සාමඤ්ඤපසූතීසු කුලෙ භවෙ
විසෙසෙ සුමනායඤ්ච ජාති සංඛතලක්ඛණෙ.

යනුවෙන් ජාති ශබ්දයෙහි අනේකාර්ථ Diverse Shades of Meanings ඇත්තාහ:- ශ්‍රමණ ජාතියක් යන තන්හි ජාති ශබ්දයෙන් නිකාය A Religious Sect යනුද, සංජාති යන තන්හි ප්‍රතිසන්ධිය Conception යනුද, සත්ව ජාතියක් යන තන්හි සාමාන්‍ය Species යනුද, ජාතවූ කෙණෙහි යන තන්හි ප්‍රසූතිය Birth යනුද, ජාති කුලපුත්‍ර යන තන්හි වංශය Family or tribe යනුද, ජාතියක් පාසා යන තන්හි භවය Existences යනුද, හීන ජාතියක් යන තන්හි විශේෂ Distinction යනුද, ජාති සුමන යන තන්හි උතුම් මල් වෙසෙසක් Jasmin Grandiflorum යනුද, ආයර්‍ය ජාතියක් යන තන්හි ශිලය morality යනුද, ජාතියත තන්හි උත්පාද ලක්ෂණය Origin of Ideas යනුද, භාණ්ඩජාතියක් යන තන්හි සමූහයක් Racial Intermixture යනුද, තූරිය ජාති යන තන්හි අවයව Compositive යනුද, වාච්‍ය වන්නෝ නමුදු "ජාති ගාම" යන තන්හි සමූහාර්ථය හෝ අවයවාර්ථය යුක්තතරය යි දතයුතු.

ගජබාරජුගේ උත්පත්තිය මෙහිදී සිදුවූ හෙයින් ජාතිග්‍රාම වීය'යි ඇතැම් කෙනෙක් කියති. එහෙත් අසවලා උපන් ගමය'යි ජාතිග්‍රාම ශබ්දයෙන් නොහැගෙනුයේ නෙයදෙශාකූල බැවින්ද, ශෙෂ කුමරුවන් උපන් ගම්වලට එබඳු ව්‍යවහාරයක් නොපැනෙන බැවින්ද යුක්තිසඞ්ගත නොවේ. ජාතිග්‍රාම යන්න ඤාති ග්‍රාමය'යි සමහරුන්ගේ මතයකි. ශිලාලිපියෙහිද "ඤාතිගම පුරය"යි සඳහන්වී තිබේ. ශිලාලිපිය පිහිටුවන ලද්දේ ක්‍රි: ව: 1464 දීය. ක්‍රි: ව: 113 දී ජාතිග්‍රාම යන නාමය ව්‍යවහාරවූ බව කුරුණෑගල්ලිපියෙන් පෙනේ. තවද ක්‍රි: ව: 1412 දී රචනාකළ වෘත්තමාලාඛ්‍යානයෙහි "ජාතිගාම්පපුරමහා" කියාද, තිසර සන්දේශයෙහි "රුහාදෙරනම්බා දූතිගම් පුරදිස්න" කියාද ව්‍යවහාරවූ බැවින් ඤාතිගම යනු යුක්තියුක්ත නොවේ. භුවනෙකබාහු භූපතීශ්වරයන්ගේ ඤාතීන් විසූ ගම හෙයින් ශිලාලිපියෙහි එසේ යෙදූබව ඇතැම් කෙනෙක් සලකති. නමුත් ඒව එකී සංඛ්‍යාවකට පූර්වයෙහි පවත් පුස්තකාරූඪ වැ ප්‍රකටව තුබූ ජාතිග්‍රාම යන්න ඤාතිගමය යි වෙනස් කිරීම නොමැනවි. ඒ අදහසින් යොදන ලදනම් ශිලාලිපි කර්තෘගේ මතිභ්‍රාන්තියකි. මාගධී රාජ ශබ්දයෙහි රඤ්ඤ යි ජකාරස්ථානයෙහි ඤකාරයක් පැනෙන හෙයින්ද, සංස්කෘත අච් + මිතඃ යන තැන අජ්මිතඃ = අඤ්මිතඃයි පැණෙන හෙයින්ද ජකාර ඤකාර දෙකෙහි වර්ගත්වය නිසා සම්බවයක් ඇතිහෙයින් ජාතිග්‍රාම යනු ඤාතිග්‍රාමය යි සුඛාවචාරණය

පිණිසැ යෙදීමට අවකාශපැනේ. එබැවින් ශිලාලිපියෙහි එසේ යොදන්ට ඇත යනු අපගේ නිගමනය වේ. විචාරක්‍ෂමයෝ පරීක්‍ෂණය කෙරෙත්වා,

---

## ii උපනගරයෙක් වැ පැවැතිකාල.

——)॰(——

ශ්‍රී. බු: වර්‍ෂ 655 දී නොහොත් ක්‍රි: ව: 113 දී අනුරාධපුර රාජ්‍ය ශ්‍රීයට පත්වූ i ගජබාරජු දවස මෙමැ ජාතිග්‍රාමය උපනගරයක් වැ පැවතිබව කුරුණෑගල් ලිපියෙහි සඳහන් වැ තිබේ. බැල්මිහ නාණන්ගේ පොතෙහිද ක්‍රි: ව: 109–131 බෙලිගල හොඬනැගිලි තැනීම පිණිසැ දැදිගම්පුරය හැර ගියබව පෙනේය'යි කිය තිබේ. එම රජහුගේ යගදාව සැදූ කම්මල තුබූ ස්ථානය කම්මල් තැන්න නමින්ද, එය තැන්පත්කළ ස්ථානය යගදකනද නමින්ද, මාලිගය තුබූ ස්ථානය මාලිගාතැන්න නමින්ද, අන්තඃපුරය මුතුකෙළිය නමින්ද, ජලස්නානය කළ ස්ථානය කපුරු ඇල්ල නමින්ද පවත්නාහු ඒ කාලයෙහි පටන් ව්‍යවහාරයෝ යනු ජනශ්‍රැති වාර්තායි.

බු: ව: 1792 දී නොහොත් ක්‍රි: ව: 1250 දී ජම්බුද්‍රෝණී පුරවරාධීශ්වර ශ්‍රී සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු භූපතීශ්වරයාණන් දවසද උපනගරයක් වැ පැවැතිණ. දඹදෙණිය අගනුවර කොට ගම්පල සහ දැදිගම උපනගර කොට වැජඹුණු බව වාදංකුශ කාව්‍යයෙහි සඳහන් වැ තිබේ.

මූතිකුමි ලොව නොයෙක දැනුම් එකාබසදමි
සුත රුවිතිපියුමි සරදූනු කාමි
දෙන ඇදූරු රැකුමි රද තියමෙන් දිරබූපා
පැරකුමි කාළ විරිදූ උදමි සිදූතුගු කුමි
ජය බේරි වැනුමි රශමනරමි
යස නලඹ රැගුමි හට සැදුසින් හළදීපා
ගුවසුමි ගුණ දෙරණ විකුමි සරතෙවිකුමි
රිවි කිරණ නොහිමි තෙද මහසමි
මනම හරු පරමි පර රණ මන් දිරදීපා
සදහමි තෙල තෙසර රැගුමි වන රණ කුමි
දිසි දඹදෙණි ගම් පල දැදිගමි
නගරාදිපරමි යුර කාප සිංහු මහිපා

එසමයෙහි අඹලෙන-සත්‍රිපුරය යන ගල්ලෙන් දෙකෙහි එම රජාණන්ගේ බිසෝවරුන් දෙදෙනෙක් විසූහ. එවකට ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන්වහන්සේ රත්නපුර පලාතේ පිහිටි දෙල්ගමුව නම් පියසේ සිට මූහපෙරහරින් වැඩමවනසේක්:- දූදිගම කොණ්ඩගල නම් ස්ථානයෙහිතබා පුදසිරිත් පැවැත්වූහ. ඒ පූජාමඞ්ගල්‍යය සඳහා ඉහළ කී බිසෝවරු පැමිණිවිට සමීපස්ථ ගලක් තුණට පැලී මධ්‍යයෙන් ශෛලමය පද්මයක් පහළවිය. ඒ අසිරිමත් පෙළහර දුටු බිසෝවරු සෙල්පියුමෙන් පුද ප්‍රීතිය දරාගත නුහුනුවෝ තත් ප්‍රදේශයට නෙළුම්දෙණිය යන නාමය තබා දළදාසාමීන්ට පිදූහ. සත්‍රිපුරෙන් පැමිණි බිසොව විශෙෂ පූජාවක් කරනු කැමැත්තී හොලොම්බුව නම් ගම්වර පිදුවාය. මෙකී ගම්වර දෙක දැනුදු දළදාමාලිගාවට හිමිව පවත්නේය. ප්‍රාදුර්භූතවූ ශෛලමය පද්මය කළුගමුව නම් ගම මොරහාවිටාල කෙනෙකුට සන්හස් පිණිසැ දී තිබෙනබව සැලසී.

බු. ව. 1891 දී නොහොත් ක්‍රි. ව. 1347 දී ගංගාසිරිපුර රාජ්‍ය පදප්‍රාප්ත iv භුවනෛකබාහු භූපාලයාණන්ගේ කාලයෙහිද උපනගරයක්වැ පැවැතිණ. ඒ කාලයෙහි කල්‍යාණිවිහාරාධිපති විල්ගම්මූල සංඝරාජ මාහිමිතුමන්ගේ බෑනණුවන්වන ගතාරාශිධාන ස්ථවිරතුමෙකුගේ ආචාර්‍යත්වයෙන් මෙහි ගතාරාපිරුවන නමින් විද්‍යාමන්දිරයක් පිහිටුවා ධර්මවිනය ශබ්දශාස්ත්‍රාදිය ඉගැන්වූහ. කල්‍යාණිශිලාලිපියෙහි:-“මතු ඇතිවන බන්ධු පරම්පරාවේ ගතාරා පිරිවෙන් හිමිනැහන් විසිනුත්”යනුවෙන් සඳහන්වූයේ යථොක්ත පිරුවන ගැනයි. ක්‍රි. ව. 1378 දී ශ්‍රී වර්ධනපුර රජ පැමිණි v භුවනෛකබාහු ධරණීශ්වරයාණන්ගේ කාලයෙහි පරිවෙණාධිපතීන් වහන්සේ මෙයින් අස්වී කැලණිවිහාරයටම වැඩිය නමුදු මෙය විල්ගම්මූල පරපුරෙන් හිස්නොවීය. කල් යාමෙන් පරිවෙණස්ථානයෙහි ශිලාස්ථම්භාදිය පමණක් ශෙෂ වීමෙන් ගල්ටැම් ඕවිට නමින් තිබී දැනට ගල්තැන්ඕවිටයයි ව්‍යවහාරයට බැසතිබේ.

---

## iii අග්‍රරාජධානියක්වැ පැවැති කාලය.

ශ්‍රී. බු. ව. 1955 දී නොහොත් ක්‍රි. ව. 1411 දී දැදිගම්පුර රජ පැමිණි ශ්‍රීමත් පරාක්‍රමබාහු මහරජාණෝ ජාතිග්‍රාමය අගනුවර කොට කෛලාශාමෘතසාගර තුෂාරසංකාශ කීර්තිහාරය දශදිග් වධූන්ගේ වක්ෂස්හි අවලම්බනය කොට විජෘම්භමානවූහ. එකල්හි

සියලු ජනයනට මහඃ ප්‍රසාදකරවූ ගෘහසමූහ ඇති ශ්‍රීකාන්තාවට පද්මාකරයක් වැනිවූ මේ නගරවරයෙහි ජනකාය දෙවියන් මෙන් ප්‍රමුදිතවූහු. මෙනුවර අවටින් දිසි පවුරු වළල්ල සූර්‍ය්‍යවංශික රජුගේ බිම්බබිම්බය නැවත සපිරකාරනු පිණිස චන්ද්‍රවංශයෙන් එවූ පරිවේශමණ්ඩලයක් මෙන් භ්‍රාජිතවී. තදනන්තරව, ප්‍රසන්න ශීතල ජලයෙන් පිරුණාවූ පරිඛාවලී තොමෝ අවපින් හෙබී, අනන්තප්‍රකාර ප්‍රාසාදකූටයෝ ශරත්කාලයෙහි මේ කුළු පෙළක්මෙන්වූහ. ධරණීතලයෙහි පතළාවූ සූර්‍ය්‍යාතප නැමති උදකයෙහි ප්‍රතිබිම්බිතවූ නගරවීථි උභයපාර්ශ්වයෙහි අනුබද්ධනාලද ධ්වජාවලීහු ප්‍රවාලගඞ්ගාවගේ උපරිභාගයෙහි අනවරතයෙන් කෙළිනාවූ අනෙකප්‍රකාර මත්ස්‍යයන් මෙන් බැබලූහ. මෙනුවර බහිර්ද්වාර සමූහය පුරසිරිදක්නා පිණිස රසාතලයෙන් අවුත් මේපුරයෙහි සකල සමෘද්ධිය දැක, ඔවුනොවුන් මුහුණ බලා පින් වත්නී! ආශ්වර්‍ය්‍යයෙකැයි පුරවර්ණනාකාරනලද දිව්‍යනාගයන් මෙන් විරාජමානවූහ. අශ්වයන්ගේ ඛුරසඞ්ඝර්ෂණයෙන් නැංගාවූ රේණූන් කරණකොටගෙන පාණ්ඩුවර්ණ ඇති හස්තිපඞ්ක්තිහු සන්ධ්‍යාවලම්බනාවූ අන්ධකාර ප්‍රබන්ධයන් වැන්නීය. නගරාලංකාර පිණිස වින්‍යාසකරනු ලබන්නාවූ ධ්වජ හා රම්භාවෘක්ෂයන්ගේ ඡායාව කරණකොටගෙන හිරුරැස් නොරැස්නා ජනයෝ නඳුන් උයන්හි දෙවියන් මෙන් අභිරමණය කළාහුය. මන්දමාරුතයෙන් කම්පිතවූ කුමුකුවෘක්ෂයෝ පුරශ්‍රීය දැක සතුටු කොට නිජමස්තකයන් කම්පිතකොළෝවනැයි හඟිමි.

බොහෝකොට කිමෙන් කිම්! අශ්වයන් නැමති රළබිඳීම ඇති හස්තීන් නැමති නෞකා ඇති ප්‍රාකාර නැමති වේලාන්ත ඇති පසඟතුරු නැමති ඝෝෂා ඇති ප්‍රාසාද නැමති පර්වතකූට ඇති රාජමන්දිර නැමති සුමේරු පර්වතයෙන් හොබනාවූ නරෙන්ද්‍ර කීර්ති නැමති චන්ද්‍රප්‍රභාවෙන් ගැවසිගත් ජාතිග්‍රාමපුර නැමති ක්ෂීර සාගරය තත්කාලයෙහි භ්‍රාජිතවී.

මේ සා මහත් ශොභාසමෘද්ධියකින් සමලංකෘතවූ ජාතිග්‍රාමපුර ප්‍රවරයෙහි විරාජිත පරාක්‍රමබාහු රාජයා පිළිබඳ ඉතිහාසගත චරිතාපදානය නම්:-ගම්පල රජපැමිණි iv භුවනෙකබාහුරජුගේ අගමැතිතෙමේ "සේනවරවංශාභිජාත සේනාලංකාධිකාර සෙනෙවිරත්" නම්‍ය. මෙතුමා iv භුවනෙකබාහු-v පරාක්‍රමබාහු-iii වික්‍රමබාහු යන රජුන් දවස ජීවත්වැ සිටි කෙනෙකි. මොහුගේ වීරඅලකෙශ්වර-වීරබාහු යන පුත්‍රයෝ දෙදෙනෙක්වූහ. බු. ව.

1914 දී කෝට්ටේ රජපැමිණි v භුවනෛකබාහු රජුදවස බාලපුත්‍ර වීරබාහු ඈපාණෝ යුවරජවැ ගම්පල විසූහ. එකල්හි භුවනෛකබාහු රජු හා සටන් පිණිසැ පැමිණි යාපාපටුනුවර විසූ ද්‍රවිඩසේනාපතියෙක් වන ආර්යචක්‍රවර්තින්ගේ දෙමළ සේනාවට බියෙන් එම රජ රයිගම්පුරයට පලාගියේය. ඉක්බිති වීරබාහු යුවරජ තෙමේ සතුරන්ට පහරදී බු. ව. 1934 දී අභිෂෙක ප්‍රාප්තවිය.

වීරඅලකේශ්වරතෙමේ රයිගම අසලදී මල්වූ වීරබාහු රජු හා සටන්කොට පැරද දඹදිවට පලාගියේය. එතැන්සිට වීරබාහු රජ නිරුපද්‍රත වැ රාජ්‍යවිචාරණය කරනුවෝ විතීය ධර්මකීර්ති සංඝරාජයන්වහන්සේ ප්‍රධාන ගලතුරුමූල මෛත්‍රෙය මහාස්ථවිරයන් ඇතුළුව ශාසන ශුද්ධියක් කරවූහ. දේශාන්තරගතවූ වීරඅලකේශ්වරතෙමේ බු. ව. 1941 දී බලසෙන් ගෙනවුත් සොහොවුරු වීරබාහුගෙන් රාජ්‍යය පැහැරගත්තේය. ඉක්බිති බු. ව. 1953 දී චීනසේනාවක් විසින් මායම් දක්වා දරුදරුකයන් සමඟ චීනයට අල්ලාගෙනයන ලදුව දෙවර්ෂයක් ලංකාව අරාජික වැ පැවතුණි.

බු. ව. 1955 දී ලම්බකර්ණගොත්‍රයට අයත් සුනෙත්‍රානම් බිසො පුත් පරාක්‍රමබාහු නම් කුමාරයෙක් සවෙනි පැරකුම්බා යන නමින් ඉදිරිපත්වැ සිටිනවිට ගියදවස චීනයට අල්වාගෙන ගිය වීරඅලකේශ්වරගේ සහ සුමිත්‍රා බිසවගේත් පුත්‍රවූ සේනාලංකාධිකාර සේනාවීරදුන්ගේ තපනාවූ පරාක්‍රමබාහු ආදිපාද තෙමේ චීනරජු විසින් හිරෙන් නිදහස්කොට ලංකාරාජ්‍යය භාරදී එවනලදුව ලක්දිව් පැමිණ වැසියන්ගේද සම්මතයපිට දැදිගම්පුර සිංහාසනාරූඪවිය. ඉක්බිති සවෙනි පැරකුම්බාහු පලාගොස් සැඟවී සිට විටින් විට වියවුල් ඇතිකරන්ට වූහෙයින් ඒ කාලයෙහි දැදිගම පරාක්‍රමබාහු මහීපාලයන්ට ජයාශංසන මුඛයෙන් වෘත්තමාලා සන්දේශ ශතකය හා තිසරසන්දේශයද රචනාකරනලද්දහ. එමසන්දේශවයෙහි වර්ණිත මෙමිඳු රාජ්‍යා ගැන:-

ඉත්ථම්භූත විභූතිභාරභරිතෙ තස්මිං පධානොදිතෙ
සාමන්තාජ්ජ ගතිඤ්ඤමොලිරතනා ලීසෙවිපාදම්බුජෝ
භූසෙනොනාරතනතනයං සමකුලේ සාම්ංත චූළාමණිං
ලඞ්කාවිවාසභුජො පරක්කමභුජො රාජාධිරාජා අහු.

(වෘත්තමාලා)

යථොක්තප්‍රකාර ස්වපත්ති භාරයෙන් භරිතවූ අනුරාජධානි හෙයින් මැ ප්‍රසිද්ධවූ ඒ ජතිග්‍රාමනම් පුරයෙහි සාමන්ත රජුන්ගේ කිරීට මාණික්‍ය නැමැති භෘංගයන් විසින් සෙවුනාලද්දවූ පාද පද්ම ඇති රත්නත්‍රය ස්වකීය උත්තමාඞ්ගයෙහි සිළුමිණක්කොට ප්‍රසාධනය කළාවූ ශ්‍රීනිවාසබාහුවක් ඇති ප්‍රධානරාජන්වූ පරාක්‍රමබාහු නම් රජෙක්වී. ජනකම්‍යාවූ සුමිත්‍රානම් මෙහෙසිකා නැමති පූර්විදිශාවෙන් පහළවූ ක්‍රමයෙන් වැඩුනාවූද තේජස් ඇත්තාවූ ද මේ පෘථිවීශ්වර තෙමේ තරුණසූර්යයාමෙන් භ්‍රාජමානවී.

•

තවද යශොඝොෂා නැමති කුඩුව නාද ඇති දනඳුවාහ නැමති මදජලධාරා ඇති ප්‍රත්‍යර්ථීන් නැමති හස්තීන්ගේ විදාරණයෙන් රත්වූ තේජස් නැමති දළඇති අන්තඃපුරස්ත්‍රීන් නැමති හස්තිනීන් සන්තොෂකරවූ පෘථිවීශ්වර නැමති සුරහස්තිවාරණ තෙමේ ජාතිග්‍රාම නැමති සුරනදියෙහි විරාජමානවී. ධෛර්‍ය නැමති පර්වතයාගේ සිරීමට භූමියක් වැනිවූද වෛරී සමූහ නැමති තුෂාරශොෂණයට දිවාකරයා වැනිවූද සත්පුරුෂ නැමති කොමුද ප්‍රබොධයට නිශාකරයා වැනිවූද මේ නරශ්‍රෙෂ්ඨයාගේ ආඥතොමෝ දිශානුදිශායෙහි ව්‍යාප්තවූවා චන්ද්‍රමරීචි කදම්බයක්මෙන් හලාදකරවූවාය. එසේම වෙලාන්ත නැමති පරිවෙෂමණ්ඩලයක් ඇති තොදෙව් නැමති මේඛලපෙළින් ගැවසිගත් තරංග නැමති වළාවෙන් හා විද්‍යුල්ලතායෙන් දිලිසෙන්නාවූ සමුද්‍ර නැමති අම්බරෝදරෙහි භාසුරවූ ලක්දිව් නැමති සඳමඬලෙහි මන්ත්‍රීමණ්ඩල නැමති තාරකාවලින් පරිවෘතවූ මේ පරාක්‍රමබාහු රජතෙමේ චන්ද්‍රදිව්‍යපුත්‍රයාමෙන් විරාජමානවීය. තිසරසන්දෙශයෙහි මෙ මැ රාජයා ගැනම:-

තු ශු ම න ර ම් බා  බෙලෙ නදහස  ලෙ ස් න
රු කා දෙ රණ ම් බා  දූනිශම්පුර  දි ස් න
හිමි පැ ර කු ම් බා  නරනිඳුහට  තො ස් න
ම මි තු ර! එ ම් බා  දත්වව මේ  හ ස් න

මෙහි සන්දෙශයන්හි වර්ණිතවූ දැදිගම පරාක්‍රමබාහුරජයාගේ රාජ්‍යාදයකාලය බු. ව. 1955–1958 අතර විය. ඒ කාලයෙහි විජයබුල් ඇතිකරමින් සිටිය ලම්බකර්ණවංශික පැරකුම්බාහු විසින් බු. ව. 1958 දී කරනලද සටනින් දැදිගම පරාක්‍රමබාහු රජතෙමේ මරුමුවට පත්විය. මේ යුද්ධයෙන් ජයලත් ස්ථානය ජාලන්කන්ද නමින්ද දැදිගම පරාක්‍රමබාහු පැරද පලායන අතර

ලුහුබැඳගිය ලම්බකණ්ණවංශික රජහු විසින් කඩුපතින් ගසා මරුලුවට පැමිණෙවූ ස්ථානය ජයකඩුව නමින්ද මෙකල ව්‍යවහාරව පවත්නේය. ලම්බකණ්ණවංශික පරාක්‍රමබාහු යුද්ධයෙන් ලබන ලද ජයග්‍රහණ" ඇතිහෙයින් බු. ව, 1958 දී vi ශ්‍රී පරාක්‍රමබාහු යන නමින් කෝට්ටේ අභිෂේකප්‍රාප්තවිය. මේ රාජයාගේ අභිෂේක වර්ණනා කාව්‍යශේඛරයෙහි මෙසේ දක්වා තිබේ:–

බුදුවසිනෙක් දහ ස
නවසිය අව පණස්ව ස
රිවිසඳ තෙද යස ස
පතල තිරිදෙක් වීය ලෝකු ස

තවද ගතාරාස්ථවිරතුමන්ගේ බන්ධුවරියක් වන තාරාබිසෝව දූදිගම් පරාක්‍රමබාහු රාජයාව අගමෙහෙසුන් වැ සිටිය බව තිසර අස්නෙන් පෙනේ. ඇගේ මාලිගාව කිරවැල්ලේ තිබිච්ච අසල "මාලිගාගොඩැල්ල නොහොත් ගනේතැන්නය"යි කියන ස්ථානයෙහි වියයි හැඟේ. දැනුදු එහි ශෛලමය නෂ්ටාවශේෂ පැනෙත්. තිසරපක්ෂියාගේ ගමන් මාර්ගය දක්වනතැන දෙරවකින් ගොස් තාරාබිසෝව දැක කොලඇල්ලා බෝධිය පසුකර දූතිගමට පැමිණියයුතු බව දක්වා තිබේ. මෙයින් හැඟියන්නේ දෙරවකට ත් දූතිනමට ත් අතර තාරාබිසෝව සිටිය බවයි. එහි කොලඇල්ලා බෝධිය'යි සඳහන්වූයේ මැණික්කඩවර බෝධිද්‍රුමය විය හැක.

තිසරසන්දේශ 124 වැනි කවෙහි "බලග වෙහෙර සැදිසිරිසර දෙරවකය" යනුද, 127 වැනි කවෙහි "තාරාබිසෝවුන් ද නැමද යාගත් ඉන් නොලසී"යනුද, 140 වැනි කවෙහි "යනු ඇල්ලා කොලහිම් දුම්දු විදිමින"යනුද, 142 වැනි කවෙහි,

ඇ ති ය ම් සිරි තැනෙක්වූ ලෙසිනි බබල නා
සි ති ය ම් ඇති නොයෙකරඳි සොඳුරු විමනි නා
බැ තිපෙම් තුනුරුවනැති සත නිතොර ව නා
දූ ති ග ම පුරවරට වදු මිතුර! සිතුමෙ නා

යනුද දක්වා තිබේ. ජලන්තන්දේ සටනෙන් පැරද පලාගියේද තාරාබිසෝවගේ මාලිගාව දෙසටය. එයින්ද එහිම විසූබව හැඟේ, ගතාරාස්ථවිරතුමන් විසින් විරචිත වෘත්තමාලා ශතකයද පූජාකත ඥාතිසම්බන්ධය නිසාම භාරකලද්දකැ'යි සිතිය හැකිය.

## iv. බෝ ධි ද්‍රු ම ය.

දෑදිගම විහාරභූමියෙහි පිහිටි ශ්‍රී මහාබෝධිද්‍රුමය වනාහි මීට වර්ෂ 2200 කට පමණ පූර්වයෙහි රජවූ දෙවානංපියතිස්ස මහරජාණන් දවස රෝපණය, කරනලද්දැ'යි සිතති. ලක්දිව බෝධි පිහිටෙවූ ඒ කාලයෙහි මෙහිද ප්‍රතිෂ්ඨාපිත බැව් මූලපරම්පරාගතය. මෙහි ප්‍රථමවරට ඇතිවූ පූජනීය වස්තුවද බෝධිද්‍රුම රාජයායි. දැනුදු දුටුවන් නෙත්සිත් පිනවන දර්ශනීය ස්වරූපයක් උසුලයි. මේ ගැන මාතමාලා ශතකායෙහි:-

සාරජාතරූපපට්ට දෙවචාප සොභනො
ලොලබාල පල්ලවොස තෙකවිජ්ජු භාසුරො
සෙතකෙතනාවලීබලාකසෙනි සංකුලො
නීලගිම්හවාරතො දුමිඤ්ඤනිරදෙ අහු.

උතුම් සනකානකපට්ට නැමති ඉන්ද්‍රචාපයෙන් ශොභනාවූ කම්පිත ලපලු සමූහ නැමති අනේක විද්‍යුල්ලතාවෙන් බබලන්නාවූ ධවලපතාකා පඞ්ක්ති නැමති බලාකාවලින් ගැවසිගත්තාවූ දුක්නැමති ග්‍රීෂ්මය දුරුකරන්නාවූ බෝධිද්‍රුමරාජ නැමති මෙඝකූටයෙක් (ජාතිග්‍රාම නැමති නභඃස්ථලයෙහි) වීය.

---

## v බුද්ධ ප්‍රතිමාලය.

සම්ඥ බුද්ධප්‍රතිමා මන්දිරය වනාහි දෑදිගම පරාක්‍රමබාහු මහ රජාණන්ගේ කාලයෙහි පටන් පැවතෙන ලද්දකි, ඒ රජතුමන් විසින් සපුලීයකින් බුද්ධප්‍රතිමා රූපයක් කප්පවා බෝධිය සමීපයෙහි විහාරගෘහයක් කරවා වැඩ තිබවනලද හෙයින් එවක්පටන් රාජමහාවිහාර නම් විය. ඊට පළමු මෙහි රාජ ප්‍රතිෂ්ඨාපිත ප්‍රතිමාලයක් තිබුණු බවට කරුණු නැත. එසේ විද්‍යමානවූයේනම් පූජෝකත සන්දේශවයෙහි මැ සඳහන් වියයුතුය. නමුත් ක්‍රි. ව. 1347 දී ගම්පල භුවනෙකබාහු රජු දවස ගතාරා පරිවෙණස්ථානයෙහි (ගල්තැන්ඕවිටේ) කුඩා දාගැබක් සහ බුද්ධ ප්‍රතිමාලයක් ද තිබී පිරුවනේ අභාවයෙන් පසු අපවත්වූහ'යි සිතියහැකිය. දැනුදු එහි පවත්නා නෂ්ටාවශේෂ අඩිතාලම් ආදීයන් සැයක් තිබෙන්ට ඇතැ'යි අදහස් වේ, එවකට බොහෝ භික්ෂූන්ගේ නිත්‍යවාසය ඇතිතැනක් වූ හෙයින් පූජනීය චෛත්‍ය ද ඇතිවීය යුතුමය.

බෙල්මහතාණන්ගේ (සතරකෝරළේ කඩයිම්) පොතේ සඳහන්වී තිබෙන "ඇ. ජේ. එච්, ප්‍රයිස් මහතාගේ වර්ෂ 1886 යේ දෙසැම්බර් 17 වැනිදින දරන දිනපොතෙන් උපුටාගත්" වගන්තියක මෙසේ කියාතිබේ:–"ක්‍රි. ව. 1275 දී ශ්‍රී භුවනෙකබාහු රජු විසින් ගොඩනගනලදැයි සිතියහැකි කදිම විහාරයක් දැදිගම තිබේ. ශෛලස්ථම්භයක දෙවනාගරාක්ෂරයෙන් යුත් පැහැදිලි සන්නසක් තිබේ. ක්‍රි. ව. 13 වෙනි ශත වර්ෂයේදී iii වෙනි විජය බාහු රජු විසින් තනවනලදැයි සිතියහැකි දාගැබක නෂ්ටාවශෙෂ මෙයින් හැතැප්මක් පමණ ඔබ්බෙහි තිබේ. පරණ ගඩොල් ගොඩවල් බොහෝ වේත්"යනුයි.

මේ වගන්තියේ සඳහන් ශ්‍රී භුවනෙකබාහු රාජයා ක්‍රි. ව. 1275 දී කුරුණෑගල්පුර රජ පැමිණි ii භුවනෙකබාහු විය යුතුය. මේ රජ දැදිගමවිසූ බවක් හෝ උපනගරයක් කොට රාජ්‍යවිචාරණය කළබවක් හෝ පුරාවෘතයෙහි සඳහන්ව නැත. එහෙත් මේ රජතෙමේ ලක්දිව බොහෝ වෙහෙර විහාරකරවූ කෙනෙකි. එබැවින් අනුමානකර ලියනලදැයි හැඟේ. ශෛලස්ථම්භයේ දෙවනාගර අකුරැය යනු බැරිවීමකින් ලියවී තිබේ. (දාගැබ ගැන ලියා තිබෙන මතයද පිළිගැනීම අපහසුයි. ඒ ගැන කරුණු මෙහි ලියන විස්තරයේ දක්වන්නෙමි.)

## vi ආශ්‍රමය.

තස්ස පුරස්ස ධජෝ විය නිච්චං
සිස්ස සුභාසිත භාරතිරඞ්ගො
විස්ස මනස්ස ජනස්ස නිවාසො
අස්සම භූමිපදෙ'පි විරාජෙ.

ඒ ජාතිග්‍රාමනම් පුරයට ධවජයක් බඳුවූද, අනවරතයෙන් ශිෂ්‍යයන්ගේ ජනභාෂිත ලක්ෂණ වාග්වතීතාවට රඟමඬලක් වැනිවූද, ශ්‍රමසංසිඳුවන්නාවූ සභායාට ශාලාවක් බඳුවූද, ආශ්‍රම භූමිප්‍රදෙශයකුදු විරාජමානවීය'යි වෘතමාලා වෙහි දක්වාතිබේ. මෙහි සඳහන්වූයේ මෙකල පවත්නා ආශ්‍රම භූමියයි. මීට ප්‍රථම සංඝාරාමය ගොඩනගා තිබුනේ ගනාරා පිරිවෙන පිහිටි (ගල්තැන් ඕවිටනම්) භූමිප්‍රදෙශයේය. එවකට කැලණි විහාරාධිපති විල්ගම්මූල සංඝරාජ මහාස්වාමින්ගේ භාගිනෙය්‍යවූ ගනා

රාහිධාන ස්ථවිරපාදයෝ පිරිවෙනේ සහ සංඝාරාමයේද ආධිපත්‍යය ඉසුලූවෝය. එවක් පටන් (ක්‍රි. ව. 1347–1411 අතර මෙහි) විල්ගම්මුල (සරෝගාමමූල) පරම්පරාව පැවතිණ.

විල්ගම වනාහි පොටමූණක් ඇති රාජකීය භටසේනා නවත්වන රක්‍ෂාසන්නිවේශ ස්ථානයක් බව "අසෝකාණනං සරෝගාම තිත්‍ථං පඨාය බුද්ධිමා–පරිතිත්‍ථං නිවේසසි සාමච්චං චතුරඞ්ගිනිං" යන්නෙන් මහාවංශයෙහි දක්වා තිබේ. එහි විහාරාරාමාදිය කරවා රාජනියමයෙන් තෝරාගත් පය්‍යාප්තිධර මහාස්ථවිරතුමෙකුට පැවරූහ. එහි මුල්අධිපතියා නම පුලස්තිපුර මහාපරාක්‍රමබාහු මහරජාණන් දවස වැඩසිටිය මුගලන් ව්‍යාකරණය කළ ශ්‍රීමත් ශ්‍රී මෞද්ගල්‍යායන ස්ථවිරයෝය. එම පරපුරෙහිවූ භික්‍ෂූහු විල්ගම්මූල පරම්පරාව නමින් ප්‍රකට වූහ. මෙහි වැඩසිටිය ශතාරාස්ථවිරතුමාද එම පරපුරේ උතුමෙකි.

ශ්‍රී. බු. වර්ෂ 1955 දී නොහොත් ක්‍රි: ව: 1411 දී දැදිගම රජමහාවිහාරය ගලතුරුමූල පරම්පරාවට හිමිවිය. ගලතුරුමූල විහාරයෙහි මුල් අධිපතියා නම වුත්තෝදය රචනාකළ ශ්‍රී සංඝරක්‍ෂිත මහා ස්වාමින්ගේ ප්‍රව්‍රජ්‍යාචාර්‍ය්‍යවූ බු. ව 1609—1659 අතර වැඩසිටි ශ්‍රී ශීලස්ථවිරයෝයි. ඉන්පසු එහි ආධිපත්‍යය ලැබූ යතීහු ගලතුරුමූල (උපලතතරමූල) නමින්මැ ප්‍රකටවූහ. මෙහි ආධිපත්‍යය ලැබූ මහා ස්වාමිපාදයෝද එම පරපුරේමැ බව වෘත්තමාලා ශතකයෙහි දක්වා තිබේ.

සත අත්‍ථිතා'පි පරත්‍ථරතො
ජින සාසන පාලන සුධමනො
ගුණ භූසන භූසනකො ච අහු
උපලනතරමූල මහා ථවිරො.

ස්වාර්ථකරණයට වඩා පරාර්ථයෙහි අභිරති ඇත්තාවූ සම්බුද්ධ ශාසනය පාලනයකරන්නාවූ පවිත්‍ර සිත් ඇති ශීලව්‍රතාදි ගුණාභරණයෙන් විභූෂිතවූ ගලතුරුමූල නම් මහා ස්ථවිරතුමෙක් (ජාතිග්‍රාමා'ශ්‍රමයෙහි) වීයැ යනුයි. මෙහි සඳහන්වූයේ ගලතුරුමූල මෛත්‍රෙය මහා ස්ථවිරතුමාය. මෙතුමා බු ව. 1139 දී වීරබාහු රජුගේ අයදුමෙන් විජිය ධර්මකීර්ති සංඝරාජයනට සහාය වැ ශාසනශුද්ධියක් කිරීමෙන්ද, සිංහල බෝධිවංශය කළ විල්ගම්මුල මහා ස්වාමීන්ගේ ආචාර්‍ය්‍ය ගලතුරුමූල මහා ස්වාමීන්ගෙන් පසු එහි ආධිපත්‍යය ලැබීමෙන්ද, දෙවුනුවර (දෙවුන්දර)

වැඩසිට "දැදිගම පරාක්‍රමබාහු රාජයාට ශුභාශීර්වාද මුඛයෙන් හා මිත්‍රත්වය හැමැත්තෙන්" තිසරසන්දේශය රචනාකිරීමෙන්ද උභයාර්ථසාධක කර්තව්‍යයන්හි ව්‍යාවෘතවූ බව පෙනේ. දැදිගම පරාක්‍රමබාහු රජු විසින් මෙකී ගලතුරුමූල ස්වාමීන්ට මෙහි ආධිපත්‍යය පැවරූ පසු ඉනත කී විල්ගම්මූල පරම්පරාවේ භික්ෂූන් ද ගතාරපරිවෙණස්ථානයෙන් රජමහා විහාරයට ම පමුණුවාගත් නමුත් එවක්පටන් ගලතුරුමූල පරම්පරාව ප්‍රමුඛ විය.

මෙකී දෙපරපුරෙහි භික්ෂූන්ගේම නිත්‍ය වාසය මෙහි ඇතිවූ බව විල්ගම්මූල පරපුරෙන් වෘත්තමාලාව ත් ගලතුරුමූල පරපුරෙන් තිසරසන්දේශය ත් රචනාකරතිබීම නිසා වැඩිදුරටත් පැහැදිලිවේ. ගතාරා පරිවෙණාධිපතීන්වහන්සේ වෘත්තමාලා ශතක රචනා කාලයෙහි එසින් අස්වී සාමණේරභූමියේ හෝ ගෘහස්ථ දශශීලරක්ෂණයෙහි හෝ සිටිය බව උපතපස්සී යන නාමයෙන් හැඟේ. එය කෙසේ වෙතත් මෙතුමා දැදිගම ගතාරා පරිවෙණාධිපතිව වැඩිසිටිය නිසාත් තම බඩුවරියක්වූ තාරාකිංසාව පැරකුම්බාරජුට අගමෙහෙසිවා සිටිය නිසාත් එම රජයාට ශුභාශීර්වාද පතා කල්‍යාණීපුර විභීෂණ සුරිඳුගෙන් ඉෂ්ටාර්ථ සිද්ධිය අයදුම්කර වෘත්තමාලාව රචනාකෙළේය.

විසුද්ධුණ්ණදප්පනතලෙ තව දිස්සමානං
සාමච්චමණ්ඩල පරක්කමබාහු රාජං
සෙනඞ්ගජනජිත දයාමය ලොචනෙහි
සම්මාවිලොකිය සුරාධිප! පාහි නිච්චං.

විභීෂණ දිව්‍යරාජෝත්තමය! යුෂ්මත්හුගේ සිත් නැමති දර්පණතලයෙහි දෘශ්‍යමානවූ ඇමතිමඬුලු සහිත පැරකුම්බා නරශ්‍රේෂ්ඨයා සෙනඞ්ග සංඛ්‍යාත රසාංජනාලේප ඇති කරුණාමය ඇස කරණකොටගෙන මොනවට දිවැස් ලා සතතයෙන් රක්ෂා කෙරෙහිවා; යනුදෙවායාචනායි.

වෘත්තමාලා ශතකය රචනාකළ කාලයෙහි ජාතිග්‍රාමා'ශ්‍රමය කවිජනවර්ණනීයවූ විශේෂාලඞ්කාරයෙන් අලංකෘතවීය. සංඝ සමූහ නැමති තාරකා සමූහයෙන් ආකූලවූ ප්‍රදීප නැමති විදුලියෙන් හා නිවාසගෘහ නැමති වලායෙන් වොරදනා ධර්මරශ්මි නැමති ශශාංකමණ්ඩලයෙන් විරාජිතවූ ආශ්‍රමය සිව්මහරජය පැරදවී. එහි මනාව පිපුනාවූ කුමුකුවෘක්ෂයෝ බඳනාලද ධවජ

සංඛ්‍යාත පාපයන් බලා බන්ධනයට පැමිණියා මෙන් යහපතැයි සතුටින් සිනාසෙන්නවුන් වැනිවූහ. ප්‍රාතඃ කාලයෙහි ගිලිහෙන්නාවූ තුෂාරකණිකා ඇති පක්ෂීන්ගේ රවප්‍රතිරව සහිතවූ උපවන වෘක්ෂයෝ සංයමීන්ගේ තපොගුණය යෙහෙකැයි සතුටු කඳුළු හෙලන්නාවූ රාත්‍රි අන්තයෝ වැනිවූහ කිසලයමුඛ නැමති ඇඳිලි ඇති සාඛා නැමති හස්තප්‍රාප්ත සුපිපිමල් ඇති වෘක්ෂයෝ ශාස්ත්‍රචාරිත්‍රයෙන් හටගත් භක්ති ඇති සුවිනීත ශිෂ්‍යයන් මෙන් බැබලූහ. අලුයම් කාලයෙහි හඬලන්නාවූ කුක්කුට පක්ෂීහු රාජමහා විහාරික තපස්විවරයන්ට කිමෙක්ද? භාවනානුයෝග කාලය එළඹසිටියේ නොවේද'යි ප්‍රබෝධකරන්නවුන් වැනිවූහ. තවද එහි ඵලසහිතවූ නාලිකේර වෘක්ෂයෝ අපි පින්වතුන් ආශ්‍රයකොට දෙව්ලොවදීද නොලැබියහැකි ඵල ලදුම්හයි ඉහාත්ම විපාකඵල දක්වන්නවුන් වැනිවූහ. විකසිතවන්නාවූ කුඩ්මල පඞ්ක්තියෙන් ගැවසීගත් චම්පෙය්‍යවෘක්ෂයෝ වනදෙවියන් විසින් සංයමීන්ට පුදනලද පහන් ඇගෑමෙන් බැබලූහ. තවද මල්වරා ඵලගෙන සිටියාවූ සහකාර වෘක්ෂයෝ භාවීයට අනතුරුව ඵල ප්‍රතිලාභයද මෙබඳුයයි සංයමීන්ට සිහිකරවන්නවුන් වැනිවූහ. මේ ආකාරයෙන් සිත්කලුවූ අසදෘශ ශ්‍රීවිභූති ඇති දූදිගම රාජමහා විහාරාධිපති උත්තරමූල මෛත්‍රෙය මහා ස්වාමීන්ට සංඝරාජ (මාහිමි) පදවිය ලැබී වැඩසිටිය බව වෘත්තමාලාවෙහි මෙසේ දක්වා තිබේ.

ඉච්චෙවං රාමඤ්ඤෙය්‍යා 'තුලසිරි විභවෙ සොපහාරෙ විහාරෙ
විජ්ජාකල්ලෝලමාලී විතතමධුරකා රතනසූදිස්සුධොජං
පඤ්ඤුබ්භින්නාවලමහා පමපියගහණෙණ චක්කපාණි සමානො
දීපෙන්තා සංයමීනං සිවපුරවටුමං සඞ්ඝරාජා විරාජෙ.

බු. ව. 1876 දී කල්‍යාණි විහාරාධිපති ශ්‍රී පරාක්‍රම විල්ගම්මූල සංඝරාජයන්ගෙන් පසු එම පදවිය ද්විතීය ධම්මකිර්ති මහා ස්වාමීන්ට විය. ඒ මාහිමිතුමාගෙන් පසුව යටියන විහාර පිරුවන් හිමි තෘතීය ධම්මකීර්ති ස්වාමීන්ට පත්විය. ඉන්පසු මේ ගාථාවෙහි සඳහන් ජාතිග්‍රාම විහාරාධිපති වනරතන ස්වාමීන්ටද ඉක්බිති තොටගමුවේ ශ්‍රී රාහුල මහා ස්වාමීන්ටද හිමිවිය.

මෙකී ගලතුරුමූල මහා ස්වාමීන්ට මාහිමි පදවිය ලැබී දූදිගම වැජඹුණු බැවින් එවකට ධම්මවිනයානුශාසක "චමූපති මූලසථවිර, නෙත්‍රප්‍රසාද මූලසථවිර, විල්ගම්මූල මහාසථවිර, ධම්මකිත්ති මහාසථවිර, භුවනෙකබාහු මහාසථවිර, වනරතන මහා

සරවීර යනාදී උතුමෝද මෙහි වැඩවිසූ බව වෘත්තමාලාවෙහි දක්වා තිබේ. තිසරසන්දේශ කාව්‍යයෙහි අත්‍ය මාහිමිතුමෙකු ගැන හෝ දෙවිනුවර විහාරාධිපතිතුමෙකු ගැන හෝ දූදිගම විහාරාධිපතිතුමෙකු ගැන හෝ වර්ණනා නොකිරීමට හේතුව කාව්‍යකර්තෘවූ තමන්වහන්සේටම මාහිමි පදවිය ලැබීමත් දෙවිනුවර ආධිපත්‍යය හිමිවීමත් නිසාම විය යුතුයි. මෙතුමා පටන් තම ශිෂ්‍යානු ශිෂ්‍යයෝ දූදිගම රජ මහා විහාරයෙහි විසූහ.

---

## vii චෛත්‍යරාජයා.

දූදිගම කොටවෙහෙර නමින් පවත්නා චෛත්‍යරාජයා ගැන පුරාවෘත්තයෙහි සඳහන්වැ නොමැතිහෙයින් කිසිවක් මේ තාක්ම නිශ්චය බැස නැත. බෙල්මහතාණන්ගේ පොතෙහි:– "විහාරයට යාර 100 කට දුරින් ඊට සම්බන්ධ නමක් නැති ගඩොලින් තැනූ වෘක්ෂලතාදියෙන් වැහුණු මහා ස්තූපයෙකි. මෙය කිසිකලෙක මුළුමනින් ගොඩනැඟී නැත. ඒ නිසා ඊට කොට දාගැබය'යි කියති. උස ප්‍රමාණය සාමාන්‍යයෙන් අඩි 59 කි. විෂ්කම්භය අඩි 203 කි. මේ ස්තූපය එහි බාගයක ප්‍රමාණ වෘත්තාකාර උසට නිර්මිතව තිබෙන බව පෙනේ" යනුද, එහිම ප්‍රසිස් මහතාගේ ලිපියකින් උපුටාගත් වගන්තියක:– "ක්‍රි: ව: 13 වෙනි ශතවර්ෂයේදී iii විජයබාහු රජු විසින් නිමවනලද සි සිතියහැකි දාගැබක නෂ්ටාවශේෂ මෙයින් හැ: 1 පමණ ඔබ්බෙහි තිබේ." යනුද, සඳහන්ව තිබේ. තවද ගජබාහු රජතුමාගේ කෘතියක් යයි සාමාන්‍ය ජනයා පිළිගෙන තිබේ.

ගජබාරජු හෝ iii විජයබාහුරජු හෝ සෑය බඳවනලද නම් දූදිගම ගැන වර්ණනාකළ තිසරසන්දේශයෙහිද වෘත්තමාලාශතකයෙහිද සඳහන්විය යුතුමය. නමුත් ඒ සන්දේශවයෙහිමැ දාගැබ ගැන කිසිවක් සඳහන්ව නැත. දාගැබ තරම් අගය නොවූ සංඝාරාමය, බෝධිය, සහ පුරවර්ණනා, රාජ වර්ණනා සඳහන්ව තිබියදී දාගැබගැන වර්ණනා නොකොළේ ඒකාලයෙහි දාගැබ නොතිබුණු හෙයිනි. දාගැබ තිබුනානම් විශෙෂ වර්ණනාවක් කරන බව එහි අගයදන්නෝ දනිති. තවද "මෙ ස්තූපය කිසිකලෙක මුළුමනින් ගොඩනගා නැත" යන බෙල්මහතාගේ නිගමනය පැසසිය යුතුය. අද දක්වාත් සෑයට කොටවෙහෙර යයි ව්‍යවහාරකිරීම ඒ නිසාම වියහැකිය.

මේ දාගැබ බඳවනලද්දේ බු: ව: 1955 නොහොත් ක්‍රි: ව: 1411 දී දැදිගම්පුර රජ පැමිණි පරාක්‍රමබාහු මහරජාණන් විසින්ය. පුරාණ නම්නුත් මිට ʻඑපී 519 කට වඩා පැරණිබවක් නොපැනේ. තිසර සන්දේශය හා වෘත්තමාලාව රචනාකල වකියට අනතුරු වර්ෂයෙහි චෛත්‍යකර්මාන්තය ආරම්භකර තිබේ. තිසරසන්දේශය රචනාකල දෙවුන්දර විහාරාධිපති ගලතුරුමූල සංඝරාජයන් වහන්සේ මෙහි වැඩමවාගැනීමට වැඩියක්ව හෙතුව චෛත්‍ය කර්මාන්තය සඳහා උපදෙස් ලබාගැනීම පිණිසමය. මෙතුමා දැදිගම විහාරාධිපති වැ නමක් ග්‍රාමාන්තාරණ්‍යක මහාස්ථවිර වරුන්ගේද සභාය ඇතුව රජුට උපදෙස් දෙමින් සැලබඳවා ගත යත අතර අප්‍රසිද්ධව සිටි කෝට්ටේ පරාක්‍රමබාහු බලයෙන් ගෙනවුත් සමන්කර දැදිගම් පරාක්‍රමබාහු මරුමුවට පැමිණවිය. ඒ නිසා චෛත්‍යකර්මාන්තය අඩාලවිය. එවක්පටන් "කොට වෙහෙරය"යි ව්‍යවහාරනී. මේ සඳහා ගඩොල් කැපීමට මැටිගත් ස්ථාන "ඉහලමැටිවල-පහලමැටිවල" නමින් ව්‍යවහාරණී. ඒ ස්ථාන මෙකල ක්ෂෙත්‍රාවති. ගර්භයේ තුනෙන් දෙකොටසක් පමණ බැඳ නොරිතිබෙන්ට ඇතැයි පෙනීමේ ප්‍රමාණයෙන් හැගේ. තමුන් පෘතුගීසීන් විසින් මෙම සෑයෙන් ගඩොල් ගෙනගොස් මැණික් කඩවර සහ ගොළොම්බුවේ කොටුබැමුත් බඳවනලදහ. ඒ නිසා චෛත්‍යයේ ගඩොල් අවටින් ගරාවැටී ආකූලව පවත්නා සවභාව සුධීන්ගේ ලය කම්පාකරයි. ජාතිප්‍රාමයට කිරිටයක් වැනි වූ මෙම චෛත්‍යරාජයා වතනතව වාසසලතාදීයෙන් ප්‍රච්ඡන්නව පවත්නේ නමුදු. ඒ කාරණ නොටගෙන ජතිග්‍රාම යාගේ යශඃප්‍රබන්ධය පුරාවෘතයෙහි නොමැකී පවත්නේමය. දැදිගම පරාක්‍රමබාහු රාජයාගේ රාජ්‍යෝදය කාලය සවල්ප වුවත් ඒ කාලයෙහි සිංහවික්‍රමයෙන් කරණලද මෙම චෛත්‍ය කර්මාන්තය නිසා සවියගුණග්‍රාමය සරා සඳමඬලක් සෙයින් ප්‍රකට ව පවත්නේය.

---

## viii ශිලාලිපිය.

ස්වස්ති ශ්‍රී මහාසම්මත පරම්පරානුයාත සූර්‍ය්‍යවංශෝද්භූත ශ්‍රී පරාක්‍රමබාහු මහාරාජාධිරාජතන්දන ත්‍රිසිංහලාධීශ්වර නව රත්නාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී භුවනෙකබාහු චක්‍රවර්ත්ති ස්වාමීන් වහන්සේට අටවන්නෙන් මතු අවුරුදු පොසොන්පුර

තෙළෙස්වනැ භුවනෙකබාහු මහරජ්ජුරුවන් වහන්සේ ජත්‍යනාජනපදවාසීන් විරුඬව පවුතිත නිසා ජයවඬිනපුරයෙන් නික්ම දික් විජය කොට, බෙලිගල්කෝරළය බද ඤුතිගම පුරයට පැමිණැ සතරකෝරළයත් සමන්වාගත්තාට පසු ශ්‍රී රජුන් මෙෂිට ජනපදවාසින් විසින් උඞරට නරසත් තැන් පත්වූ ගියදවස තමතමන් කළාවූ අක්‍රවිෂ මූල්කොට නිග්‍රහ පැමිණෙත් ය යන සැකය දුරුවන පිණිස උඩහුව පවතිත යම්ම කෙනෙකුන්ට සිංහලසංගේදමට එක්කිකල අපරාධ මඩිකවැ අඞ්ගහානි ආඥහානි ජීවිතහානි නොකරනු නොකරවනුවත්ම පරම්ත හොගහිමියන්ට ඇරි තවත් ගමක අතිකෙනකුට දෙනකල ගම හිමියන්ට මූල්ගෙවතුත් දී බිජුවට අමුණතුත් අරිනුවත්ම තුනුරුවන්ගේ ආඥය දළදා පාත්‍රාධාතූන් වහන්සේගේ ආඥය ලොකපාල දෙවියන්ගේ ආඥය යි ගිවිස භුවනෙකබාහු මහරජ්ජුරුවන් වහන්සේ විදල මෙහෙවරින් මේ අභයදාන ශිලාලෙඛනය ලිඛවව සත්හස් නිරුවරගත් වික්‍රමසිංහ අදිකාරම්හ.

---

මේ ශිලාලිපිය බු. ව. 2013 නොහොත් ක්‍රි. ව. 1469 දී කෝට්ටේ රජපැමිණි vi භුවනෙකබාහු මහරජාණන්ගේ අණ පරිදි වික්‍රමසිංහ අදිකාරම්තුමන් විසින් පිහිටුවන ලද්දකි. ශිලාලිපියෙන් හැඟෙන්නේ මේ (සපුමල්කුමාර)=භුවනෙකබාහු රාජයා ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ දරුවෙකු බවයි. (එතුමාගේ නිජම පුත්‍රයා නම්:–viii වීරපරාක්‍රමබාහු ඇපාණෝයයි කියති.) සපුමල් කුමරු සහ අංගම්වල කුමරුත් පුත්‍රප්‍රෙමයෙන් වඞිනය කරගත් දෙදෙනෙකි. අංගම්වල කුමාරයා අම්බුළුගල ආදීපාද තනතුරටත් සපුමල්කුමාරයා යාපාපට්ටුනෙහි අධිපතිකමටත් පත්ව සිරිනාතර පැරකුම්බා රජුගේ දියනියවන ලොකනාථා නම උලකුඩය දෙවියගේ පුත් ජයවීර පරාක්‍රමබාහු ii ජයබාහු නමින් කෝට්ටේ රජකමට පත්විය. ඒ බව සපුමල්කුමරුට සැලවි බළසෙන් ගෙනවූත් ජයබාහු මරා තෙමේ භුවනෙකබාහු නමින් රජවිය. ඒ යුධයේදී මේ පලාත්වැසිහු ජයබාහුට පක්ෂව ත් සපුමල්කුමරුට විපක්ෂව ත් ක්‍රියාකොළෝල. එසේවුවත් ජයශ්‍රීයට පත් සපුමල්කුමරු භුවනෙකබාහු නමින් කෝට්ටේ අභිෂෙකප්‍රාප්ත වැ ගියදවස විපක්ෂව සිටි අයට උදහස්නොව නිදහස් ඇතිකරනුවස් ජයවඞිනපුරයෙන් නික්ම ඒ ඒ පලාත් වසහකරමින් ජතිග්‍රාමයට පැමිණෑ සිවුකෝරළයත් වසගයට ගෙන එතැන් පටන් අඞ්ගහානි ආඥහානි ජීවිතහානි නොකරනු නොකරවනුවස් ගිවිස්වා ඉක්බිති මේ අභයදාන ශිලාලෙඛනය වික්‍රමසිංහ අදිකාරම ලවා පිහිටෙවූබව පෙනේ.

චේ මැ භුවනෙකබාහු රාජ්‍යය ගැන තවත් ප්‍රවෘත්තියක මෙසේ දක්වා තිබේ:-විජයබාහු රජු චීනමායමට අසුවී අල්වා ගෙන ගියවිට කියපත්වූ සුනෙත්‍රාදේවිය තම කුමරුවාගේ ආරක්ෂා සංවිධානය පතන්නී ළදරුවා වීදාගම මතරණුවන්ට භාරකළාය. එවිකට ගම්පල භුවනෙකබාහුනම් කුමාරයෙක්ද සිවුකෝරළේ තිලෝකමල්ල නම් කුමාරයෙක්ද. දෙමටානගම වික්‍රමබාහුනම් කුමාරයෙක්ද, රයිගම අලගක්කෝනාරනම් කුමාරයෙක්ද සෛවරීබලපවත්වමින් අධිපතිව විසූහ. පසුව මූලකී ළදරු කුමරා ශිල්පශාස්ත්‍ර හා දෙශපාලනක්‍රම ඉගණිමෙන් බු. ව: 1953 වැන්නෙහි සිරිපැරකුම්බා නමින් ඉදිරිපත්වැ රයිගම පුරයෙහි රජකෙළේය.

එසමයෙහි ගම්පල විසූ භුවනෙකබාහු පුත් අංගම්වල කුමාරයාද, සිවුකෝරළේ විසූ තිලෝකමල්ල පුත් සපුමල්කුමාරයාද සිරිපැරකුම්බා රජුට පක්ෂව සිටින නිසා පුත්‍රප්‍රෙමයෙන් වර්ධනය කළහ. රයිගම විසූ අලගක්කෝනාර මරුමුවට පත්විය. දෙමටානගම විසූ වික්‍රමබාහුට හදිසිරෝගයක් වැළඳී ජන්මාන්තරගතවිය. ඉක්බිති ඔහුගේ දේවිය සහ කුඩා දරුවන් සිරිපැරකුම්බා රජු විසින් තමවෙතට ගෙන්වා කුඩා දරුවා වීදාගම සවාමීන්ට පුද දේවිය මහෙෂිකා තනතුරට පත්කරගනු ලැබීය. කුඩා දරුවා "තොටගමුවේ ෂට්භාෂා පරමෙශ්වර ශ්‍රී රාහුල මාහිමි"නමින් ප්‍රකටවූහ. යනුයි.

මේ ප්‍රවෘත්තියෙන් හැඟෙන්නේ ශිලාලිපියෙහි සඳහන් භුවනෙකබාහු (සපුමල්කුමාර) රජතෙම පැරකුම්බාහු රජුගේ දරුවෙක් නොව තිලෝකමල්ලගේ දරුවෙක් බවයි. පැරකුම්බා රජු පුත්‍රප්‍රෙමයෙන් වර්ධනයකළ බවද පෙනේ. ඒ නිසා "ශ්‍රී පරාක්‍රමබාහු රාජාධිනන්දන"කියා ශිලාලිපියෙහි යොදන්ට ඇතැයි හැඟේ. තවත් එ ප්‍රවෘත්තියේම "විජයබාහු රජු චීන මායමට අසුවූ බවද ඒනිසා සුනෙත්‍රා බිසොව අනාථවූ බවද අලගක්කෝනාර මරුමුවට පත්වූබවද කියාතිබේ. මේ කරුණු, විශ්වාසකටයුතු නොවෙත්. සිරිපැරකුම්බා රජුට පූර්වසම කාලයෙහි වීරබාහුවූත් විජයබාහු නමින් රජෙක් සිටිය බව පුරාවෘත්තයෙන් නොපෙනේ. සුනෙත්‍රා බිසොවගේ සවාමි තෙම විජයබාහු නොව ජයමාලේ සවාමි වියයුතුය. අලගක්කෝනාර මරුමුවට පත්වූවා නොව වීර අලකේශ්වර නමින් සිටිනවිට සුමිත්‍රා බිසොව සහ කුමාරයන් සමග චීනයට අල්වා ගෙන ගියහ. ඔහු පුත් පැරකුම්බා කුමරු දැදිගම පරාක්‍රම

තවද ශිලාලිපියෙහි සඳහන් vi ශ්‍රී පරාක්‍රමබාහු රජතෙමේ කිරවැල්ලෙන් කුමාරියක් සරණකරගත් බවද ඒ දැදිගමින්යයි සිතියහැකි බවද බැල්මහතාගේ පොතේ කියාතිබේ. නමුත් ඒ රජුගේ දේවියනම් දෙමටාහාමි විසූ වික්‍රමබාහුගේ මෙහෙසිය වන ශ්‍රී රාහුල තෙරුන්ගේ මෑණියෝය. වික්‍රමබාහු මළපසු සරණපාවාගත්හ. මේ සරණය බු. ව. 1953 දීය. නැවත බු. ව. 1958 දීද කිරවැල්ලෙන් කුමාරියක් සරණපාවාගත්බව කියා තිබේ. ඒ කුමාරියනම් දැදිගම පරාක්‍රමබාහු රාජයාගේ භාර බිසොව වියයුතුයි. දැදිගම පරාක්‍රමබාහුගේ මරණයත් බු. ව. 1958 දීම හෙයිති. පළමු දේවිය ත් හිමියා මළ තැනැත්තියක් හෙයින් දෙවෙනි දේවියද එබඳු භාන්තාවක්වූවාට වරදක් නැත.

---

## විශේෂ කරුණු.

ක්‍රි. ව. 1542 දී කෝට්ටේ රජපැමිණි දොන් ජුවන් ධර්මපාල රජුගේ කාලයෙහි දැදිගම වාසයකළ 'දොන් පිලිප්'' නම් ප්‍රතිකාල් සේනාපතියා සෙවරිබලය පවත්වන්ටවූ පසු ඉහත කී රජු විසින් ජීවග්‍රාහයෙන් අල්වාගෙන මරුමුවට පමුණුවනලදී. ඒ සෙනාපතියා විසූ ස්ථානය "දොන්පාවුල්ල" නමින් ව්‍යවහාර කෙරෙති.

ජනිග්‍රාමය පිළිබඳ ඓතිහාසික කරුණු මේ ලිපියෙහි ඇතුළත් කෙළෙමු. සම්පූර්ණ විස්තරයක් ලිවීමට බොහෝ පරිශ්‍රමදරා කරුණු සෙවූනමුත් එයින් බොහොමයක් පූර්වාපර විරොධත්වයෙන් ආකූල ව්‍යාකූලීභූතය. එහෙත් මැනවැයි හැඟී ගිය කරුණු පමණක් මෙහි සංග්‍රහ කෙළෙමු. අපගේ මේ ශ්‍රම සාඵල්‍යයෙහි පුරාවෘතඥ තත්ත්වගවේසී විචාරක්ෂමයෝ සුපසන්න වෙත්වා.

**M. Gunaratana Thero.**
*Dedigama Rajamaha Viharaya,*

Nelundeniya, P. O.
31-1-1931

# අනුක්‍රමණිකා.


| | | | |
|---|---|---|---|
| | | | පිට. |
| **උද්දේශපරිකථානම් ප්‍රථම පරිච්ඡේදය.** | | | 1-25 |
| ප්‍රාරම්භ ගාථා | ... | ... | 1 |
| බුද්ධගුණ වෙසෙස් | ... | ... | ,, |
| දහම්ගුණ ,, | ... | ... | 2 |
| සඟගුණ ,, | ... | ... | 3 |
| විශුද්ධ්‍යපි වර්ණනා | ... | ... | 4 |
| ඥාණ සම්පද | ... | ... | 7 |
| පහාණ ,, | ... | ... | ,, |
| ආනුභාව ,, | ... | ... | 9 |
| රූපකාය ,, | ... | ... | 12 |
| සත්වෝපකාර ,, | ... | ... | 16 |
| ප්‍රයෝග ,, | ... | ... | 17 |
| ත්‍රිවිධ කල්‍යාණය | ... | ... | ,, |
| අර්ථපද ෂට්කය | ... | ... | 18 |
| ව්‍යංජනපද ,, | ... | ... | 19 |
| ශබ්දනය භේද | ... | ... | 20 |
| අලංකාරනය ,, | ... | ... | 21 |
| නෙත්තිනය ,, | ... | ... | 23 |
| හාරෝපදේශය | ... | ... | ,, |
| නයෝප ,, | ... | ... | 25 |
| ප්‍රස්ථානෝප,, | ... | ... | ,, |
| සූත්‍රවිභාග | ... | ... | ,, |
| **ශීලවිශුද්ධිනම් ද්විතීය පරිච්ඡේදය.** | | | 26-50 |
| ශීලය | ... | ... | ,, |
| ,, යනු කුමක්ද | ... | ... | 27 |
| ,, අර්ථ කවරේද | ... | ... | 30 |
| ,, ලක්ෂණාදිය | ... | ... | ,, |
| ,, අනුශස් | ... | ... | ,, |
| ,, විභාග | ... | ... | 32 |
| චිත්තවිථි විභාග | ... | ... | 36 |
| විථිසංස්ථානාකාර | ... | ... | 40 |
| පඤ්චද්වාරික විථිවිභාග | ... | ... | 41 |

| | | | |
|---|---|---|---|
| මනොචාරික පිපිවිඥානය | ... | ... | 44 |
| කර්මසාධක පිපිසංඛ්‍යාව | ... | ... | 45 |
| ඒ ගැන සවකිය මතයක් | ... | ... | 47 |
| ශීලයාගේ කෙලෙසීම | ... | ... | 48 |
| ,, පිරිසුදුබව | ... | ... | 49 |
| චිත්තවිශුද්ධි කථානම තෘතීය පරිච්ඡෙදය. | | | 51=81 |
| සමාධිය යනු කුමක්ද | ... | ... | ,, |
| එහි අර්ථ කවරේද | ... | ... | ,, |
| ,, ලක්ෂණාදිහු කවරහුද | ... | ... | 52 |
| ,, ප්‍රභෙද කෙතෙක්ද | ... | ... | ,, |
| ,, කෙලෙසීම කිම | .. | ... | 54 |
| ,, පාරිශුද්ධිය කිම | ... | ... | 55 |
| සමාධිය කෙසේවැඩිය යුතුද | ... | ... | ,, |
| දශපලිබොධ | ... | ... | 56 |
| කල්‍යාණ මිත්‍රත්වය | ... | ... | 57 |
| චරිත විභාග | ... | ... | ,, |
| සමසතළිස් කර්මස්ථාන | ... | ... | 62 |
| අනනුරූප විහාර | ... | ... | ,, |
| අනුරූප ,, | ... | ... | 63 |
| කුඩාපලිබොධ | ... | ... | ,, |
| භාවනාක්‍රම | ... | ... | ,, |
| පරිකර්ම නිමිත්ත | ... | ... | 64 |
| උද්ග්‍රහ ,, | ... | ... | ,, |
| ප්‍රතිභාග ,, | ... | ... | 65 |
| උපචාර සමාධිය | ... | ... | ,, |
| අර්පණා ,, | ... | ... | ,, |
| සත්ප්‍රාය අසත්ප්‍රායවිධි | ... | ... | 66 |
| දශවිධ අර්පණා කෞශල්‍යය | ... | ... | 67 |
| පංචොපමා විභාග | ... | ... | ,, |
| පංචවශිතා | ... | ... | 69 |
| ධ්‍යානපංචකොපමා | ... | ... | 71 |
| අරූපධ්‍යාන | ... | ... | 74 |
| ඍද්ධිවිධ ඥානය | ... | ... | 76 |
| දිව්‍යශ්‍රොත්‍ර ,, | ... | ... | 77 |
| පරචිත්තවිජානන ,, | ... | ... | 78 |
| පූර්වෙනිවාස ,, | ... | ... | ,, |
| දිව්‍යචක්ෂුරභි ,, | ... | ... | 80 |
| යථාකම්මූපග ,, | ... | ... | 81 |

| | | | | |
|---|---|---|---|---|
| **දෘෂ්ටිවිශුද්ධිකථානම් චතුර්ථ පරිච්ඡේදය.** | | | | 82=90 |
| මිථ්‍යාදෘෂ්ටි | විභාග. | ... | ... | ,, |
| නාමරූප | ,, | ... | ... | 83 |
| චතුර්ධාතු | ,, | ... | ... | 85 |
| සප්තවිධමාර | ,, | ... | ... | 87 |
| අටළොස්ධාතු | ,, | ... | ... | ,, |
| ද්වාදශායතන | ,, | ... | ... | 88 |
| ස්කන්ධ | ,, | ... | ... | 89 |
| **කාංක්ෂාවිතරණ විශුද්ධිකථානම් පංචම පරිච්ඡේදය.** | | | | 91=98 |
| ෂොඩශවිධ කාංක්ෂාව | | ... | ... | ,, |
| හෙතුප්‍රත්‍ය විභාග | | ... | ... | 92 |
| සභාග විසභාග වීථි | | ... | ... | 94 |
| පරිණත භංගඨ්වය | | ... | ... | 95 |
| අනුලෝමප්‍රතීත්‍යසමුත්පාද | | ... | ... | ,, |
| හෙතුඵල විභාග | | ... | ... | ,, |
| කර්මවිපාකවෘත්ත | | ... | ... | 96 |
| ච්‍යුතිප්‍රතිසන්ධි විභාග | | ... | ... | 98 |
| **මාර්ගාමාර්ගඥානදර්ශනකථානම් ෂෂ්ඨම පරිච්ඡේදය.** | | | | 99=109 |
| නයවිදර්ශනා | විභාග | ... | ... | ,, |
| රූපසප්තක | ,, | ... | ... | 102 |
| අරූපසප්තක | ,, | ... | ... | 106 |
| උදයව්‍යය | ,, | ... | ... | 107 |
| උපක්ලේශ | ,, | ... | ... | 108 |
| **ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධිකථානම් සප්තම පරිච්ඡේදය.** | | | | 110=125 |
| උදයව්‍යයානුදර්ශන | ඥානය | ... | ... | ,, |
| භඞ්ගානුදර්ශන | ,, | ... | ... | 111 |
| භයතූපස්ථාන | ,, | ... | ... | 113 |
| ආදීනවානුදර්ශන | ,, | ... | ... | 114 |
| නිර්වේදානුදර්ශන | ,, | ... | ... | 115 |
| මුඤ්චිතුකාම්‍යතා | ,, | ... | ... | 116 |
| ප්‍රතිසංඛ්‍යානුදර්ශන | ,, | ... | ... | ,, |
| සංස්කාරොපෙක්ෂා | ,, | ... | ... | 117 |
| සාමුද්‍රිකකාකොපමාව | | ... | ... | 118 |
| විමොක්ෂමුඛකථා | | ... | ... | ,, |
| සප්තාර්‍ය්‍යපුද්ගල විභාග | | ... | ... | 121 |
| සත්‍යානුලොමික ඥානය | | ... | ... | 123 |
| සංඥාන්තර නිදර්ශන | | ... | ... | 125 |

| | | | |
|---|---|---|---|
| ඤාණදර්ශනවිශුද්ධිකථා නම් අෂ්ටම පරිච්ඡේදය. | | | 126=133 |
| ගෝත්‍රභූ ඥානය | ... | ... | 127 |
| ශ්‍රෝතාපත්ති මාර්ග ,, | ... | ... | 129 |
| මාර්ගප්‍රත්‍යවේක්ෂණ ,, | ... | ... | 130 |
| විපිවිත්‍යාග | ... | ... | 131 |
| සකෘදාගාමිමාර්ගඥානය | ... | ... | ,, |
| විපිවිත්‍යාග | ... | ... | 132 |
| අනාගාමි මාර්ගඥානය | ... | ... | ,, |
| විපිවිත්‍යාග | ... | ... | 133 |
| අර්හත්මාර්ගඥානය | ... | ... | ,, |
| විපිවිත්‍යාග | ... | ... | ,, |
| පරිශිෂ්ටාධිකාරනම් නවම පරිච්ඡේදය. | | | 134=144 |
| මාර්ගඥානානුභාව | ... | ... | ,, |
| සතර සතිපට්ඨාන විභාග | ... | ... | 135 |
| ,, සම්‍යප්‍රධාන ,, | ... | ... | ,, |
| ,, ඉර්ධිපාද ,, | ... | ... | 136 |
| පඤ්ච ඉන්ද්‍රිය ,, | ... | ... | ,, |
| ,, බල ,, | ... | ... | ,, |
| සප්ත බෝධ්‍යාඞ්ග ,, | ... | .. | 137 |
| මාර්ගාඞ්ග ,, | ... | ... | 138 |
| සම්ප්‍රයෝග ,, | ... | ... | 139 |
| ව්‍යුත්ථානබල සමායෝගය | ... | ... | 140 |
| ක්ලේශමලාපගමනය | ... | ... | 141 |
| පරිඥාදිකෘත්‍යවිභාග | ... | ... | 142 |
| සත්‍යාදී විභාග | ... | ... | 143 |
| ග්‍රන්ථපරිසමාප්තිය | ... | ... | 144 |
| කර්තෘනාම සඥගීතය | ... | ... | 145 |

# පත්ථාවනා.

### ඤාණ සම්පදා.

1 දසබල ඤාණතරඞ්ගං- සබ්බඤ්ඤුත ඤාණසාගරං ධීරං
ඡබ්බිධ අසාධාරණ-ඤාණවිභූතිං මහාමුනිං වන්දෙ;

### පහාණ සම්පදා.

2. එකසහස්සං පඤ්ච-සතානි ජින්දි සවාසනක්කිලෙසෙ
යො පඤ්චමාරවිජයො-තං ඛීණාසව මහාමුනිං වන්දෙ;

### ආනුභාව සම්පදා.

3. යස්සාධිපතිස්ස ලොකෙ-යං යං ඉච්ඡති සමිජ්ඣති තං තං
ඉද්ධිප්පභාව විභවං මහානුභාවං මහාමුනිං වන්දෙ;

### රූපකාය සම්පදා

4. වත්තිංස විමල ලක්ඛණ-අසීත්‍යානුබ්‍යඤ්ජනඞ්කිතං රුචිරං
සම්පන්නරූපලක්ඛිං-දුල්ලභරතනං මහාමුනිං වන්දෙ;

### ධම්මකාය සම්පදා.

5 සීලං සමාධි පඤ්ඤා-විමුත්ති තඤ්ඤාණදස්සනං තෙහි
අප්පටිමං තනුදයං-අනන්තපඤ්ඤං මහාමුනිං වන්දෙ.

---

6. ලඞ්කාය පච්ඡිමදිසාය පසිද්ධ මාතු-
-රම්බ අනෙක විභවාකර සන්තිකෙ යො
සම්පාලිතො'වතිපතිප්පභුතිහි ජන්තී-
-ගාමප්පුර විලසි රජමහාවිහාරෙ.

7. රඤ්ඤා පරක්කමභුජෙන සුමාපිතස්මිං,
තස්මිං වසී පවර උත්තරමූලථෙර
යො සාධු ධම්මවිනයෙ නිපුණො ස ථෙර-
-වංසාවතංස පටිපත්තිපරො සුධීරො.

8 තස්ස'ග්ගවංස පරිපාලන බුද්ධිසාලී
සම්බුද්ධසාසන චිරට්ඨිති'මෙසකො යො
ථෙරෙ ස සීලරක්ඛණො රතනං යතීසු
සිස්සානුසිස්ස විතතිං ස'මලං චකාර.

9 සායෙව උජ්ජලිත පුබ්බ විහාරභූමි
කාලන්තරෙන විකලඞ්ග කලඞ්කිතාසී
සද්ධාධතෙන සපරත්ථ රතෙන තෙන
අජ්ජා'පි රාජති යථා පටිසංඛතා'ව.

10. සංගීත කිත්ති විසරස්ස යතිස්සරස්ස
ආබාල්‍යතො මම'භිවුඩ්ඪි හිතෙරතස්ස
සම්පුණ්ණ පීතිහදයා සුගතිං ගතස්ස
ථෙරස්ස තස්ස ගරුගාරව භාජනස්ස.

11. තං පාදරෙණු පරිසෙවන පණ්ඩිතො යො
සිස්සො ගුණාදිරතනො'පි යතී කතඤ්ඤූ
සො'හං ගුරුං ගුණගුරුං අනුමොදයාමි
සා'යං ක්‍රියා'පි ගුරුනො විභවාය හෙතු.

---

12 භුවි ගීත යසො ගුණී ස විජ්ජො-
-දය විජ්ජාලය මජ්ඣිමෙර'ධිපො යො
විභයි සදයො පිතෙ'ව මය්හං
තමහං සාධුතරං ගරුං සරාමි.

13. තිදිවො'පගතං ගතං සමානං
ඉහ ඤාණිස්සරතං යථත්ථතො'ව
වචනිස්සරතං තිපෙටකො යො
තමහං ඤාණගුණොදයං සරාමි.

14. යථා ධම්මං සංගහිතා-සුධීන්ද විභාසිනී
වන්දී'ව සාරදී භාතු-අයං ලඞ්කාම්බරොදරෙ.

සිවං.

*M. Gunaratana Thero.*

# විශුද්ධි දීපිකා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## මාලාභාරිණී.

1 සිරිසඤ්ඤමුනිස්සරං සරන්තො
පරමත්ථඤ්ච තදීරිතං සද්ධම්මං
පටිපත්ති පරායණඤ්ච සඞ්ඝං
සිරසා සාදර ගාරවෙන වන්දෙ;

2 ඉති වෙ රතනත්තයම්හි තම්හි
පණිපාතා සුකතං කතං යදත්ථි
දුරිතාපගතෙන තෙන සම්මා
ඉහ මෙ හොතු සති මති 'භිවුද්ධි;

3 සුවිසුද්ධ විසුද්ධි විඤ්ඤතීයං
මුනිනා දෙසිත ලොකියෙතරත්ථං
ඉති "සීලවිසුද්ධි" ආදිනා 'හං
ඉහ දීපෙමි "විසුද්ධි දීපිකාය"

4 ඉම 'මත්ථ 'මහං "විසුද්ධිමග්ගා"
අති සංඛෙප වසා සමුද්ධරිත්වා
පරමත්ථනයං 'නුලොමයන්තො
රචයෙ දීපනිරුත්තියා යථත්ථං;

5 අපි යො 'ත්‍ර මම 'ත්ථි වෙ පමාදො
කවයො ලොකහිතාය සොධයන්තු
ජින ධම්ම 'මසෙස ලොක අත්ථං
පරිසුද්ධං 'ව යතො සමාවහෙය්‍ය;

"බුද්ධො 'ති; කෙනට්ඨෙන බුද්ධො? බුජ්ඣිතා සච්චානි 'ති=බුද්ධො." යි යනුවෙන් දක්වනලද ඒ මාගේ ස්වාමිදරුවාණෝ කාමී කෙලශයෙන් ජනිත ජනතාව අවිඥත පූර්වකොටි ඇති සංසාරයෙහි වෘත්ත දුඃඛ ප්‍රවෘත්තියෙන් මුදා නිර්වාණපුර ප්‍රවේශය කරනුවස් මහාකරුණා සමායොගයෙන් පංචමහා පරිත්‍යාගා 'නුගත දානාදී සමත්‍රිංශත් පාරමීධර්මයන් පුරා පිළිවෙළින් බොධිද්‍රුම රාජයා

කරු පැමිණැ විදුරසුන් අරා සපරිවාර මාර පරාජය කොටැ සර්වාස්තා සකල ක්ලේශයන් නසා සත්‍යඥාන කෘත්‍යඥාන කෘතඥානයන්ගේ වශයෙන් ත්‍රිපරිවෘත්ත ද්වාදශාකාරයකින් චතුස්සත්‍යාවබෝධය කොටැ සමුත්පාදිත ආගමා 'ධිගම ධර්මරාජන්වූසේක්;=සකල ලෝකනයන රසායනවූ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණා ශීත්‍යානුබ්‍යඤ්ජන ව්‍යාම ප්‍රභාමණ්ඩල කේතුමාලා ලඞ්කාරයෙන් විරාජිත රූපකාය සම්පත්තියකින් හා චිරචිතෝපචිත පාරමිතා පරිශෝධිත අපරිමිත ගුණගණා'භරණ විභූෂිත අනන්‍ය සාධාරණවූ "ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශන" සංඛ්‍යාත ධර්මකාය සම්පත්තියකින් ද සමුපේත වැ බුද්ධරාජ්‍යයකර වැඩලා වූ තුන් ලොවට ප්‍රදීපායමාන වූ තුන්ලොවට ප්‍රතිෂ්ඨාධාර වූ තුන්ලොවට කල්පද්‍රුමවූ තුන්ලොවට චින්තාමාණික්‍ය වූ තුන්ලොවට මාතෘ වූ තුන්ලොවට පිතෘ වූ තුන්ලොවට ධර්මරාජන් වූ තුන්ලොවාසීන්ගේ ආමිෂ ප්‍රතිපත්ති පූජාවන් පිළිගැණිමට යොග්‍යවූ තීර්ථක නමැති ගනඳුරට දිවාකරයා වැනි වූ වෛනෙය ජන නමැති කෞමුද ප්‍රබෝධයට නිශාකරයා වැනිවූසේක්;= ඒ ඒ බුදුමඟුලෙහි නරකාග්නිය සිහිල් කරවූ තිරිසනුන්ගේ බිය බැහැරකරවූ ප්‍රේතයන්ගේ සාපිපාසංසිඳ වූ ලෝ ඇදිරි නරකයෙහි අඳුරු නැසූවාවූ මුහුදු කරදිය මිහිරිදිය කරවූ ජාත්‍යන්ධයන්ට ඇස් දුනවූ ජාති බධිරයන්ට කන්දුනවූ ජාතිමූගයන් ලවා ගීතිකා කියවූ ජාතිපංගුලයන් ලවා ලැසිගමන් ගැන්වූ බලලුන් හා මීයන් මිත්‍රකරවූ නාගයන් හා ගුරුළන් ප්‍රේමකරවූ කාකයන් හා උළුකයන් සමගිකරවූ දේවාතිදේවවූ මාරාතිමාරවූ බ්‍රහ්මාති බ්‍රහ්මවූ වන්දනීයාති වන්දනීය වූ පූජනීයාති පූජනීය වූ සමන්තභද්‍රවූ අසම සමවූ කරුණා නිධානවූ ශ්‍රීඝන සුගත තථාගත වරධර්ම චක්‍රවර්ති ස්වාමීවූ අප ත්‍රිලෝක තිලක ත්‍රිලෝගුරු භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේද;

**''ධම්මො'ති; කෙනට්ඨෙන ධම්මො? අත්තානං ධාරෙන්තෙ චතූසු අපායෙසු වට්ට දුක්ඛෙසු ච අපතමානෙ සත්තෙ ධාරෙතී'ති=ධම්මො''** යි යනුවෙන් දක්වනලද සතරඅපායාදී දුක්ඛතෝයාදී ධරණ හෙයින් ධර්මනම් වූ ශ්‍රොතාපත්ති මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමි මාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලය නිර්වාණය 'යි කියනලද ප්‍රතිවෙධ ධර්මයට අසහාය හෙතුවූ සමස්ත සත්ත්වචිත්ත සන්තානගත මොහ නමැති ගණඳුරු නසනු පිණිස සර්වඥ නමැති උදයගිරි ශිඛරයෙන් පහළ වූ ළහිරු මඬලක් වැනිවූද, ක්ලෙශ නමැති සර්ව නිර්වාපණයට සර්වඥ නමැති මෙඝමුඛයෙන් නිකුත් බ්‍රහ්මස්වර නමැති ගර්ජනා ඇති අමෘත වර්ෂාවක්

වැනිවූද, සංසාර නමැති අගාධපාර ඇති මහ සයුර තරණයට සවර්ණ නෞකාවක් වැනිවූද, චතුරොඝ නමැති සිවුගඟ තරණයට පාතපාත්‍රයක් වැනිවූද, දුඃඛාදි චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයෝය; කායගතාදී සතර සතිපට්ඨාන ධර්මයෝය, සතර ඉර්ධිපාද ධර්මයෝය, සිවුපිළිසිඹියාවෝය, සතර සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෝය, පඤ්චෙන්ද්‍රිය ධර්මයෝය, පඤ්චබල ධර්මයෝය, සප්තබොධ්‍යාඞ්ග ධර්මයෝය 'යි යන මෙකී සියලු ධර්මයෝ මැ ධාරණකෘත්‍ය සාධක හෙයින් රසශයෙන් එකවිධ වූ ධර්මවිනය වශයෙන් ද්විවිධවූ පිටකවශයෙන් ත්‍රිවිධ වූ නිකාය වශයෙන් පඤ්චවිධවූ අඞ්ගවශයෙන් නවවිධවූ ස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් හා බනවර වශයෙන් එක්දහස් එකසිය අසූතුනක් හා ග්‍රන්ථවශයෙන් දෙලක්ෂ අනූපන්දහස් පන්සියපණසක් හා අක්ෂර වශයෙන් අනූසාරලක්ෂ හැටහතර දහසක් ඇති සපර්‍ය්‍යාප්ති නවලොකොත්තර ශ්‍රී සද්ධර්මරත්නයද;

**"සංඝො'ති; කෙනට්ඨෙන සංඝො? සමූහට්ඨෙන සංඝො"**යි යනුවෙන් සමූහාර්ථයෙන් සඞ්ඝනම් ලද "එකබීජී-කොලංකොල-සත්තක්ඛත්තු පරම" යයි කියනලද සොවාන් පුද්ගලයන් තුන්දෙනා හා "කාම-රූපා'රූප" භවයෙහි අධිගත ඵල ඇති සකෘදගාමීන් තුන්දෙනාද යන මෙකී සදෙනා මැ "දුක්ඛාපටිපදා" දි ප්‍රතිපදා සතරින් ගිනූ කල සූවිසි දෙනෙක් වෙති "අන්තරාපරිණිබ්බායී-උපහච්ච පරිණිබ්බායී-අසංඛාර පරිණිබ්බායී-සසංඛාර පරිණිබ්බායී-උද්ධංසොතො අකනිට්ඨගාමී" යයි කියනලද අවිහනම් බඹලොව අනාගාමීන් පස්දෙනෙකු හා එසේමැ අතප්ප නම් බඹලොව පස්දෙනෙකු හා සුදස්ස නම් බඹලොව පස්දෙනෙකු හා සුදස්සී නම් බඹලොව පස්දෙනෙකු හා අකනිට්ඨා බඹලොව උද්ධංසොත පුද්ගලයක්හු නැති හෙයින් සිවුදෙනෙකු දැ'යි මෙසේ පඤ්චසුද්ධාවාසයෙහි අනාගාමීන් සූවිසිදෙනෙක් වෙති. පළමු සූවිසි දෙන හා මේ සූවිසිදෙනඑකතුකළ කල අටසාළිස්දෙනෙක් වෙති. "ශුෂ්කවිදර්ශක-සමථයානික" යන රහත්දෙන මත් සමග සමපණස් ආර්‍ය්‍යපුද්ගල කෙනෙක් වෙති "සොවාන්-සකෘදාගාමි-අනාගාමි අර්හත්" යන මාර්ගස්ථ පුද්ගලයන් සතරදෙනා හා මෙකී සිවුපණස් දෙන "ශ්‍රද්ධාධුර-ප්‍රඥාධුර" දෙකින් ගිනූකල්හි ආර්‍ය්‍යපුද්ගලයෝ එක්සිය අටදෙනෙක් වන්නාහු. මෙකී ශ්‍රාවක සංඝයා හා දශවි ක්ලෙශාදීන් සමූලඝාතනය කළ ආර්‍ය්‍ය සංඝයාද, තදර්ථසංසිද්ධි සාධක ප්‍රතිපදානුරක්ෂණයෙහි නිරත වූ සම්මුති සඞ්ඝයාද්‍ය'යි භෙදත්‍රයකින් වර්ණිත වූ සවර්ග මර්ත්‍ය පාතාල සත්ත්වත්‍රය වාසීන්ගේ කුශල බීජ රොපණයට පුණ්‍යක්ෂෙත්‍රායමාන මෛත්‍රීක්ෂමොපශම දිසී සීල සාමඤ්ඤතාදී ගුණගණාභරණ විභූෂිත ශ්‍රීමත් ශ්‍රීඝන ශ්‍රී සඞ්ඝරත්නයද;

යන මේ බුද්ධ ධර්ම සඞ්ඝ සංඛ්‍යාත ත්‍රිවිධරත්නයට මාගේ කායාදී ද්වාරත්‍රයෙන් සකසා වැඳ හෙවත් මනෝද්වාරගත භක්ති ශ්‍රද්ධාතිශයෙන් ප්‍රේරිත වැ වාග්ද්වාරයෙන් ස්තුති කොටැ කායද්වාරයෙන් ප්‍රණත වැ **"විශුද්ධිදීපිකා"** නම් ධර්ම සංග්‍රහයක් කරන්නෙමි. ඒ මේ ධර්ම සංග්‍රහය සසරබිය තුරුස්නා සත්පුරුෂ ශ්‍රොතෘ ජනයෝ අර්ථානුරූප ව්‍යඤ්ජනය හා ව්‍යඤ්ජනානුරූප අර්ථය සලකා සාවධානවීමෙන් මනාකොටැ ස්වර්ණ භාජනයෙහි නික්ෂිප්ත සිංහතෛලයක් මෙන් නොනස්නා සොටැ ලෙහි ලා ධැරීමෙන් ශ්‍රවණය කෙරෙත්වා හෙවත් ශ්‍රවණොද්ග්‍රහණ ධාරණ පරිප්‍රශ්න චින්තනාදි ක්‍රමයෙන් ශික්ෂාව කෙරෙත්වා.

තවද මෙ මැ පූජ්‍ය පූජා නිෂ්පාදක කුශල චෙතනායෙන් විධූත 'ශෙෂකිල්විෂයන් ඇති චිත්තසන්තානයෙහි භවාන්තරයෙහිදු කරනලද අන්තරායකර ධර්මයන් ප්‍රත්‍ය වෛකල්‍ය කරණයෙන් ප්‍රතිබාහනය කොටැ තද්ධේතුක වූ භයාද්‍යන්තරාය නිවර්තනයෙන් යථාරබ්ධ ග්‍රන්ථයාගේ නිර්විඝ්නයෙන් පරිසමාප්තිය සලකන අපි යථා ශක්තින් ග්‍රන්ථ නිෂ්පාදනයෙහි ව්‍යාපෘත වන්නෙමු.

---

**"තස්ස විසුද්ධි සබ්බමල විරහිතං අච්චන්ත පරිසුද්ධං නිබ්බාණං වෙදිතබ්බං"** යනුවෙන් එහි විශුද්ධිය නම් රාගාදී සියලු කෙලශ මලයෙන් පහවූ අත්‍යන්ත පවිත්‍ර නිර්වාණ ධර්මය'යි දතයුතු. නිෂ්පර්‍යාය වශයෙන් මෙසේ වුවද තදර්ථසංසිද්ධියට සදුපායභූත ශීලවිශුද්ධ්‍යාදිය හා ඒ ආශ්‍රිත කථා ප්‍රබන්ධය ද පර්‍යාය විසින් විශුද්ධි නම් වන හෙයින් ඔවුන්ගේ දැක්වීම හෝ ප්‍රකාශය **"විශුද්ධි දීපිකා"** නමු.

එබැවින් මෙහි "ශීලවිශුද්ධි-චිත්තවිශුද්ධි-දෘෂ්ටිවිශුද්ධි-කාංක්ෂාවිතරණවිශුද්ධි - මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි - ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධි-ඥානදර්ශනවිශුද්ධි" යන සප්ත විශුද්ධීන් පිළිබඳ ලෙශමාත්‍රවිස්තාරයක් දක්වම්හ.

මේ අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ:-

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො,**
**චිත්තං පඤ්ඤඤ්ච භාවයං.**
**ආතාපී නිපකො භික්ඛු**
**සො ඉමං විජටයෙ ජටං;"**

යනු වදාළසේක.

මෙහි "**සීලෙ පතිට්ඨාය**" යන වචනයෙන් ශීලවිශුද්ධියද, "**චිත්තං**" යන වචනයෙන් චිත්ත විශුද්ධියද, "**පඤ්ඤං**" යන වචනයෙන් සෙසු විශුද්ධි පඤ්චකයද 'යි මෙසේ සප්ත විශුද්ධියම වදාරනලදී. විශුද්ධි සම්පාදනොපාය දක්වන සර්වඥයන්වහන්සේ සත්ත්වයෙකුගේ පරිශුද්ධත්වයට ඉවහල් වූ කාරුණ්‍ය මේ ගාථාවට ඇතුලත් කළහ. එබැවින් එකී පිරිසුදු භාවය පතන සකල සාධුජන සත්පුරුෂයන් විසින් යථොක්ත අවවාදය සිතතබා ශීල විශුද්ධ්‍යාදි විශුද්ධි පරම්පරාවෙන් ගොස් හෙවත් පළමුකොට ශීල නමැති පෘථිවියෙහි පිහිටා සමාධි නමැති සාරගලෙහි මුවහත් තබනලද විදර්ශනා ප්‍රඥා නමැති ශස්ත්‍රය වීර්‍ය්‍ය බලයෙන් ඔසවන ලද පාරිහාරික ප්‍රඥා නමැති හස්තයෙන් නභාගෙන අනුශය වශයෙන් සන්තානගත ක්ලේශමල සමූලොච්ඡේදනය කොට දෙව් මිනිසුන් සහිත සත්ත්ව ප්‍රජාවෙහි අග්‍ර දක්ෂිණාහර්‍ය වූ විශුද්ධ පුද්ගල භාවය සැමනි විය යුත්තාහුමය. හේ මෙසෙයින් දතයුතු – අනෛර්‍යාණික මිථ්‍යාධර්මයන්ගෙන් ගැවසිගත් ලොක කුහරයෙහි ච්‍යුති උත්පත්ති වශයෙන් හැසිරෙන සමස්ත සත්ත්ව ප්‍රජාව පිළිබඳ සංසාර සීමාව නෛර්‍යාණික ස්වාඛ්‍යාත ධර්මානුකූල වැ සලකා බලනවිට අවස්ථා තුනකින් ගිණිය හැකි වේ එනම්:– **අශුද්ධ අවස්ථාව, ශුද්ධ අවස්ථාව, විශුද්ධ අවස්ථාව**. යන මොවුන්ගේ වශයෙනි. එහි අශුද්ධ අවස්ථාවෙහි "**සත්ත්ව**" යන නාමයද, ශුද්ධ අවස්ථාවෙහි "**බොධිසත්ත්ව**" යන නාමයද, විශුද්ධ අවස්ථාවෙහි "**බුද්ධ**" යන නාමයද, ලොක සම්මත වශයෙන් ව්‍යවහාර කරනු ලැබෙත්.

එයිනුදු අශුද්ධ අවස්ථාවෙහි සත්ත්ව යන නාමය කුමක් හෙයින් කියනු ලැබේද? යත්:- චක්ෂුරාදි ද්වාදශායතනයෙහි කාමතෘෂ්ණාදින්ගේ වශයෙන් ආශක්තවේනුයි ගිජුවේනුයි මූලාවේනුයි=සත්ත්ව නම් වේ නොහොත් පංචකාමයෙහි සිත් ඇලවන්නේනුයි=සත්ත්ව නම්. එක්සියඅටක් ප්‍රභේද ඇති තෘෂ්ණා නමැති අවුලෙන් අවුල්වී රාගයෙන් රත් වැ මොහයෙන් මූළා වැ ජාති ජරා මරණාදි දුකින් පීඩිත වැ අනෙකවිධ දුශ්චරිත කෙරෙමින් සසර දුක් විඳිනා කාලය අශුද්ධ අවස්ථාවයි. ඒ කාලයෙහි පංචකාමයෙහි ගිජුව වසන හෙයින් සත්ත්වයාය 'යි අවිශෙෂයෙන් කියනු ලැබේ.

ශුද්ධ අවස්ථාවෙහි බොධිසත්ත්ව යන නාමය කුමක් හෙයින් කියනු ලැබේද? යත්:– "**බොධි වුච්චති චතූසු මග්ගෙසු ඤාණං**" යනුවෙන් සතර මාර්ගඥානය බොධිය 'යි කියනු ලැබේ. එහි සිත් ඇලවා වසන්නේනුයි=බොධිසත්ත්ව නම්. යම් කාලෙක පටන් පංච කාමයෙහි ආදීනව දැක සසර කලකිරී දන ශීලාදි සුචරිත ධර්මයන්

රැස්කෙරෙමින් අභිය නයානුකූල යොනිසො මනස්කාරයෙන් තීක්ෂ්ණ නම් ශාන්ත සැපතක් ඇතැ'යි ආභොග මනස්කාරය කොට තදනුකූල ගුණදම් පුරණ කාලය ශුද්ධ අවස්ථාවයි. ඒ කාලයෙහි සොවාන් ආදී සතර මාර්ගඥානය ලබාගැනීම පිණිස සිත් ඇලවා වසන හෙයින් බොධිසත්ත්වයාය 'යි කියනුලැබේ.

විශුද්ධ අවස්ථාවෙහි බුද්ධ යන නාමය කුමක් හෙයින් කියනු ලැබේද? යත්:- **"බුජ්ඣිතා සච්චානීති=බුද්ධො"** යනුවෙන් දුඃඛ සමුදය නිරොධ මාර්ග සංඛ්‍යාත චතුරාර්‍ය්‍යසත්‍යාවබොධය කළ හෙයින් බුද්ධය 'යි කියනු ලැබේ. අවිශෙෂයෙන් මෙසේ වුවද, **"චතුසච්චබුද්ධ, පච්චෙකබුද්ධ, සම්මා සම්බුද්ධ"** කියා මෙහි ගුණ තිරෙන වශයෙන් ප්‍රභෙද තුනක් ඇති වේ. එහි චතුසච්චබුද්ධ යනු ශුද්ධ අවස්ථාවෙහි බොධිසත්ත්ව නාමයෙන් යෙදී එකාසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම්දම් පුරා පරොපදෙශයෙන් චතුරාර්‍ය්‍යසත්‍යාවබොධය කළ රහතන්වහන්සේ සඳහා කියනලදී. පච්චෙකබුද්ධ යනු යථොක්ත පදවියෙහි සිට දෙයාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි ගුණදම් පුරා චතුරාර්‍ය්‍යසත්‍යාවබොධයකළ පසේබුදුන් සඳහා කියන ලදී. සම්මා සම්බුද්ධ යනු බොධිසත්ත්ව පදවියෙහි සිට සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි සමතිස් පෙරුම් පුරා නියත විවරණ ශ්‍රී ලදින් ක්‍රමයෙන් බොධිද්‍රුම රාජයා කරා පැමිණැ පරොපදෙශ රහිත වැ ස්වයම්භූඥානයෙන් චතුරාර්‍ය්‍යසත්‍යාවබොධය කළ සර්වඥයන් වහන්සේ සඳහා කියන ලදී.

ඒ මහොත්තමයාණන් වහන්සේගේ සානුශය සන්තානගත කෙලශමලාපගමයෙන් අති පරිශුද්ධ වූ ස්කන්ධසන්තතියට බුද්ධයන නියමය ඇතිවූ බව **"විසුද්ධක්ඛන්ධ සන්තානො බුද්ධො'ති නියමො කතො"** යනුවෙන් හැගේ. ඒ පිරිසුදු ස්කන්ධ සන්තතිය කෙසේ ඇතිවූසේක්ද? යත්:- හෙතුසම්පද මහිමයෙන් ඇතිවූහ. එහි හෙතුසම්පද නම් කවරහ? යත්:- අප මහබෝසතාණෝ අශුද්ධ අවස්ථාවෙහි සත්ත්ව යන අවිශෙෂයෙන් සසර වසනුවෝ සංසාර ගතවැ අනන්ත දුක් විඳුනා සත්ත්වවර්ගයා දැක මොවුන් කෙසේ නම් මම සසරකතරින් ගොඩනගා පියම්දෝහෝ යි උපන් මහා කරුණා ඇතිසේක්;= තදුපායභූත සර්වඥතාඥානයාගේ නිෂ්පත්ති යට හේතු වූ සමත්‍රිංශත් පාරමීධර්මයන් සම්පූර්ණකළසේක. එබැවින් "මහාකරුණාව හා බොධිකාරක ධර්ම" මෙහි හෙතුසම්පදන මැ'යි දතයුතු. ඒ හෙතුවින් ජනිත ඵලසම්පද තොමෝ චතුර් විධ වන්නියැ. එනම්:- ඥානසම්පද, ප්‍රහාණසම්පද, ආනුභාව සම්පද, රූපකායසම්පද, යන මොවුන්ගේ වශයෙනි.

එහි ඥානසම්පද නම් කවරහ? යත්:- "**සබ්බඤ්ඤුතඤ්ඤාණපදට්ඨානං මග්ගඤ්ඤාණං තම්මූලකානි ච දසබලාදි ඤාණානි ඤාණසම්පදා**" යනු වියූබැවින් සර්වඥතාඥානයට ආසන්න කාරණාවූ අර්හත් මාර්ගඥානයද, එ මැ මූල්කොට ඇත්තා වූ දශබලාදී ඥානයෝද ඥානසම්පද නමි. මෙහි ආදි ශබ්දයෙන් ගතයුතු වූ ඥානයෝ නම්:- සකලඥෙයමණ්ඩලයෙහි නොපැකිළ පවත්නා අනාවරණඥානයැ- ත්‍රිවිද්‍යාඥානයැ - චතුර්වෛශාරද්‍යඥානයැ - ගතිපංචකඥානයැ-ෂට්අසාධාරණඥානයැ - සප්තබෞධ්‍යාඞ්ගඥානයැ - අෂ්ටාඞ්ගිකමාර්ගඥානයැ - නවලොකොත්තරඥානයැ - දශබලඥානයැ- එකාදශ මෛත්‍රීඵලඥානයැ-ද්වාදශ ප්‍රත්‍යාකාරඥානයැ-ත්‍රයොදශධුතාංගඥානයැ-තුදුස් බුද්ධඥානයැ-ත්‍රිපංචධර්මඥානයැ-සොළොස් ආනාපානඥානයැ-(විඥප්තිලක්‍ෂණ ව්‍යතිරික්ත රූපධර්මාදූෂවූ)= සතළොස් විභක්‍ෂණඥානයැ - අටළොස් ආවෙණිකධර්මඥානයැ- එකුන්විසි ප්‍රත්‍යවෙක්‍ෂඥාණයැ - විංශති විෂමදෘෂ්ටිඥානයැ - සමතිස් පාරමීධර්මඥානයැ-සමසතළිස් කර්මස්ථානඥානයැ- සමපනස් උදයව්‍යයඥානයැ-පරපනස් කුශලධර්මඥානයැ-සිවුසැට කලාශිල්පඥානයැ - සප්තසප්තති ඥානවස්තුඥානයැ - එකොනනවුති චිත්තඥානයැ - ෂණ්ණවුතිපාෂණ්ඩඥානයැ - සුවිසිකෙළලක්‍ෂ පරිමිතවූ සමාපත්තිඥානයැ - අනන්තනය සමන්ත ප්‍රස්ථානඥානයැ - සකල ලොකධාතුගත අපරිමිත සත්වයන්ගේ ආශයානුශයාදි අධ්‍යාශයඥානයැ-යනාමෙයි. සර්වධර්මයන් සර්වාකාරයෙන් දැනවදාළ මුනිඳුයාණන් වහන්සේගේ ඥානවිෂය අචින්ත්‍ය හෙයින් මෙහි බිඳු මාත්‍රයක් දක්වූ බව දතයුතුයි. මේ සියලු ඥානමහිමයෝමැ යටකී හෙතුසම්පද බලයෙන් ජනිත වූ සේක්මයැ.

දෙවැනි වූ ප්‍රහාණ සම්පද නම් කවරහ? යත්:- **සවාසන සකල සංකිලෙසාන 'මච්චන්ත'මනුප්පාද ධම්මතාපාදනං පහාන සම්පදා**" යනුවෙන් සවාසනා සකල කෙලශයන්ගේ අත්‍යන්තානුත්පාද ස්වරූප බවට පැමිණවීමය'යි දක්වූහ. මෙහි වාසනා යන්නෙන් "සතර මාර්ගඥානයෙන් කෙලශප්‍රහාණය කළ ක්‍ෂීණාශ්‍රව සන්තානයෙහි (පුහුදුන්ගේ කාය වාක් ප්‍රයොගය වැනිවූ)=දුටු ඇසූ අන්‍යයන්ට අප්‍රසාද එළවන කාය වාක් ප්‍රයෝගයට හෙතුවූ නෂ්ට කෙලෙසුන් විසින් තබාලාගිය තමන්ගේ සාමර්ථ්‍ය විශෙෂය" දතයුතුයි. මේ වාසනා ශක්තිය හා සමඟ නැසූ සකල කෙලශයෝ නම්:- **ඛුද්දක වත්ථුවිභඞ්ග පාළියෙහි** දක්වෙණ "ජාතිමද ගොත්‍රමද ආරොග්‍යමද යෞවනමදාදී" එකකනය වශයෙන් විභාග වූ තෙසැත්තෑවක් (73); කෙලශයෝද; "කොධ=උපනාහ, මක්ඛ=පලාසාදී" දුකයන්ගේ වශයෙන් විභාග වූ සතිසක් (36) කෙලශ

යෝද; "අකුශල මූලත්‍රිකය, අකුශල විතර්කත්‍රිකය,, යනාදී ත්‍රිකයන්ගේ වශයෙන් විභාග වූ එක්සිය පසක් (105) කෙලශයෝද; "කාමාදී ආශ්‍රව සතරය, ග්‍රන්ථ සතරය, ඕඝ සතරය, යොගසතරය" යනාදි චතුෂ්කයන්ගේ වශයෙන් විභාගවූ සපනසක් (56) කෙලශයෝද; "ඕරම්භාගිය සංයොජන පඤ්චක, උද්ධම්භාගිය සංයොජනපඤ්චක,, යනාදී පංචකයන්ගේ වශයෙන් විභාගවූ සැත්තෑවක් (70) කෙලශයෝද; 'විවාදමූලධර්ම ෂට්කය, ඡන්දරාගෂට්කය" යනාදි ෂට්කයන්ගේ වශයෙන් විභාග වූ සූවාසූවක් (84) කෙලශයෝද; "අනුශය ධර්මසප්තක, සංයොජන ධර්ම සප්තක" යනාදි සප්තකයන්ගේ වශයෙන් විභාග වූ එකුන්පනසක් (49) කෙලශයෝද; "කෙලශවස්තුඅෂ්ටකය" කුසීතවස්තුඅෂ්ටකය, යනාදි අෂ්ටකයන්ගේ වශයෙන් විභාග වූ සිවුසැටක් 64) කෙලශයෝද; "ආඝාතවස්තුනවයෙක, පුරුෂමල නවයෙක" යනාදී නවකයන්ගේ වශයෙන් විභාග වූ එකාසූවක් (81) කෙලශයෝද; "කෙලශවස්තු දසයෙක, අකුශලකර්මපථ දශයෙක" යනාදී දශකයන්ගේ වශයෙන් විභාග වූ සැත්තෑවක් (70) කෙලශයෝද; යන මේ සියල්ලමැ එකතු කළ කල්හි කෙලශධර්ම හසිය අසූඅටක් (688) වෙති. බ්‍රහමජාල සූත්‍රාගත පූර්වාන්තාපරාන්තකල්පික දෙසැට (62) මිථ්‍යාදෘෂ්ටීන් සමග පිඩුකළ කල්හි සත්සිය පනස් (750) කෙලශධර්මකෙනෙක් වෙති. මේ සත්සිය පනස "උත්පන්න, අනුත්පන්න" දෙකින් ගිණූකල්හි එක්දහස් පන්සියයක් (1500) කෙලශයෝ වෙතැ'යි දතයුතු. යටකි වාසනා සහිත මේ එක්දහස් පන්සියයක් කෙලශයන්ගේ ප්‍රහාණිය ප්‍රහාණ සම්පදනමු.

චතුෂ්කනය කෙලශ 64 ක්ද පංචකනයකෙලශ 75 ක්ද ගෙන සර්වසංග්‍රාහික ක්‍රමයෙන් කෙලශයෝ 1526 ක් වෙති. නවකනය කෙලශයන්ගෙන් මානනවකය හැර දෙසැත්තෑවක් ගෙන කෙලශයෝ 1508 ක් වෙති. මූලටීකාචාර්‍ය්‍යමතානුකූල වැ **"දියඩ්ඪ කිලෙස සහස්සානි දසාධිකානි හොන්ති"** යනුවෙන් කෙලශධර්මයෝ 1510 ක් බව පෙනේ. **"අප්පකං පන ඌනමධිකංවා ගණනූපගං නහොති"** යනුවෙන් සවල්පයක් අඩුවැඩි වුවද ගණනූපග නොවන බව කියනලදී.

අනුටීකාචාරීන් වහන්සේ විසින් දක්වනලද **"දියඩ්ඪසහස්ස"** කෙලශවිභාගය නම්:- ලෞකිකසිත් එකාසූව ආරම්මණ විජානන ලක්‍ෂණයෙන් එකක්කොට දෙපනස් චෛතසිකයන් හා ගත් කල්හි ලැබෙන තෙපනසද, නිෂ්පන්නරූප අටළොසද, පරිච්ඡේද රූපයද, උපචය සන්තති සංඛ්‍යාත ජාතිරූපය අනිච්චතා ජරතා දෙකත් සමඟ ගත් කල්හි ලැබෙන ලක්‍ෂණරූපත්‍රයද, යන මේ

සියල්ල පිඬුකළ පසු පන්සැත්තෑ ධම්කෙනෙක් වෙති. මොවුහු "ආධ්‍යාත්මික වාහ්‍ය" භෙදයෙන් වි ගුණිත වූ එක්සිය පනසක් වෙති. මේ එකෙකී ධර්මයක් පාසා මැ **"ලොභ ද්වෙෂ මොහ මාන දිට්ඨි විචිකිච්ඡා ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප"** යන දශ ක්ලෙශයන් ලැබෙන හෙයින් දශ ගුණිත වූ එක්දහස් පන්සියයක් (1500) ක්ලෙශ ධර්මයෝ වෙතැ'යි දතයුතුයි. මෙතෙකින් නිම වූ ප්‍රහාණසම්පද තොමෝ ද පූර්වොපචිත හෙතුසම්පද මහිමයෙන් මැ සිඬවූ සේක්ම යැ.

තුන්වැනිවූ ආනුභාවසම්පද නම් කවරහ? යත්:- **"සචිත්ත නිප්ඵාදන ආධිපච්චං ආනුභාව සම්පද"** යනුවෙන් කැමති පරිද්දෙන් අභිමතාර්ථයන් නිෂ්පාදනය කිරීමෙහි අධිපති භාවය (ඓශ්වර්‍ය්‍යය) ආනුභාවසම්පද නමැ'යි දක්වූහ. සකල ගුණ නිධාන වූ ඒ මහොත්තමයාණන් වහන්සේගේ ආනුභාමහිමය චින්තාවිෂයාතික්‍රාන්ත හෙයින් අචින්ත්‍යයහ. වර්ණනාවිෂයාතික්‍රාන්ත හෙයින් අවාච්‍යයහ, ඥානවිෂයාතික්‍රාන්ත හෙයින් අවෙද්‍යයහ. එසේවුවද සංක්ෂෙපවිසින් මෙසෙයින් සැලකිය යුතු. සිඬ සාර්ථකද හෙතුසම්පද සංඛ්‍යාත සකලාර්ථයන් ඇති හෙයින් සිඬාර්ථ නම්ලද, අප මහබෝසතාණෝ බුදුවන ජාතියෙහි මවු කුස පිළිසිඳිමය බිහිවීමය යනා දිනයන්හි ලොවැ පහළ වූ අසිරිමත් ලකුණු වලින් "මෙතුමා එබඳු ආනුභාසම්පන්න කෙනෙක" යන බව පරීක්ෂණයෙන් දත හැකිවේ. ඒ අසිරිමත් ලක්ෂණයෝ නම්:- දශ සහශ්‍රී ලොකධාතුව එකවිට ප්‍රකම්පිතවීම, ඒතාක් වැසි දෙවුබඹහු මේ සක්වළට පැමිණීම, ලවණසාගරය මිහිරිරසවත් වීම, සන්හුන් රළපතර ඇතිවීම, ගං හෝ ආදියෙහි ජලවේගය නැවතීම, සියලු ජලාශයන්හි පස්පියුම් පිපීම, ලිය රුක් ආදිය අකාල පුෂ්පාකුලවීම, ජාත්‍යන්ධයෝ ඇස් ලැබීම, බිහිරෝ කන් ලැබීම, ගොළුවෝ දිව් ලැබීම, පිලුවෝ පා ලැබීම, කුදුහු මනා සිරුරු ලැබීම, රෝගීහු නිරෝගී වීම, බන්ධනගත සත්වයෝ එයින් මිදීම, හස්තිහු කුංචනාද කිරීම, අශ්වයෝ හෙෂාරව පැවැත්වීම, භෙරි වීනාදී තූර්‍ය්‍යභාණ්ඩ තුමූම වාදනය වීම, පලන් අබරණ තුමූම ධ්වනි පැවැත්වීම, පක්ෂීහු රැව්පිළිරැව් නොදීම, නිත්‍ය විරොධිහු එක කොළිමඬුල්ලෙහි ප්‍රීතිවින්දනය, පක්ෂීහු අහස් ගමන් නැවැත්වීම, නරකාග්නිය නිවීම, ලෝ ඇඳිරි නරකයෙහි ආලොක පැතිරීම, ප්‍රෙතයෝ බත් පැන් ලැබීම, තිරශ්චීනයෝ නිර්භය වීම, ච්‍යුති උත්පත්තිදෙක නැවතීම, සඳහිරු ආදීන්ගේ ගමන් වැළකීම, අහස්තරු දෘශ්‍යමාන වැ බැබලීම, සියලු රත්න ජාතීන් ප්‍රකටවීම, සියලු දිගුන් ප්‍රසන්න ව ශීතමාරුතය හැමීම,

භවත්‍රයම පෙණියාම, සුවඳ සුනු සහිත මල්වැසි වැසීම, යනාදී යසි. තිහිවූ ඇඟිල්ලෙහි විශෙෂ වශයෙන් ඇති වූ අන්‍ය ලක්‍ෂණ යෝද, අෂ්ටාදශ විද්‍යා. සිවුසැට කලාශිල්පාදිය සවබුද්ධියෙන් මැ ප්‍රගුණවීමද, එහිමැ සංග්‍රහ බවට පැමිණේ. මේ වූකලී ඒ මහ තාණන්ගේ ආනුභා මහිම නම්.

තවද බුදුබව ලබන දිනයෙහි යුද පිණිස පැමිණි දශබිම්බරක් මරසෙනඟ බලා සිංහනසේක් මාගේ බුඩමඞ්ගල්‍යය සඳහා පැමිණ සිටි දෙවු බඹ ආදීහු මරසෙන් දැක හයින් දිවපූහ. මම වූකලී හුදකලාවීමි. එතකුදු වුවත් මම මේ වජ්‍රාසනය නොහරිමි. මම චතාහි චතුපාරිශුඩශිල නමැති වාසල් සතරක් ඇති ඉන්ද්‍රියසංවර ශිල නමැති මාරපාලයන් ඇති පාරමී නමැති නගරවරයෙහි ශීල නමැති කඳවුරු බැඳ බොධිදුම නමැති ජයසේසත නඟා වජ්‍රාසන නමැති අසුපිට නැඟී මෛත්‍රී නමැති ජලයෙන් පරිපූර්ණවූ ගුණ නමැති පරිඛාවලයෙන් පරික්‍ෂිප්තවූයෙමි. මාගේ සමතිස් පෙරුම් නමැති යොධයො ඇත. සත්තිස් බොධිපාක්‍ෂිකධර්‍මම නමැති මන්ත්‍රිමණ්ඩලයක් ඇත. නවදහස් අසූසියක්කෙළ පනස් ලක්‍ෂ සතිස්මහා සංවරශිල නමැති බලසෙනඟක් ඇත. එබැවින් තෙල මරහු පරදවා ජයගැන්ම මට අරුම පුදුමසේ නොපැණේ ය'යි සිතත් සිතත් මැ මරසෙන් පැරද පලාගියාහ. මේද ආනුභා සම්පදනමු

තවද පැරද ගිය වසවත් මරහුගේ "**තණ්හා-රතී-රඟා**" යන දූන් තුන්දෙනා ජිනෙන්ද්‍රයාණන්වහන්සේ කාමයෙන් පොළඹාගැනුම් වස් අතිනීල වලාකුල් බඳු කෙශකලාපයෙන්ද පූර්ණචන්ද්‍රයාබඳු මුව පියුමෙන්ද ඉන්ද්‍රචාප බඳු නැමි බැමසඟලින්ද අර්ධචන්ද්‍රාකාර පටුනලලින්ද ශශලාංඡන බඳු කියඹුවැලින්ද ඉන්දීවර බඳු නෙත්සුවළින්ද රණාඞ්කුෂවැනි උත්තුඞ්ග නාසිකාවෙන්ද ප්‍රවාලාඞ්කුර වැනි අධරයුගමයෙන්ද කොඳකැකුළුවන් දශන පඞ්ක්තියෙන්ද රනොවිලිවන් කර්ණයුගමයෙන්ද සංඛප්‍රතිභාග ග්‍රිවයෙන්ද සවර්ණලතා බඳු හස්තායුගමයෙන්ද සවර්ණහංසාකාර තිව් පුන්පියවුරු මඩලින්ද නීලවර්ණ වසාරොදින්ද දුනුමිටවන් හිඟු වලගින්ද පුලිනතල වැනි පුළුලුකුලින්ද ගහරන්පුවරු බඳු පෘෂ්ඨ භාගයෙන්ද රන්ටැම් බඳු දෙවටොරයෙන්ද රන්බුබුළු වැනි ජානු යුගමයෙන්ද මයූරග්‍රීවාකාර කොණ්ඩා යුවළින්ද රත්පියුම් බඳු පායුවළින්ද බාලපල්ලව බඳු රතැඟිලිපෙළින්ද මූක්තාදම බඳු නියපෙළින්ද සමන්විත වැ නන්විසිතුරු දිවසළු හැඳපැළඳ පාද පාදාඞ්ගුලි පාදකටක පස්රු පස්පෙරගර එක්වැටි පාමුදු රන් මිරිවැඩි පාඩගම් ආදී ආභරණයෙන් හා නන්විසිතුරු පැහැයෙන්

බබලන උතුරුසළුලා නුවනග බැල්මෙන් හා මඳ මඳ සිනාවෙන් පිරුනාවූ මූව නැමති සඳපෙළින් දිවන දශනරංසින් සලලාල නමැති කෞමුද වනයක් ප්‍රබොධ කරවමින් මෙසේ දුටුදුටුවන් ඇසුඇසුවන් සිතුසිතුවන් සිත් පොළඹාපියන සයිස්යක් වෙස්මවා ගෙන පැමිණි අනෙකවිධ අනඞ්ගලීලා දක්වන්ටවන්හ. එවේලෙහි ස්වාමිදරුවෝ කාරුණ්‍යපිඩක්සේ නිශ්චලවැ වැඩහිඳ ශ්‍රීමත් මුඛ නමැති පද්මයෙන් සුවඳගඳ විහිදුවා අෂ්ටාඞ්ගසම්පෙත මධුර ස්වරයෙන් වදාරණසේක්:-නැගනි! කුමක්නිසා වෙහෙසෙව්ද? තොප තොපගේ තෙල සත්‍රීලීලාව කෙලශ හරිනයන්ට මැ සුදුසු බව මුත් මා සේ නිකෙලශිවූ ශාන්තවූ දාන්තවූ අමාමහ නිවන් දුටුවානට නොසුදුසුය'යි වදාරත් මැ ඒ මාරසත්‍රීහු කලකිරි පැරද පලාගියාහ. මෙද ආනුභා මහිමය'යි දතයුතු.

තවද සුර නර විහඟ ගණාකිණී අමෘත ඵලහරිත කල්පපාදප ප්‍රතිභාගවූ තිලොගුරු බුදුරජාණන්වහන්සේ යමකප්‍රාතිහාර්‍ය්‍ය නම් ඉර්ධ්‍යානුභාවයක් දක්වනසේක්:- එකෙකිචිත්තක්ෂණයෙහි තෙජොකසිණ ආපොකසිණ සමාපත්තිවයට සමවදිමින් ඌර්ධ්වකාසින් නාබතල්කඳක් සා ගිනිකඳක් විහිදුවනසේක. අධඃකායයෙන් නාබතල්කඳක් හා දියකඳක් විහිදුවනසේක. මෙසේමැ ශ්‍රීමුඛය දකුණැස වමැස දකුණුකණ වම්කණ දකුණු දසරුව වම් දසරුව දකුණත වමත යනාදි එකෙකී අවයවයන්ගෙන්ද එකෙකි ඇඟිලිවලින් හා අසූඅස්සෙන්ද නවානුදහසක් රෝමකූපයන්ගෙන්ද නාබතල්කඳක් හා ගිනිකඳදියකඳ බැගින් දිවෙයි. එකිනෙක අමිශ්‍රව පැණෙයි. උඹිංහවාග්‍රය දක්වා ගොස් ආපසුහැරී සක්වළ ගල්මුවවිට හැපී මුළුසක්වළගැබ විසිරයෙයි. එකෙනෙහි ෂට්වර්ණ ගණ බුඹරසම්මාලාව දශදික් පැතිර හාත්පස බබලන්ට වන්නී යන්ත්‍රනාළයකින් ශවර්ණ රසධාරා විසුරුවන කලක්මෙන් වූහ. මෙසේ අනන්‍ය සාධාරනවූ යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා විජම්භන දෙශනා කරනු පිණිස තව්තිසා දෙව්ලොව බලා දක්ෂිණ ශ්‍රීපාදය මූෂ්ටිරතන ප්‍රමාණ තැන් නගාලූ ඇසිල්ලෙහි සවාසූදහසක් යොදුන් උස යුගන්ධර පර්වතය හුයාපූ වේබඩක්සේ නැමිනැමී අවුත් මස්තකයෙන් පිළිගත. එසේමැ එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උස මහාමෙරු පර්වතරාජයා නැමී නැමී අවුත් වාම ශ්‍රීපාදය පිළිගත. මෙසේ මිනිස්ලොවැ එක්පියවරෙක යුගන්ධරැ මූදුනෙහි එක්පියවරෙක මෙරමුදුනෙහි එක්පියවරෙකැ'යි තුන්පියවරෙකින් දෙව්ලෝ වැඩිසේක.

ඒ බවදුටු සක්දෙව්රජාණෝ සක්විතිරජක්හු දුටු රාජසෙවකයෙකු මෙන් හුනස්නෙන් නැඟී පෙරගමන් කොටැ වැඩමවා

ගොස් තමාගේ පඬුපුල්අස්න තරම් උතුම් අස්නක් දෙව්ලොව නැතිහෙයින් එම අස්න බුදුන්ට පවරා ඉක්බිති මේ දෙලොස් රියන් උසැති බුදුහු සැටයොදුන් උසැති අස්නෙහි කෙසේ නම් වැඩහිඳින්නේද'යි සිතූහ. ඒ බව දැනගත් සර්වඥයන්වහන්සේ ඔහට බුද්ධානුභාවය අනවාලම්'යි සිතා දිග නවවියත් පුළුල සවියත් සහලසිවුර සතරපොටක් කොට දිග දෙසිය සතළිස්ගව් පුළුල දෙසියයක්ගව් උසසැටගව් වට අටසියයක්ගව් ඇති පඬුපුල් අස්නෙහි එලාලූසේක් බැලූ බැලූ අත සහලසිවුර මුත් ඒසා මහත් ආසනය නොපෙනෙයි. එකල්හි සර්වඥයන්වහන්සේ එහි වැඩ සිටිසේක් සියලුදෙවියෝ කර ඔසව ඔසවා බුදුසිරි බලමින් විස්මිත වූහ.

මෙසේ මැ අපලාල චූලෝදර මහෝදර අග්ගිසිඛ ධූමසිඛාදි මහානුභාසම්පන්න නාගයෝද, ධනපාලාදි හස්තිහුද, සච්චක නිඝණ්ඨපුත්‍ර අම්බට්ඨමානවක පොක්ඛරසාත්‍යාදී මනුෂ්‍යයෝද, ආලවක සූචිරෝමාදි තෙදැති යක්ෂයෝද, බකබ්‍රහ්මාදි බ්‍රහ්මයෝද, යන මේ ආදී මහානුභාසම්පන්නයන් දමනයකිරීමද තිරශ්චීනාදීන්ට පවා ධර්මදෙශනා කොට දෙවැනි. තුන්වැනි ආත්මයන්හි මාර්ගඵලාවබෝධයට හෙතුසම්පත් දැනවීමද යනාදි අනෙකවිධ ඥානානුභාව බුද්ධානුභාව ඉද්ධ්‍යානුභාවාදී සියලු බුද්ධමහිමයෝ මැ ඒ මහොත්තමයාණන් වහන්සේගේ ආනුභා සම්පද නමැ'යි දතයුතු. ආනුභා මහිමයැ අති සංක්ෂෙප මුඛයෙන් මෙසේ කිවද බුද්ධානුභාව වර්ණනාවිෂයාතික්‍රාන්තයහ'යි දතයුත්තේය.

සිව්වැනිවූ රූපකාය සම්පද නම් කවරහ? යත්:-‘ **සකලලොකනයනාභිසෙකභූතා පන ලක්ඛනානුබ්‍යඤ්ජන පටිමණ්ඩිතා අත්තභාවසම්පත්ති රූපකායසම්පදා නාම**” යනුවෙන් සකල ලොක නයන රසායනවූ ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් සමලංකෘතවූ ආත්මභාව තෙමේ රූපකාය සම්පද නමැ'යි දතයුතු. එහි ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණයෝ නම්:-සුවර්ණපාදුකා බඳු පාදතල ඇති බවය, ශ්‍රීපතුල් දෙක්හි දහස් දහස් දැවි ඇති නිම් නැබ සහිත දෙසිය සොළසක් මගුල් ලකුණු ඇති බවය, පීණායත විළුම් ඇති බවය, දික්වූ ඇඟිලි ඇති බවය, මෘදුතරුණවූ අතුල් පතුල් ඇති බවය, ජාල කවුළුවක් බඳු හස්තපාද ඇති බවය, උස්වූ පිහිටි ගුල්ඵයන් ඇති බවය, ඕළුමුවන්ගේ බඳු ජංඝා ඇති බවය, සිට නොනැමී දෙඅත් ලෙන් දෙදන පිරිමදිනා බවය, කොශගර්භයෙහි අවහිතවූ වස්ත්‍රයෙන් ගුහ්‍යකටයුතු පුරුෂ ව්‍යඤ්ජනය ඇති බවය. රන්වන් සිරුර ,හා කසුන්වන් සිවි පැහැ ඇති බවය, සියුම් සිවි ඇති

බවය, එකෙකී කූපයෙහි එකෙකී රෝමය බැගින් ඇති බවය, දක්ෂිණාවර්ත වැ උඩුමුවගවත් රෝම ඇති බවය, බ්‍රහ්මයාට බඳු දීර්ඝප්‍රමාණයෙන් ඍජු වූ ගාත්‍රා ඇති බවය, දෙඅත් පා පිට දෙඅංශකූට සකන්ධ යන සප්තස්ථානයෙහි පිරිපුන් මාංසොත්සද ඇති බවය, සිංහයාගේ පේ‍රඩකය බඳු පිරිපුන් සර්වකාය ඇති බවය, පරිපූර්ණ වූ අන්තරාංස (පිට දෙ අස මැද) ඇති බවය, සම වූ කාය හා ව්‍යාම ඇති බවය, සම වට කඳට ඇති බවය, රසයන්ගේ ග්‍රාසයෙහි (අදනයෙහි) අග්‍ර වූ රසහරණීන් ඇති බවය, සිහහනු ප්‍රතිභාග හනු ඇති බවය, සතළිසක් දන්තයන් ඇති බවය, ඔවුන්ගේ මැ සමත්වය, අවිවරත්වය, සුෂ්ඨුශුක්ලත්වය ඇති බවය, මෘදු පෘථුලායත ජිහ්වා ඇති බවය, මහා බ්‍රහ්මයාට බඳු අෂ්ටාඞ්ග සමුපෙත ස්වර ඇති බවය, අභිනීල වූ (නීලාදී වෙසෙස් පැහැ ඇතද ඔවුන්ගේ විශිෂ්ටත්වය ඇති)=නෙත්‍රයන් ඇති බවය, එවිගස උපන් රතුවස්සක්හුගේ අක්ෂිගුල බඳු අක්ෂිගුල ඇති බවය, නලල්තල මැද දක්ෂිණාවර්ත වැ ඌර්ධ්වාග්‍රව සිටි ශ්වෙතවර්ණ රෝම යක් ඇති බවය, නලල්පටකින්වෙළනලද හිසක්වැනි බව දේහෝ නොහොත් නලල්පට්යක්සෙයින් සැමතන්හි පිරිමඬුළු හිසක් ඇතිබවය, යන මොහු වෙත්. මෙයින් බුදුහු මණිගණ ප්‍රභා සමුජ්ජ්වලිත රත්නාකරයක්හුගේ ශ්‍රී විභූතිය අභිභවනය කෙරෙත්.

අශීත්‍යනු ව්‍යඤ්ජනයෝ නම්:— චිතත්‍ර, අනුපූර්ව, වෘත්තාඞ්ගුලිය, තාම්‍ර, තුංග, සත්ඛනබය, නිගුළ්හගොප්ඵසය, සමපාදය, ගජ, සිංහ, හංස, උසභ සමාන ක්‍රමය, දක්ෂිණාවර්ත ගාත්‍රය, සමන්ත චාරු ජානුමණ්ඩලය, පිරිපුන් පුරුෂ ව්‍යංජනය, අච්ඡිද්‍ර, ගැඹුරු, දක්ෂිණාවර්ත නාභිය, හෙමගජාකාර ඌරුබාහුය, සුවිභක්ත, අනුපූර්ව, මටසිළුටු, අනුස්සන්න, අලීන, තිලකාදි විරහිත, අනුපූර්වරුචිර, පරිශුද්ධගාත්‍රය, කොටිසත සහශ්‍ර හස්තිබල ධාරණය, උත්තුංග නාසය, සුරක්ත විජමාංශය, සුදු, සිනිඳු දන්තය, පිරිසුදු ඉන්ද්‍රිය, වටවූ දන්තය, රක්තවූ ඔෂ්ඨය, ආයත වක්ත්‍රය, ගැඹුරු පානිතලලෙඛය, ආයත, ඍජු, රුචිරසණ්ඨානලෙඛය, පිරිමඬුළු සිරුරුපැහැය, පිරිපුන් කපොලය, දිගුපුළුල් නෙත්‍රය, පස්පැදිස්නා ඇස් සඟල, ආකුංචිතාග්‍ර හමුකය, මුදුතුරුණුරක්තවූ ජිහ්වාය, ආයත රුචිර කර්ණය, නිර්ගණ්ඨිශිෂිය, නිගුළ්හ, ඡත්‍රසන්නිභ ශිෂිය, පෘථුලායත ලලාටය, මනාව පිහිටි බැමසඟල, මොලොක්, ශෞම්‍ය, උජ්වලිත, මටසිළුටු, කොමල, සිනිඳු, සුවඳවිහිදුනාගාත්‍රය, සමවූ, මොලොක්, දක්ෂිණාවර්ත, අතිනිල, ඝනිගධලොමය, ඉතා සියුම් ආශ්වාස ප්‍රාශ්වාසය, සුගන්ධ මුඛය, සුගන්ධමූර්ධනය, සුනීල, දක්ෂිණාවර්ත, සුසංස්ථාන, සිනිඳු, සිළුටු, අළලිත, සම, කොමලකෙශධාතුය, සිරොධාතුවෙන් ඔඩුරියන්

පමණ තැන් නැඟී ගැම්මේලෙහි මැ ජෝතිමත්ව තිබෙන කේතුමාලාවය, යන මොහුවෙත්. මෙබඳු අසූවක් අනුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් බබලන බුදුහු විචිත්‍ර ලක්‍ෂණ සම්පත්තියෙන් හා ප්‍රජ්වලිත කේතුමාලාජාලයෙන් සමුජ්වලිත රූපශෝභා ඇති සේක.

මෙසේ යථොක්ත වූ දෙතිසක් පුරුෂලක්‍ෂණයෝද, අසූවක් අනුව්‍යඤ්ජනයෝද, 'සවස්තික දෙකය, නඳවට දෙකය'' යනාදි පදසිය සොළසක් චක්‍රලක්‍ෂණයෝද, යන තුන්සිය අටවිස්සක් මඞ්ගල්‍ය ලක්‍ෂණයන්ගෙන් සමලඞ්කෘත වූ රූප ශ්‍රී තොමෝ අප බුදුහුගේ රූපකාය සම්පදනමැයි දතයුතු මෙතෙකින් අප තථාගත සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේගේ "හේතුසම්පද මහිමයෙන් පහළවූ" **ඥාණ-ප්‍රහාන-ආනුභාව-රූපකාය**-යන චතුර්විධ ඵලසම්පද තොමෝ කියා නිමවනලද්දු

මෙකියනලද චතුර්විධ ඵලසම්පදවන්ගේ ප්‍රතිලාභය හෙතුකොටගෙන ඒ මහතාණන් වහන්සේගේ ස්කන්ධසන්තතිය අතිපරිශුද්ධ වූ සේක ගුණ ධර්මයන්ගේ වශයෙන් සමස්ත සත්ව විෂයෙහි අග්‍රෙශ්වරවූහ. ඒ නිසා මැ සමන්තභද්‍රසේක, අසමසමසේක, අතුල්‍යසේක. අනන්‍යසාධාරනසේක, ත්‍රෛලොක්‍යතිලකවූහ, ප්‍රඥවට වල්ලභවූහ, මොහඳුරට දිවාකරවූහ, සියළු දොෂයන්ගෙන් දුරුවූහ, සියළු ගුණයන්ගෙන් යුක්තවූහ, සියළු දේදූතවදළුසේක, තුන්ලොවට අසහාය ශාස්තෘවූසේක, කාරුණ්‍යපිඬක් වැනි සේකැ'යි දතයුතු.

මෙබඳු ගුණගණෙන් හිව් එතුමාණන්වහන්සේගේ "**කෙශලොම**" දීහු පවා අත්‍යන්ත පවිත්‍ර වූයේ මැ පූජනීය ද්‍රව්‍යවූහ. එබැවින් එයින් රසම්මාලා නික්මෙන්ට වන, කිසේයැ ? යත්.— සර්වමාර වාරණ කෙසරින්ද්‍රායමාන වූ අප භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥයන්වහන්සේ බුදුබව ලැබූ සිව්වැනි සතියෙහි රුවන්ගෙහි වැඩහිඳ පරමතර විචිත්‍රනය සම්පන්න සූක්‍ෂමාති සූක්‍ෂමතර පරමාර්ථ ධර්මය සම්මර්ශණාකාර වදාරණසේක් "**චතුර්විධ=ධම්සඞ්ගණියැ, අෂ්ටාදශවිධ = විභඞ්ගයැ, තුදුස්ප්‍රකාර=ධාතුකථායැ, ෂඩ්විධ=පුද්ගල ප්‍රඥප්තියැ, සකවාද පරවාද විසින් සහස්‍රවිධ=කථාවස්තුයැ, දශවිධ=යමකයැ**" යන ප්‍රකරණාගත ධර්ම සම්මර්ශණයෙන් පසු සුවිසිවිධ වූ පට්ඨානයට බැස "**ෂඩ්විධ අනුලොම නයැ. ෂඩ්විධ ප්‍රත්‍යනීක නයැ, ෂඩ්විධ අනුලොම ප්‍රත්‍යනීක නයැ. ෂඩ්විධ ප්‍රත්‍යනීක අනුලොම නයැ**" යන චතුර්විංශත් ප්‍රස්ථාන නය අලලා සර්වඥතාඥනයෙන් මට සිලුටු පරමතර ගම්භීර ධර්මය සම්මර්ශණය කරත් කරත් මැ ශ්‍රී ශරීරයෙන් ෂඩ්වර්ණ

ඝණ බුඩරසම් මාලා නික්මෙන්ට වන. කෙශ මශ්‍රු භ්‍රූලතාවන් ගෙන් හා නෙත්‍රයුගමයාගේ නීලස්ථානයෙන්ද නිල්වන් රශ්මි මාලා නික් මැ නභසථලය අඤ්ජනචූර්ණයෙන් ඈකිර්ණ සමාකිර්ණ වූවාක් මෙන්ද, දියබෙරලිය මල්දම් විසිරයන කලක්මෙන්ද, නිලු පුල්මලින් වැසීගියාක් මෙන්ද, කොණෙහි කොණෙහි සැලෙන්නා වූ ඉඳුනිල්මිණිමුවා තල්වැට පෙළක් මෙන්ද ප්‍රශාරිත නීලවර්ණ මයුර චන්ද්‍රිකාමය පට්ටවස්ත්‍ර පඬසානියක් මෙන්ද ශොභාමත්විය.

ශ්‍රී ශරීරයෙහි රන්වන් වූ ස්ථානයන්ගෙන් රන්වන් රශ්මිහු නික්මෙන්ට වන. ඒ රශ්මීන් කාරණකොටගෙන සියලු දිශා භාගයෝ රන්රසින් ඉසිනුලබන්නාක්මෙන්ද රන්වන් ධවජමාලා ලලිත වන්නාක්මෙන්ද කොකුම්සුණු විසිරෙණ කලක්මෙන්ද කිණිහිරි මල්මාලාවන්ගෙන් ගැවසී ගත්තාක් මෙන්ද ශොභා සම්පන්න වූහ. මාංශ රුහිරයන්ගෙන් හා නෙත්‍රයන්ගේ රක්ත වර්ණස්ථානයන්ගෙන් ලේවන්රැස් නික්මෙන්ට වන්හ. ඒ කාරණ කොටගෙන සියලු දිගුන් රක්තවර්ණ සින්දූර චූර්ණයෙන් රංජිත වූවාක් මෙන්ද සුපක්ව ලාක්ෂාරසයෙන් ඉසිනු ලබන්නාක්මෙන්ද, රක්තවර්ණ වස්ත්‍රයෙන් පිරිකෙව්කළාක්මෙන්ද, බඳුවද එරබදු මලින් සැදුම්ලද්දක් මෙන්ද ශ්‍රී සම්පන්න වූහ.

අසථි දන්තාදීන්ගෙන් හා නෙත්‍රයුග්මයාගේ ශ්වෙතස්ථාන යෙන්ද, අවදාත රශ්මිහු නික්මෙන්ට වන. ඒ කාරණකොටගෙන සියලු දිශාභාගයෝ රජතකුම්භයෙන් විසිරෙණ ක්ෂීරධාරාවන් ගෙන් ගැවසුනාක්මෙන්ද, ප්‍රශාරිත රිදීමය පටවස්ත්‍ර විතානයක් මෙන්ද, ක්ෂණ ක්ෂණයෙහි සැලෙන්නාවූ රිදී තල්වැට පෙළක් මෙන්ද, සිඳුවාර සුමන මාලතී කුඳ කුමුදාදී මල්මාලාවන්ගෙන් ලීලොපෙත වන්නක්හු මෙන්ද, වූහ.

අතුල් පතුල් තොල් සගල් ආදී මදරත් පැහැති තැන්වලින් මඳටවන් රස්මීන් නික් මැ දශ දිගුන් රක්තපද්මයෙන් වැසුනාක් මෙන්ද, මූරුතමල් රැසක් ඉසින්නාක්මෙන්ද බැබලූහ.

තාදනන්තර වැ ලොවැතිනාක් පැහැ එක්කොට යුක්තස්ථාන යෙහි යොදා දක්ෂ සිත්තම් කරුවෙකු විසින් සිතුවම්කරනලද විසිතුරු සිතුවම් පටක් විදහා පානකලක්මෙන් පබසර කැළුම් නික්මෙන්ට වන්හ.

මෙසේ "නීල පීත ලෝහිත 'වදාත මාඤ්ජෂ්ට ප්‍රභාශ්වර" යන ෂට්වර්ණ ඝණ බුඩරස්මි මාලාවෝ දශදිගුන් හොබවමින් ධාවන ප්‍රතිධාවනය කළහ. එසේ දිවන්නාහු උඩින් භවාග්‍රය හා යටින් අජටාකාශයද වටින් අනන්තාපරිමාණ සක්වළවල්ද බබුලු වන්ට වන්හ. කොළලක්ෂයක් සක්වළ පිහිටි චන්ද්‍ර සූර්‍ය්‍ය තාරකා

රූප උද්‍යාන විමාන කල්පවෘක්ෂ දිව්‍යබ්‍රහ්මාදීන්ගේ ප්‍රභා සමෘද්ධිය අභිභවා දිලිසෙන්ටවන් වේලෙහි යථොක්ත චන්ද්‍ර සූර්‍ය්‍යාදීහු මධ්‍යාහ්නයෙහි නැගූ තෙල්පහන් මෙන් වූහ.

මේසා මහත් ප්‍රභා සමෘද්ධියක් ඇති බුද්ධරස්මීන්ගේ නිර්ගම නය වනාහි බුදුරජාණන්වහන්සේගේ අධිෂ්ඨාන ඉර්ධි භාවනා මය ඉර්ධ්‍යාදියක් නිසා නොවෙති. වැලි කුමක් හෙයින්ද ? යත්:- සුනිපුණාති සූක්ෂමතර පරමතරගම්භීර ප්‍රස්ථානධර්මනය සම්මර්ශණය කරන්නා වූ සර්වඥයන් වහන්සේගේ සෞම්‍යනාගය මය ඥානය කාරණකොටගෙන තදධාරවූ ලොහිතය ප්‍රසන්නවිය. ඒ හෙතුවින් වස්තුරූපයද තදනුගත රූපාන්තරයෝද ප්‍රසන්න වත් වත් මැ අවිතිර්භොග චිත්තාෂ්ටකයන්ගේ පැතිරයාම හෙතු කොටගෙන ෂඩ්වර්ණය ප්‍රසන්නවූහ. එහෙයින් **"විත්තා පච්චය උතුසමුට්ඨාන"** වර්ණායතනය හාත්පස අසූරියන් පමණ තැන් නිශ්චල වැ පිහිටියේය, එකල්හි ශ්‍රී ශරීරයෙහි නීල පීතාදී ඒ ඒ වර්ණස්ථානවලින් එකි එකි වර්ණානුරූප රස්මිමාලාවෝ නික් මෙන්ට වන්හ.

එබැවින් ඒ මහොත්තමයාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි පවත්නා **"කෙස්-ලොම්-නිය-දත්"** ආදීහු පවා අති පරිශුද්ධවූහ. එහෙයින් ඊට **"කෙශධාතු-දන්තධාතු"** යී ව්‍යවහාර කෙරෙති. එම ද්‍රව්‍යයන්ට පවා පුද සිරිත් පැවැත්විමෙන් ත්‍රිවර්ගසැපත් සිද්ධ වන්නාහ. මෙකිනාක් සියලු ගුණ ධර්මයෝ මැ ව්‍යවදාන පාක්ෂික විශුද්ධිය නිසාම ඇතිවූහයි සැලකිය යුතු. ඒ මේ විශුද්ධිය ඇති කරගත් සර්වඥරාජොත්තමයාණන්වහන්සේ දෙවි මිනිසුන් සහිත සත්ත්ව ප්‍රජාවට විසුද්ධි සම්පාදකොපාය දක්වා වදාළසේක. ඒ වූකලී ත්‍රිවිධ සම්පදාවන්ගේ වශයෙන් සලකා බලනවිට **"සත්වොපකාර සම්පද"** නමැයි දතයුතු.

එහි සත්වොපකාර සම්පදානම් කවරහ ? යත්:- **"සත්තූප කාරො පන ආසයපයොගවසෙන දුවිධො; තථා දෙවදත්තා දීසු විරොධිසත්තෙසු පි නිච්චං හිතජ්ඣාසයතා; අපරිපාක ගතින්ද්‍රියානං ඉන්ද්‍රියපරිපාකකාලාගමනඤ්ච; ආසයතොනාම"** යනුවෙන් උත්තමාධ්‍යාශ උත්තමවීර්‍ය්‍ය යන මොවුන්ගේ වශයෙන් සත්වොපකාර සම්පද තොමේ දෙවැදෑරුම් වන්නීයැ. ඔවුනතු රෙන් උත්තමාධ්‍යාශ නම් ලද 'ආශය සම්පදාව වූකලී තමහට ප්‍රතිවිරුද්ධ වූ දෙවදත්තාදීන් කෙරෙහි නිරන්තරයෙන් හිතාභි වෘද්ධිකාමී අදහස් ඇති බවද, එසේ මැ නොමුහු කළ ඉඳුරන් ඇත්තා වූ සත්වයන්ගේ ඉඳුරන් මුකරනතාක් කල් බලා සිටිමද, යන මේ යි

**"තදඤ්ඤ සත්තානං පන ලාභ සක්කාරාදි නිරපෙක්ඛ චිත්තස්ස ශාන්තතාය මුඛෙන සබ්බ දුක්ඛ නිය්‍යානික ධම්මදෙසනා පයොගො නාම"** යනුවෙන් ඉහතකී **දෙපක්ෂය** කෙරෙන් අන්‍ය වූ සත්වයන්ට ලාභසත්කාරාදියෙහි අපෙක්ෂාරහිත සිත් ඇති සර්වඥයන්වහන්සේගේ" ත්‍රිවිධ යානය (තිලකුණු) කාරණාකොට ගැනීම් වශයෙන් සියලු වෘත්තදුඃඛ නිර්ගමනයට හෙතුවූ ධර්මදෙශනා තොමෝ ප්‍රයොග සම්පදා නමු. මෙසේයින් සලකා බලනවිට අවිශෙෂයෙන් සියලු සත්ව වර්ගයා කෙරෙහි හිතානුකම්පා පරවශ වැ ඔවුන් සසර දුකින් ගොඩනගා විශුද්ධි සංඛ්‍යාත නිවන් මගට පමුණුවන අදහස් ඇති බව හා ඒ පිළිබඳ උත්සාහය සර්වඥයන්වහන්සේගේ "සත්වොපකාර සම්පදාවය" යි දතයුතු.

ඒ මේ සත්වොපකාරසම්පදා සංඛ්‍යාත ධර්මදෙශනා තොමෝ කෙබඳු වන්නීද ? යත්:- **"සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති"** යනුවෙන් දක්වන ලදහ. පාළි ත්‍රිපිටක ධර්ම සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍ය්‍යය හා ශික්ෂාත්‍රය සංගෘහීත මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය ද යන ශාසන මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවය ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තව ද අර්ථ ව්‍යඤ්ජන සහිතව ද සියල්ලෙන් සම්පූර්ණව ද පිරිසුදුව ද ප්‍රකාශකරණ බව සර්වඥයන් වහන්සේගේ දෙශනා සංස්ථිතියයි.

එහි ශාසන බ්‍රහ්මචර්‍ය්‍යය පිළිබඳ **"ආදිකල්‍යාණ, මධ්‍ය කල්‍යාණ, පර්‍ය්‍යවශාන කල්‍යාණ"** යන ත්‍රිවිධ කල්‍යාණය නම්:- සතරපද ගාථාවක ප්‍රථම පාදය ආදිකල්‍යාණ නමි. දෙවැනි තුන්වැනි පාදයෝ මධ්‍යකල්‍යාණ නමි. සිවුවැනි පාදය පර්‍ය්‍යවශාන කල්‍යාණ නමැ 'යි දතයුතු. එකානුසන්ධික සූත්‍රයෙහි "නිදානය-මධ්‍යය-නිගමනය," යන ස්ථානත්‍රයද, නානානුසන්ධික සූත්‍රයෙහි "ප්‍රථමානු සන්ධිය-මධ්‍යභාගය-අවශානානු සන්ධිය" යන ස්ථානත්‍රයද, ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තයහ 'යි දතයුතුයි. මේ මෙහි තාත් පර්‍ය්‍යාර්ථයි.

අවිශෙෂාර්ථ වශයෙන් වනාහි "සියලු පව් නොකටයුතු බව ආදිකල්‍යාණ නමි. සියලු කුශල් කටයුතු බව මධ්‍යකල්‍යාණ නමි. සිත පිරිසුදු කටයුතු බව පර්‍ය්‍යවශාන කල්‍යාණ නමැ 'යි දතයුතු. මෙහි ශීලයෙන් ආදියෙහි යහපත් බවද සමාධියෙන් මධ්‍යයෙහි යහපත් බවද ප්‍රඥාවෙන් අවශානයෙහි යහපත් බවද ඇඟවූහ.

විශෙෂාර්ථ වශයෙන් වනාහි විනය දේශනාවෙන් ශීලකථාව දක්වන ලද හෙයින් ආදිකල්‍යාණය ද සූත්‍රදේශනාවෙන් සමාධි කථාව දක්වන ලද හෙයින් මධ්‍යකල්‍යාණය ද පරමාර්ථ දේශනාවෙන් ප්‍රඥකථාව දක්වනලද හෙයින් පර්‍ය්‍යවසාන කල්‍යාණය ද ප්‍රකාශිතයි. පිටකයන්ගේ වශයෙනුදු මෙසෙයින් මැ සැලකිය යුතු

මාර්ග බ්‍රහමචර්‍ය්‍යය පිළිබඳ ත්‍රිවිධ කල්‍යාණය නම්:- එකී එකී කෙලශ ධර්මයක් පාසා "ව්‍යතික්‍රම අවස්ථාය, පරියුත්ථාන අවස්ථාය, අනුශය අවස්ථාය" යි අවස්ථා තුන තුන බැගින් ඇතිසෙති. එයින් ව්‍යතික්‍රම අවස්ථාව තදඞ්ග වශයෙන් දුරලීම ආදිකල්‍යාණ නම් පරියුත්ථාන අවස්ථාව විෂ්කම්භන වශයෙන් යටපත් කිරීම මධ්‍ය කල්‍යාණ නම්. අනුශය අවස්ථාව සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් මුල්සිඳීම පර්‍ය්‍යවසාන කල්‍යාණ නමැයි දතයුතු. මේ කියනලද්දේ තාත් පර්‍ය්‍යාර්ථ වශයෙනි.

අවිශෙෂාර්ථ වශයෙන් වූකලී "වාචා-කර්මාන්ත-ආජීව" යන මාර්ගාඞ්ග තුනින් ආදි කල්‍යාණ වූ පූර්වභාග ශීලයද, "ව්‍යායාම-ස්මෘති-සමාධි" යන මාර්ගාඞ්ග තුනින් මධ්‍යකල්‍යාණ වූ සමාධියද, "දිට්ඨි-සංකප්ප" යන මාර්ගාඞ්ගදෙකින් පර්‍ය්‍යවසාන කල්‍යාණ වූ ප්‍රඥවද දක්වන ලදහ. පූර්වභාගයෙහි හා මාර්ගක්ෂණයෙහි ලැබෙන මෙමැ ත්‍රිවිධ කල්‍යාණමය වූ ශික්ෂාත්‍රය කරණකොටගෙන කෙලශයන් පිළිබඳ ඉහතකී ත්‍රිවිධ අවස්ථාව මැ ප්‍රහාණ වන බව සැලකිය යුතුයි.

විශෙෂාර්ථ වශයෙන් වනාහි "ශීලමෙසජ" ආදියෙහි යහපත් බවද, "ශමථ-විදර්ශනා මාර්ග-ඵල" යන මෙයින් මධ්‍යයෙහි යහපත් බවද "නිර්වාණ" යෙන් අවසානයෙහි යහපත් බවද කියන ලදී. නොහොත් "ශීල-සමාධි" දෙකින් ආදිකල්‍යාණයද "විදර්ශනා-මාර්ග" දෙකින් මධ්‍යකල්‍යාණයද "ඵල-නිර්වාණ" දෙකින් (සොපාදිසෙස අනුපාදිසෙස නිර්වාණ ධාතුදෙක සඳහා) පර්‍ය්‍යවසාන කල්‍යාණයද ප්‍රකාශ කරනලදී. මෙසේ. දෙවැදෑරුම් බ්‍රහමචර්‍ය්‍යයන් පිළිබඳ ත්‍රිවිධ කල්‍යාණය සැකෙවින් කියා ඉක්බිති "අර්ථ ව්‍යඤ්ජන" සහිත බව දක්වනු ලැබේ.

"සංකාසන-පකාසන-විවරණ-විභජන-උත්තානිකරණ-පඤ්ඤත්ති"ති අත්‍ථපද සමායොගතො සාත්‍ථං; "අක්ඛර-පද-ව්‍යඤ්ජන-ආකාර-නිරුත්ති-නිද්දෙස" සම්පත්තියා ව්‍යඤ්ජනං 'යි කියනලද අර්ථපද ෂට්කයෙන් හා ව්‍යංජන පද ෂට්ක

ශයෙන් ද යන වාදස පදයෙන් යුක්ත වීම "අර්ථව්‍යඤ්ජන" සහිත බවය 'යි දතයුතුයි. මෙහි අර්ථපද ෂට්කයෙහි දක්වන ලද සංකාසනය යනු **"සංඛෙපෙන කාසනං දීපනං-සංකාසනං"** යි විග්‍ර බැවින් සැකෙවින් අර්ථය හැඟවීම සංකාස්න නම්. **"පඨමං කාසනං පකාසනං"** යනුවෙන් ප්‍රථමකොට දීපනය ප්‍රකාශන නම්. (මෙහි ප්‍ර යන උපසර්ගය ආදි කර්මයෙහි වේ ) මේ දෙපදය උද්දෙශ බැවින් තීක්ෂ්ණේන්ද්‍රිය පුද්ගලයන් සඳහා කියනලදී.

**සංඛිත්තස්ස විත්ථාරවචනං සංඛිත්තස්ස පුනවචනඤ්ච විවරණ විභජනානි"** යනු කී හෙයින් සැකෙවින් කියන ලද්ද හුගේ විස්තර වචනයද එක් වරෙක කිවහුගේ පුනර් වචනයද විවරණ විභජන නම්. මේ දෙපදය නිර්දෙශ බැවින් මධ්‍යමෙන්ද්‍රිය පුද්ගලයන් සඳහා කියන ලදී. "**විවටස්ස විත්ථාරතරාභිධානං විභත්තස්ස පකාරෙහි ඤාපනං විනෙය්‍යානං චිත්තපරිතොස නං උත්තානීකරණ පඤ්ඤාපනානි**" යනු කියනලද හෙයින් විවෘතය විස්තරකොට කීම උත්තානීකරණ නම්. විභක්තයාගේ ප්‍රකාරයෙන් ඥාපනය වෛනය ජනයන්ගේ චිත්තපරිතොෂණය ප්‍රඥපන නම්. මේ දෙපදය ප්‍රතිනිර්දේශ බැවින් මුදින්ද්‍රිය පුද්ගල යන් සඳහා කියනලදී. මෙකී සවැදෑරුම් අර්ථයෙන් යුක්තවීම සාර්ථ නම්.

ව්‍යඤ්ජන පද ෂට්කයෙහි යම් පදයක් උසුරුවන කාලයෙහි නොනිමියාවූ ඒ පදයෙහි ඊප්සිතාර්ථයක් නොහඟවන පදාවයව වූ වර්ණයක් හෝ අභිමතාර්ථයක් හඟවන එකාක්ෂර ශබ්දයක් හෝ අක්ෂරනම. බොහෝ අක්ෂර ඇති වැ අභිමතාර්ථය හැඟ වීමට පොහොසත් වූ විභක්ත්‍යන්ත අක්ෂරසමූහය පද නම. සංක්ෂෙප පද සමූහයකින් කියනලද අර්ථය පහළකරන වාක්‍යය ව්‍යඤ්ජන නම ඒ වාක්‍යය නොයෙක් ප්‍රකාරයෙන් විභාග කිරීම ආකාර නම· ඒ ආකාරයෙන් කියනලද අර්ථය නොහැරකීම නිරුක්තිනම. ඒ නොහැර කී අර්ථ විස්තරය නිරවශෙෂකොට දැක්වීම නිර්දෙශ නම. මෙකී සවැදෑරුම් සම්පත්තියෙන් යුක්තවීම සව්‍යඤ්ජන නමැ 'යි දතයුතු.

තවද මෙහි සවැදෑරුම් අර්ථ පදය හා සවැදෑරුම් ව්‍යඤ්ජන සම්පත්තිය එකවට මිශ්‍රකිරීම් වශයෙනුදු අර්ථ දතයුතු. එනම්:- භාග්‍යවතුන් වහන්සේ වනාහි ඇතැම් දෙශනාවක් අක්ෂරයෙන් සැකෙවින් දෙශනාකෙළේයැ. පදයෙන් පළමුකොට ප්‍රකාශ කොළේයැ. ව්‍යඤ්ජනයෙන් විස්තර කොළේයැ. ආකාරයෙන්

විසඤ්ජනය කෙළේයැ. නිරුක්තියෙන් හාත්පසින් විස්තර කෙළේයැ. නිර්දෙශයෙන් නිරවශෙෂකොට අර්ථය භගවා වදලේය යනුයි.

එපරිද්දෙන් මැ අක්ෂරයෙන් උද්ඝාටනය කොටැ උද්ඝටිතඥයන් පදයෙන් විනය නය කෙළේයැ. පදයෙන් විභාගකොට විපචිතඥයන් ආකාරයෙන් විනය නය කෙළේයැ. නිරුක්තියෙන් පමුණුවා ඥෙය පුද්ගලයන් නිර්දෙශයෙන් විනයනය කෙළේයැ. මෙසේ මේ ශාසන ධර්මය උද්ඝාටනය කරනුයේ උද්ඝටිතඥයන්ද, විභාග කරනුයේ විපචිතඥයන්ද, පමුණුවනුයේ ඥෙය පුද්ගලයන්ද විනය නය කෙළේ යැ. ඔවුනතුරෙන් උද්ඝාටනය ආදියෙහි යැ. විපචනය මධ්‍යයෙහි යැ. ප්‍රාපණය අන්තයෙහි යැ. මෙසේ කාලත්‍රයෙහි තෙපරිද්දෙකින් දෙසූ ත්‍රිවිධ දෙශයන් නසන්නාවූ ත්‍රිවිධ ගුණයන් එලවන්නාවූ මේ ශාසන ධර්මය ත්‍රිවිධ විනෙජනයන් විනයනය කරන හෙයින් ත්‍රිවිධ කල්‍යාණ වන්නේ යැ. ව්‍යංජන සහිත වන්නේය යි දතයුතු.

කෙවල පරිපූර්ණ පරිශුද්ධ පරිදි කියේයැ ? යත්:- එලවිය යුතුවූ හෝ බහාලිය යුතුවූ අර්ථයක් නැති බැවින් කෙවල පරිපූර්ණ වන්නේ යැ. පහකට යුතු කෙලශධර්මයකුදු නැති බැවින් පිරිසුදුවන්නේයැ. තවද ශීලාදි පංචවිධ ධර්මස්කන්ධයෙන් යුක්ත හෙයින් කෙවල පුරිපූර්ණවන්නේයැ. දෘෂ්ටි මානාදි උපකෙලශ විරහිත හෙයින්ද සසරදුකින් එතරවීම පිණිස පවත්නා හෙයින්ද තෘෂ්ණා නිශ්‍රයක් නැති හෙයින්ද ලොකාමිෂයෙහි නිරපෙක්ෂා හෙයින්දුයි යන මේ කරුණුවලින් පිරිසුදුවන්නේයැ.

මෙසෙයින් සලකා බලනවිට අප සම්බුද්ධ ද්‍යොතනමයාණන් වහන්සේගේ ශාසන ධර්මය ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත බවද අර්ථ ව්‍යංජන සහිත බවද සියල්ලෙන් සම්පූර්ණ බවද පිරිසුදු බවද වැටහෙනුදු මෙපමණකින් මෙහි තත්වාර්ථය නොවැටහෙන්නේමයැ. මේ වූ කලී නෙත්තිනයානුකූලවැ දතයුතුවේ. එසේවුවත් මෙහිදී එය විස්තර කිරීමෙන් අභිප්‍රෙතාර්ථය සිද්ධනොවන හෙයින් මුඛමාත්‍රයක් පමණක් දක්වම්හ:-

'ශබ්දනය-අලඞ්කා රනය-නෙත්තිනය" යන භෙදයන්ගේ වශයෙන් නයභෙදය ත්‍රිවිධවේ. එහි ශබ්දනය දූකලී උපචාර භෙදයෙන් දශවිධකොට දක්වූහ එනම්:- "එකාදෙසූපචාර

**සම්ඥූපචාර, ඨානූපචාර, ඨාන්‍යූපචාර, සදිසූපචාර, ගුණූප චාර, කාරණූපචාර, තද්ධම්මූපචාර, හෙතූපචාර, ඵලූපචාර"** යනුයි. මෙකී දසූපචාරයන්ගේ වශයෙන් සැලකියයුතු ශබ්දනය භෙදය එකී එකී ධර්ම දෙශනාවක් පාසා මැ ලැබෙන් කිසේයැ? යත්:- සර්වඥයන්වහන්සේගේ ධර්මදෙශනාවසරයෙහි හටගත් මනොද්වාරික විභූතාලම්බනයෙහි ප්‍රතීත භවාංගචලන මනොද්වාරාවර්ජන සත්ජවන්යුක්ත චිත්තවීථිගත ප්‍රථම ජවනචෙතනා තොමෝ **"ඒකදෙසූපචාර"** යැ. මනොද්වාරාවර්ජනය **"සම්ඥූපචාර"**යැ,. හෘදයවස්තුව' **'ඨානූපචාර"**යැ දෙශනාමය චෙතනාවට සහජාතනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යවන වේදනා, සංඥා, චිත්ත, යන ස්කන්ධත්‍රය **' ඨාන්‍යූපචාර"**යැ. සෙසු සංස්කාරයෝ **"සදිසූපචාර"**යැ. සර්වඥයන් වහන්සේගේ දෙශනාගුණසමංගිතාව **"ගුණූපචාර"** යැ. වාක්විඥප්තිය **"කාරණූපචාර"**යැ. මෙත්තා කරුණාදීහු **"ඵලූපචාර"**යැ. සර්වඥ ප්‍රඥප්තිය **"හෙතූපචාර"**යැ. විඥප්ති වර්ජිත චිත්තජරූපයෝද වස්තුරූප වර්ජිත කර්ම ඍතු ආහාරජ රූපයෝද **"තද්ධම්මූපචාර"**යැ. මේ කියන ලද්දේ ශබ්දනය භෙද මුඛ මාත්‍රයෙකි.

තවද **"වාචකනය, දර්ශිතනය, ප්‍රකාශනය, විභාවනය, දීපකනය, අනුභාවනය"** යි ෂට්විධ වූ ශබ්දනය භෙදාන්තරයකුදු ඇත. මෙහි වනාහි දෙශනා ධර්මයෙහි අර්ථවාචකත්වය **"වාචකනය"**යැ. එකී එකී අක්ෂරයන් පිළිබඳ මනසානුවර්ණානුස්මරණ විඥප්ති ජනක චෙතනාවෝ **"දර්ශිතනය"**යැ. එම චෙතනා සහජාතවූ ධර්මයන්ද අනන්තර ප්‍රත්‍යවූ චිත්තොත්පාදයන්ද ඔවුනට සහජාත පුරෙජාතාදී ප්‍රත්‍යවූ වස්තුරූපයද ප්‍රකෘති උපනිශ්‍රය වූ ධර්මයන් ද යන මොවුන්ගේ වශයෙන් **"දීපකනය"**යැ. මනසින් ව්‍යවස්ථිත වාක්භෙදය **"ප්‍රකාශනය"**යැ. ශ්‍රොතෘජනයාගේ ප්‍රසාද බාහුල්‍යය **"විභාවනය"**යැ. තමන්වහන්සේගේ විශාරදත්වය **"අනුභාවනය"**යැ. මෙසෙයින් සොඩෂවිධවූයේ දෙශනාමය ශබ්දනය භෙදය නමැයි දතයුතුයි.

පිටකත්‍ර ධර්මය පිළිබඳ අලඞ්කාරනය වනාහි **"භාවය, විභාවය, අනුභාවය"**යි භාවත්‍රිකයෙකින් හා **"ව්‍යංගය"** යන භෙදයකින්ද යුක්තවේ. එහි ව්‍යංගය පමණක් නැවත ත්‍රික ත්‍රිකයකින් භින්න වැ නවප්‍රකාර වේ. සර් සංග්‍රාහක වශයෙන් ත්‍රික චතුස්කයක් ඇති නිසා ද්වාදශ පදකොතෙක් වූහු. ඔවුනතුරෙන් ප්‍රථම භාවත්‍රිකයෙහි **"භාව"** යනු ලොකව්‍යවහාරානුකූල ස්වභාවිකොක්තියි=හෙවත් අවිද්‍යා තෘෂ්ණා කර්මොපාදානාදි හෙතු ප්‍රත්‍යයෙන් පවත්නා ස්කන්ධායතනාදීන්ට සම්මුති වශයෙන් පවත්නා

සත්ත්ව පුද්ගලාදි ව්‍යවහාරය යි. "**විභාව**" යනු සවභාවිකයට විරුද්ධාර්ථ කථනය යි හෙවත් සත්ත්ව පුද්ගල ව්‍යවහාරය හැර ස්කන්ධ ධාත්වායතනාදි අවිපරීතාර්ථය පැණවීම යි. "**අනුභාව**" යනු භාව විභාව දෙදෙනාගේ (සම්මුති පරමාර්ථ දෙකේ) අනුගමනයෙන් ප්‍රතිඵල ඇඟවීමෙහි සවාධීන ශක්තිය යි හෙවත් "පුරිසරූපං" යන මෙහි භාව විභාව දෙදෙනාගේ සංගතියෙන් රූපප්‍රාප්තියක් හැඟවීමයි.

ව්‍යංගාලංකාරයෙහි පැණෙන ත්‍රික ත්‍රිකය නම්:- "**වාච්‍ය, වාචක, මුඛ්‍යව්‍යාපාර**" යන වාච්‍ය ත්‍රිකය ද; "**ලක්ෂ්‍ය, ලාක්ෂණික, ලක්ෂණ ව්‍යාපාර**" යන ලක්ෂණ ත්‍රිකයද; "**ව්‍යංග, ව්‍යංජක, ව්‍යංජනව්‍යාපාර**" යන ව්‍යංග ත්‍රිකයද; යන මේයි. මෙකී ව්‍යංගාලඞ්කාර විසින් සූත්‍රාර්ථ පිරික්සනුවන් විසින් එකී එකී සූත්‍ර එකී එකී ත්‍රිකයන්ගේ වශයෙන් සැලකිය යුතුයි නිදර්ශණයක්.-

"මාතරං පිතරං හන්ත්වා රාජානො චෙව ඛත්තියො
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝොයාති බ්‍රාහ්මණො"

මව් පිය දෙදෙනාද් ඉක්ෂ්වාකුවංශික රජුන් දෙදෙනාද අයකැමියා සහිත රටද නැසූ බමුණු තෙමේ නිදුක්වූ නිවන් පුරට පැමිණි යනු මෙහි භාවයි. මේ වූකලී ආගම විරොධි වශයෙන් පැණෙතුදු ව්‍යංගාලඞ්කාරායතන වාච්‍යත්‍රිකයෙන් අර්ථ ගත් කල්හි අර්ථ ව්‍යංජන සහිත කෙවල පරිපූර්ණතායෙන් පිරිසුදුමයැ. එහි වාච්‍ය යනු කියනලද්ද හෝ අභිප්‍රෙතාර්ථය යි වාචක යනු කීම හෝ වක්තෘසංලාපයයි. මුඛ්‍ය ව්‍යාපාර යනු අභිප්‍රෙතාර්ථසාධක ව්‍යර්ථානුයොගය යි. එබැවින් මූලකී ගාථාව "මව් පිය රජ අයකැමි රට බමුණු" යන නාමයෙන් කී හෙයින් වාචකාලඞ්කාර යි. ඔව්හුම "තෘෂ්ණා අස්මි මාන ශාසවතොච්ඡෙද දෘෂ්ටි වාදශායතනනිශ්‍රිත නන්දිරාග බාහිතපාපික්ෂීණාශ්‍රව" යන අභිප්‍රෙතාර්ථයන් කියනලද හෙයින් වාච්‍යාලඞ්කාර යි. තෘෂ්ණාදීන්ගේ නැසීම පිණිස කටයුතු භාවනානුයොගිත්වය ව්‍යාපාරාලඞ්කාර යි. වාච්‍ය වාචක දෙදෙනා එකට යොද සංකීර්ණ වශයෙන් අර්ථගත් කලැ "තෘෂ්ණානමැති මවද අස්මිමානනමැති පියාද භවවිභවදෘෂ්ටිනමැති මහීපාලයෝදෙදෙනාද වාදශායතනනමැති අයකැමියාද නන්දිරාගනැමැති රටද සමුච්ඡෙද කල ක්ෂීණාශ්‍රව තෙමේ නිවන්පුර පැමිණේ" යන සුන්දරාර්ථයක් හැගේ. මේ ක්‍රමයෙන් වාදශවිධ අලඞ්කාරනයානුකූල වැ සූත්‍රාර්ථ

යන් ගවේශනය කට්‍යුතුයි. මෙසෙයින් සියලු ධර්මයම ත්‍රිවිධ කල්‍යාණතාදී ගුණයන්ගෙන් යුක්ත වන්නේය. මේ කියන ලද්දේ අලඞ්කාරනය විභාග මුඛ මාත්‍රයකි.

නෙත්ති නය භේදයෙහි "**හාරොපදෙශ, නයොපදෙශ, ප්‍රස්ථානොපදෙශ**" යන ත්‍රිවිධොපදෙශයක් දක්වන ලදී. එහි හාරොපදෙශය සොළොස් වැදෑරුම් වේ. නයොපදෙශය පංචප්‍රකාර වේ. ප්‍රස්ථානොපදෙශයෙහි අටළොස් මූල පදකෙනෙක් වෙති. ඔව්හු සංක්ලෙශ භාගිය වොදානභාගිය වශයෙන් විප්‍රකාරයහ සි දතයුතු.

"දෙසනා විචයො යුත්ති පදට්ඨානො ච ලක්ඛණො
චතුබ්‍යූහො ආවට්ටො විභත්ති පරිවත්තනො
වෙවචනො ච පඤ්ඤත්ති ඔතරණො ච සොධනො
අධිට්ඨානො පරික්ඛාරො සමාරොපනිනා සොළස"

යනුවෙන් හාරොපදෙශයෙහි ෂොඩෂවිධත්වය දක්වූහ. මෙහි දක්වෙන දෙශනාහාර විචයාහාරාදී ඒ ඒ හාරක්‍රමයන්ගේ උපදෙශයන්ගෙන් තද් තද් සූත්‍රාගත චතුස්සත්‍යයන් නිර්ධාරණය කොරෙමින් සූත්‍රාර්ථාවබොධය කරන පිළිවෙළ පැහැදිලිවේ.

"අස්සාද දීනවතා නිස්සරණම්පි ච ඵලං උපායො
ආණත්ති ච භගවතො යොගීනං දෙසනා හාරො.

යනුවෙන් දෙශනාහාරය කියනලදී එහි "**ආශ්වාදය, ආදීනවය, නිර්යානය, ඵලය, උපාය ය, අණත්තිය**" යි මෙකී පදෂට්කයන්ගේ වශයෙන් සූත්‍රාර්ථාවබොධය හෝ චතුස්සත්‍යයන් සපයා ගැනීම දෙශනාහාරය යි. මෙහි ආශ්වාද නම්:- ආරම්මණ රසාශ්වාදනය යි හෙවත් "සැප වේදනා, සොම්නස් වේදනා, ඉෂ්ටාලම්බන, තෘෂ්ණා, තෘෂ්ණාවිචරිත, චාශෂ්ටිදෘෂ්ටි" යන මොවුන්ගේ වශයෙන් අනෙකවිධ වූවද රසතෘෂ්ණාව මුල්වැ ආශ්වාදය ඇතිවන හෙයින් එය **සමුදය සත්‍යය** යි. ආදීනව නම් ත්‍රෛභූමක වෘත්තය යි. හේ වූකලී **දුඃඛ සත්‍යය** යී. නිර්යාන නම් වෘත්තදුඃඛනිර්ගමනය යි හේ **නිරොධසත්‍යය** යි ඵලනම් සුතමයඥාන චින්තාමයඥාන හෝ ඵලඥාන යි උපාය නම් මාර්ගාඞ්ග ධර්මයෝ යි හේ **මාර්ගසත්‍යය** යි. ආණත්ති නම් දන්දෙව! සිල් රකුව! යනාදි විධානය යි. මෙසේ යම්කිසි සූත්‍රයක ආශ්වාදාදීන් අතුරෙන් යමක් ඇතිකලැ එය මුල්කොට චතුස්සත්‍යය ධර්මය

උපුටාගැනිම් වශයෙන් අර්ථාවබොධය කරන ක්‍රමය දෙශනා හාරය යි. ඒසේ නොලැබෙතොත් සෙසු හාරක්‍රමවලින් සැලකිය යුතුයි. මේ මේ සූත්‍ර කිනම් කිනම් හාරක්‍රමයන්ට ඇතුළත්කර වදාළෝද? යනුවෙන් පරීක්‍ෂාකොට අර්ථ දතයුතුයි. සෙසු හාර ක්‍රමයන් පිළිබඳ ගාථා උදාහරණාදිය දැක්වීමෙන් විස්තරකිරීම දීර්ඝවන හෙයින් ඉතා සංක්‍ෂෙපමුඛයෙන් දක්වනු ලැබේ.

**විචයහාරය**=යනු ප්‍රශ්න ව්‍යාකරණ පූර්වාපරානුගීති ආශ්වාද ආදීනව නිර්යාන ඵලොපායාණත්ති යන ලක්‍ෂණයන්ගේ වශයෙන් වදාළ ධර්මය යි. **යුක්තිහාරය**=යනු ශබ්දාර්ථ දෙදෙනාගේ යුක්තායුක්ත භාවය වෙන්කොට වදාළ ධර්මය යි **පදස්ථානහාරය**=යනු මේ ධර්මය මීට ආසන්නය යි අන්‍යොන්‍ය ආසන්න ධර්මයන් වෙන්කොට වදාළ ධර්මය යි. **ලක්‍ෂණහාරය**=යනු සූත්‍රයෙහි නො ආවාවූ ධර්මයන් ආවුන්සේ පැමිණිපදයකින් ලක්‍ෂණීකෘත්‍ය හෙතුඵල විසින් සමකොට වදාළ ධර්මය යි. **චතුබ්‍යූහ හාරය**=යනු නිරුක්ති අභිප්‍රාතිධානපූර්වාපරසන්ධි යන සතරාකාරයෙන් යුක්තකොට වදාළ ධර්මය යි. **ආවර්තහාරය**=යනු සභාග විසභාග පදස්ථාන යෙන් පෙරළා වදාළ ධර්මය යි. **විභක්ත්‍යාහාරය**=යනු සංක්ලෙශ ව්‍යොදාන ධර්මයන් සාධාරණාසාධාරණ විසින් ද භූමිවශයෙන්ද පදස්ථාන වශයෙන්ද විභාගකොට වදාළ ධර්මය යි. **පරිවර්තන හාරය**=යනු කුශලාකුශල ධර්මයන්ගේ අන්‍යොන්‍ය විරුද්ධය හැ ගෙන සේ පෙරලා වදාළ ධර්මය යි. **වෙවචන හාරය**=යනු එක එකවචනය පර්‍යාය වචනයන්ගේ වශයෙන් බොහෝ පරිද්දෙන් බෙද වදාළ ධර්මය යි. **ප්‍රඥප්තිහාරය**=යනු එක ධර්මයක් විවිධ ප්‍රඥප්තීන්ගේ වශයෙන් බෙදා වදාළ ධර්මය යි. **ඔතරණහාරය**=යනු ස්කන්ධ ධාත්වායතනාදීහු ප්‍රතීත්‍යසමුත්පාදයන්ගේ වශයෙන් බහා අර්ථාවබොධය වන පරිදි වදාළ ධර්මයයි. **ශොධනහාරය**=යනු ප්‍රශ්න ව්‍යාකරණ ආරම්භ යන මොවුන්ගේ වශයෙන් අර්ථ හඟවා වදාළ ධර්මය යි **අධිෂ්ඨාන හාරය**=යනු සාමාන්‍ය විශෙෂ යන්ගේ ලක්‍ෂණ හෙතුවින් නිර්ධාරණයකොට වදාළ ධර්මය යි. **පරික්ඛාර හාරය**=යනු හෙතුප්‍රත්‍යයන්ගේ වශයෙන් වෙන්කොට වදාළ ධර්මය යි. **සමාරොපන හාරය**=යනු පදස්ථාන වෙවචන භාවනා පහාණ යන මොවුන්ගේ වශයෙන් අර්ථ හඟවා වදාළ ධර්මය යි. මෙසේ සර්වඥයන් වහන්සේ විසින් ඒ ඒ පුද්ගලයන් ගේ අදහස් පරිද්දෙන් සලකා ඔවුනට චතුස්සත්‍යාවබොධය වන අයුරින් හාරක්‍රම සොළසක්වැ විභාගකොට ධර්මය දෙශනා කරන ලද්දහ.

පංචප්‍රකාර වූ නයෝපදෙශය කවරහ ? යත්:– “**නන්‍ද්‍යාවත්තන්‍යාය, තිපුක්ඛලන්‍යාය, සීහවික්කීළිතන්‍යාය, දිශාවිලොචනන්‍යාය, අංකුශන්‍යාය**” යන මොහු වෙත්. එහි නන්‍ද්‍යාවත්තන්‍යාය නම්:– තෘෂ්ණා අවිද්‍යා, දෙකින්, සංක්ලෙශ පාක්ෂික සූත්‍රාර්ථය ද සමථවිදර්ශනා දෙකින් ව්‍යවදාන පාක්ෂික සූත්‍රාර්ථයද චතුරාර්‍ය්‍ය සත්‍යයන් හා යුක්තකොට අර්ථ දැනගන්නා ක්‍රමය යි. තිපුක්ඛල න්‍යාය නම්:– ත්‍රිවිධ අකුශල මූලයන්ගෙන් හා ත්‍රිවිධ කුශල මූලයන්ගෙන් සංක්ලෙශ ව්‍යවදානත්වය සලකා චතුරාර්‍ය්‍ය සත්‍යයන් උද්ධරණය කරන්නාවූ ක්‍රමය යි. දිශාවිලොචනන්‍යාය නම්:– කුශලාදී ධර්මයන් යටකී න්‍යාය පරිදි සලකා චතුරාර්‍ය්‍ය සත්‍යයන් දැනගන්නා ක්‍රමයයි. අංකුශන්‍යාය නම්:– සමෘති ආදීන් උපනිශ්‍රයකොට යටකී න්‍යාය ලක්ෂණයෙන් කී පරිදි අර්ථාවබොධන ක්‍රමය යි. මෙහි සඳහන් දිශාලොචන අංකුශ යන න්‍යායදෙක යටකී ත්‍රිවිධ න්‍යාය පරිඥනයට ඉවහල් වශයෙන් පවත්නා බව “**ද්වයං තිණ්ණං නයානං සිද්ධාය වොහාරනයමග්ග මෙව හොති**” යනුවෙන් දක්වන ලදී. මේ කියනලද්දේ නයොපදෙශය පිළිබඳ අති සංක්ෂිප්ත වූ විස්තරාංශුවකැයි දතයුතු යි.

ප්‍රස්ථානොපදෙශය පිළිබඳ අටළොස් මූලපදයෝ නම්:– **තණ්හා– අවිජ්ජා– ලොභො– දොසො– මොහො– සුභසඤ්ඤා– සුඛසඤ්ඤා– නිච්චසඤ්ඤා– අත්තසඤ්ඤා**” යන අකුශලමූල පද නවයෙක. “**සමථො– විපස්සනා– අලොභො– අදොසො– අමොහො.– අසුභසඤ්ඤා– දුක්ඛසඤ්ඤා– අනිච්චසඤ්ඤා– අනත්තසඤ්ඤා**” යන කුශල මූල පද නවයෙක. මෙකී අකුශල මූල පදයන්ට සියලු අකුශලයෝද කුශල මූලයන්ට සියලු කුශලයෝද දුකත්‍රික චතුෂ්කයන්ගේ වශයෙන් ඇතුළත් වෙති. අතිරික්තයො ආරම්මණූපනිශ්‍රයාදී වශයෙනි. මෙහි කී අකුශල පක්ෂයෙන් සංක්ලෙශිකත්වය ද කුශල පක්ෂයෙන් පරිශුද්ධිකත්වය ද තදංගාදීන්ගේ වශයෙන් ප්‍රහාණිකත්වය ද අභවා වදාළ ශාස්ත්‍ර ශාසනය ප්‍රස්ථානොපදෙශය යි

යථොක්ත ත්‍රිවිධොපදෙශානුකූලවැ ඒ ඒ වෛනය ජනයන්ගේ විනයනය සඳහා වදාළ ධර්මය හෙවත් අනුශාසනාව සොළොස් වැදෑරුම් වෙති, හේ මෙසෙයින් සැලකිය යුතුයි. “සංක්ලෙශභාගිය සූත්‍රයැ, වාශනාභාගිය සූත්‍රයැ, නිර්වේදභාගිය සූත්‍රයැ, අශෛක්ෂභාගිය සූත්‍රයැ, සංක්ලෙශවාශනාභාගිය සූත්‍රයැ, සංක්ලෙශනිර්වේදභාගිය සූත්‍රයැ, සංක්ලෙශඅශෛක්ෂභාගිය සූත්‍රයැ, සංක්ලෙශනිර්වේදඅශෛක්ෂභාගිය සූත්‍රයැ, සංක්ලෙශවාශනානිර්වේදභාගිය

සූත්‍රයෘ, වාශනානිවේදහාගිය සූත්‍රයෘ, තෘෂ්ණාසංකෙලශභාගිය සූත්‍රයෘ, දෘෂ්ටි සංකෙලශ භාගිය සූත්‍රයෘ, දුශචරිතසංකෙලශභාගිය සූත්‍රයෘ, තෘෂ්ණාවොදතභාගිය සූත්‍රයෘ, දෘෂ්ටිවොදතභාගිය සූත්‍රයෘ, දුශචරිත වොදත භාගිය සූත්‍රයෘ" යන මේයි.

මේ ක්‍රමයෙන් සලකා බලනවිට සර්‍වඥභාෂිතයාගේ ව්‍යංජන පද විභාග හා අර්ථ විභාග පරිඥනය සඳහා සොඩෂවිධ ශබ්දනය කෙනෙක්ද, වාදශවිධ අලඞකාර නය කෙනෙක් ද, ත්‍රයත්‍රිංශත් නෙත්තිනය කෙනෙක් ද, අඨාරස මූලපද කෙනෙක් ද සොඩෂවිධ සූත්‍රවිභාගයක් ද'යි යන මේ පසාත්‍ර නය විභාගයක් දක්වෙනා හෙයින් තදනුකූල පිරික්ෂණයෙහි ලා බලනුවනට බුඩ භාෂිතය ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත බවද, අර්ථව්‍යඤ්ජන සහිත බවද, සියල්ලෙන් සම්පූර්ණ බවද, පිරිසුදු බවද, වැටහෙන්නේයෘ.

එබැවින් මෙකීතාක් සියලු ගුණ ධර්මයෝ විශුඩිය හෙතු කොට ගෙන ලබාගත් බව ද, ඒ විශුඩියෙන් යුත් සර්‍වඥයන් වහන්සේ විසින් දෙවි මිණිසුන් සහිත සකල සත්ව වර්‍ගයාහට විශුඩි සම්පාදක උපාය දක්වා වදාළ බවද, මෙතෙහි කොට විශුඩිය කැමති සකල සත්පුරුෂ සාධු ජනයන් විසින් මෙහි පහත දක්වන ශීලවිශුඩි ආදී සප්තවිශුඩීන් දැන ඉගෙන තදනුකූල පිළිවෙත් පිරිමෙන් බුඩාදි මහොත්තමයන්වහන්සේලා විසින් ප්‍රත්‍යක්ෂකර වදාළ විශුඩිසංඛ්‍යාත අමෘත මහා නිර්‍වාණසම්පත් සිඩ කටයුත්තාහුය.

ගුණරතන ප්‍රණීත විශුඩි දීපිකා නම් ලද ධර්මප්‍රකරණයෙහි උද්දෙශ පරිකථා නම් ප්‍රථම පරිච්ඡේදය නිමි.

## ශීල විශුඩිය.

මූලං සබ්බගුණානං
කායවචීසඤ්ඤමො යතතෙනා ති
චතුපාරිසුඩිසීලං
සීලවිශුඩි' ති කිත්තයි භගවා.

**කිංසීලං? කෙනඨෙන සීලං? කානස්ස ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානි? කිමානිසංසං සීලං? කතිවිධ ඤ්චෙතං සීලං? කොචස්ස සඞකිලෙසො? කිං වොදනානි? තත්‍රිදං විසජ්ජනං:-**

**විශුද්ධි දීපිකා** නම් ලද මෙ මැ ධර්මප්‍රකරණයෙහි මවිසින් කියනු ලබන සප්ත විශුද්ධීන් අතුරෙහි ආදියෙහි දැක්විය යුතු "**ශීලවිශුද්ධිය**" සඳහා මූල කී අර්ථකථා පාළිය උපන්‍යාස කරන ලද්දෙමි. එහි ස්වරූප වශයෙන් ශීලය නම් කුමක් ද? කවරාර්ථයකින් ශීලනම්වේ ද? මේ ශීලයාගේ ලක්‍ෂණ කෘත්‍ය වැටහෙන ආකාර ආසන්නකාරණ යන මොහු කවරහු ද? මේ ශීලය කුමක් අනුසස් කොට ඇත්තේ ද? මේ ශීලයාගේ ප්‍රභේද කොතෙක් ද? මොහුගේ කෙලෙසීම කවරේ ද? පිරිසුදු භාවය කුමක්ද? යන මේ ප්‍රශ්න විසඳීම් වශයෙන් විස්තර දක්වම්හ.

**"කිං සීලන්ති පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිවත්තිං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා"** යන මෙහි ශීලය නම් කුමක් ද? යත්:- ප්‍රාණවධාදි අකුශලයන්ගෙන් සමාදාන විරති සම්ප්‍රාප්තවිරති වශයෙන් වළකින්නහුගේ හෝ ආචාර්ය්‍යඋපාධ්‍යායාදි වත් පිළිවෙත් පුරන්නහුගේ හෝ චේතනාදි ධර්මයෝ ශීලනම්. මෙහි ආදි ශබ්දයෙන් අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යක් දෘෂ්ටිහු ගැණෙත්. එබැවින් කුශල චිත්ත සම්ප්‍රයුක්ත විරති චේතනාව මුඛ්‍ය වශයෙන් ශීලය යි දක්වන ලදුත් ඒ මේ විරති චේතනාතොමෝ සම්ප්‍රාප්තවිරති සමාදානවිරති සමුච්ඡේදවිරති වශයෙන් ත්‍රිවිධවූවාද ලෝකොත්තර මාර්ගචිත්තක්‍ෂණයෙහි ලැබෙන සමුච්ඡේදවිරතිය මේ අවධියෙහි නොගැණෙන හෙයින් අතිරික්තයන්ගේ වශයෙන් කරුණු දක්වනු සඳහා **"අසමාදින්න සික්ඛාපදානං අත්තනො ජාතිවයබාහුසච්චාදීනි පච්චවෙක්ඛිත්වා අයුත්තං අම්හාකං එවරූපං පාපං කාතුන්ති සම්පත්තං වත්ථුං අවීතික්කමන්තානං උප්පජ්ජමානා විරති සම්පත්තවිරති"**යනාදිය කීහු. ශික්‍ෂාපද සමාදානයක් නැති කල්හිදු තමන්ගේ ජාතිගොත්‍රාදිය සලකා මා වැනි ජාතිසම්පන්න වයොවෘද්ධ ප්‍රඥසම්පන්න වූ වෙකුට මෙබඳු පව්කම් කිරීම නුසුදුසුය යි වෙනැ පැමිණි අකුශලයෙන් තුරන් වන විට උපදනා විරතිය "සම්ප්‍රාප්තවිරති" නම්. ඔහුගේ වශයෙන් අකුශලයන් කෙරෙන් වෙන්වීම මේ මතු දැක්වෙන කථාප්‍රවෘත්තියෙන් පැහැදිලි වේ:- මේ ලක්දිවැ **චක්කන** යන නමින් උපාසකයෙක් සිටියේය. ඔහු බාල කාලයෙහි ස්වකීය මෑණියන්ට දරුණු රෝගයක් උපන. ඒ රෝගයට ප්‍රතිකාර සඳහා අමුහාමස් වුවමණා බව වෙදෙකු විසින් කියන ලදුව "චක්කනය! තෙපි හැල්කෙතට ගොස් සාවෙකු අල්වා ගෙන එවයි" කී වැඩිමහල්ලාගේ නියෝගය ලැබ තෙමේ හැල්කෙත රැකවල් ගෙන සිටිනාතර සමීපයෙහි

සිටි සාවෙකු දක ප්‍රීතින් පිනාගොස් පසු පස්සෙහි ලුහු බඳනා ලද්දේ මරණ භයින් බියපත් වැ වේගයෙන් පැනයන සාවා ලතා ප්‍රතානයක පටලැවී "කිරිකිරි" යන ශබ්දයෙන් හැඬීය. එකල්හි චක්කන තෙමේ එකී ශබ්දානුසාරයෙන් ගොස් අනාථ වූ ඒ සාවා අල්වා ගෙන සිතනුයේ අහෝ !! මේ සාවාගේ ජීවිතය මම කෙසේ නම් තොර කෙරෙම් ද? මොහුගේ ජීවිතයත් ජීවිතයැ. මෑණියන්ගේ ජීවිතයත් ජීවිතයැ. මොහුගේ දිවි නසා මෑණියන්ගේ දිවි ගලවා ගැන්ම මා වැන්නෙකුට කෙසේනම් තරම් වේදැ යි සිතත් සිතත් මැ මෛත්‍රී සහගත සත්ව කරුණාව පහළ වැ "තෙපි යව, කැමති පරිද්දෙන් වනයෙහි හැසිර ජීවත්වෙව" යි පිය තෙපුල් පවසා සාවා මුදා හැරියේයැ. එක්බිති චක්කන තෙමේ ලස් නොවී හිස් අතින් ගෙට අවුත් සන්තොසින් සොහොයුරු වෙතැ පැමිණ තමා කළ ඒ පුවත් සියල්ලම නොවළහා කියේ යැ. ඒ බසින් උරණවූ සොහොයුරු රළු වදන් තෙපලමින් තෙපි කෙලේ අපට වත් නොපටවත් මවටවත් හිත පිණිස නොපවතින හිස් වූ නිෂ්ඵල වැඩෙකැ" යි දෙස් නැගූකල්හි ශොක යෙන් පීඩිත වැ රෝගයෙන් වැතිර හුන් මෑණියන් වෙතේ සිට මෙතේ ගුණ පතුරුවා මෙසේ සත්‍යක්‍රියා කෙළේ යැ:- අම්ම මෑණියෙනි ! ඔබ කුසින් බිහිවූ කල්තැන් පටන් මේ වනතෙක් මම ප්‍රාණවධ කළ විරූ බවක් නොදනිමි. ඒ මේ සත්‍යය කාරණ කොට ගෙණ රෝගී වූ ඔබ නිරෝගි වන්නැ යි කියනවත් සමග මැ මෑණියෝ නිරෝගි වූ වායූ.

මෙසේ සම්ප්‍රාප්තවිරතිය දක්වා තදනන්තරවැ "සමාදාන විරතිය" දක්වන අටුවාචාරීන් වහන්සේ **"සමාදින්න සික්ඛාපදානං පන සික්ඛාපදසමාදානෙච තතුත්තරිම අත්තනො ජීවිතං පරිච්චජිත්වා වත්ථුං අවීතික්කමන්තානං උප්පජ්ජමානා විරති සමාදානවිරති"** යනු කීහු. ශික්ෂාපද සමාදන් වූවෙකුට ඒ ඒ ශික්ෂාපදයන් වාක්භෙදයෙන් සමාදන්වන ඇසිල්ලෙහි මේ මේ අකුශලයන්ගෙන් වළකිමි යි සිතනවිට උපදනා විරතිය ද ශික්ෂා පදසමාදානයෙන් මත්තෙහි මාගේ දිවි පුදන්නේ නමුදු ශික්ෂා පද ව්‍යතික්‍රමණය නොකරමි යි සිත්නුවනට උපදනා විරතියද "සමාදාන විරති" නමි. ඒ බව මේ මතුදක්වන කථා ප්‍රවෘත්ති යෙන් දත හැකි වේ:- දඹදිවැ උත්තරවඩ්ඪමාන පර්වතාසන්න යෙහි වසන්නා වූ එක්තරා උපාසකයෙක් රත්නත්‍රයෙහි මමත්වය ඇතියේ එක් දිනක් අම්බරිය විහාර වාසී පිඩගල බුද්ධරක්ඛිත ස්ථවිරයන් සමීපයෙන් පන්සිල් සමාදන්වැ ගෙන කුඹුරක් සාමින්

සිට අනන්තයෙහි මුදුහළ ගෝන්ගෙය නැතිසේ දැකැ ඒ මේ අනැසොයනුයේ උත්තරවර්ධමාන පර්වතය මුදුනට පැමිණියේ යැ. එහිදී ඔහු පිඹුරෙකුට අසුවී භොගාවලීන් වෙළුන කල්හි නොඉවසිය හැකි වේදනාවෙන් පීඩිත වැ අතෙහි වූ ශස්ත්‍රයෙන් මූ නසාලියම් දෝ හෝ යි සිතනුවත් සමග මැ එදවස් සමාදන් වූ ශීලය සිහිපත් විය. එක්බිති ශික්ෂාගරුත්වය ඇති උපාසක තෙමේ මූ මරා ශික්ෂාපද ව්‍යතික්‍රමණය නොකරමි සි සිතා නිශ්ශබ්ද වූ නමුත් පිඹුරා නිශ්ශබ්ද නොවී වඩ වඩාත් වෙළන්ට වන. එවිටද වධක චෙතනාව උපන් නමුත් ශීලභෙදයක් වේදෝ යන බියෙන් නිශ්ශබ්දවිය. තුන්වැනි වාරයෙහිද අධික වේදනාවෙන් පීඩිත වැ වධක චෙතනාව උපන් කල්හි අධිවාසනක්ෂාන්තියෙන් යුක්ත වැ "සිතනුයේ:-" මට තෙවරක් වධක චෙතනාව ඉපදීමට මේ ශස්ත්‍රය ම හෙතුවිය. එබැවින් මූ මා මරන්නේ නමුදු මවිසින් මූගේ දිවි නොරකිරිම නොකටයුතුය යි අතෙහි තුබූ ශස්ත්‍රය වනමැදට දමා ගැසීයැ. එකෙණෙහි ඔහුගේ කාරුණා පූර්ණ ශිල තෙජසින් නැතිගත් පිඹුරා ඔහු මුදාහැර ඉවතට පලාගියේයැ මෙසේ ස්වකීය ජීවිතයටත් වඩා සමාදන් වූ ශීලය මැ ගරුකොට අකුශලයෙන් වෙන්වීම සමාදාන විරතිය'සි දත යුතු,

ප්‍රතිසම්භිදා මාර්ගයෙහි "**චෙතනා, චෛතසික, සංවර, අවිතික්‍රම**"යන සතරට ශීල යන නාමය කීහ. එහි යොනිසොමනස්කාරාදියෙන් යුක්තවූවෙක් ශීලය සමාදන්වූයේ හෝ නොවූයේ දස අකුශල කර්ම පථයෙන් වලකිනවිට උපදනා කුශලචිත්ත විථියෙහි සත් ජවන්යුක්ත චෙතනාවෝ "චෙතනා ශීල" නම්. ඒ සිත හා සමග පවත්නා අනභිධ්‍යාදීහු "චෛතසික ශීල" නම්. ප්‍රාතිමොක්ෂාදි පංචවිධ සංවරය "සංවරශීල නම්. කායවචී සඤ්ඤමය "අවිතික්‍රමශීල" නම් වෙති පංචවිධ සංවරයෝ නම්:- සප්තාපත්තිස්කන්ධයට ඇතුළත් විනය ශික්ෂාවෝ=ප්‍රාතිමොක්ෂසංවරයැ, චක්ෂුරාදි ෂඩින්ද්‍රිය සංවරණය=සතිසංවරයැ. තෘෂ්ණාදෘෂ්ට්‍යාදි කෙලශයන්ගේ මුල්සිඳින මාර්ගඥානය-ඥානසංවරයැ ඉවසීම් වශයෙන් පවත්නා අවෛෂය ප්‍රධානකොට ඇති ක්ෂාන්තිය=ක්ෂාන්තිසංවරයැ, කාම විතර්කාදීන් දුරුකරන සම්ප්‍රයුක්ත වීර්යය=විරිය සංවරයැ යන මොහු වෙත්.

මූල කී ක්‍රමයෙන් උපදනා සම්ප්‍රාප්ත සමාදාන විරතීහුද වත් පිළිවෙත් පුරන්නහුගේ තත් තත් කෘත්‍ය සාධක චෙතනාවෝද ප්‍රතිසම්භිදා ක්‍රමයෙහි දැක්වෙන චෙතනා චෛතසික සංවර අවිතික්‍රම යන මොව්හුද ශීලය සි දතයුතු සි.

**කෙනඨෙන සීලනති සීලනඨෙන සීලං. කිමිදං සීලනං නාම සමාධානං වා කායකම්මාදීනං උපධාරණං වා කුසලානං ධම්මානං"** යනුවෙන් කවරාර්ථයකින් 'ශීල නම් වේද? යත්:- ශීලනාර්ථයෙන් ශීලනමැයි කීහ. මෙහි කී ශීලනාර්ථය නම්:- කාය කර්මාදීන් මොනවට පිහිටුවීම හෝ කුශලධර්මයන්ට ආධාර භාවය හෝ යි ශීලශබ්දයෙහි පිහිටීම් දැරීම් යන අර්ථයක් ඇති බැවින් ශබ්ද ශාස්ත්‍රඥයෝ ඊට ශීලනාර්ථය'යි කියති. එහි පිහිටීම් අර්ථයෙන් ශීල පරිදි කිසේ යැ? යත්:- කායාදිවාරත්‍රය මොනවට පිහිටුවා ගැනීම හෝ විසිර නොයාදී පවත්වා ගැනීම හෙවත් ඒ ඒ ශික්ෂා අණපනත්හි පිහිටීමය' යි දතයුතු. දැරීම් අර්ථයෙන් ශීලය නම්:- සමථ විදර්ශනාදී ඒ ඒ කුශලධර්මයන් රැස්කිරීමට ශීලය ආධාරස්ථාන වන බැවින් ඔවුන්ගේ දැරීම ශීලයෙන් සිඬවේතු'යි දැරීම් අර්ථයෙනුදු ශීලය'යි දතයුතුයි.

———:———

**"කානස්ස ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානීති? සීලනලක්ඛණං සීලං, දුස්සීල්‍ය විද්ධංසන රසං, සොචෙය්‍ය පච්චුපට්ඨානං; හිරොත්තප්ප පදට්ඨානං."** ශීලයාගේ ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය පදස්ථානය යන මොහු කවරහුද? යත්:- කායාදි වාරත්‍රය නොවිසිර පැවැත්ම හා ලොවි ලොවිතුරා කුශලධර්ම යන්ට ආධාර සවභාවය ශීලයාගේ ලක්ෂණය යි. දුශ්ශීල භාවය නැතිකිරීම හා නිරවද්‍යතාව ශීලයාගේ රසය යි. (කෘත්‍යය හා සම්පත්තිය රසය යි කී නියා යි) ත්‍රිවිධවාරයාගේ පිරිසුදු බව වැට හීම ශීලයාගේ ප්‍රත්‍යුපස්ථාන යි. (එළඹ සිටීමයයිසේයි) හිරිඔතප් දෙක ශීලයට ආසන්න කාරණා යි. ඒ එසේ මැයි=පවට බිය ලජ්ජා ඇතිකල්හි මැ ශීලය උපදනේ ද පිහිටා සිටිනේ ද වෙයි. හිරි [illegible] නැති කල්හි නූපදනේ ද නොපිහිටා සිටිනේ ද [illegible] ඔවුහු ශීලසංරක්ෂණයෙහි ප්‍රාකාරප්‍රතිභාගයහ.

————————

**"කිමානිසංසං සීලනති අවිප්පටිසාරාදි අනෙකගුණ පටිලාභානිසංසං."** ශීලය කුමක් අනුසස් කොට ඇත්තේ ද? යත්:- [illegible] අනෙක ගුණ ධර්මයන්ගේ ප්‍රති ලාභය අනුස්ස් කොට ඇත්තේ යැ. ඒ එසේමැයි. ශීලසංවරය විපිළිසර නොවීම පිණිස ද, විපිළිසර නොවීම ප්‍රමොද්‍යය පිණිස ද, ප්‍රමොද්‍යය ප්‍රීතිය පිණිස ද, [illegible] ප්‍රශ්‍රබ්ධිය (සන්සිඳීම) පිණිසද, ප්‍රශ්‍රබ්ධිය සැප පිණිස ද, [illegible] නාමරූප පරිග්‍රහයෙන් පෙරවූ ක්ෂණිකසමාධි [illegible] සමාධිය පිණිස ද. සමාධිය යථාභූතඥාන දර්ශනය "හෙවත් සප්‍රත්‍ය නාමරූප දර්ශනය හා තරුණ විදර්ශනාව

පිණිස ද, යථා භූතඥාන දර්ශනය නිර්වේදය හෙවත් ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනාව පිණිස ද, නිර්වේදය විරාගය හෙවත් මාර්ගඥානය පිණිස ද, විරාගය විමුක්තිය හෙවත් අර්හත් ඵල විමුක්තිය පිණිස ද, විමුක්තිය විමුක්තිඥාන දර්ශනය හෙවත් ප්‍රත්‍යවේක්ෂාඥානය පිණිස ද, විමුක්තිඥාන දර්ශනය අනුපාදා පරිනිර්වාණය හෙවත් භවොත්ප ත්තිය නොගෙන සකන්ධ පරිනිර්වාණය පිණිස ද, පවත්නේ යැ. එබැවින් අනුසස් වශයෙන් මෙහි කියනලද කාරණයන්ගේ පරම්පරෙප නිශ්‍රය (එකිනෙකට උපකාරවීම) අර්හත්ඵල විමොක්‍ෂ යම ප්‍රයොජන කොට ඇත්තේය යි දතයුතු යි. තවද මේ ශීල ය ආනිශංසකථනයෙහි වාර ප්‍රතිභාගයක යි කිවද මෙහිදී සවිප්‍ර කාරයෙන් විස්තරකිරීම අනභිමත හෙයින් අන්‍යතර ආනිශංස කෙනෙකුදු අති සංක්‍ෂෙප මුඛයෙන් දක්වම්හ. '**සීලාලඞ්කාර සමො අලඞ්කාරො නත්ථි සීලගන්ධසමො ගන්ධො නත්ථි සීලසමං කිලෙසමල විසොධනං නත්ථි සීලසමං පරිළාහූපසමනං නත්ථි සීලසමං කිත්තිජනනං නත්ථි සීලසමං සග්ගාරොහන සොපානං නත්ථි නිබ්බාණ නගරපවෙසනෙ තව සීලසමං ද්වාරං නත්ථී'ති,,** ශීලාලඞ්කාරයට සමවූ අලඞ්කාරයකුදු නැත, ශීලගන්ධයට සමවූ සුගන්ධයකුදු නැත, ශීලයට සමවූ කෙලශමල විශොධනයකුදු නැත (කෙලෙස්මල බැහැරලීමයයිසේයි). ශීලයට සමවූ කෙලෙස් ගිනි නිවීමකුදු නැත, ශීලයට සමවූ කීර්ති ජනනයකුදු නැත (කීර්ති සම්භවය යිසේ යි), ශීලයට සමවූ දෙව්ලෝ නගින හිනි පෙති පෙළකුදුනැත, ශීලයට සමවූ නිවන්පුර වදනා වාරයකුදු නැතැයි කී හෙයින් යථොක්ත ගුණ ප්‍රබන්ධයෙහි රැන්නා සකල සාධු ජනයන් විසින් ශීලපාලනය මැ කටයුත්තා හුය.

## ' මධුරත්ථ විලාසිනී '

සීලං සුඛානං පරමං නිදානං
සීලෙන සීලී තිදිවං පයාති;
සීලං හි සංසාරමුපාගතස්ස,
තාණංච ලෙණංච පරායණංච.

අවස්සයො සීලසමො ජනානං,
කුතො පනඤ්ඤො ඉධවා පරත්ථ;
සීලං ගුණානං පරමං පතිට්ඨා,
යථා ධරා ථාවර ජංගමානං.

සීලං කිරෙව කල්‍යාණං,
සීලං ලොකෙ අනුත්තරං;
අරිය වුත්ති සමාචාරො,
යෙන වුච්චති සීලවා.

---

**කතිවිධඤ්චෙතං සීලන්ති ඉදං විස්සජ්ජනං සබ්බමෙව තාවඉදං සීලං අත්තනො සීලන ලක්ඛණෙන එකවිධං චාරිත්ත වාරිත්ත වසෙනදුවිධං හීන මජ්ඣිම පණීත**

**වසෙන තිවිධං භික්ඛු භික්ඛුණී අනුපසම්පන්න ගහට්ඨ සීලවසෙන චතුබ්බිධං පහාණ වෙරමණී චෙතනා සංවර අවීතික්කම වසෙන පඤ්චවිධන්ති"** ශීලය කොපමණ ප්‍රභෙද ඇත්තේද? යන මේ ප්‍රශ්නයෙහි විසඳීම මෙසේ දතයුතුයි. කෙසේදයත්? සර්වසංග්‍රාහික වශයෙන් ඒ මේ සියළු ශීලයෝ මැ ගත් කල්හි සෙසු ගුණ ධර්මයන්ට ආධාර **ස්වභාවය**'යි කියන ලද **ස්වකීය** සීලන **ලක්ෂණයෙන්** එකවිධ වන්නේ යැ. චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් ද්විවිධ වන්නේ යැ. හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ත්‍රිවිධ වන්නේ යැ. භික්ෂු භික්ෂුණී අනුපසම්පන්න ගෘහස්ථශීල වශයෙන් චතුර්විධ වන්නේ යැ. ප්‍රහාණ වෙරමණී චෙතනා සංවර අව්‍යතික්‍රම වශයෙන් පංචවිධ වන්නේය'යි දත යුතුයි.

මෙහි කියන ලද ප්‍රභෙද අතුරෙන් එකවිධ කොඨාශයෙහි අර්ථ උද්දෙශවාරයෙහි කී නයින් සැලකිය යුතුයි. ද්විවිධ කොඨාශයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් **"මෙ මෙ දේ කටයුතුය"** යි පණවන ලද ශික්ෂාපදයන්ගේ යම් පිරීමෙක් හෝ ආචාර්ය උපාධ්‍යාදී වත් පිළිවෙත් කිරීමෙක් හෝ වේද ඒ=චාරිත්‍ර ශීල නම්. මේ මේ දේ නොකට යුතුය 'යි යමක් ප්‍රතික්ෂෙපකරන ලද නම් එයින් වෙන්වීම හෝ ප්‍රාණඝාතාදී අකුසලයන්ගෙන් සම්ප්‍රාප්ත විරති සමාදාන විරති වශයෙන් වෙන්වීම=වාරිත්‍රශීල නමැයි දතයුතු. ත්‍රිවිධ කොඨාසයෙහි ලාමක වූ ඡන්දාදියෙන් යුක්ත වූයේ හීන ශීලය යිද, මධ්‍යම ප්‍රමාණ (තුරුණු) වූ ඡන්දාදියෙන් යුක්ත වූයේ මධ්‍යම ශීලය යිද, තියුණු වූ ඡන්දාදියෙන් යුක්ත වූයේ ප්‍රණීත ශීලය යිද, කියනලදී. එහි සතර අධිපතීන්ගෙන් ඡන්ද-විරිය-වීමංස යන තුන සංස්කාරස්කන්ධ පර්යාපන්න ධර්මයෝයි චිත්තය විඥානස්කන්ධය 'යි සියළු වීථි චිත්තයෝ ම මේ ධර්ම සතරින් යමක් අධිපතිකොට උපදනාහු යැ. මොවුන්ගේ හීන මධ්‍යම ප්‍රණීත භාවය අධිමොක්ෂයාගේ හීනාදී ස්වභාවයෙන් ම සිද්ධවේ. එබැවින් හීන වූ අධිමොක්ෂයෙන් යුක්තවූ චිත්ත වීථියෙහි උපදනා ඡන්දාදීහුද ලාමකවෙත්. එහි ම යෙදුනු චෙතනා විරතීහු=හීන ශීලය'යි දතයුතු. මධ්‍යම ප්‍රණීත ශීලයෝද මෙසේම සැලකියයුතුවන්නාහ. චතුර්විධ කොඨාස යෙහි භික්ෂුශීලය නම්:- උපසපන් භික්ෂූන් අරභයා වෙන්කොට පණවනලද්දවූ ද උභය සාධාරණ වූ ද ශික්ෂාවෝ යි. භික්ෂුණී ශීලයනම්: උභය සාධාරන ශික්ෂාවන් හා භික්ෂුණීන් අරභයා වෙන්කොට පණවනලද ශික්ෂාවෝයි. අනුප සම්පන්න ශීලය නම්:- හෙරණ හෙරණීන් උදෙසා පණවනලද උභතො සුද්ධික සරණාගමනයෙන් යුත් දශශීලය යි. ගෘහස්ථ ශීලයනම්:-ගිහිගේ වැස්සන් විසින් රැක්කයුතු නිත්‍යශීල උපෝෂථශීල දශශීල යනාදිය යි.

පුද්ගල භෙදයෙන් මෙසේ සංක්‍ෂෙපයෙන් කියන ලද්දේ නුමුත් එහි භික්‍ෂු ශීලය වනාහි සිව් පිරිසුදු ශීලයන්ගේ වශයෙන් විභාග කටයුතු වන්නේ යැ. ඔව්හු කවරහුද? යත්:- ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය, ඉන්ද්‍රියසංවර ශීලය, ආජීව පාරිශුද්ධ ශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යන මොහු මෙත්. මොවුනතුරෙන් "සප්තාපත්තිස්කන්ධයට ඇතුළත් ශික්‍ෂාවන් පුරන්නහුගේ ඒ ඒ ඇවතට නොපැමිණීම පිළිබඳ වැ උපදනා කාමාවචර කුශල චිත්තවීථි හා සම්ප්‍රයුක්ත චෙතනා තොමෝ,,= ප්‍රාතිමොක්‍ෂසංවර ශීල නමු. චක්‍ෂුරාදි සදොරට රූපාදි අරමුණු නොවැද්දදීම් වශයෙන් ඒ ඒ ඩාරයන් රක්නා වූ පුද්ගලයාහට එකී එකී අරමුණක් අතීතාදි ක්‍රමයෙන් සිතනවිට)' උපදනා කුශලචිත්තවීථි හා සම්ප්‍රයුක්ත චෙතනා තොමෝ,,=ඉන්ද්‍රියසංවර ශීල නමු. "දිවිපැවැත්ම කාරණා කොටගෙණ පණවනලද ෂට්විධ ශික්‍ෂාපදයන්ගේ වශයෙන් ඒ ඒ මිථ්‍යාජීවයෙන් වළකිනවිට විරමණයක් පාසා උපදනා කුශල චිත්තවීථි හා සම්ප්‍රයුක්ත විරතීහු,,=ආජීවපාරිශුද්ධ ශීල නමු "නුවණින් ප්‍රයොජන සලකා චීවරාදි සිවුපසය පරිභොග කරන්නාහට ඒ ඒ ප්‍රත්‍යයන් පිළිබඳ වැ උපදනා කුශලචිත්තවීථි හා සම්ප්‍රයුක්ත චෙතනාදි චෛතසිකයෝ තුමූ,-ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල නමැ'යි දතයුතු.

ඒ මේ චතුර්විධ ශීලය "**දෙශනා-සංවර-පර්‍යෙෂණ-ප්‍රත්‍යවෙක්‍ෂණ**" යන කරුණු සතරින් ශුද්ධවන හෙයින් ඊට චතුපාරිසුද්ධි (සිව්පිරිසුදු) ශීලයයි කියත. මෙයින් ඉන්ද්‍රිය සංවරණය පිළිබඳ කරුණු දැනගැනීම බොහෝදෙනාට ප්‍රයෝජනවේදෛ යන අදහසින් ඒ පිළිබඳ ලෙශමාත්‍ර විස්තරයක් දක්වමහ :-

**"සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්‍වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති**—පෙ—යනුවෙන් චක්‍ෂුරාදීන්ගේ සංවරණය වදාළහ, බුදුහු:- හේතෙමේ (ප්‍රාතිමොක්‍ෂ සංවරණයෙන් යුත් තැනැත්තේයි සේයි) ඇසින් රූපය දැක නිමිත්තානුව්‍යංජන විසින් නොගන්නේ වේ, යමක් හෙතුකොටගෙන තෙල චක්‍ෂුරින්ද්‍රියය නහමක් සංවෘතවැ වසනුයේ අභිධ්‍යාදෞර්මනස්‍යාදි ලාමක අකුශල ධර්මයෝ නැවත නැවත වැඩි පවතිද්ද (උපනාහුද) ඔහුගේ සංවරණය පිණිස පිළිපදී. චක්‍ෂුරින්ද්‍රියය රකී, චක්‍ෂුරින්ද්‍රියෙහි සංවර (ය) යට පැමිණේ. ශ්‍රොත්‍රාදීන් ගැනද මේ ක්‍රමයෙන් සුදුසුසේ අර්ථ ගතයුතුයි.

මෙහි "ඇසින් රූපය දැක" යනු කාරණූපචාර වශයෙන් ඇසයයි ලබන ලද නම් ඇති රූපාරමුණු දැක්මෙහි සමර්ථවූ චක්ෂුර් විඥාන සිතින් රූපාරමුණ දැකැ යනාර්ථයි, ඇස සිතක් නොවන හෙයින් රූපය නොදකී. සිතද ඇසක් නොවන හෙයින් රූපය නොදකී. වැලි කෙසේ දක්නේද? යත්:- චක්ෂුර්ද්වාරයාගේ රූපාරමුණ හා ගැටීමෙක් ඇතිකල්හි (ඇසට රූපය හමුවූ කලැයි සේයි) චක්ෂුප්‍රසාද රූපය ආධාරකොට පවත්නාවූ සිතින් රූපය දක්නේයැ. යම්සේ "ඊයෙන් ඉලක්කය විදිනා නමුදු ඊයට ආධාරවූ දුන්නෙන් විදිනාහයි" පවත්නා ලෝක ව්‍යවහාරය මෙන් සිතින් රූපය දක්නේ නමුදු සිතට ආධාරවූ චක්ෂුප්‍රසාදයාගේ නාමය ගෙන "ඇසින් රූපය දකීය"යි කීහ.

"නිමිත්තග්‍රහණය නොකෙරෙයි" යන මෙහි චක්ෂුර්ද්වාරයට රූපය හමුවූ කල්හි උපදනා චක්ෂුර්විඥාන චිත්තවීථියෙහි චක්ෂුර් විඥාන, ජවන, යන මොවුන් විසින් ගත් පමණක් මුත් මතු මත් තෙහි ශුභාශුභ වශයෙන් නොගන්නේ යැ යනාර්ථයි "අනුව්‍යංජන ග්‍රහණය නොකෙරෙයි" යන මෙහි ප්‍රතිලබ්ධාරම්මණයෙහි අත් පා ආදී අවයව යහපත් වශයෙන් නොගන්නේ යැ නොහොත් යථා ස්වභාවයෙන් සලකන්නේ යැ, යනාර්ථයි. නොවසන ලද චක්ෂුර්ද්වාරයට හමු වූ ඉෂ්ටාරමුණෙහි විෂමලෝභයද අනිෂ්ටාරමුණෙහි දෙම්නසද උපදනා හෙයින් චක්ෂුර්ද්වාරය සංවරකටයුතු බව නියමිත නමුදු කිසිසේත් චක්ෂුර්ද්වාරයාගේ සංවරයෙක් හෝ අසංවරයෙක් නැත්තේ යැ. චක්ෂුප්‍රසාදය නිසා සම්‍යතියක් (මනා සිහි ඇතිබවෙක්) හෝ මුලාසිහි ඇති බවෙක් හෝ නූපදනේ යැ වැලි කෙසේ නම් සංවරාසංවරදෙක වන්නේ ද? යත්:-

"යද රූපාරම්මණං චක්ඛුස්සාපාථමාගච්ඡති තද භවඞ්ග විකඛත්තුං උප්පජ්ජිත්වා නිරුද්ධෙ කිරියා මනොධාතු ආවජ්ජනකිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති. තතො, චක්ඛුවිඤ්ඤාණං දස්සනකිච්චං තතො විපාකමනොධාතු සම්පටිච්ඡනකිච්චං තතො විපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු සන්තීරණකිච්චං තතො කිරියාහෙතුකමනොවිඤ්ඤාණධාතු ඔත්පන කිච්චං සාධයමානා උප්පජ්ජිත්වා නිරුජ්ඣති. තදනන්තරං ජවනං ජවති තත්‍රාපි නෙවභවඞ්ගසමයෙ න ආවජ්ජනාදීනං අඤ්ඤතර සමයෙ සංවරො වා අසංවරො වා අත්ථි. ජවණක්ඛණෙ පන සචෙ දුස්සීල්‍යං වා මුට්ඨස්සච්චං වා අඤ්ඤාණං වා අක්ඛන්ති වා කොසජ්ජං වා උප්පජ්ජති අසංවරො හොති"

යම්කලෙක රූපාරම්මණ ඇසට හමුවීද එකල්හි භවාංග සිත දෙවරක් ඉපිද නිරුද්ධවූ පසු කිරියමනොධාතු චිත්තය ආවර්ජන කෘත්‍යය සිද්ධකරමින් වරක් ඉපිද නිරුද්ධවේ. එක්බිති චක්ෂුර්විඥාන චිත්තය දර්ශන කෘත්‍යය සිද්ධකරමින් වරක්ද, විපාක මනො ධාතු චිත්තය අරමුණ පිළිගණිමින් වරක්ද, විපාක අහෙතුක මනොවිඥානධාතු චිත්තය අරමුණ තීරණය කරමින් වරක්ද, කිරියාහෙතුක මනොවිඥාන ධාතු චිත්තය අරමුණ නියම කරගනිමින් වරක්ද, ඉපිද නිරුද්ධ වේ. තදනන්තරව ජවන් වශයෙන් සත්වරක් සිත ඉපිද නිරුද්ධ වේ. මෙහි භවාංග සිත් උපදනා සමයෙහිද ආවර්ජනාදි අන්‍යතර සිතක් උපදනා සමයෙහිද සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ නොවන්නේමය. ඉදින් ජවන්සිත් උපදනා සමයෙහි අමනසිකාර හෙතුවෙන් අකුශලපක්ෂයෙහිවූ ලොභාදි චෛතසිකයෝ ඒ ජවන් හා යෙදීමෙන් **"දුශ්ශීල්බව-සිහි මුළාබව-නොදැන්ම-නොඉවසීම-කුශීතබව"** යන මෙයින් යමක් උපදීද ඒ අසංවරය යි දතයුතු. මෙසේ ජවන ක්ෂණයෙහි වන්නාවූ අසංවරය මැ චක්ෂුද්වාරයාගේ නොවැසීමය 'යි කියනලදී. එපරිද්දෙන්ම ජවනක්ෂණයෙහි **"සීල-සති-ඥාණ-ඛන්ති-විරිය"** සංවරයන්ගෙන් යමක් ජවන සහජාතවූ කල්හි චක්ෂුද්වාරයාගේ සංවරය වේ. මෙසේ ජවනක්ෂණයෙහි උපදනා "සංවර අසංවර දෙක සඳහා" චක්ෂුරින්ද්‍රියයාගේ සංවර අසංවර දෙක දක්වූහ 'යි දතයුතු.

මෙහි වනාහි චක්ෂුද්වාරයට රූපාරම්මණ හමුවූ කල්හි දෙවරක් සිත භවාංග වශයෙන් ඉපිද ඊට අනතුරුව පංචද්වාරාවර්ජන සිත එක්වරක්ද චක්ෂුර්විඥාන සිත එක්වරක්ද සම්ප්‍රත්‍යෙෂන සිත එක්වරක්ද සන්තීරණ සිත එක්වරක්ද ව්‍යවස්ථාපන සිත එක්වරක්ද පිළිවෙළින් ඉපිද තදනන්තරව යොනිසො මනසිකාරයෙන් යුක්තවීනම් කුශල් වූද අයොනිසො මනසිකාරයෙන් යුක්තවීනම් අකුශල් වූද සත්ජවන් කෙනෙක් ඉපිද නැවත භවාංග පාතය වේ. හෙවත් ඒ අරමුණ ලැබීමට මත්තෙන් සිත එල්බගෙන පැවති කර්මාදී අරමුණක්ම අරමුණු කෙරෙයි. මෙසේ කීපවාරයක් භවාංග වශයෙන් ඉපිද නැවත එම අරමුණ එල්බගෙන භවාංග වශයෙන් දෙවරක්ද මනොද්වාරාවර්ජන වශයෙන් එක්වරක්ද ජවන වශයෙන් සත්වරක්ද මනොද්වාරයෙහි චිත්තවීථිය උපදනේය. නැවතත් සිත කීපවාරයක් භවාංගවී යථොක්ත අරමුණේම එල්බගෙන මනොද්වාරයෙහිම භවාංග වශයෙන් දෙවරක්ද මනොද්වාරාවර්ජන වශයෙන් එක්වරක්ද ජවනයන්ගේ

වශයෙන් සත්වරක්ද උපදනා හෙයින් මේ තුන්වන මනෝද්වාරික ජවනයන් සඳහා චක්ෂුද්වාරයෙහි සංවරාසංවර දෙක කීහ යි නිෂ්පර්යාය විසින් දතයුතුයි. ශ්‍රොත්‍රද්වාරාදියෙහි උපදනා වීථි චිත්තයෝද සංවරාසංවරයෝද යටකී ක්‍රමානුසාරයෙන්ම සැලකිය යුතුයි.

මේ අර්ථය සුවසේ තේරුම් ගැනීම පිණිස
චිත්තවීථි ක්‍රමය දක්වම්හ.

---

චිත්තවීථින්ගේ උත්පත්තියට කාරණාවූ ස්ථානයෝ සදෙනෙකි. එනම්:- **"චක්ෂුද්වාරය-ශ්‍රොත්‍රද්වාරය-ඝ්‍රාණද්වාරය-ජිහ්වාද්වාරය-කායද්වාරය-මනොද්වාරය"** යන මොහුයි. මෙකී ෂඩ්ද්වාරයන් අතුරෙන් චක්ෂුද්වාරයෙහි "අතිමහන්තාරම්මණවීථි එකෙක, මහන්තාරම්මණ වීථි දෙකෙක, පරිත්තාරම්මණවීථි සයෙක අතිපරිත්තාරම්මණ වීථි සයෙකැ 'යි මෙසේ පසළොස් චිත්තවීථි කෙනෙක් උපදනාහ.

එසේ මැ ශ්‍රොත්‍රද්වාරයෙහි පසළොසෙක, ඝ්‍රාණද්වාරයෙහි පසළොසෙක, ජිහ්වාද්වාරයෙහි පසළොසෙක, කායද්වාරයෙහි පසළොසෙකැ 'යි= පඤ්චද්වාරයෙහි පන්සැත්තෑ චිත්ත වීථිකෙනෙක් වෙති. මනොද්වාරයෙහි වූකලී විභූතාරම්මණ වීථි පසෙක, අවිභූතාරම්මණ වීථි දෙකෙකැ'යි චිත්ත වීථි සතෙකි. සර්ව සංග්‍රාහික වශයෙන් "ෂඩ්ද්වාරයෙහි දෙයාසූ (82) චිත්ත වීථි කෙනෙක් වන්නාහ 'යි දතයුතු.

මෙවූනතුරෙන් චක්ෂුද්වාරයෙහි උපදනා පසළොස් චිත්ත වීථීන් පිළිබඳ "අතිමහන්තාරම්මණ" වීථිය දක්වන ටීකාචාර්‍ය්‍යහු:- **"එක චිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං භවඞ්ගචලනමාදිං චුද්දසවීථිචිත්තවසෙන සොළසචිත්තක්ඛණායුකං ආරම්මණං අතිමහන්තං නාම"** යනු කීහු. භූමි ජාති සම්ප්‍රයුක්ත සංස්කාර ආරම්මණ වශයෙන් සවකීය ප්‍රතිසන්ධි චිත්තයට සමවූ භවාඞ්ග චිත්තපරම්පරාව පවත්නාකල්හි යම් භවාඞ්ග සිතක් සමග එකක්ෂණිකව උපන් රූපාරම්මණක් වේද, ඒ අරමුණ මධ්‍යමායුෂ්කා වූ චක්ෂුප්‍රසාදයට හමුව ගැටෙයි. (සත්වයන්ගේ ප්‍රතිසන්ධි භවාඞ්ග චුති යන කෘත්‍ය සාධක වූයේ එක් භවයෙක, එක් ජාතියක, එක් අරමුණෙක, එල්බ සිටිනා එකම චිත්තයෙකි. ඉහාත්මයෙහි විඳ පුරුදු යමක් අරමුණු නොවේනම් එකෙණෙහි සවකීය ප්‍රතිසන්ධිය දුන් පූර්වජාතික "කම්, කම්නිමිති, ගතිනිමිති" යන මෙයින්

යමක් අරමුණු කෙරෙයි. එසේ පැවැත්ම "භවාංගචීම" නමැයි දතයුතු.) ඒ ගැටුනු කල්හි වීථි සිත් ඉපදීමට මත්තෙන් ඉක්ම ගිය භවාංග අතීත භවාඞ්ග නම. මෙසේ උපන් රූපාරමුණ චක්ෂු ප්‍රසාදය හා ගැටුනු කල්හි වීථි සිත් ඉපදීමට ආරම්භ වූ බැවින් භවාඞ්ග ශ්‍රොතස සැලීම් වශයෙන් වරක්ද, සිඳීම් වශයෙන් වරක්ද 'යි දෙවරක් භවාඞ්ග සිත ඉපිද නිරුද්ධ වෙයි. ඉක්බිති ඒ අරමුණම එල්බගෙන පඤ්චද්වාරාවර්ජන සිත ආවර්ජන කෘත්‍ය ය සිද්ධකෙරෙමින් වරක්ද, කුශලාකුශල විපාක චක්ෂුර්විඥාන දෙදෙනා අතුරෙන් එක්තරා සිතක් නිසිසේ දර්ශන කෘත්‍යය සිද්ධ කෙරෙමින් වරක්ද, සම්ප්‍රතිච්ඡන චිත්තයන් දෙදෙනා අතුරෙන් අනුරූප වූ සිතක් අරමුණ පිළිගැනීම් වශයෙන් වරක්ද කුශල විපාක අකුශල විපාක සන්තීරන යන ත්‍රිවිධ චිත්තයන් ගෙන් සුදුසු සිතක් අරමුණ තීරණය කෙරෙමින් වරක්ද, වොත්ථ පන චිත්තය අරමුණ ව්‍යවස්ථාපනය (නිශ්චය) කෙරෙමින් වරක් ද 'යි මෙසේ පිළිවෙළින් ඉපිද නිරුද්ධ වෙති. ඉක්බිති එමඅරමුණ ගෙන දනගැනීම් පැහැදීම් වශයෙන් හෝ ඇලීම් දූෂ්‍යවීම් වශයෙන් සුදුසුසේ එකුන්තිස් (29) කාමාවචර ජවනයන්ගෙන් එක්තරා සිතක් ලබනලද හේතුප්‍රත්‍ය ඇතුව සත්වරක් ජවන කෘත්‍ය වශයෙන් ඉපිද නිරුද්ධ වූ ඉක්බිති එකොළොස් තදාලම්බන සිත් අතුරෙන් යම් සිතක් තදාලම්බන කෘත්‍යය සිද්ධ කෙරෙමින් දෙවරක් ඉපිද වීථිනිරෝධය වේ. (යථොක්ත රූපාරමුණ සතළොස් (17) චිත්තක්ෂණයකට ආයු ඇති නිසා මේ සතළොස් වන තදාලම්බනය සමග නිරුද්ධ වූ පසු පෙර මෙන්ම සිත පූර්වකර්මීය අරමුණු කෙරෙමින් භවාඞ්ග පාත වේ.) මේ චක්ෂුර්ද්වාර යෙහි උපදනා **"අතිමහන්තාරම්මණ"** වීථියයි.

**"ඨිතිවිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං ද්වාභාගං භවාඞ්ගචලනමත්තමාදස විපිවිත්තා එක භවංග විත්තාවසෙනවා භවඞ්ගචලනමත්ත මාදස විපිවිත්ත වසෙන වා පඤ්චදස චුද්දස විත්තක්ඛණායුකං ආරම්මණමය මහන්තං නාම"** යන ටීකා පාඨයෙන් මහන්තාරම්මණ වීථි දෙක දක්වූහ:–

යම් රූපාරමුණක් ඉපිද භවාඞ්ග සිත් දෙකක් ඉක්ම ගොස් හමුවීනම් තදාලම්බන යුගල ඉපදීමට අරමුණෙහි ආයු මඳ බැවින් ද එකතදාලම්බනයක් නූපදනා බැවින් ද සප්තජවනා නන්තර වැ උපදනා භවාඞ්ගය සමග වීථි නිරොධයවනුයේ පළමු වැනි **"මහන්තාරම්මණ"** වීථි නමි.

යම් රූපාරම්මණයක් ඉපිද භවාඞ්ග සිත් තුනක් ඉක්මවා හමුවී නම් ඒ අරමුණ සත්වන ජවනක්ෂණය හා සමායුෂ්ක බැවින් ඔහුගේ නිරොධය සමග වීථිනිරොධය වනුයේ දෙවැනි "මහන්තාරම්මණ" වීථි නමැයි දතයුතු. මේ කියනලද්දේ චක්ෂුර්ද්වාරික මහන්තාරම්මණ වීථි යුගලයි.

**"චතු පඤ්ච ඡ සත්ත අට්ඨ නව චිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං යථාසකම්. තෙරස බාදස එකාදස දස නව අට්ඨ චිත්තක්ඛණායුකං ජනකාරම්මණං පරිත්තං නාම"** යනුවෙන් පරිත්තාරම්මණ වීථි සය දක්වූහ:-

යම් රූපාරම්මණයක් ඉපිද භවාඞ්ග සතරක් ඉක්මවා හමුවීනම් එහි භවාඞ්ග චලනොපච්ඡෙද ආවර්ජන දර්ශන සම්ප්‍රත්‍යෙෂණ සන්තීරණයන්ට අනතුරු වැ ව්‍යවස්ථාපන චිත්තය පමණක් දෙවරක් ඉපිද පස්වැනි භවාඞ්ගය හා සමග වීථි නිරොධය වනුයේ **"පළමුවැනි පරිත්තාරම්මණ"** වීථිය යි.

යම් රූපාරම්මණයක් භවාඞ්ග පසක් ඉක්මවා හමුවීනම් එහිදු යටකී ක්‍රමයෙන් ව්‍යවස්ථාපන සිත දෙවරක් ඉපිද සිවුවැනි භවාඞ්ගය හා සමග වීථි නිරොධය වනුයේ **"දෙවැනි පරිත්තාරම්මණ"** වීථිය යි.

යම් රූපාරම්මණයක් භවාඞ්ග සයක් ඉක්මවා හමුවීමෙන් ව්‍යවස්ථාපන සිත දෙවරක් ඉපිද තුන්වැනි භවාඞ්ගය හා සමග නිරුද්ධ වනුයේ '**තුන්වැනි පරිත්තාරම්මණ**" වීථිය යි.

යම් රූපාරම්මණයක් භවාඞ්ගසිත් සතක් ඉක්මවා ව්‍යවස්ථාපන දෙසිත කෙළවර දෙවැනි භවාඞ්ගය හා සමග ආයුගෙවීමෙන් වීථි නිරොධය වනුයේ **සතරවැනි පරිත්තාරම්මණ**" වීථිය යි.

යම් රූපාරම්මණයක් භවාඞ්ග සිත් අටක් ඉක්මවා හමුවීමෙන් උපදනා ව්‍යවස්ථාපන දෙසිත කෙළවර ප්‍රථම භවාඞ්ගය හා සමග ආයුගෙවී වීථිනිරොධය වනුයේ **"පස්වැනි පරිත්තාරම්මණ"** වීථිය යි.

යම් රූපාරම්මණයක් භවාඞ්ග සිත් නවයක් ඉක්මවා පිළිවෙළින් උපන් දෙවැනි ව්‍යවස්ථාපන චිත්තය හා සමග ආයුගෙවීමෙන් නිරුද්ධ වනුයේ **"සවැනි පරිත්තාරම්මණ"** වීථිනමැ යි දතයුතුයි. මේ වීථිහු සදෙන අල්පායුෂ්ක වූ අරමුණු විෂයකොට උපදනා හෙයින් "පරිත්තාරම්මණ" වීථිනමැ යි කීහ.

**"දස එකාදස බාදස තෙරස චුද්දස පණ්ණරස චිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං සත්ත ඡ පඤ්ච චතු ති ද්වි භවංගචලන චිත්තක්ඛණායුකං ජවනාරම්මණං අතිපරිත්තාරම්මණං නාම"** යනුවෙන් අතිපරිත්තාරම්මණ වීථි සය දක්වූහ.

යම් රූපාරම්මණක් භවාංගසිත් දසයක් හෝ එකොළොසක් හෝ දොළසක් හෝ තෙළෙසක් හෝ තුදුසක් හෝ පසළොසක් ඉක්මවා හමුවීද ඒ සියලු වාරයන්හිම වීථි චිත්තයන්ගේ ඉපදීමට ප්‍රතිලබ්ධාරම්මණයෙහි ආයු මඳ බැවින් භවාංගචලනොපච්ඡේද යන දෙසිත පමණක් ඉපිද නැවතත් සිත භවාංගශ්‍රොතසට බස්නේය. එබැවින් ඒ වාර සයෙහිම පිළිවෙළින් පශ්චාත් භාගයෙහි භවාංග සතක්ද සයක්ද පසක්ද සතරක්ද තුනක්ද (භවාංගචලනොපච්ඡේද)=දෙකක්ද චිත්තක්ෂණ පරිපූරණය සඳහා උපදිනු ලැබෙත්. මේ වීථිහු සදෙන චක්ෂුර්ද්වාරයෙහි ස්වල්ප තරායුෂ්ක වූ අරමුණු විෂයකොට උපදනා "අතිපරිත්තාරම්මණ" වීථි නමැයි දතයුතු

මෙතෙකින් චක්ෂුර්ද්වාරයෙහි උපදනා පසළොස් චිත්තවීථීන් කියා නිමවන ලදී. මේ ක්‍රමයෙන්ම ශබ්දාරම්මණක් හමුවීමෙන් ශ්‍රොත්‍රද්වාරයෙහි උපදනා චිත්ත වීථි පසළොස ද, ගන්ධාරම්මණක් හමුවීමෙන් ඝ්‍රාණද්වාරයෙහි උපදනා චිත්තවීථි පසළොසද, රසාරම්මණක් හමුවීමෙන් ජිහ්වාද්වාරයෙහි උපදනා චිත්තවීථි පසළොසද, ස්ප්‍රෂ්ටව්‍යාරම්මණක් හමුවීමෙන් කායද්වාරයෙහි උපදනා චිත්ත වීථි පසළොසද, යන පඤ්චද්වාරික පන්සැත්තෑ (75) චිත්ත වීථීන් දතයුත්තාහ

ඉක්බිති මනොද්වාරයෙහි උපදනා විභූතාරම්මණ වීථි පස දක්වන ටීකාචාරීහු:- **"මනොද්වාරෙ පන එක ද්වි ති චතු පඤ්ච චිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං සොළස පණ්ණරස චුද්දස තෙරස බාදස චිත්තක්ඛණායුකං ගොචරං විභූතං නාම"** යනු කීහු:- මනොද්වාරයෙහි වූකලී චිත්ත වීථීන්ගේ පහළවීම" වර්තමාන කාලික විඥප්ති, ලක්ෂණ, රූප සදෙනා හැර,, ෂඩාලම්බන සංඛ්‍යාත අවශෙෂ දෙවිසිරූපයන්ගෙන් යමක් අරමුණුකොට වෙති. එබැවින් සතළොස් චිත්තක්ෂණයට ආයු ඇත්තාවූ ෂඩාලම්බන ධර්මයන් අතුරෙන් යම්කිසි අරමුණක් එකම භාවාංගයක් ඉක්මවා හමුවූයේද එහි භවාංගචලන උපච්ඡේද මනොද්වාරාවර්ජන සප්ත ජවන තදාලම්බන යුගලයන මොවුනට අනතුරුව උපදනා සතරවැනි භවාංගය හා සමඟ නිරුද්ධවනුයේ **"පළමුවැනි විභූතාරම්මණ"** වීථියයි.

එසේම භවාඞ්ග දෙකක් හෝ තුනක් හෝ හතරක් හෝ පසක් ඉක්මවා හමුවූ ආලම්බණයෝ පිළිවෙළින් උපන් වීථිචිත්ත යන්ට අනතුරැ වැ උපදනා තුන්වැනි දෙවැනි පළමුවැනි භවාඞ්ග යන්හා ද දෙවැනි තදලම්බයාගේ භඞ්ගයහා ද සමකාලිකවැ නිරුඬවනුවෝ **"දෙවැනි තුන්වැනි සිවුවැනි පස්වැනි විභූතා රම්මණ"** වීථිහු වෙත්. මෙකී වීථිහු පස්දෙන මැ ප්‍රකට අර මුණෙහි උපදනා හෙයින් ද මනොද්වාරයෙහි උපදනාහෙයින් ද ඔවුනට "මනොද්වාරික විභූතාරම්මණ" වීථිහුය 'යි යෙත්.

**"ජ සත්ත චිත්තක්ඛණාතීතං හුත්වා ආපාථගතං එකා දස දස චිත්තක්ඛණායුකං ගොචරං අවිභූතං නාම"** යනු වෙන් භවාඞ්ග සයක් හෝ සතක් ඉක්මවා හමුවූ අරමුණ ජවනානන්තර වැ උපදනා භවාඞ්ගය හා ද ජවිතාන්තිකයා හා ද වීථිනිරොධය වන්නාහු **"පළමුවැනි දෙවැනි අවිභූතාරම්මණ"** වීථිහු වෙත්. මෙකී වීථි යුගල මැ අප්‍රකට අරමුණෙහි උපදනා හෙයින් "අවිභූතාරම්මණ" වීථි යනු කීහු.

මෙතෙකින් 'චක්ඛු- සොත - ඝාණ - ජිව්හා-කාය - මනො' යන ෂඩ්වාරයෙහි උපදනා දෙයාසූ (82) චිත්තවීථීන් කියා නිම වන ලදී. ඉක්බිති මොවුන්ගේ සුඛාවබොධය පිණිස පිළිවෙ ළින් වීථි වින්‍යාශ දක්වම්හ.

---

## වීථි සංස්ථානාක්ෂර:-

| | | |
|---|---|---|
| ග | = භවාඞ්ග | චිත්තය. |
| තී | = අතීතභවාඞ්ග | ,, |
| ල | = භවාඞ්ග චලන | ,, |
| චෙ | = භවඞ්ග උපච්ඡෙදක | ,, |
| ප | = පඤ්චද්වාරාවර්ජන | ,, |
| ච | = චක්ෂුර්විඥාන | ,, |
| සං | = සම්ප්‍රතීච්ඡණ | ,, |
| ණ | = සංතීරණ | ,, |
| වො | = ව්‍යවස්ථාපණ | ,, |
| ජ | = ජවන | ,, |
| ද | = තදලම්බණ | ,, |
| ම | = මනොද්වාරාවර්ජන | ,, |

මෙහි පහත දක්වන ඒ ඒ චිත්තවීථිවල මූලකුරු පමණක් සඳහන්කරන බැවින් පළමුකොට මේ සංස්ථානාක්ෂර බලා තේරුම්ගත යුතුයි.

**භවාඞ්ග** = යනු අතීත භවයෙහි ගත් කර්මාදි තුනින් යමක් ගෙන පැවැත්මයි.

**අතීතභවාඞ්ග** = යනු අරමුණ ප්‍රසාදය හා ගැටීමට ප්‍රථම ඉකුත්වූ වාරසංඛ්‍යාවයි.

**භවාඞ්ගචලන** = යනු අරමුණ ගැටීමෙන් භවාඞ්ග සන්තතිය චඤ්චල වූබවයි.

**භවාඞ්ගුපච්ඡෙදක** = යනු භවාඞ්ග සන්තතිය සිඳීමෙන් ආවර්ජනයට අවසර දුන්බවයි.

**පඤ්චද්වාරාවර්ජන** = යනු පඤ්චද්වාරයට යොමුවූ අරමුණු ආවර්ජනාකරන බවයි.

**චක්ඛුර්විඥාන** = යනු චක්ෂුද්වාරයට යොමුවූ අරමුණ දැකීම් වශයෙන් උපදනා සිතයි.

**සම්පටිච්ඡන** = යනු එම අරමුණ පිළිගැනීම් වශයෙන් උපදනා සිතයි.

**සන්තීරණ** = යනු එම පිළිගත් අරමුණ තීරණය කරමින් උපදනා සිතයි.

**වොත්ථපන** = යනු එම තීරණයාගේ නිශ්චයට බැසගත් සිතයි.

**ජවන** = යනු එම අරමුණු රසය බුක්තිවිඳින කාලය තුළ උපදනා චිත්තයෝය.

**තදාලම්බණ** = යනු එම ජවන චිත්තයන්ගේ ප්‍රතිබිම්බයන් සේ එහිම උපදනා විපාකයෝයි.

**000 මෙලකුණ** = එකචිත්තක්ෂණයක් "උත්පාද-ස්ථිති-භඞ්ග" යන ක්ෂණත්‍රයකින් යුත් බව ඇඟවීමටයි.

---

## චක්ෂුද්වාරයෙහි උපදනා
## අති මහන්තාලම්බණ චිත්තවීථිය.

1. තදාලම්බන වාරය

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | න | ඡෙ | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ |
| | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | ··· | |

මෙහි පෙර පසු භවාඞ්ග "කර්ම-කර්මනිමිති-ගතිනිමිති" යන මෙයින් යමක් අරමුණු කෙරෙත්. අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණය හා උපදනා රූපාලම්බණය මධ්‍යමායුෂ්ක චක්ෂුප්‍රසාදය හා ගැටීමෙන් චිත්තවීථිය ඉපිද දෙවෙනි තදාලම්බණය හා සමග වීථි නිරෝධය වේ. මෙහි ජවනයෝ සත්දෙන එකුන්තිස් කාමාවචර ජවනයන් අතුරෙන් එකක් වියයුතුයි. අයොනිසොමනස්කාරාදියෙන් යුක්තවීනම් අකුශල ජවන 11 න් එකක්ද යොනිසොමනස්කාරාදියෙන් යුක්ත වීනම් කුශල ජවන 8 න් එකක්ද සත්වරක්ම උපදනේය. එහි විපාක චිත්තයෝ 11 දෙන අතුරෙන් එකක් සුදුසුපරිද්දෙන් තදාලම්බණ නාමයෙන් දෙවරක් උපදී.

ජවනවාර 2 යි. භවාඞ්ග 2 ක් හෝ 3 ක් ඉක්මුණු නිසා තදාලම්බන ඉපදීමට ආයු මද හෙයින් ජවනාවශානයෙහි වීථිනිරෝධයවේ,

### I මහන්තාලම්බන වීථිය

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### II මහන්තාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

———:———

මේ වොඨ්ඨපනවාර වීථිසයයි. මෙහි ජවන් ඉපදීමට ආයුමද හෙයින් වොඨ්ඨපනය දෙවරක් ඉපිද භවාංගයවේ.

### I පරිත්තාලම්බනවීථිය

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ | භ | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### II පරිත්තාලම්බන වීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### III පරිත්තාලම්බන වීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### IV පරිත්තාලම්බන වීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### V පරිත්තාලම්බන වීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

### VI පරිත්තාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | තී | තී | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | වො | භ |
| | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |

ජවනයන්ගේ උත්පත්තිය දක්වා නොසැහෙනු වැ ඉක්මුනා වූ චිත්තක්ෂණ ඇති වැ විෂයබවට පමිණියා වූ අරමුණ පරිත්ත නම්. එහි උපදනා වීථි පරිත්තාලම්බනවීථි නම් වේත්. මේ අරමුණ අල්පායුෂ්ක බැවින් ජවනයන්ගේ උත්පත්තියට ප්‍රත්‍ය නොවෙයි. ජවනයෝ උපදනාහු නියමයෙන් තමන් සත්වාරයෙක් උපදනට ආයු ඇති අරමුණෙහි මැ උපදනාහ.

---

මේ මෝඝවාරයෙහි චිත්තවීථි සයයි.

I අති පරිත්තාලම්බනවීථිය.



II අති පරිත්තාලම්බන වීථිය.



III අති පරිත්තාලම්බන වීථිය.



IV අති පරිත්තාලම්බන වීථිය.



V අති පරිත්තාලම්බන වීථිය



VI අති පරිත්තාලම්බනවීථිය.



මෙහි වීථිචිත්තයන්ගේ ඉපදීමක් නැති හෙයින් මෝඝවාරය යි. කියනු ලැබේ

මෙතෙකින් චක්ෂුර්වාරයෙහි උපදනා චිත්තවීථි 15 කියා නිමවන ලදී. "ශ්‍රොත-ඝ්‍රාණ-ජිහ්වා-කාය" යන වාර සතරහි වීථිචිත්තයෝද මෙසේමැයි. සුදුසු තන්හි විඤ්ඤාණයන් පමණක් ඒ ඒ වීථියේ නමින් යොදා ගතයුතුයි.

## ඉක්බිති මනොද්වාරයෙහි උපදනා විභූතාලම්බන චිත්තවීථි පස දක්වනු ලැබේ.

— —:— —

ප්‍රකට අරමුණෙහි උපදනා හෙයින් මේ වීථි පසටම විභූතාලම්බන වීථිය යි කියනු ලැබේ.

I විභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ | භ | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

II විභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

III විභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

IV විභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

V විභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

විඥප්තිලක්ෂණ රූප සය හැර සෙසු දෙවිසිරූපයන්ම අරමුණු කෙරෙත්ය 'යි දතයුතු.

---

## මනොද්වාරයෙහි උපදනා අවිභූතාලම්බන චිත්තවීථි දෙක.

අප්‍රකට අරමුණේ උපදනා හෙයින් මේ වීථි දෙකටම අවිභූතාලම්බනය 'යි කියනු ලැබේ.

1 අවිභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | ○○○ | |

II අවිභූතාලම්බනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | තී | තී | තී | තී | තී | තී | ල | ජෙ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ |

සංක්ෂෙප මුඛයෙන් දක්වනලද ෂට්වාරික වීථින් කියා නිමවන ලදී.

---

තවද චක්ෂුරාදිද්වාරයකට රූපාදි අරමුණක් ගොචරවූ කල්හි එම වර්තමාන අරමුණගෙන පචවාරික වීථියක්ද; එම අරමුණම අතීත වශයෙන් ගෙන තදනුවර්තක මනොවාර වීථියක්ද; අර්ථසාධක ශුද්ධ මනොවාර වීථියක්ද යි මෙසේ වීථිතුනක් උපදනා බව බහුතරාචාර්‍ය්‍යසම්මත විනිශ්චයකි. චක්ෂුර්වාරයාගේ සංවරණය හෝ අසංවරණයද එහි තුන්වැනි මනොවාරිකජවනයන්ගේම සංවරාසංවරදෙකින් වන්නේය යි දක්වනලදී. සෙසු වාරයන්ගේ ද එසේ මැයි.

එක අරමුණක් පිළිබඳවැ උපදනා ඒ වීථිතුන මෙසේයි:-
වර්තමාන රූපය අරමුණු කරන.

චක්ෂුර්වාරිකවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | ල | ජෙ | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ |

අතීත රූපයඅරමුණු කරන
තදනුවර්තක මනොවාරවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | ල | ජෙ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ | භ | භ |

කුශලා කුශල සම්සිද්ධිය වන
අර්ථසාධක ජවනවීථිය.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | ල | ජෙ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ | භ | භ | භ | භ |

---

ඉන්ද්‍රිය සංවර ශීලයෙහි දක්වන චක්ඛුන්ද්‍රිය සංවරණය වනාහි මෙම තුන් වැනි අර්ථසාධක ශුද්ධ මනොවාර වීථියේ ජවනයන්ගේ සංවරණය සඳහා කියනලදී, එහි විස්තර එම ශීලවර්ණනාවෙහි කියනලදී.

"දිස්වාති චක්ඛුවිඤ්ඤාණෙන දිස්වා, ඉදඤ්ච දුතිය තතිය මනොවිඤ්ඤාණ වීථියො චක්ඛුවිඤ්ඤාණ වීථියා සංගහෙත්වා වුත්තං" යන ටීකා පාඨයෙන් හැඟෙන්නේ දෙවැනි තුන්වැනි මනොවිඥාන වීථිහු චක්ෂුර් විඥාන විථියෙහි සංග්‍රහ වන බවයි.

මෙසින් හැඟෙන්නේ චිත්තවීථි තුන තුන ඉපදීමෙන් "දර්ශ
න-ශ්‍රවණ-ඝ්‍රාණ-ස්වාදන-ස්පර්ශන" යන කෘත්‍යයන් පමණක් සිද්ධ
වන බවයි. හෙවත් එක එක කෘත්‍යයකට චිත්තවීථි තුන තුන
ආවශ්‍යක බවයි. හැඳිනීම-අර්ථාවබෝධය-රජ්ජන-දූසන-යනාදි
ය සඳහා වැඩිමනත් චිත්තවීථින් වුවමනාබව විචාරණය කරන්
නෙකුට හැඟේ. ඒ බව **"පඤ්චද්වාරෙ රූපාදි ආරම්මණෙ ආපා
ථගතෙ නියමිතාදි වසෙන කුසලා'කුසල ජවනෙ උප්පජ්ජිත්වා
භවඞ්ගං ඔතිණ්ණෙ මනොද්වාරික ජවනං තංයෙවාරම්මණං
කත්වා භවඞ්ගං ඔතරති. පුන තස්මිං යෙව ද්වාරෙ ඉත්ථි පුරිසො
ති ආදිනා වවත්ථපෙත්වා ජවනං උප්පජ්ජිත්වා භවඞ්ගං ඔත
රති, පුනවාරෙ පසාද රජ්ජනාදි වසෙන ජවනං ජවති"** යන
නික්ෂෙපකාණ්ඩ අනුටීකා පාඨයෙන් වැඩිදුරටත් පැහැදිලි
වෙයි. එනම්:– චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි රූපාදි අරමුණු ආපා
ථගත කල්හි නියම කිරීමාදි වශයෙන් කුශලා'කුශල ජවන් ඉපිද
භවාඞ්ගයට බැසගත් පසු තදනුවර්තීක ජවන වීථියක් හා ශුද්ධ
මනොද්වාරික ජවන වීථියක්ද ඉපිද ඒ රූපාදි අරමුණුම ගෙණ
භවාඞ්ග ශ්‍රොතසට බස්නේය. නැවත ඒ මනොද්වාරයෙහිම ස්ත්‍රී
පුරුෂාදි වශයෙන් නියම කොට සතරවන මනොද්වාර ජවන වීථි
යක් ඉපිද භවාඞ්ගයට බැසගන්නේය. නැවත පස්වැනි වාර
යෙහි එම අරමුණෙහි පැහැදීම් ඇලීම් වශයෙන් අර්ථසාධක
ජවන වීථියක් දිවෙයි, හෙවත් උපදනේය යනුයි.

**"සොතවිඤ්ඤාණ වීථියා අනන්තරං අතීත සද්දාරම්මණාය
ජවන වීථියා අනන්තරං නාම පඤ්ඤත්තියා ගහණං, තතො
පරං අත්ථාවබොධො."** යන විභාවිනී පාඨයෙන්ද වර්තමාන ශබ්දා
රම්මණික ශ්‍රොතවිඥාන වීථියක් හා අතීත ශබ්දාරම්මණික මනො
ද්වාරික ජවන වීථියක්ද ඉක්බිති නාම ප්‍රඥප්තිය අරමුණුකොට
ජවන වීථියක් හා අර්ථ ප්‍රඥප්තිය අරමුණුකොට ජවන වීථියක්
දැයි වීථිසතරක් උපදනා බව හැඟේ. එහි රජ්ජන දූසනාදිය
සඳහා පස්වැනි වූ අර්ථ සාධක ජවන වීථියක් ආවශ්‍යකයි. තවද
**"ඉමිනානයෙන රූපගන්ධාදි ආරම්මණෙසුපි එකා විඤ්ඤාණ
වීථි, එකා තදනුවත්තක වීථි, තතො නාමග්ගාහක වීථි, තතො,
අත්ථබොධක වීථිති' චතස්සො වීථියො ලබ්භන්ති'ති වෙදිතබ්බා,**
යන සංඛෙපවණ්ණනා පාඨයෙන්ද රූපාදි අරමුණෙක්හි වීථි
සතරක් ඉපදීමෙන් අර්ථ ප්‍රඥප්තිය නිශ්චය කරන බව හැඟේ
එහිද රජ්ජන දූසනාදිය සඳහා පස්වැනි අර්ථ සාධක ජවන
වාරයක් වුවමනාවෙයි **"සද්දං පඨම චිත්තෙන, තීතං දුතිය
චෙතසා නාමං තතිය චිත්තෙන, අත්ථං චතුත්ථ චෙතසා,,** යන
සම්මොහ විනොදනී පාඨයෙන්ද ඒ අර්ථයම පැහැදිලි කෙරෙයි.

මෙකී ආචාර්‍ය්‍යී මතානුකූලව සලකනවිට පඤ්චද්වාරයෙහි අරමුණු ගැටීමෙන් එකෙකි අරමුණක්පාසා පඤ්චද්වාරික චිත්තවීථියක්ද, එම අරමුණ අතීතකාලික වශයෙන් ගෙන තදනුවර්තික මනොද්වාරවීථියක්ද, නාමප්‍රඥප්තිය දැනගන්නා ශුද්ධ මනොද්වාරික වීථියක්ද, අර්ථප්‍රඥප්තිය දැනගන්නා ශුද්ධ මනොද්වාරික වීථියක්ද, ඉක්බිති ප්‍රසාද රජ්ජනාදි වශයෙන් කුශලාකුශල අර්ථ සාධක ජවනවීථියක්ද යී මෙසේ වීථි පසක් උපදනා බව හැඟෙන හෙයින් ඒ පිළිබඳ වීථි චිත්‍රාංශ දක්වමහ. (මගේ මේ කියමන විචාරණ බුද්ධිමතුන් පරීක්‍ෂා කෙරෙත්වා.)

**යම්කිසි රූපාරම්මණයක් චක්ඛුප්‍රසාදය හා ගැටීමේදී උපදනා වීථි පරම්පරාව පිළිබඳ සංකෙත නිරූපණය.**

වර්තමානරූපාරම්මණය අරමුණු කරන.

I චක්ඛුද්වාරික චිත්තවීථිය.




එම අතීතාරම්මණය අරමුණු කරන.

II තදනුවර්තික මනොද්වාරවීථිය.




නීල පීතසංඥා වශයෙන් එහි හැඳිනීමකරන.

III නාම ප්‍රඥප්ති විඥානවීථිය.




එහි වාචකාර්ථය නිශ්චයකරන.

IV අර්ථප්‍රඥප්ති බොධකවීථිය.




කුශලාකුශල කර්මසාධකජවන

V අර්ථසාධක ජවනවීථිය.



මෙම අඤ්ඤ සාධක ජවන චිත්තය සඳහා "**අඤ්ඤසාධිකා පන සත්තම ජවනචෙතනා උපපජ්ජවෙදනීය කම්මං නාම**" යනාදිය කියනලද හෙයින් මෙහි උපදනා ජවන් සතේ පිළිවෙළින් දෘෂ්ටධර්මවේදනීයාදි කර්ම විභාගය කරන ලදහ. ප්‍රථම ජවන සහජාත චේතනා නම්ලද කර්මය ඉහාත්මයෙහි විපාකදීමද, සත්වැනි ජවන සහජාත කර්මය අනතුරු ආත්මයෙහි විපාකදීමද, මධ්‍යයෙහි වූ පංච ජවන සහජාත කර්මයෝ සංසාර සීමාව ඇතිතාක් විපාකදීමද කියනලදහ. මෙහි සත්වැනි ජවන චෙතනාව සූතිස් ජවනයකින් ආසෙවන ප්‍රත්‍යය ලැබූහෙයින් "ගරුකර්ම" නම්විය. මේ සඳහා විස්තර බොහෝ ඇතත් කාරණය ඇඟවීම පමණක් මෙහිදී අභිමත හෙයින් මෙයින් අවසාන කරමි.

---

**කොචස්ස සඞ්කිලෙසො කිං වොදානන්ති තත්‍රිදං විසජ්ජනං, ඛණ්ඩාදිභාවො සීලස්ස සඞ්කිලෙසො අඛණ්ඩාදිභාවො වොදානන්ති,** යනුවෙන් ශීලයාගේ කිලුටු භාවය කවරේද? පිරිසිදු භාවය කවරේද? යන මේ ප්‍රශ්නයෙහි විසඳීම වන්නේය. එහි ශීලයාගේ යම්බඳු ඛණ්ඩසබලාදි ස්වභාවයක් වේ නම් එය කිලුටු බවය යි කියාද, අඛණ්ඩ අච්ඡිද්‍රාදි ස්වභාවයක් වේ නම් එය පිරිසුදු බවය යි කියාද දතයුතුයි. මේ අර්ථය වනාහි "ලාභ කීර්ති ඥාති ශරීර ජීවිත" යන මොවුන්ගේ වශයෙන්ද සප්තවිධ මෛථුනයන්ගේ වශයෙන්ද සැලකියයුතුයි:-

මේ ලොකයෙහි යම්කිසිවෙක් තමහට ලැබෙන ලාභයක් නිසා හෝ යශසක් නිසා හෝ ඥාතීන් නිසා හෝ ශරීරය නිසා හෝ ජීවිතාශාවෙන් හෝ ශික්ෂාගරුත්වය නැති යේ තෙමේ තමා සව දන් වූ ශීලයෙහි මුල හෝ අග යම් ශික්ෂාපදයක් කඩකෙළේද ඔහුගේ ශීලය කොණ්සිඳුනාලද වස්ත්‍රයක් මෙන් කඩවූයේවෙයි. යමෙකුගේ ශීලයෙහි මධ්‍යවර්ති ශික්ෂාපදයක් බිඳුනේද ඔහුගේ ශීලය මැදින් සිදුරුකළ වස්ත්‍රයක්මෙන් සිදුරුවූයේවෙයි. යමෙකුගේ ශීලයෙහි පිළිවෙළින් දෙතුන්ශික්ෂාපදකෙනෙක් බිඳුනේවේද ඔහුගේ ශීලය පිට හෝ බඩ හටගත් අසමාන වර්ණයෙන් යුක්ත වූ කබර ගවදෙනක මෙන් සබල වූයේ වෙයි. යමෙකුගේ ශීලය අතරතුර බිඳුනු ශික්ෂාපදයන්ගෙන් යුක්ත වූයේද ඔහුගේ ශීලය නන්පැහයෙන් විසිතුරු තිත් (ගෝමර) දෙනකමෙන් තිත් සහිත වූයේවෙයි. මෙසේ පළමු කොට ලාභ යශස් ආදිය නිසා වන ශීලයාගේ ඛණ්ඩඡිද්‍ර සබල කල්මාෂ භාවයෝ දතයුත්තාහ.

සත්වැදෑරුම් මෛථුන්දම්හි යෙදීම් වශයෙන් ඇතිවන ශීලයාගේ ඛණ්ඩාදිභාවය කෙසේ ද? යත්:- බඹසරවස් රක්නා යම්කිසිවෙක් මාගමුන්ගේ. ඇඟිලිම් නැගැවීම් අතපය මැඩීම් යනාදී කායික වතාවත් ඉවසාද එහි ඇලේද ඊට කැමතිවේද එයින් සතුටට පත්වේද් ඒ වූකලි බඹසරවස කඩවීමය සිදුරුවීමය කබරසහිතවීමය තිත්සහිතවීමය යි කියනු ලැබේ. එසේම ඇතැම් කෙනෙක් මාගමුන් හා කෙලෙස් වශයෙන් සිනාසෙන්නේවේද කායසංසර්ගවශයෙන් ක්‍රීඩාකරන්නේවේද සම්භාරයෙන් මමත්වය උපදවන්නේවේද ඔහුගේ බ්‍රහ්මචර්‍ය්‍යාශයද කඩවූයේ වෙයි සිදුරුවූයේවෙයි කබරසහිත වූයේ වෙයි තිත් සහිතවූයේ වෙයි. තවද ඇතැම් කෙනෙක් රාගනිශ්‍රිත සිතක් පෙරටුකොට ඇසින් ඇස නොම්බලා සිටීමය 'යි කියනලද "දර්‍ශනරාගයෙන්ද", රාගනිශ්‍රිත සිතක් පෙරටුකොට ශබ්දශ්‍රවණය කිරීමය යි කියනලද "ශ්‍රවණරාගයෙන්ද", රාග නිශ්‍රිත අදහසින් කළ කිදේ සිහිකිරීමය යි කියනලද "අනුස්මරණ රාගයෙන්ද" පස්කම්සැප විඳුනාසත්‍වයන්ගේ සැපතෙහි ඇලීම ය යි කියනලද "කාමරාගයෙන්ද", මේ බඹසරවස්රැකීමෙන් මම දෙවියෙක් බඹෙක් වන්නෙමැයි සිතනුවනට උපදනා "තෘෂ්ණා පරාමාශයෙන්ද",යන මේ සියල්ලෙන්ම බඹසරවස කඩවන්නේය සිදුරුවන්නේය කබරසහිතවන්නේය තිත් සහිත වන්නේයයි දතයුතු. මෙසෙයින් ශීලයාගේ කෙලෙසීම සැකෙවින් කියා නිමවන ලදී.

ශීලයාගේ විශුද්ධිසංඛ්‍යාත පිරිසුදු භාවය කෙසේද? යත්:- සර්‍වප්‍රකාරයෙන් ශික්‍ෂාපද නොබිඳීමය යි කියනලද "අඛණ්ඩ" භාවයෙන්ද, සිදුරු නොකිරීමයයි කියනලද "අච්ඡිද්‍ර" භාව යෙන්ද, කැලැල් රහිතවීමයයි කියනලද "අසබලත්ව"යෙන්ද, තිත් රහිත වීමයයි කියනලද "අකල්මාෂ" භාවයෙන්ද එසේම සප්තවිධ මෛථුනයෙහි නොයෙදීමෙන්ද යි යන මෙතෙක් කාරණයෙන් ශීලය පිරිසුදුවෙයි. යම්හෙයකින් අපිරිසුදු බවක් ඇතිවූවද ඊට පිළියම් කිරීම් වශයෙන් ප්‍රකෘතියට පැමිණවීමද ශීලවිශුද්ධියයි දතයුතුයි.

තවද කිපීමලක්‍ෂණකොට පළමුව උපදනා ද්වේෂ සහගත සිතය, බද්ධවෛරය වශයෙන් උපදනා ද්වේෂ සහගත සිතය, අනුන්ගේ ගුණ මැකීම් වශයෙන් උපදනා ද්වේෂ සහගත සිතය, අනුන්ගේ ගුණ හා සමගුණ ඇතිවිය නොහෙමි යන දෞර්මනස් සහගත සිතය, යන මේ ද්වේෂය මුල්ව උපදනා අකුශල චිත්තයෝද;

පර සම්පත්තෙහි ගැටෙමින් උපදනා ඊර්ෂ්‍යා සහගත සිතය, ස්වකීය සම්පත සඟවන මසුරුබව මුල්ව උපදනා අකුශල සිතය, ඇතිදෙය් මුවහකරන ලොභාකාරවූ සිතය, තමාකෙරෙහි නැතිගුණ පහළකරනු කැමැති ලොභවිකාර සිතය, යනමෙකී ලොභමූලිකා අකුශල චිත්තයෝද;

චිත්තවිකාරයෙන් දූෂිවූ අකුශල සිතය, අනුන්ගේ ගුණ මතුවිය නොදෙනු කැමති දෙම්නස් සහගත සිතය, ජාත්‍යාදී යෙන් තමා උසස් කරනු කැමති මාන සහගත සිතය, අතිශයින් සම්ප්‍රකාරයෙන් මැ තමා උසස්කරනු කැමති අතිමාන සහගත සිතය, ජාති මදාදි වශයෙන් සතුටුවෙමින් උපදනා මාන සහගත සිතය, පස්කම් සැපතෙහි ප්‍රමාදවීම් වශයෙන් උපදනා ලොභ සහගත සිතය, යන මෙකී වෙෂ මූලික ලොභමූලික අකුශල චිත්තයෝ ද; යන මේ පාපධර්මයන් නොයිපදවීම් වශයෙනුදු ශීල විශුඩිය දූනවිය යුත්තාහුයැ. අලොභ අදහස් ඇති බවය, ලද දෙයකින් සතුටුවන බවය, මනාකොට කෙලෙස් ලියන (සාපා හරිණ) බවය, යනාදි ගුණදම් ඉපදවීම් වශයෙනුදු ශීලවිශුඩිය ඇතිකරගත යුතුසි.

මෙසෙසින් පිරිසුදු වූ ශීලය වනාහි තෘෂ්ණාදාශත්වයෙන් මුදා රහත් බව එළවන බැවින් "**භුජිස්ස**" නම් වේ. නුවනැත්තවුන් විසින් පසස්නාලද බැවින් "**විඤ්ඤුප්පසත්ථ**" නම් වේ. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් නොඅල්වාගනු ලබන බැවින් ."**අපරාමඨ**" නම්වේ. උපචාර සමාධිය හා අර්පණා සමාධිය පිණිස පවත්නා බැවින් "**සමාධිසංවත්තනික**" නම් වේ. එබැවින් සකල ගුණ නිධාන වූ ශීල ගුණ දම් පිරීමෙන් හා ශීලවිශුඩිය ඇතිකරගැනීමෙන් ලොවී ලොවුතුරා සැපත් සිඩකටයුතු.

තස්මා හි ලොකියෙතර
සුඛමිච්ඡන්තා පතිස්සතා හවථ;
සීලම්හි යතො සීලෙ
තථෙ තථා විශුඩියොපස්සථ.

ගුණරතන ප්‍රණීත විශුඩි දීපිකා නම් ලද ධර්මප්‍රකරණයෙහි
**ශීලවිශුඩි නම් මිනිය පරිච්ඡේදය නිමි.**

# චි ත්ත වි ශු ද්ධි ය.

---

නීවරණා'පගමා ච
ඣානඞ්ගානං සමාගමා චෙව;
චිත්ත විසොධනතො චතු-
ඣානං ජඤ්ඤ 'ත්‍ර "චිත්තසුද්ධිති."

---

**කො සමාධි? කෙනට්ඨෙන සමාධි? කානස්ස ලක්ඛණරස පච්චුපට්ඨාන පදට්ඨානානි? කතිවිධො සමාධි? කො චස්ස සංකිලෙසො? කිං වොදානං? කථං භාවෙතබ්බො? සමාධිභාවනාය කො ආනිසංසො 'ති? තත්‍රිදං විස්සජ්ජනං:-**

සමාධිය යනු කුමක්ද? කවරාර්ථයකින් සමාධිනම් වන්නේද? සමාධිහුගේ ලක්ෂණය කෘත්‍යය ඵලය ආසන්නකාරණය යන මොහු කවරහුද? ඒ සමාධිය කෙතෙක් ප්‍රභෙද ඇත්තක්ද? ඔහුගේ කිළුටු භාවය කුමක්ද? පිරිසුදු භාවය කුමක්ද? සමාධිය කෙසේ වැඩිය යුතුද? සමාධි භාවනාවෙහි අනුශස් කවරේද? යන මේ ප්‍රශ්න කර්මයෙහි මතු කියනු ලබන්නේ විසඳීමයි.

"**කො සමාධිති? කුසලචිත්තෙකග්ගතා සමාධි**" යන මෙහි සමාධිය නම් කුමක්ද? යත්.- කුශල චිත්තෛකාග්‍රතා තොමෝ සමාධි නමැයි දක්වූහ. (මෙහිදී අභිමත කරනු ලබන්නේ චිත්තශීර්ෂයෙන් දැක්වුණු ලෞකික සමාධිය බැවින්) අනවද්‍ය සුඛවිපාක ලක්ෂණකොට ඇති කුශල චිත්තයාගේ ඒකාග්‍රතාව හෙවත් එකම අරමුණක චිත්ත චෛතසික යන්ගේ නොවිසිර පැවැත්ම සමාධි නම්. චිත්තවිශුද්ධ්‍යාවශරයෙහි සමාධි කථා කුමටය? යත්:- "චිත්තං පඤ්ඤඤ්ච භාවයං" යන බුද්ධ වචනයෙහි "චිත්ත" ශබ්දයෙන් සමාධිය වදාළ හෙයිනි. නානාවිධ අරමුණු ගැන්මෙන් කාලුෂ්‍යභාවොපගත වූ චිත්තය නීවරණ විගමනයෙන් හා ධ්‍යානාඞ්ගසමාගමයෙන් සම්භවන සමාධිය කරණ කොටගෙන විශුද්ධියට පැමිණේනු යි, කාරණොපචාර වශයෙනුදු සමාධිය චිත්තවිශුද්ධි නමැයි දතයුතුයි.

"**කෙනට්ඨෙන සමාධිති? සමාධානට්ඨෙන සමාධි; කිමිදං සමාධානං නාම? එකාරම්මණෙ චිත්ත චෙතසිකානං සමං සම්මා ච ආධානං ඨපනන්ති වුත්තං හොති**" කවරාර්ථයකින් සමාධිනම් වේද? යත්:- සමාධානාර්ථයෙන් (මනාකොට පිහිටු

වන අර්ථයෙන්) සමාධි නම් වේ. කුමක කුමක් පිහිටුවන්නේද? යත්:- එකම අරමුණෙක චිත්ත චෛතසිකයන් පිහිටුවන්නේ යැ. යම් ධර්මයක්හුගේ බලයෙන් චිත්ත චෛතසික ධර්මයෝ එකම අරමුණෙක සමව මනාව පිහිටුවීම හෝ තැබීම සමාධානාර්ථය යි දක්වූ හෙයින් ඒ මේ චිත්ත චෛතසිකයන්ගේ පිණ්ඩීකරණාර්ථයෙන් සමාධිය යි කියනු ලැබේ. ඕ කවරක්ද? චිත්තෛකාග්‍රතා නම් වන්නී ය, ඕතොමෝ වික්ෂෙප ප්‍රතිපක්ෂයහයි දතයුතු.

**“කානස්ස ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානානීති? එත්ථ පන අවික්ඛෙපලක්ඛණො සමාධි වික්ඛෙප විධංසන රසො අවිකම්පන පච්චුපට්ඨානො සුඛමස්ස පදට්ඨානං”** ඒ සමාධියගේ ලක්ෂණ කෘත්‍ය ඵල ආසන්නකාරණා යන මොහු කවරහුද? යත්:- සමාධිය නානාලම්බණයෙහි චිත්තචෛතසිකයන් නොවිසුරුවන බව ලක්ෂණකොට ඇත්තේයැ. වික්ෂෙපය සි කියනලද නොයෙක් අරමුණුහි චිත්ත චෛතසිකයන් ගෙනගොස් බහාලන බැව් නැසීම කෘත්‍ය හෝ සම්පත්කොට ඇත්තේයැ. උදහසින් චිත්ත චෛතසිකයන් නොසැලෙන බව ඵලකොට ඇත්තේ යැ. පස්කම් සැපතින් පහවූ නිරාමිෂ සුවය ආසන්න කාරණාකොට ඇත්තේ යැ, මේ බව “සුඛිනො චිත්තං සමාධියති” යනුවෙන් වදාළහ, බුදුහු. සුඛිත පුද්ගල තෙමේ සිත එකහකරන්නේයැ යනාර්ථයි.

**කතිවිධො සමාධීති? අවික්ඛෙපලක්ඛණෙන තාව එකවිධො; උපචාර අප්පණාවසෙන දුවිධො; හීන මජ්ඣිම පණීත වසෙන තිවිධො; දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි වසෙන චතුබ්බිධො; පඤ්චකනයෙ පඤ්චඣානඞ්ග වසෙන පඤ්චවිධො.** සමාධියකි ප්‍රකාරයක් වන්නේද? යත්:- නොයෙක් අරමුණුහි චිත්ත චෛතසිකයන් නොබහාලීම් සංඛ්‍යාත ලක්ෂණයෙන් එකවිධ වන්නේ යැ.

උපචාර සමාධි අර්පණා සමාධීන්ගේ වශයෙන් ද්විවිධ වන්නේ යැ. **“බුද්ධානුස්සති”** ආදි අනුස්මෘති කර්මස්ථාන සදෙනය; **“මරණසති උපසමානුස්සති”** යන කර්මස්ථාන දෙකය; **ආහාරෙ පටිකූලසඤ්ඤා, චතුධාතුවවත්ථානං”** යන කර්මස්ථාන දෙකය; යන මෙකී දශවිධ කර්මස්ථාන භාවනාවෙන් ලබනලද චිත්තෛකාග්‍රතාවද, අර්පණා සමාධියට පෙරටුවැ උපදනා චිත්තෛකාග්‍රතාවද, යන දෙක උපචාර සමාධිනමි. ප්‍රථමධ්‍යාන වීථිහුගේ ගොත්‍රභූසංඛ්‍යාත පරිකර්මචිත්තයට අනතුරුවැ උපදනා ප්‍රථමධ්‍යාන සිත හා සමග පවත්නා එකාග්‍රතාතොමෝ අර්පණා

සමාධි නැමැයි දතයුතු (මෙහි පරිකර්ම සිතට ගොත්‍රභූ ව්‍යවහාරය සමථයානිකයාගේ පරිත්ත ගොත්‍රාභිභවනයෙනැයි දතයුතු) ප්‍රථම ධ්‍යානය උපදවනු කැමැති මන්ද ප්‍රාඥතෙමේ කර්මස්ථාන භාවනා කරන කල්හි "ධ්‍යානය උපදනාසමයෙහි" සවැනි මනොද්වාරාවර්ජනය ට අනතුරුව ජවන් පස්කින් යුත් චිත්තවීථියක් උපදනේ යැ. එහි ප්‍රථම ජවනය පරිකර්මනම්. දෙවැනි ජවනය උපචාර නම්. තුන්වැනි ජවනය අනුලොමනම්. සිවුවැනි ජවනය ගොත්‍රභූ නම්. පස්වැනි ජවනය ධ්‍යාන නමැයි කීහ ඉක්බිති භවාඞ්ග දෙකක් ඉපිද වීථිනිරොධය වේ. මෙහි ජවන් පස අතුරෙන් දෙවැනි උපචාර නම් ලද චිත්තක්ෂණය හා යෙදුනු එකාග්‍රතාතොමෝ උපචාර සමාධි නම පස්වැනි ධ්‍යානචිත්තක්ෂණය හා සම්ප්‍රයුක්ත එකාග්‍රතා තොමෝ අර්පණා සමාධිනම්. ධ්‍යානය ලඟ හැසිරෙන අර්ථයෙන් උපචාරය යි කියාද කෙලශධර්මයන් විෂ්කම්භණය කරන හෝ යටපත්කරන අර්ථයෙන් අර්පණාය යි කියාද ව්‍යවහාර කරනු ලැබෙත්.

සමාධියගේ හීන මධ්‍යම ප්‍රණීත විභාගය කෙසේද? යත්:- ප්‍රථමයෙන්ම ලැබුනු සමාධිය හාත්පසින් දුර්වල බැවින් හීන සමාධියයිද, අතිශයින් භාවිතා නොකරනලද සමාධිය මධ්‍යමය යිද, පඤ්චප්‍රකාර වශීභාවයට පමුණුවන ලද සමාධිය ප්‍රණීතය යිද කියනු ලැබේ.

දුක්ඛාපටිපදාදීන්ගේ වශයෙන් දක්වනලද සතරකාරය කෙසේද?යත්:- දුක්වූ ප්‍රතිපත්ති හා අප්‍රකට නුවණැති සමාධියද, දුක්වූ ප්‍රතිපත්ති හා තියුණු නුවණැති සමාධිය ද, සැපවූ ප්‍රතිපත්ති හා අප්‍රකට නුවණැති සමාධිය ද, සැපවූ ප්‍රතිපත්ති හා තියුණු නුවණැති සමාධිය ද, යන මොවුන්ගේ වශයෙන් චතුර්විධ වන්නේ යැ. මෙහි දුක්වූ ප්‍රතිපද කවරී ද? අභිඥ කවරී ද? යි යතහොත්: පෘථිවි කසිණාදීන්ගේ වශයෙන් ධ්‍යානභාවනා කරන්නහුගේ ආරම්භයෙහි පටන් ඒ ඒ ධ්‍යානයාගේ උපචාරසිත දක්වා පැවති සමාධි භාවනා තොමෝ ප්‍රතිපදනමු. ඒ උපචාර චිත්තක්ෂණය පටන් අර්පණා චිත්තයන් දක්වා මේ දතුරෙහි උපන් ප්‍රඥවෝද අර්පණාචිත්ත සම්ප්‍රයුක්ත ප්‍රඥවද අභිඥ නම් වන්නී යැ. ඒ මේ ප්‍රතිපද තොමෝ නීවරණ විතර්කාදි විරොධ ධර්මයන්ගේ බාහුල්‍ය පැවත්ම හේතුකොටගෙන ඇතැම් යොගාවචරයන්ට දුක්වන්නී යැ, ඇතැම් කෙනෙකුට ඔවුන්ගේ බාහුල්‍ය සමායෝගයක් නැති හෙයින් සැප වන්නී යැ. අභිඥවද ඇතැම් කෙනෙකුට අප්‍රකට වෙයි හෙවත් මදවෙයි සුහුසුලු නොවූ පැවතුම් ඇතිවෙයි, ඇතැම්

කෙනෙකුට තියුණුවෙයි හෙවත් මඳවෙයි යුහුසුලු පැවතුම් ඇති වෙයි භාවනානුයෝගී යම් කිසිවෙක් නොසැපවූ සෙනසුන් ආදිය සෙවුනේද දශපළිබොධයන්ගේ උපච්ඡේදය නොකොළේ මැ භාවනාවිධානයාගේ නොපිරිහීම් ආදී පූර්වකෘත්‍යයන් නොකොළේද දශවිධ අර්පණා කෞශල්‍යයෙන් තොරවූයේද ඕහට දුක්වූ ප්‍රතිපත්ති වන්නියැ. අප්‍රකටවූ අභිඥද වන්නී යැ. සැපවූ සෙනසුන් ආදිය සෙවුනාහට සැපවූ ප්‍රතිපත්ති වන්නි යැ. තියුණුවූ අභිඥද වන්නි යැ. යමෙක් පළමු වැ සැපවූ සෙනසුන් ඇසුරු කොටැ පසු වැ නොසැපවූ සෙනසුන් සෙවුනේද ඕහට සුවවූ ප්‍රතිපත්ති හා අප්‍රකට අභිඥද වන්නී යැ. යමෙක් පළමු වැ නොසැපවූ සෙනසුන් ඇසුරුකොට පසුවැ සැපවූ සෙනසුන් සෙවුනේද ඕහට දුක්වූ ප්‍රතිපත්ති හා තියුණුවූ අභිඥද වන්නි යැ. මෙසේ ප්‍රථම චතුෂ්කයන්ගේද ද්විතියතෘතියයන්ගේද මිශ්‍රභාවය දතයුතුයි. පලිබො පසිඳුම් ඈ පෙරකිස නොසපයා බවන්නාහට දුක්වූ ප්‍රතිපත්ති වන්නී යැ. පාදත්‍යයාහට සැපවූ ප්‍රතිපත්ති වන්නී යැ.

තවද මේඅර්පය අර්පණාකෞශලයන්ගේ සැපයීම්නොසැපයීම් වශයෙනුදු තෘෂ්ණා අවිද්‍යාදෙදෙනාගේ මැඩපැවැත්වීම් උත්සන්න වීම් වශයෙනුදු සමථ විදර්ශනාදෙක්හි පූර්වජාතික අභ්‍යාස වශයෙනුදු තියුණුවූ රාගාදි කෙලෙස් හා මෘදුවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේද මදවූ කෙලෙස් හා තියුණුවූ ඉන්ද්‍රියයන්ගේද විද්‍යමානා විද්‍යමාන භාවයෙනුදු දතයුතුයි. මෙසේ දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදීන්ගේ වශයෙන සමාධිය චතුර්විධ වන්නේයැ.

පඤ්චප්‍රකාර සමාධි ප්‍රභේදය කෙසේද?යත්:- **"ප්‍රථමධ්‍යාන, ද්විතියධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන"** යන චතුෂ්කාණය, ප්‍රභේදයෙහි සඳහන් වූ ද්විතීයධ්‍යානය දෙකක් වශයෙන් බෙදා (දෙකට කඩා) ධ්‍යාන පඤ්චකය දැක්වූහ. "විතර්ක - විචාර - ප්‍රීති- සැප-ඒකාග්‍රතා" යන පඤ්චාඞ්ගසමන්වාගතවූයේ ප්‍රථමධ්‍යානනමි." "විචාර ප්‍රීතිසැප ඒකාග්‍රතා" යන චතුරාඞ්ගයෙන් යුක්තවූයේ ද්විතීය ධ්‍යානනමි. "ප්‍රීතිසැප ඒකාග්‍රතා" යන අඞ්ගත්‍රයෙන් යුක්තවූයේ තෘතීය ධ්‍යාන නමි. "සැප ඒකාග්‍රතා" යන අඞ්ගවයෙන් යුක්ත වූයේ චතුර්ථධ්‍යාන නමි. "උපෙක්ෂා ඒකාග්‍රතා" යන අඞ්ගවයෙන් යුක්තවූයේ පඤ්චමධ්‍යාන නමැයි දතයුතුයි. මේ කියනලද්දේ පඤ්චකණය වශයෙනි.

**කොවස්ස සංකිලෙසො? කිං වොදානන්ති?** යන මෙහි සමාධියගේ කෙලෙසීම හා පිරිසුදු භාවය කෙසේද? යත්:- සමාධියගේ කෙලෙසීම නම් හාන භාගී ධර්ම හෙවත් ධ්‍යානයෙන් පිරිහීම සෙවුනා ධර්මයි. එනම්:- පස්කම් සැප පිළිබඳ සංඥා

මනස්කාරාදිය පැවැත්වීම හෝ තදනුකූල ජවනාවර්ජනයන්ගේ පැවැත්මයි. ධ්‍යානලාභියෙක් පස්කම් සැපතෙහි ගිජුවූයේද එහි සිත් ඇලවූයේද කාමවිතර්කයන් කල්පනා කෙරේද ඔහුගේ සමාධිය කෙළෙසුනා නම් වෙයි.

සමාධියගේ පිරිසුදු භාවය නම් විශෙෂ භාගිධර්ම හෙවත් මතු විශෙෂාධිගමයට හේතුවූ ධර්මයි. එනම්:–වශිප්‍රාප්ත ප්‍රථමධ්‍යානාදියෙන් නැගී ද්විතීයධ්‍යානාදීහු කෙසේ උපදවන්නෙම් දෙහෝයි සිතනුවනට උපදනා සංඥ මනස්කාරයෝයි,= හෙවත් ජවනාවර්ජනයෝයි. මතුමත්තෙහි වූ ධ්‍යාන විදර්ශනාදීන්ගේ ප්‍රතිලාභය පිණිස මනස්කාර කරන්නහුගේ සමාධිය වොදානපාක්ෂික (පිරිසිදු පක්ෂයෙහිවූයේ) යයි දතයුතු.

**කථං භාවෙතබ්බොති?** යො පනායං ලොකියො (සමාධි) සො වුත්තනයෙන සීලානි විසොධෙත්වා සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන යවාස්ස දසසු පලිබොධෙසු පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වා කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසංකමිත්වා අත්තනො චරියානුකූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ විහරන්තෙන ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බොති; අයමෙත්ථ සඞ්ඛෙපො.

**සමාධිය කෙසේ වැඩිය යුතුද?** යන ප්‍රශ්නයෙහි විසඳීම නම්:–යම්මේ ලෞකික සමාධියෙක්වේද ඒ සමාධිය දට ශීලවිශුද්ධියෙහි ආක්‍රමයෙන් ශීලය පිරිසිදුකොට විශුද්ධශීලයෙහි පිහිටියහු විසින් තමහට දශපලිබෝධයන්ගෙන් යමක් ඇත්නම් ඒ පලිබොධයන් පසිඳ කමටහන්දෙන කල්‍යාණමිත්‍ර ආචාර්යවරයෙකු වෙතැ එළඹැ තමාගේ චරිතයට සුදුසු සමසතළිස් කමටහන් අතුරෙන් එක්තරා කමටහනක් ගෙන සමාධි භාවනාවට නුසුදුසු අටළොස් විහාර අත්හැර පචාඞ්ගයෙන්යුත් සුදුසුවෙහෙරක වෙසෙමින් දීඝනඛාදි ක්ෂුද්‍රපලිබොධයන් නසා සියලු භාවනාවිධි නොපිරිහෙලා භාවනා කටයුත්තේය.

මෙසේ භාවනා ක්‍රමය අති සංක්ෂෙප මුඛයෙන් කියනලද්දේ නමුදු මෙහිදී විස්තර කටයුතු කරුණු අටක ඇතිවෙත්. එනම්:– "දසපලිබොධ, කල්‍යාණමිත්‍රත්වය, චරිතවිභාග, සමසතළිස් කම්ස්ථාන, නුසුදුසු අටළොස්මහාවිහාර, පසඟින් යුත් සුදුසු විහාර, ක්ෂුද්‍රපලිබොධ, භාවනාක්‍රම" යන මොහුයි. මෙතැන් සිට මේ කරුණු පිළිවෙළින් විස්තර කරනු ලැබේ.

'ආවාසො ච කුලං ලාභො ගණො කම්මඤ්ච පඤ්චමං
අද්ධානං ඤාති ආබාධො ගන්ථො ඉද්ධීති තෙ දස''

ආවාසය කුලය ප්‍රත්‍යලාභය පරිවාරගණ (සමූහ) ය නවකර්මාන්තය මාර්ගගමනය ඥාතීහුය රෝගාබාධය පර්යාප්ති ග්‍රහණය පුහුදුන් ඉර්ධිය යන මේ දශය (භාවනාවට අවිවෙක කම් ඇති කරන) පළිබොධයෝයි. එහි ආවාසනම්:- එක් ගැබක් ඇති ගෙයක් හෝ එක් පිරිවෙණක් හෝ මුළු සංඝාරාමය හෝ වෙයි. එහි පිළිබඳ සිත් ඇති මහණහටම ආවාස පළිබොධය වන බව මුත් සෙස්සනට නොවේ. කුලය නම්:- ඥාතිකුලය හෝ උපස්ථායක කුලයයි. උපස්ථායක කුලය සුවපත් කල මටද සුව වන්නේය යි සිතන්නහු විසින් කුලයා කෙරෙහි නියැළී මිශ්‍රව විසීම හෙතුකොටගෙන පළිබොධ වන්නේ යැ. ලාභය නම්:- චීවරාදි සිවුපසයෝයි. පිනැති මහණහට ගියගිය තැන බොහෝ පිරිකර සහිත මහදන් දෙන්නාහුයැ. ඒ මහණහුද ඔවුනට අනුමෙවෙනි බණදහම් කියන්නාහු මහණුවම් පිරීමට නොද අවකාශ ලබති. එබැවින් ලාභයද පළිබොධ වෙයි. ගණ පළිබොධය නම්:-සූත්‍රාභිධර්මය හදරණ ශිෂ්‍ය ගණයා යි. ඔවුනට පෙළ අටුවා අස්වමින් වසනුවනට සමාධිභාවනාව සඳහා තගමක් අවසර ඇත්තේ යැ. එබැවින් එයද පළිබොධ නමි. කර්ම නම්.- විහාරාරාමාදී නව කර්මයෝ යි. එහි යෙදී වසන භික්ෂුවටද භාවනානුයොගය සඳහා විවෙක නැති හෙයින් පළිබොධහයි දතයුතු. අද්ධාන නම්:- මාර්ගයෙහි යාමයි. යම් භික්ෂුවක්හට යායුතු ගමන් ඇත්නම් ඒ ගමන් ගොස් කටයුතු නිමවා වළට වැද මහණුවම් කටයුතු හෙයින් අදන්මගද පළිබොධ වෙයි. නෑයොනම්:- ආචාර්ය උපාධ්‍යායාදීහුයි. මොවුන් ගිලන්වූවහුනම් වහා පිළියම් කොට ඒ පළිබොධ පසිඳිය යුතු හෙයින් එයද පළිබොධ නමි. ආබාධ නම්:- තමහට වැළඳි තිබෙන රොගාබාධයකි එබඳු යම් කිසි රෝගයක් ඇතද එය සුවකිරීමෙන්ම භාවනා කටයුතු හෙයින් ආබාධයද පළිබොධ වෙයි. ග්‍රන්ථ නම්- ත්‍රිපිටක පර්යාප්ති ධර්මය පරිහරණය කිරීමයි ඒ ධර්මය ඉගෙනීම් දැරීම් ප්‍රගුණ කිරීම් පිළිවිසීම් ආදියෙහි නියුක්ත වීමද භාවනාවට පළිබොධ වෙයි. ඉර්ධි නම්:- පෘථග්ජනයන් විසින් උපදවනලද ලෞකික සමාධියි. පුහුදුන්ගේ ඒ ඉර්ධිය පිටින් මිස නොගොනැහෙන (උත්තානසෙය්‍යක) දරුවෙකුමෙන්ද පැලපතගොයමක් මෙන්ද උපද්‍රව අධික හෙයින් දුකසේ පරිහරණය කටයුතුවෙයි. එබැවින් එය විදර්ශනා වඩනුවනට මුත් සමාධිභාවනාකරන්නවුන්ට නොද පළිබොධවේ. එබැවින් යොගීහු විසින් මෙකී දශපළිබොධ පසිඳිය යුක්තාහයි දතයුතු.

සබ්බත්ථ කම්ස්ථාන පාරිහාරිය කම්ස්ථාන යන ද්විවිධ කම්ස්ථානයන් දෙන්නාවූ කල්‍යාණමිත්‍රතෙමේ කෙබඳු ස්වභාව ඇත්තෙක් වියයුතුද? යන බව දක්වන්නාහු:-

පියො ච ගරු භාවනීයො-වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා නොචට්ඨානෙ නියොජයෙ

යනු කීහු. යමෙක් තමාගේ ශීලසම්පද හෙතුවෙන් ප්‍රියවේද එහෙයින් මැ පාෂාණඡත්‍රයක් මෙන් ගරුවේද, ගුණවිසින් බුහුමන් කටයුතුවේද, ඔවදන් දෙනසුලු වේද, චොදනා වශයෙන් පිළිවිසි තෙපුල් පවා විපුල් සිතින් ඉවසාද. ප්‍රතීත්‍ය සමුත්පාදාදි සුගැඹුරු දහම් කථා නොගැඹුරුසේ කියනසුලු වේද, නොමනා තන්හි නහමක් යොදවන්නේද, මෙ කීතාක් ගුණ ගෙණෙන් හිමි හේතෙමේ ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග වීර්‍ය්‍ය ස්මෘති සමාධි ප්‍රඥා සංඛ්‍යාත ගුණාභරණ විභූෂිත වූයේමැ, එකැනියෙන් අඩුනොව හිතවැඩකිරීමෙහි නිරත හෙයින් "කල්‍යාණමිත්‍ර" වේමයැ. එබැවින් මෙබඳු කල්‍යාණ මිත්‍රයෙකු වෙතැ පැමිණැ කමටහන් ගතයුතුබව දක්වන ලද්දී.

ඉක්බිති චරිත විභාගය දක්වනුලැබෙ. මෙහි වනාහි මූල චරිතයන්ගේ වශයෙන් සදෙනෙක් වෙති. ඔහු කවරහුද? යත්:- රාගචරිතයාය, ද්වෙෂචරිතයාය, මොහචරිතයාය, ශ්‍රද්ධාචරිතයාය, බුද්ධිචරිතයාය, විතර්කචරිතයාය, යන මොහුවෙත්. මොවුන්ගේ සංඛ්‍යාවිභාග දක්වනුවෝ:-

"රාගාදිකෙ තිකෙ සත්ත සත්ත සද්ධාදිකෙ තිකෙ
එක ද්වි තික මූලම්හි මිස්සතො සත්තසත්තකං" යි කීහු.

මෙහි "රාග-දොස-මොහ-රාගදොස-රාගමොහ-දොසමොහ-රාග දොස මොහ" යන රාගාදි ත්‍රිකයෙහි එක් සප්තකයෙක. එසේම "සද්ධා-බුද්ධි-විතක්ක-සද්ධාබුද්ධි-සද්ධාවිතක්ක-බුද්ධිවිතක්ක-සද්ධාබුද්ධිවිතක්ක,, යන ශ්‍රද්ධාදිත්‍රිකයෙහි එක් සප්තකයෙකැයි මෙසේ ත්‍රිකයුගලයෙහි අමිශ්‍ර චරිතයෝ තුදුස්දෙනෙකි. තවද රාගාදිත්‍රිකය ශ්‍රද්ධාදිත්‍රිකය හා මිශ්‍රකොට රාගමූලක දොසමූලක මොහමූලක සංඛ්‍යාත එකමූලකත්‍රය තුනෙහි සප්තකත්‍රයක් හා ද්විමූලකත්‍රයෙහි සප්තකත්‍රයද ත්‍රිමූලකත්‍රයෙහි සප්තකයදැයි මෙකී සප්තක සතෙහි එකුන්පනස් චරිතකෙනෙක් වන්නාහ. මෙම එකුන්පනස හා මූලකී අමිශ්‍ර චරිතතුදුස එක්කොටගත් කල්හි තෙසැටක් (63) චරිතයෝ වන්නාහයි දතයුතුයි.

ඒ මේ රාගාදි චරිතයන්ගේ එකොසී ප්‍රකෘතිහු ,,පෙරජාතියෙහි පුරුදුකරනලද්දක් කාරණකොටද සතරමහා භූතයන්ගේ උත්සන්නතාව හෙතුකොටගෙනද, වාතාදි දොෂත්‍රය කාරණකොටද, වන්නාහ යි මතාන්තර ඇතද, කර්මායූහනක්ෂණයෙහි හෙවත් කුශලාකුශල කර්මයන් රැස්කරන අවධියෙහි පැවැති, ලොභාදි ෂඩ්විධ හෙතූන්ගේ ශක්ති ස්වභාවය හෙතුකොටගෙන සම්භවන්නාහ යි අර්ථකථා විනිශ්චය සාරයෙහි දක්වා තිබේ. පෙර ජාතියෙහි සත්ක්‍රියා බහුලත්වයෙන් හා දිව්‍යසුඛානුභව කිරීමෙන් යුක්ත වැ සිට එයින් සැවැ මේ මිනිස් ලොවැ උපදනුයේ රාගචරිත වේ. යටජාතියෙහි පරඝාට වධ බන්ධනාදිය හා බද්ධවෛර කළාහුද නිරයදුක් අනුභව කළාහුද එයින් සැව මෙහි උපදනාහු ද්වෙෂචරිතයෝ වෙත්. පෙර අත්බැව්හි රහමෙර පානය කළාහුද නොඇසූපිරූතැන් ඇත්තාහුද තිරිසන් යෝනියෙහි වාසයකළාහුද මෙහි උපදනාහු මොහචරිතයෝ වෙති, මහාභූතයන්ගේ වශයෙන් වනාහි පෘථුවිධාතු ආපොධාතු දෙදෙනාගේ උත්සන්නතාවයෙන් මොහචරිත වීමද තෙජොධාතු වායොධාතු දෙදෙනාගේ උත්සන්නතාවයෙන් ද්වෙෂචරිත වීමද සතර ධාතූන්ගේ මැ සමප්‍රවෘත්තියෙන් රාගචරිත වීමද කියන ලදී. මෙකියනලද්දේ අසම්භාව්‍ය වූ මතාන්තරභෙද නමැයි දතයුතු.

සම්භාව්‍ය වූ අර්ථකථා සාරය කීසේ යැ?යත්:- "ලොභ ද්වෙෂ, මොහ; අලොභ අද්වෙෂ අමොහ" යන ෂඩ්විධ හෙතූන්ගේ වශයෙන් චරිත සම්භවය දක්වීමයි. එනම්:- කුශලාකුශල කර්මායූහනක්ෂණයෙහි යම් කිසිවෙකුගේ ලොභය අධිකවත් ද්වෙෂ මොහ දෙක දුර්වලවත් පැවැත්තේ ද ඔහු ලොභොබී කාරුණික පැණවතෙක් වැ උපදී. යමෙකුගේ ද්වෙෂය අධිකවත් ලොභ මොහ දෙක දුර්වලවත් පැවැත්තේ ද ඔහු කිපෙනසුලු ත්‍යාගවන්ත පැණවතෙක් වේ. යමෙකුගේ මොහය අධිකවත් ලොභ ද්වෙෂ දෙක දුර්වලවත් පැවැත්තේ ද ඔහු මුලාසිහි ඇති ත්‍යාගවන්ත කාරුණිකයෙක් වේ. යමෙකුගේ අලොභය අධිකවත් අද්වෙෂ අමොහ දෙක දුර්වලවත් පැවැත්තේද ඔහු දෙනසුලු කිපෙන අනුවණයෙක්වේ. යමෙකුගේ අද්වෙෂය අධිකවත් අලොභ අමොහ දෙක දුර්වලවත් පැවැත්තේ ද ඔහු කාරුණික ලොකොභී අඥනයෙක් වේ. යමෙකුගේ අමොහය අධිකවත් අලොභ අද්වෙෂ දෙක දුර්වලවත් පැවැත්තේ ද ඔහු ප්‍රඥාවන්ත ලොභොබී කිපෙනසුලු කෙනෙක් වෙතැයි දතයුතු මේ ඒකාධික හෙතු නයයි.

එසේම ලෝභ ද්වේෂ දෙක අධික වැ මෝහය දුර්වලවීමෙන් ලෝභාවිෂ්ට කිපෙන පැණවතෙක් වීමද; ද්වේෂ මෝහ දෙක අධික වැ ලෝභය දුර්වලවීමෙන් කිපෙන සුලු අඥාන ත්‍යාගවන්තයෙක් වීමද; මෝහ ලෝභ දෙක අධික වැ ද්වේෂය දුර්වලවීමෙන් අඥාන ලෝභාවිෂ්ට කාරුණිකයෙක් වීමද; අලෝභ අද්වේෂ දෙක අධික වැ අමෝහය දුබලවීමෙන් දෙනසුලු කාරුණික අඥානයෙක් වීමද; අද්වේෂ අමෝහ දෙක අධික වැ අලෝභය දුබලවීමෙන් කාරුණික පැණැති ලෝභාවිෂ්ටයෙක් වීමද; අමෝහ අලෝභ දෙක අධික වැ අද්වේෂය දුබලවීමෙන් පැණැති ත්‍යාගවන්ත කිපෙන ස්වභාව ඇත්තෙක් වීමද; දතයුතුයි. මේ ද්විකාධික හෙතු නයයි.

තවද යමෙකුගේ ලෝභ ද්වේෂ මෝහයන් අධිකවීමෙන් අලෝභ අද්වේෂ අමෝහයෝ දුර්වලවූවෝද ඔහු ලෝභාවිෂ්ට කිපෙන ගතියෙන්යුත් අඥානයෙක් වන බවද; යමෙකුගේ අලෝභ අද්වේෂ අමෝහයන් අධිකවීමෙන් ලෝභ ද්වේෂ මෝහයෝ දුර්වල වූවෝද ඔහු දෙන සුලු කාරුණ්‍යගුණයෙන් යුත් ප්‍රඥාවන්තයෙක් වන බවද සැලකිය යුතුයි. මේ ත්‍රිකාධික හෙතුනයයි. මෙසේ තුදුස් නය විභාග කොතෙක් වූහ.

මෙසේ පුද්ගලයන් අතුරෙහි යමෙක් කර්මායුහනක්ෂණයෙහි ලෝභසහගත වීද රාගචරිතවෙයි. ද්වේෂ සහගතවීද ද්වේෂචරිත වෙයි. මෝහ සහගතවීද මෝහචරිත වෙයි. ප්‍රඥාසහගතවීද බුද්ධි චරිත වෙයි. ශ්‍රද්ධාබහුලවීද ශ්‍රද්ධාචරිත වෙයි. කාමවිතර්කාදීන් පරිවෘත වීද විතර්ක චරිතවේය යි දතයුතුයි. මේ කියන ලද්දේ මූලචරිත විභාගයයි. මිශ්‍රචරිත විභාගය වනාහි මොවුන්ගේ සම්මිශ්‍රණයෙන් දතයුත්තේ යැ. ඉක්බිති අසවිලා මෙනම් චරිත ඇත්තෙක යනාදි ක්‍රමයෙන් ඒ ඒ චරිතයන් හැඳිනගන්නා පිළිවෙළ දක්වන්නා හු:-

"ඉරියාපථතො කිච්චා භොජනා දස්සනාදිතො
ධම්මප්පවත්තිතො චෙව චරියායො විභාවයෙ,, යනු කීහ.

ඉරියව්වු වශයෙන්ද කෘත්‍ය වශයෙන්ද භෝජන වශයෙන්ද බාහ්‍යාදීන්ගේ වශයෙන්ද ධර්මප්‍රවෘත්ති වශයෙන් දැයි මෙසේ පඤ්ච ප්‍රකාරයෙන් චර්‍ය්‍යාවන් ප්‍රකාශ කරන්නේ යැ. එහි ඉරියව්වු වශයෙන් වනාහි රාගචරිත පුද්ගලතෙමේ දුටුවින් පහදවන සුරුවන් ගමන් ඇතිවෙයි. වෙලෙව් ගමන් ඇතද සෙමින් පියවර තබයි. සම වැ තබයි. සම වැ උදුරයි. එසේවූවද අක් විළුඹින් බරවූ පාලකුණුවෙයි.

ද්වේෂචරිත තෙමේ බිම කණන්නක්හු සෙයින් වහා පියවර හෙළයි, වහා උදුරයි; තදින් භූමිසළුශිය කෙරෙයි; පසුභාගයෙන් ඇද ලද පාලකුණු වෙයි; මෝහචරිත තෙමේ ගාත්පස ව්‍යාකුල ගමන් ඇතිවෙයි. ත්‍රස්තවූවක්හු සෙයින් පියවර හෙළිම නැඟීම කෙරෙයි. අක් විළුඹින් බිම එබීයිය පාලකුණුවෙයි. රාගචරිතයාගේ හිඳීම හා සිටීම ප්‍රසාද එලවයි, යහපත් ආකාර ඇත්තේ වෙයි; ද්වේෂචරිතයාගේ දැඩිවූ ආකාරවෙයි, මෝහ චරිතයාගේ ඇළලුනු ආකාර ඇතිවෙයි.

රාගචරිතයා සෙමින් සෙමින් සමකොට අසුන් පණවා වැදහෙව අඟපසඟ සුරැකිව තබා ලොලවන ලීලාවෙන් සයනය කෙරෙයි. ද්වේෂචරිතයා වහවහා යම්තම් දූයෙකින් යහන් අතුට අවසඟ එකෙකු මෙන් යහනෙහි වැදහෙව මුහුණ හකුළුවා සයනය කෙරෙයි. මෝහචරිතයා දුටුවන් නොපහදින සටහන් ඇති සේ යහන් අතුට මුණින් වැදහෙව සයනය කෙරෙයි. නිදිගැට හැර නැඟිටින වේලෙහිද රාගචරිතයා වහානැඟීසිට සැක සහිතවූවෙකු මෙන් සෙමින් පිළිවදන්දෙයි. ද්වේෂ චරිතයාද වහා නැඟිසිට කිපියක්හු සෙයින් රළුබසින් පිළිතුරු දෙයි. මෝහචරිතයා හුංකාර ශබ්දපවත්වමින් කම්මැලිව සෙමින් නැඟී සිට පිළිතුරුදෙයි.

කෘත්‍ය වශයෙන් වනාහි රාගචරිත පුද්ගලතෙමේ ඇමදීම් ආදි කටයුතු කරන කල්හි නොදැඩි නොමොළොක් සේ සමව මූස්න අල්වා සුහුසුලු නොවී වැලි නොදවිසුරුවමින් නිකමල් ඇතිරියක් මෙන් පුලිනතල ඇතිරෙන සේ පිරිසිදුවැ හමදනේ යැ. ද්වේෂචරිතතෙමේ වැර සේ තරයේ මැ මූස්න අල්වා වෙලෙවි වෙලෙවි වැ දෙපාශ්වයෙන් වැලි උඩ නඟනහා රළුහඬ ඇතිකොට පවිත්‍රවුව ද නොසම කොට හමදනේ යැ. මෝහචරිත තෙමේ සිථිලකොට මූස්න අල්වා වැලි පෙරළ පෙරළා කැලිකසළ වැලිසමඟ විකලකර අපිරිසිදු විසමබව පැණෙනසේ හමඳනේ යැ. සෙසු කෘත්‍ය විෂයෙහිදු මේ නියායි.

භොජන වශයෙන් වූකලි රාගචරිතතෙමේ මුදු සිනිඳු බොදුන් ප්‍රිය වෙයි. සුමිහිරි මියුරුරසැති රැස්නේ යැ. බත්පිඬු රිසිසේ රසවිඳ වළඳයි. මධුර රසයක් ලද සොඳුරු මුහුණක් ඇතිවෙයි. ද්වේෂචරිතතෙමේ කුළු අරළු බොදුන් ප්‍රිය වෙයි. ඇඹුල් රසෙහි මත වඩයි. මුව නොපෝනා තරම් මහත් වූ පිඬුකොට රසනොවිඳ මැ සුහු සුහු වැ වළඳයි විරසවූ අහරක්

ලදින් දුර්මුඛ වෙයි. මොහචරිතතෙමේ නියමයෙන් එකෙක්ම කැමැතිවන්නේ නොවෙයි. කුඩා පිඩුකොට වළඳනුයේ බඳුනෙහි හුළු විසුරුවයි. අහර තැවරුණු අතින් ආකූලසේ අනුභව කෙරෙයි. නොයෙක් සිතිවිලි ඇතිවැ ප්‍රමාදව වළඳයි.

දර්ශනාදීන්ගේ වශයෙන් රාගචරිත තෙමේ මඳක් සිත්කළු රූපයක් දැකැ විම්හිත වූවෙකුමෙන් බොහෝ වේලාවක් බලාසිටී. මඳවූ ගුණයෙක ද ඇලෙන්නේ යැ. ඇත්තාවූ ද දෝෂය නොගන්නේ යැ. හැරයන්නහු ද නොමූදනු කැමැති වෙයි. වේෂචරිතතෙමේ මඳකුදු නොමනා දැයෙහි බොහොසේ කලකිරෙයි. ලෙසමාත්‍ර වරදෙහි පවා ගැටෙන්නේ වෙයි. ඇත්තාවූ ද ගුණය එසෙයින් නොපිළිගනී. හැරයන්නහු නිරපෙක්ෂකාව යාහැකි වෙයි. මොහචරිත තෙමේ යම් රූපයක් දැකැ සෙස් සත්ගේ බස්අසා සතුති හෝ නිඳුකෙරෙයි. හෙවත් අනුන් පසසන තෙමේත් පසසයි. අනුන් ගරහන තෙමේත් ගරහයි (විචාරණ බුද්ධි රහිතයයි කී නියා යැ ) ශ්‍රද්ධාචරිතාදීන්වද මෙකී ක්‍රම සමවෙත්.

ධර්ම ප්‍රවෘත්ති විසින් වනාහි රාග චරිතතෙමේ "ඇතිදෙස් මුවහ කරන මායාවෙන් ද, නැතිගුණ පහළ කරන සාඨ්‍යයෙන් ද, උන්නති ලක්ෂණ මාන්නයෙන් ද, පවිටු අදහස් ඇති ලාමක ඊප්ෂාවෙන් ද, තෘප්තියට නොපැමිණෙන මහිච්ඡතාවෙන් ද, ස්වකීය ලාභයෙන් සතුටුනොවෙන අසන්තුෂ්ටිතාවෙන්ද, නාගරිකයන්ගේ ප්‍රකෘතිසංඛ්‍යාත කෙලශ ශෘඞ්ගයෙන්ද, සැරසිමෙහි ලොල්වීම් සංඛ්‍යාත චාපල්‍යයෙන්ද" යන මේ ආදී පාප ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි. වේෂචරිත තෙමේ කිපීම ලක්ෂණ කොට ඇති ක්‍රෝධයෙන්ද බද්ධවෛරයයි කියනලද උපනාහයෙන්ද අනුන් ගුණ මැකීම ලක්ෂණකොට ඇති මකුගුණයෙන්ද යුගග්‍රහ ලක්ෂණ පලාසයෙන්ද අනුන් සැපත නොඉවසිය හැකි ඊර්ෂ්‍යාවෙන්ද තමා සැපත් සඟවනු කැමති මසුරුභාවයෙන්ද යන මෙකී පාපධර්මයන්ගෙන් යුක්තවූයේවෙයි. මොහොචරිත තෙමේ චිත්තයාගේ අකර්මණ්‍යතා ලක්ෂණපීනයෙන්ද වෙදනාදීන්ගේ අකර්මන්‍යතා ලක්ෂණ මිද්ධයෙන්ද අවූපසම ලක්ෂණ උද්ධත්‍යයෙන්ද විපිළිසර බවය යි කියනලද කෞකෘත්‍යයෙන්ද සංසය ලක්ෂණ විචිකිත්සායෙන්ද අනුවණින් නොමඟ දැඩිකොට ගැන්මෙන්ද එය බැහැර නොකළහැකි සවභාවයයි කියනලද දුප්පටිනිස්සග්ගිතාවයෙන්ද යුක්තවූයේ වෙයි. මේ බාහුල්‍යවෘත්ති වශයෙනි.

ශ්‍රද්ධා චරිතයාහට නිරාලය වූ වස්තුපරිත්‍යාග කටහැකි මුක්ත ත්‍යාගයද ආර්‍ය්‍යයන් දක්නා කැමැති බවද බණ අසනු කැමැති බවද ප්‍රීති බාහුල්‍යයද රජ ඇමැති ආදීන් සමග නොහැනී වසන බවද ඇතිදෙස් මුවහ නොකරන බවද තුන්රුවන්හි පැහැදීමද යනමෙකී ධර්ම බහුල වූ පවත්නේ යැ.

බුද්ධිචරිතයාහට සුවචබවද කල්‍යාණ මිත්‍රයන් ඇති බවද භොජනයෙහි පමණ දන්නා බවද සිහිනුවණ දෙකින් යුක්ත බවද අප්‍රමාදභාවයෙහි යෙදීමද කළකිරිය මනාතන්හි කළකිරිමද එසින්ම උත්සාහ වැඩීමද යන මෙකී ගුණධර්ම බහුලවූ වන්නේ යැ. විතර්ක චරිතයාහට දෙඩමළු බවද ගණයාකෙරෙහි ඇලුනු බවද කුශල ක්‍රියාවෙහි නොඇලීමද චංචලසිත් ඇති බවද රාත්‍රිකාලයෙහි එක්වන් වූ හිඳ සෙට දවසට කටයුතුදේ කල්පනා කිරීම් නමැති දුමින් දුමනබවද පසුදින දවල්හි තදනුකූල උත්සාහ කිරීම් නමැති ගින්නෙන් ජ්වලිත වීමද චිත්තයාගේ ආරම්මණ සංක්‍රමණයද යන මේ කාරුණු බහුල වූ පවත්නේය සි දතයුතු. මෙතෙකින් චරිත විභාගය අතිසංක්‍ෂෙප මුඛයෙන් කියා නිමවනලදී.

සමසතළිස් කර්මස්ථානයෝ නම්:- දශ කසිණයෝය, දශ අශුභයෝය, දශ අනුස්මෘතිහුය, සතර අප්‍රමාණ්‍යයෝය, එකාම සංඥාවය, එකාම ව්‍යවස්ථානය, සතර ආරූප්‍යයෝය යන මොවුහු වෙත්. කමටහන්දෙන අචාර්‍ය්‍යතෙමේ යොගාවචරයාගේ චරිතය දැන මෙයින් සුදුසු කමටහනක් නියම කරන්නේ යැ.

එසේ කර්මස්ථාන ඉගෙනගත් යොගාවචරයාහට භාවනානුයොගය සඳහා නුසුදුසු අටළොස් මහාවිහාර දක්වන්නාහු:- "මහාවාසං නවාවාසං" යනාදිය කීහ:- මහවෙහෙරය, අලුත්වෙහෙරය, ජරාවාස වෙහෙරය, මහමංඇසුරුකළ වෙහෙරය, පැන්කෙම් ඇති වෙහෙරය, පලාකොළ ඇති වෙහෙරය, මල් ඇති වෙහෙරය, ඵලාඵල ඇති වෙහෙරය, ප්‍රාර්ථනීය වෙහෙරය, නුවර ඇසුරුකළ වෙහෙරය, දර දුවදඬු ඇති වෙහෙරය. කෙත් ඇසුරුකළ වෙහෙරය, විසභාග භික්ෂූන් ඇති වෙහෙරය. පටුනුගම් හෙවත් ශුංකස්ථාන ඇසුරුකළ වෙහෙරය, රාජ්‍යසීමා ඇසුරුකළ වෙහෙරය, පසල්දනව් ඇසුරුකළ වෙහෙරය, නොසැප වෙහෙරය, කල්‍යාණ මිත්‍රයන් නොලැබිය හැකි වෙහෙරය යන මේ අටළොස් ස්ථානයන් භාවනානුයොගයට අයොග්‍යයහ.

යම් වෙහෙරක් පඤ්චාඞ්ගයකින් සමන්විතවූයේද එවෙහෙර භාවනානුයොගය සඳහා සුදුසු වන්නේ ය. ඒ මේ අඞ්ගපස කවරහුද ? යත්:- මිනිස් පියෙන් අඩගව්වකට වඩා නොදුරවීම හා, දුනුපත් සියකට වඩා නොලංවීමය, ගමනාගමන සම්පන්න වීම (යාමඊමේ පහසුව) ය්, දහවල් මහජන සන්නිපාතයෙන් තොරවූවක්වීමය, රාත්‍රියෙහි කථාශබ්ද නොඇසෙනසේ නිශ්ශබ්දවූ වෙහෙරක් වීමය. මැසි මදුරු දිඞ්ජාතීන්ගේ සළුශී නැති තැනක් වීමය, යන මොහුවෙත්. මෙබඳු වෙහෙරක වසන භික්ෂුවට සිවුපසය ලැබීමෙන් අදහස් පරිදි නිදහස් ඇතිවේද ධම්ධර විනයාචායඞ්වරහු ලැබෙද්ද උපන් සැක පසිඳිය හැකිවේද එබඳු වෙහෙරක් මැ සුදුසු වන්නේය යි දතයුතුයි.

මෙසේ සුදුසු සෙනස්නක වසන්නහු විසින් කුඩා පළිබොධයෝද පසිඳිය යුතුවෙත්. එනම්:- දික්වූ කෙශනඛාදිය සිඳිමය. දිරාගිය සිවුරු මැහිලිදූම්ම් ආදියෙන් පිළියම්කොට රැඳිමය, මලගත් පාත්‍රා පිසීමය, මැසිපුටු ආදිය පවිත්‍ර කිරිමය, යන මොහු වන්නාහ.

මෙසේ පසිඳිනාලද කුඩාපළිබොධ ඇති මහණහු විසින් සියලු භාවනා විධි නොපිරිහෙලා භාවනා කටයුතුයයි දක්වූහෙයින් මෙතැන් පටන් සමාධිභාවනා ක්‍රමය දක්වනු ලැබේ. භාවනා කර්‍මයට ස්ථාන වන හෙයින් කම්ස්ථානයයි කියනලද "සමසතළිස් කම්ස්ථානයන් අතුරෙන්" යම් කිසිවක් භාවනාකට යුතුබව අවිශෙෂයෙන් කිවද ඔවුන්ගේ ආදියෙහි දක්වෙන "පඨවිකසිණ" භාවනා ක්‍රමය දක්වම්හ.

භාවනාභිලාෂී ආදිකර්මිකතෙමේ ප්‍රථමයෙන් ශීලවිශුඞිය ඇතිකොට උක්තප්‍රකාර ආවාසාදී දශවිධ පිළිබොධයන් පසිඳැ ප්‍රිය ගරුභාවනීයාදී ගුණොපෙතකල්‍යාණ මිත්‍රයෙකු සමීපයට එලඹ තමාගේ චරිතානුකූල කම්ස්ථානයක් ඉගෙන මහා වාසාදී අෂ්ටාදශ විධ අනනුරූප විහාර දුරුකොට නාතිදූරාදි පඤ්චාඞ්ග සඞ්ගත විහාරයෙක වෙසෙමින් කෙශනඛහරණාදි කුඩා පළිබොධයනුදු පසිඳැ එක්වියත් සතරඟුල් පුළුල ඇති වටවූ කසිණ මණ්ඩලය අභිමුඛකොට තබා දෙරියන් වියත් පමණ අත්පසැ මනාකොට පැණවූ වියත්සතරඟුල් ප්‍රමාණ උසැති අස්නෙක්හි සුවෙන් හිඳ "අප්පස්සාදා කාමා" යනාදි ක්‍රමයෙන් මේ පඤ්චකාම සම්පත්තිහු නම් නිරාස්වාදඞ්යෙන් ඇට සැකිල්ලක් වැන්නැ නැවත නැවත දවනාඞ්යෙන් තණසුලක් වැන්නැ. අතිශයින් තවනාඞ්යෙක් ගිනිඅඟුරුවළක් වැන්නැ. එහා නැතිවියහැකි අඞ

යෙන් ස්වප්නයක් වැන්නා, සියලු අඟපසඟ බිඳින අර්ථයෙන් වෘක්ෂ ඵලයක් වැන්නා, අධිකුට්ටනාර්ථයෙන් (වෙසෙසින් කොටන) මස් ලොඹුවක් වැන්නා, විනිවිදිනාර්ථයෙන් අඬයටියක් වැන්නා. භය ඵලවනාර්ථයෙන් සර්ප හිසක් වැන්නා" යි මෙසේ කාමයෙහි ආදීනව සලකා සියලු දුක් කෙළවර කිරීමට කාරණාවූ නෛෂ්ක්‍රම්‍ය යෙහි හටගත් අභිලාෂ ඇතිව, "බුද්ධ ධර්ම සඞ්ඝ" ගුණානුස්මරණ යෙන් ප්‍රීතිප්‍රමොද්‍ය උපදවා මේ ප්‍රතිපත්ති තොමෝ බුද්ධාදි මහොත්තමයන් විසින් පිළිපදින ලද නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදා යි එහි හටගත් ගෞරව ඇතිව, සිත් පිහිටුවා, වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් යෙදී සමවූ අයුරින් ඇසදල්වා කිසුණෙහි වර්ණය ප්‍රත්‍යවෙක්ෂා නොකොට ලක්ෂණ මනස්කාරයෙහුදු නොරවා, වර්ණය නොහැර මැ උත්සද විසින් ප්‍රඥප්තියෙහි (කසිණාරම්මණෙහි) සිත් පිහිටුවා එකඟවූ සිතින් "පඨවී - පඨවී" යයි වාක් භෙදයෙන් භාවනා කටයුතුයි. (මෙතැන්හි කසිණාරමුණ "පරිකර්ම නිමිත්ත" නමි. එහි කරන භාවනාතොමෝ "පරිකර්ම භාවනා" නමු.)

යම් කලෙක ඒ පරිකර්මනිමිත්ත සිතින් ලද්දේවේද ඇසින් බලන්නෙකුට මෙන් මනොද්වාරික චිත්තයට හමුවේද හෙවත් ඇස පියාලා හෝ අන්‍යස්ථානයකට පැමිණ හෝ නමස්කාර කරනුවහට කසිණමණ්ඩලය සදෘශ වැ මනොද්වාරික ජවනයන්ට විෂයවූයේ ද එසමයෙහි එම අරමුණ උත්ග්‍රහනිමිත්ත නම් වේ. ඒ භාවනා ද සම ව හෝ මනාව එකාලම්බනයෙහි පිහිටන්නීය. එසේ චිත්තසමාධාන වශයෙන් සමාහිත වූ යෝගාවචර තෙමේ එයින් මතුවෙහි යථොක්ත උද්ග්‍රහනිමිත්ත විෂය කොට, භාවනා කරත් කරත් මැ යම් කලෙක උද්ග්‍රහනිමිත්තට වඩා පිරිසුදු වූ ප්‍රඥප්ති සංඛ්‍යාත කසිණඅරමුණ චිත්තයෙහි මොනවට පිහිටි යේ ද එකල්හි ප්‍රතිභාගනිමිත්ත උපනැ යි කියනුලැබේ.

එතැන් පටන් කාමච්ඡන්දාදි නීවරණසංඛ්‍යාත පරිපන්ථයන් කෙරෙන් විශෙෂයෙන් මැ පරිහීණවූ කාමාවචර සමාධිනම්ලද උපචාරභාවනා තොමෝ නිෂ්පන්නවූවා නම් වෙයි.

ඉන් මතු එහි ප්‍රතිභාගනිමිත්ත උපචාරසමාධියෙන් සමා සෙවනය කරන්නාහට රූපාවචරධ්‍යාන සංඛ්‍යාත විතර්කාදි පඤ්චාඞ්ගසමන්නාගත වූ ප්‍රථමධ්‍යාන චිත්තය පිහිටන්නේය යි දතයුතු.

මෙහි යටකී ක්‍රමයෙන් නිමිත්තග්‍රහණය කොට භාවනාකරන යෝගාවචරයා විසින් කලෙකින් ඇස දල්වා කලෙකින් ඇස පියාලා ආවර්ජනාකොට උද්ග්‍රහනිමිත්ත ඉපදවිය යුතු, යම් තාක්නූපදීද ඒතාක් මේ ක්‍රමයෙන්ම භාවනා කටයුතුයි. එසේ

භාවනාකරන්නාහට ඇසින් දක්නා සේම මනොද්වාරයට කසිණාරමුණ ආපාථගත වූයේද එකල්හි උද්ග්‍රහනිමිත්ත පහළවූයේය යි කියනලදී. එතැන් පටන් ඒ ස්ථානයෙහි නොසිට තමා වසන තැනකට පැමිණ භාවනා කටයුතු. එසේ කරන්නහුගේ තරුණවූ සමාධිය යම් අසත්ප්‍රායකින් නටුයේ නම් නැවතත් කසිණමණ්ඩලය වෙත පැමිණ ප්‍රතිභාගනිමිත්ත උපදවා ආපසු තමාගේ සෙනස්නට පැමිණ භාවනාකටයුතු. මෙසේ භාවනා කරන්නාහට අනුක්‍රමයෙන් කාමච්ඡන්දාදී නීවරණයෝ විෂ්කම්භිත වෙති. උපචාරසමාධීන් චිත්තය මනාව පිහිටන්නේය. ප්‍රතිභාග නිමිත්තද උපදනේ යැ.

මෙකී උද්ග්‍රහනිමිත්ත ප්‍රතිභාග නිමිත්ත යන දෙකේ වෙනස කෙසේද? යත්:-කසිණදොෂය පෙණෙන්නේ උද්ග්‍රහනිමිත්තනම්. ප්‍රතිභාගනිමිත්ත වනාහි ථවිකාවෙන් පිටත්කොට ගත් ආදශතලයක් මෙන්ද සුධොතශංඛයක් මෙන්ද මේඝමුඛයෙන් නිකුත් පුන්සඳ මඬලක් මෙන්ද උද්ග්‍රහනිමිත්ත ප්‍රදලනයකොට නික්මුනාක් මෙන් ශතගුණයෙන් සහශ්‍රගුණයෙන් සුපරිශුද්ධවැ වැටහෙන්නේයැ. ඒ ප්‍රතිභාග නිමිත්ත පහළවූතැන් පටන් යෝගාවචරයාගේ පචනීවරණයෝ විෂ්කම්භිතවූවෝම වෙති. කෙලශයන්ගේ සමුදාචරණයද නොවන්නේයැ. උපචාර සමාධීන් චිත්තය සමාහිත වන්නේයයි දතයුතුයි. මෙහි සමාධිතෙමේ උපචාර සමාධිය අර්පණාසමාධිය සි ද්විප්‍රකාරවන්නේයැ. උපචාර සමාධිහුගේ ප්‍රතිලාභයෙහි පචනීවරණයන්ගේ විගමණයෙන් චිත්තය සමාහිත වන බවද අර්පණා සමාධිහුගේ ප්‍රතිලාභයෙහි විතර්කාදී අඞ්ගයන් පහළවීමෙන් චිත්තය සමාහිත වන බවද දතයුතුයි. තවද උපචාරසමාධියෙහි අඞ්ගදූර්වලත්වයද අර්පණා සමාධියෙහි අඞ්ගයන්ගේ ස්ථිරත්වයද සැලකියයුතු වන්නේය. එබැවින් අර්පණාචිත්තය දවසක් මුළුල්ලෙහිත් සිටින්නේයි. එහි උපචාර සමාධිය හා සමග යම් ඒ ප්‍රතිභාගනිමිත්තක් පහළවීද එසේ වූ යොගාවචරයා විසින් එම පළගෙනීමහිඳ ඒ ප්‍රතිභාග නිමිත්ත වඩා අර්පණාවට පැමිණියයුතු වන්නේයැ. ඉදින් එසේ නොපැමිණිය හැකිවී ද ඔහු විසින් සක්විතිරජකුමරෙකු උපන් ගර්භයක් මෙන්ද දුලීභරත්නයක් මෙන්ද නිරතුරු වැ රක්ෂාකටයුත්තේය.

එසේ රක්නාහු විසින් ලබනලද ධ්‍යානය විනාශනොවන්නේයැ. එබැවින් මින්මතු ඒ ප්‍රතිභාග නිමිත්තරක්නා ක්‍රමය දක්වනු ලැබේ.

සප්තවිධ අසත්ප්‍රාය කරුණු දුරලීමෙන්ද සප්තවිධ සත්ප්‍රාය කරුණුසෙවනය කිරීමෙන්ද දශවිධ අර්පණා කෞශල්‍යය දනවීමෙන්ද ප්‍රතිභාගනිමිත්ත ආරක්ෂා කටයුතුවේ එහි සප්තවිධ අසත්ප්‍රාය සත්ප්‍රාය දෙක දක්වන්නාහු:-

"ආවාසො ගොචරො භස්සං පුග්ගලො භොජනං උතු
ඉරියා පථො 'ති සත්තෙ'තෙ අසප්පායෙ විවජ්ජයෙ;
සප්පායෙ සත්ත සෙවෙථ එවං හි පටිපජ්ජතො
නචිරෙනෙව කාලෙන හොති කස්සචි අප්පණා" යනු කීහු.

නොසැපවූ සෙනසුන් ගොදුරුගම් කථා පුහුලන් භොජන සෘතු ඊර්‍යාපථයන් දුරලීමෙන් සැපවූ ඔවුහුම සෙවන කරන්නාවූ යොගීහට නොබෝකලකින් මැ අර්පණා සමාධිය උපදනේය යි ප්‍රකාශිත හෙයින් ඔවුන්ගේ විස්තරය මෙසේ දතයුතු:-

යම් සෙනස්නක් ඇසුරුකරන්නාවූ යොගාවචරයෙකුට නූපන් ප්‍රතිභාග නිමිත්ත නූපදනේද පෙර උපන් නිමිත්ත හෝ නස්නේද නොඑළඹසිටි සිහිය නොඑළඹෙන්නේද එකඟනොවූ සිත එකඟනොවේද එබඳු ආවාසසෙනසුන් නොසැපවන්නේයැ ඊට වෙනස්වූයේ සැපවන්නේයි. එබැවින් යම්වෙහෙරක බොහෝ සෙනසුන් ඇතද එහි එකෙකී සෙනෙසුන තුන්තුන් දවස බැගින් වැස සත්ප්‍රායා සත්ප්‍රාය දෙක දතයුතුහයි කීහ. මෙම ලක්දිව සුළුන්නාලෙන් වැසි පන්සියක් භික්ෂූහු එහිම කම්ටහන්ගෙන රහත්ඵලයට පැමිණියෝයැ. සෙසුතැන්හි සෝවාන් ආදි මාර්ගඵල ලබා මෙම සුළුන්නාලෙනට පැමිණ රහත්වූවන්ගේ ගණන නැති. සිතුල්පව් මිහිඳුපව් ආදි විහාරයෝද මෙසේ මැයි. යම් ගොදුරුගමක් සෙනස්නේ සිට පිඬුසිඟා යනකල හෝ පෙරළා එනකල හෝ හිරුරැස් මුහුණට නොවදනා සේ උතුරෙන් හෝ දකුණෙන් පිහිටියේද ගමනාගමනයට පහසු පරිද්දෙන්විද සුලභවූ පිණ්ඩපාතය ඇත්තේද එබඳු ගොචරග්‍රාමය සැපවන්නේයැ. ඊටවෙනස්වූයේ නොසැපයයි දතයුතු. එසේම රාජකථාදි ස්වර්ගමොක්ෂ බාධක තිරශ්චීනකථා නොසැපවන්නේයැ. අල්පෙච්ඡතාදි දශකථාවෝම සැපවන්නාහ. තවද පමණදැන කාලොචිත කථාකරන්නවුන්ගේ ආශ්‍රය සැපවන්නේ යැ. අභූත බස්කියන වාචාලයන්ගේ ආශ්‍රය නොසැප්වන්නේයැ. (ඔවුහු ප්‍රසන්න ජලය කිළුටු කරන මඩවතුර වැනියාහ.) භොජනයද සෘතුගුණයද තමතමාට රුචිවූ පරිද්දෙන් සත්ප්‍රාය අසත්ප්‍රාය වන්නාහ. ඊර්‍යාපථයද තුන්දිනක් පරීක්ෂාකොට තමහට රිසිසේ සිත් එකඟවන පරිද්දෙන් සැපවිය යුත්තාහ. මෙසේද පිළිපදනාවූ යමෙක් හට අර්පණාසමාධිය නූපන්නේනම් ඔහු විසින් දශවිධ අර්පණ කුශලත්වය සැපවියයුත්තාහ. එනම්:-

වාහ්‍යාභ්‍යන්තර වස්තූන්ගේ නිර්මලත්වයද, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ සමානත්වය ඇතිකිරීමද, කසිණාදි නිමිත්තග්‍රහණයෙහි දක්‍ෂභාවයද, යොග්‍යපරිදි චිත්තයාගේ වැඩීම, නිග්‍රහ කිරීම, සතුටුකිරීම, මැදහත්භාවය යන සතරාකාරයද්, නොසන්හුන් පුගුලන් දුරුකිරීමද සන්හුන් පුගුලන් සෙවුමද, සමාධි ඉපද වීමෙහි කැමති බවද යන මෙකී කරුණු දශයයි.

මෙකී දශවිධ අර්පණා කෞශල්‍යය සැපයූ යොගාවචරයාහටද අර්පණාසමාධිය නූපදනේ නම් එපමණකින් නොනැවත මතුමත්තෙහි උත්සාහ වැඩියයුතු වන්නේයැ. එසේ ව්‍යායාම කරන්නහුගේ සිත ලීනොද්ධත්‍යභාවයෙන් වළකා සමකොට පවත්වාගත යුත්තේයැ. ඒබව උපමාවශයෙන් දක්වන්නාහු:-

"රේණුම්හි උප්පලදලෙ සුත්තෙ නාවාය නාළියා
යථා මධුකරාදීනං පවත්ති සම්පවණ්ණිතා;
ලීන උද්ධත භාවෙහි මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයෙ'ති" යනුකීහ.

පුෂ්ප පරාග (මල්රොන්) ය, මහනෙල්මල්පෙතිය, මකුළුහුයය, නැවය, තෙල්නළය, යන මෙහි මීමැස්සාය, ශල්‍යවෛද්‍යශිෂ්‍යයාය, මකුළුහුයගන්නාපුරුෂයාය, නැව්පදින්නාය, තෙල්වත්කරන්නාය, යනමොවුන්ගේ පැවැත්ම අටුවාහි යම්සේ උපමාවශයෙන් වණ්ණිතා කරන ලදද එපරිද්දෙන්ම හැකිලෙනබවය, උදහස් වන බවය, යන මෙයින් සම්ප්‍රකාරයෙන් මුදුනිමිත්තට අභිමුඛ කොට සිත මෙහෙයන්නේ යැ, යනු භාවයි.

මෙහි උපමා උපමේය දෙදෙනාගේ සම්බන්ධ මුඛයෙන් අර්ථ වණ්ණනාව කෙසේද? යත්:- යම්සේ අති දක්‍ෂවූ මීමැස්සෙක් අසවල්රුකැ මල් පිපිනැයි දැන තියුණුවෙගයෙන් පියාසර කර යන්නේ ඒ රුක ඉක්මගොස් නැවත ආපසුහැරී එනුයේ සුලන් ආදියෙන් මල්රොන් ක්‍ෂයවගිය කල්හි මැ පැමිණෙන්නේ යැ. අතික් අදක්‍ෂවූ මීමැස්සෙක් මදවේගයෙන් ප්‍රමාදව යන්නේ බොහෝ වේලාවක් ඉක්මීමෙන් මල්රොන් ක්‍ෂයව ගියකල්හි මැ පැමිණෙන්නේයැ. දක්‍ෂ මීමැසිතෙමේ වනාහි තියුණුනොවූද නොමඳවූද සමප්‍රමාණජවයෙන් යන්නේ සැපසේ මැ වෘක්‍ෂ ශාඛාදියෙහි සුපුෂ්පිත මල් රුසට පැමිණ රිසිසේ මල්රොන්ගෙන මී බැඳ මධුරස අනුභවකරන්නේ යැ.

තවද යම්සේ ශල්‍යකර්ම දන්නා වෛද්‍යාචාර්යයෙකු ළඟ "දිය තැටියෙහි තැබූ මහනෙල් පතෙහි නහර විදුම් ආදි" ශස්ත්‍ර කර්මයෙහි හික්මෙන අතවැස්සන් අතුරෙන් එක්තරා නොසන් සුන් අතිදක්‍ෂ අතවැස්සෙක් තියුණු වෙගයෙන් ශස්ත්‍රය

හෙලන්නේ මහතෙල් පත දෙබෑකොට පලන්නේ හෝ දියෙහි ගිලාබස්වන්නේ හෝ වෙයි. අතික් අදක්ෂවූ අතවැසියෙක් මහතෙල් පත කැපියේදෝ හෝ ගැලියේදෝ හෝ යි යන හයින් ශස්ත්‍රය ලංකරන්ටද නොපොහොසත් වෙයි. දක්ෂවූ අතවැසි-වනාහි තියුණුනොවූ නොමඳවූ සම ප්‍රයෝගයෙන් ඒ මහතෙල් පතෙහි ශස්ත්‍රපද දක්වා ශිල්ප ඉගෙන එයින් යශසට පැමිණෙන්නේය.

තවද යම්සේ යම්කිසිවෙක් සතර බඹයක් පමණ මකුළු-හුයක් ගෙනාවහු නම් හේ තෙමේ සාරදහසක් ධනය ලබන්නේයයි රජුවිසින් අණබෙර ලැවූකල්හි අතිදක්ෂවූ පුරුෂයෙක් තියුණුවේගයෙන් මකුළුහුය අදනාහු ඒ ඒ තැන සිඳින්නේම වෙයි. අතික් දක්ෂවූ පුරුෂයෙක් සිඳෙයි යන බියෙන් අතින් අල්වන්ටද නොපොහොසත් වෙයි. දක්ෂවූ තැනැත්තේ තියුණු-නොවූ නොමඳවූ සම ප්‍රයෝගයෙන් කෙළවරපටන් අල්වා දඬුකඩකාවෙලා මකුළුහුය ගෙනහැරදී ලාභයට පැමිණෙන්-නේය.

තවද යම්සේ අතිදක්ෂවූ නැව්පදින්නෙක් බලවත් සුළඟෙහි රුවල පුරා සුළංගන්වන්නේ නැව විදෙශයට පමුණුවා ලන්නේ වෙයි. අතික් අදක්ෂවූ නැව් පදින්නේක් මඳ සුළඟෙහි රුවල නගන්නේ නැව එතැනම සිටින්නේවෙයි. දක්ෂවූ තැනැත්තේ වනාහි මද සුළඟෙහි රුවල පවතින් පුරවනුයේ තද සුළඟෙහි අඩ රුවල ගසනුයේ සැපසේම කැමති තැනට පැමිණෙන්නේය.

තවද යම්සේ කිසියම් ශිෂ්‍යයෙක් තෙල් නොදවිසුරුවා (තෙල්) නළ පුරාලූයේ වී නම් ඔහු මෙතෙක්ලාභ ලබන්නේයයි ආචාර්‍ය්‍යයා විසින් අතවැස්සනට කීකල්හි අති දක්ෂවූ ශිෂ්‍යයෙක් තියුණු වේගයෙන් තෙල්නළ පුරලන්නේ තෙල් විසුරුවන්නේ-යැ. අතික් අදක්ෂවූ අතවැස්සෙක් තෙල්විසිරේදෝ හෝ යි යන හයින් තෙල් වත්කරන්ටද නොපොහොසත්වෙයි. දක්ෂවූ අත-වැසිතෙමේ තියුණුනොවූ නොමඳවූ සම ප්‍රයෝගයෙන් තෙල් නළ පුරාදී මහත් ලාභයට පැමිණෙන්නේ ය යි දතයුතුයි.

එපරිද්දෙන් මැ යම්කිසි යොගාවචරයෙක් ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි වහාම අර්පණා සමාධියට පැමිණෙමැ යි සිතා දෘඪතර වීර්‍ය්‍යකෙරේද ඒ යොගාවචරයාගේ සිත දෘඪතර වීර්‍ය්‍ය කරණකොටගෙන නොසන්සුන් බැවිහි වැටීමෙන් අර්පණාවට,

නොපැමිණිය හැකිවන්නේය. ඇතැම් යෝගාවචරයෙක් දුඩි තර වීර්‍ය්‍යයෙහි දෙස්දක අර්පණාසමාධියෙන් මට කවර ප්‍රයොජනද, මම ලැබුණු ප්‍රතිභාග නිමිත්තම රක්නෙමැයි. වීර්‍ය්‍යපිරිහෙලාතම් ඒ යොගීහුගේසිත හැකුළුණු වීර්‍ය්‍යඇති බැවිහි වැටෙන්නේය, එබැවින් හෙතෙමේද අර්පණවට නොපැමිණෙයි. යම් කිසිවෙක් මදකුදු හැකුළුනාවූ සිත ඒහැකිළීමෙන්ද උදහස්වූ සිත ඒ උදහසින්ද මුදා සම පියොවින් ප්‍රතිභාග නිමිත්තට අභිමුඛවැමෙගෙයාතම් ඒ යෝගාවචරයාම අර්පණාසමාධියට පැමිණෙන්නේය යි දක්වතලදහ.

මෙසේ ප්‍රතිභාග නිමිත්තට අභිමුඛවූ සිත මෙහෙයන්නාහට දැන් අර්පණා සමාධිය උපදින්නේය යි කී සමයෙහි භාවාඞ්ග චිත්තය සිඳගෙන එම පඨවි කසිණය අරමුණුකොට මනොද්වාර වීථියෙහි මනොද්වාරාවර්ජන චිත්තය උපදින්නේය. තදනන්තර වැ එම අරමුණ විෂයකොට ජවනයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් උපදනාහ. එහි ජවනයන් සතරදෙනාගේ වාරයෙහි ප්‍රථම ජවනය අර්පණාවට පරිකම් වැ සිටිහෙයින් පරිකර්මය යි ද සමීපචාරීහෙයින් උපචාරය යි ද කියනු ලැබේ. දෙවැනි ජවනය වනාහි පූර්වභාගයෙහි පරිකර්මචිත්තයන්ටද මත්තෙහි අර්පණාවටද අනුකූල බව හෙයින් අනුලොමනම්. තුන්වැනි ජවනය පරිත්තගොත්‍රය හෝ පෘථග්ජනගොත්‍රය මැඩපවත්වන හෙයින්ද මහද්ගත ගොත්‍රය වඩන හෙයින්ද ගොත්‍රභූනම්. සතරවැනි ජවනය අර්පණා නමැයි දතයුතුයි.

ජවනයන් පස්දෙනෙකු උපදනා වාරයෙහි ප්‍රථමජවනය පරිකර්ම නම්. දෙවැනි ජවනය උපචාර නම්. තුන්වෙනි ජවනය අනුලොම නම්. සිව්වැනි ජවනය ගොත්‍රභූ නම්. පස්ඇති ජවනය අර්පණා නැමැයි දතයුතුයි. මේ ක්‍රමයෙන් අර්පණා චිත්තය සිව්වැනිව හෝ පස්වැනිව මුත් සැවැනිව හෝ සත්වැනිව නුපදනේමය. එසේ වීමට හේතුව භවාඞ්ගයට ආසන්න වන බැවිනැයි දතයුතුයි.

මෙපමණකින් යෝගාවචරතෙමේ කාමච්ඡන්දාදි පචාඞ්ගයන් ප්‍රහීන කළාවූද, විතර්කාදි පචාඞ්ගයෙන් සමන්විතවූද, ත්‍රිවිධ කල්‍යාණයෙන් හා දශලක්ෂණයෙන් සමුපෙතවූද, ප්‍රථමධ්‍යානය ලැබුයේය'යි දතයුතුයි.

ඉක්බිතිඑම ප්‍රථමධ්‍යානය "ආවර්ජන සමාපද්‍යානවුට්ඨාන අධිෂ්ඨාන ප්‍රත්‍යවෙක්ෂණ" සංඛ්‍යාත පචවිධ වශිතාවන්ගේ වශයෙන් වශීභූත කෙරෙයි. මෙහි විතර්කාදි ධ්‍යානාඞ්ගයන්

පස්දෙනා කෙරෙන් එකක් එකක් අරමුණුකොට උපන්නාවූ ආවර්ජනයහට අනතුරුවැ උපදනා ජවනයන් සතර පස් දෙනෙකුගෙන් මතු භවාඞ්ගසිත් කීපයකින් මත්තට නොගොස් නැවත නැවත ධ්‍යානාඞ්ගයන් ආවර්ජනය කරන්නට සමර්ථබව ආවර්ජනවශිතා නම්වේ. ධ්‍යානයට සමවදිනා කැමති සිතට ඉක්බිතිව කීප භවාංගයකින් මත්තට නොගොස් උපන් ආවර්ජනයට ඉක්බිති වැ ධ්‍යානයට සමවැදීමෙහි සමර්ථ බව සමාපජ්ජනවශිතා නම් වේ. යථාපරිච්ඡින්න කාලය නොයික්මවා ධ්‍යානයෙන් නැඟී සිටීමෙහි සමර්ථ බව වුට්ඨානවශිතා නම් වේ. (පිරිසුන් කලම නැඟීමද මෙහිම ඇතුලත් වේ ) ශීඝ්‍ර ජලප්‍රවාහ ඇති නදියගේ ජලප්‍රවාහය රඳවා සිටි සේතුබන්ධයක් මෙන් භවාඞ්ගවේගය සිඳ අසුරුසණක් හෝ දශඅසුරුසණක් ධ්‍යානචිත්තය පිහිටුවන්නට සමර්ථ බව අධිෂ්ඨාන වශිතා නම් වේ. විතර්කාදි අඞ්ගයන් විෂයකොට ශීඝ්‍රව ඉපදවූ ආවර්ජනානන්තර වැ ප්‍රත්‍යවේක්ෂා ජවනයන් ලඝුකොට පැවැත් වීමේ සාමර්ථ්‍යය ප්‍රත්‍යවෙක්ෂා වශිතා නමැ'යි දතයුත්තේයැ.

මෙසේ පචවශිතාවෙන් වශීභූතයා විසින් ප්‍රගුණ වූ ප්‍රථමධ්‍යානයෙන් නැඟී මේ සමාපත්ති තොමෝ ආසන්න නීවරණ ප්‍රතිපක්ෂයත් ඇත්තිය'යිද විතර්කයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ගදුර්වලය'යිද මෙසේ ප්‍රථමධ්‍යානයෙහි දෙස් දැක ද්විතීයධ්‍යානය ශාන්ත හෙයින් මනස්කාරකොට ප්‍රථමධ්‍යානයෙහි නිකාන්ති දුරුකොට ද්විතීයධ්‍යානාධිගමය පිණිස භාවනායොග කටයුතුයි. ඉක්බිති ප්‍රථමධ්‍යානයෙන් නැඟී ස්මෘති සම්ප්‍රජන්‍යයෙන් යුක්තවූ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ ඒ යොගාවචරයාහට යම් කලෙක්හි විතර්කයා ඖදාරිකහෙයින් වැටහේද විචාර ප්‍රීති සැප චිත්තෛකාග්‍රතා ශාන්තහෙයින් වැටහෙද්ද එසමයෙහි ඔහට ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිසද ශාන්තාඞ්ගප්‍රතිලාභය පිණිසද එම ප්‍රතිභාග නිමිත්ත ''පඨවි-පඨවි'' කියා නැවත නැවත මනසකාර කරනුයේම ද්විතීයධ්‍යානය උපදනේය 'යි කියයුතු සමයෙහි භාවාඞ්ගය සිඳගත එම පෘථිවි කසිණයම අරමුණුකොට මනෝද්වාරාවර්ජනය උපදනේයැ. ඉක්බිති එම අරමුණ නිමිත්ත කොටගෙන යටකී පරිද්දෙන් සතරපස් ජවන්කෙනෙක් පරිකර්මාදිනාමයෙන් උපදිති ඔවුන්ගේ අවශානයෙහි විතර්ක වර්ජිතවූ විචාර ප්‍රීතිසැප ඒකාග්‍රතාසත චතුරඞ්ගයෙන් යුක්තවූ රූපාවචර ද්විතීයධ්‍යානය උපදනේ යැ. සෙස්ස යටකීපරිද්දෙන් දතයුත්තේ යැ. යම්සේ

ප්‍රථමධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි නීවරණයෝ ප්‍රහීණ වෙද්ද එපරිද්දෙන් ද්විතීය ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහි විතර්කය ප්‍රහීණ වන්නේ නොවෙයි. අර්පණායෙහිම විතර්ක රහිතවූ චතුරඞ්ග සමන්‍වාගත ද්විතීයධ්‍යානයඋපදනේ යැ.

මෙසේ ද්විතීයධ්‍යානය අධිගත කල්හි යටකී පරිද්දෙන් මැ ආවර්ජනාදි පඤ්චවශිතාවෙහි කරනලද පරිචය ඇති යෝගාවචරයා විසින් ප්‍රගුණවූ ද්විතීයධ්‍යානයෙන් නැගී මේ සමාපත්ති තොමෝ ආසන්න විතර්ක සංඛ්‍යාත ප්‍රතිපක්ෂයා ඇත්තිය 'යි ද විචාරයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ගදුර්වලය 'යි ද ඒ ද්විතීය ධ්‍යානයෙහි දෙෂදක තෘතීයධ්‍යානය ශාන්ත හෙයින් සලකා ද්විතීය ධ්‍යානයෙහි නිකාන්තිය දුරුකොට තෘතීය ධ්‍යානාධිගමය පිණිස භාවනානුයෝග කටයුතු. එහි යෙදෙන්නාවූ යෝගාවචරහට විචාරය ඖදාරික හෙයින්ද ප්‍රීති සැප එකාග්‍රතා ශාන්ත හෙයින්ද වැටහෙන්නේයැ. එසමයෙහි ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිසද ශාන්තාඞ්ග ප්‍රතිලාභය පිණිසද එම ප්‍රතිභාග නිමිත්ත **"පඨවී-පඨවී"** කියා නැවත නැවත මනසිකාර කරනුවහට විචාර වර්ජිතවූ ප්‍රීති සැප එකාග්‍රතා යන අඞ්ගත්‍රයෙන් යුක්තවූ තෘතීය ධ්‍යානය උපදනේ යැ සෙස්ස යටකී පරිද්දෙනි.

එසේම යථොක්ත ක්‍රමයෙන් භාවනාකරන්නාහට ප්‍රීති වර්ජිතවූ සැප එකාග්‍රතා දෙකින් යුක්තවූ චතුර්ථධ්‍යානයද' සැප වර්ජිතවූ උපෙක්ෂා එකාග්‍රතා දෙකින් යුක්තවූ පඤ්චමධ්‍යානයද, උපදනේය 'යි දතයුත්තේයැ. මෙහිදු ප්‍රීත්‍යාදි ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණය උපචාරක්ෂණයෙහි නොව අර්පණාක්ෂණයෙහි මැ වන්නේ යැ.

මෙපමණකින් කියා නිමවන ලද්දේ **"පඤ්චකනය විභාග වශයෙන්"** රූපාවචරධ්‍යාන 'යි. මේ ධ්‍යාන පඤ්චකය සුවසේ තේරුම්ගැනීම පිණිස මෙහි පහත දක්වන කථාප්‍රවෘත්තිය අතිශයෝපකාරි වන්නීයැ. ඕතොමෝ කවරක? යත්:-

පසල්දනව්වැසි එක්තරා අමාත්‍ය පුත්‍රයෙක් 'රාජොපස්ථාන කරනුසඳහා එක්දිනක් නුවරට පැමිණියේයැ. ඔහු රජු නොදැක මැ අතුරුවීථියට ගොස් රහමෙර පානයකිරීමෙන් අතතුබූ ධන සියල්ල මැ විනාශකොට සුරාමදයෙන් මත්ව පානාගාරයෙහි මැ වැටී හුන්නේයැ. ඉක්බිති නොමඳවූ මදයෙන් මත් ඔහුගේ වස්ත්‍රාභරණාදිය මූදගෙන දිරාගිය හනකඩක් හඳවා පානාගාරයෙන් බැහැර ගෙනගොස් මග අසල කැලිකසල වැඩි තණබිමක

දමාපූය. එසේවුවත් මදයෙන්මත් ඔහුට නුපුරුදු නාණ්ඩිම පුරුදු ශෛය්‍යාවක් මෙන් වූහෙයින් එහිම නිදන්ටවන. එවේලෙහි වීථියෙහි ගමන්කරන එක්තරා අඞ්ගවිද්‍යා පාඨකයෙක් ඔහුවෙත පැමිණ අඞ්ගලක්‍ෂණ සලකා බලා ළහසිටියවුන් බනවා කියනුයේ:- සගයෙනි! මේ සුරාමදයෙක් මත්වැ නිදන පුරුෂ තෙමේ මහානුභාසම්පන්න එකෙක මොහුගේ සහායෙන් බොහෝ වැඩවන්නේයැ. මහාගුණ වහාම පතළ වන්නේ නමුදු දෙලෝවැඩ පමාවන විරසවූ රහමෙර පීමෙන් සොඳුරු ගුණ අඳුරුව ගියේය. එබැවින් මොහු වහාම විඩා නොව වඩාගෙන ගොස් පිළිදුගුම් කට්යුතුයයි සතිටුහන් කොට මගට පිළිපන්නේයැ. ඉක්බිති වඞ්කවූ අදහස් නැති අඞ්ග විද්‍යා පාඨකයාගේ මඞ්ගලවූ අඞ්ග ලක්‍ෂණ ඇසීමෙන් ඔදවැඩි සිත් ඇති පිරිවර ජනයෝ අමාත්‍ය පුත්‍රයාගේ ශරීරයෙහි මෘත්තිකාලෙපණය කොට නහවා රළුපහස් ඇති ස්ථූල වස්ත්‍රයක් හඳවා ප්‍රාශාදය සමීපයට ගෙන ගියෝයැ. එහිදීද සුවඳපැන් සොළොස්කළයකින් ස්නානය කරවා අගනා සියුම් පටවස්ත්‍ර යුග්මයක් පලඳවා ප්‍රාශාදයට වඩාගෙන ගොස් නිසියේ පිළියෙලකරනුබු රසමසැවුලෙන් යුත් භොජනය රිසිසේ වැළඳවූයේය. ඉක්බිති රන්දූලින් වටකළ සුන්දරමන්දිරයෙහි සයනයක වඩා හිඳුවා බත්මත ඉක්ම යනතෙක් සයනය කරවයි නියෝග කොට පානාගාරයට යන ගමන් වල කනු සඳහා සතර දෙනෙක් අට අතකින් දෙඅත්පා මැඩගෙන සිටියාහ. තවකෙනෙක් සාදරයෙන් පාදසම්බාහනය කළහ. අනෙකෙක් තල්වැටගෙන පවන්සලන්නටවන තව කෙණෙක් මනුවන වැඩ සඳහා තුතිගී කියමින් වීණා වාදනය කළහ. මෙසේ පිරිවරනාලද ඇමති තෙමේ නිද්‍රොපගත වැ පහාගිය විඩා ඇත්තෙකුසේ වහා පිබිද බලනුයේ සිය්සේ අත්පා මැඩගෙන සිටියවුන් දැක තෙපි මට වදනොදී ඉවත යවයි තර්ජනය කෙළේ යැ. එවිට ඒ සතරදෙනම පහව ගියෝය. ඉක්බිති මදවෙලාවක් නිදාගෙන නැවතත් නින්දෙන් පිබිද පාපිරිමැදීම ද නොකමැතිවනුයේ ඔහුවද තර්ජනය කොට බැහැර කෙළේවන තව ස්වල්පවේලාවකට පසු නින්දෙන් පිබිද පවන්සැලීමද නොඉවසිය හැකිසේ වැටහුනුහෙයින් ඔහුද බැහැරකෙළේයැ. ඉක්බිති වීණානාදයෙන් සන්හුන් හිත් ඇත්තේ මදවේලාවක් නිදාගෙන සිට නින්දෙන් පිබිද මේ වීණානාදය නානා විපත් සහිතය යි සලකා ඔහුටද තර්ජනයකොට පලවා හැරියේයැ. ඉක්බිත්තෙන් 'අත්පා මැඩීමය-පාපිරි මැදීමය-පවන් සැලීමය-වීණාවාදනය" යන සතර උවදුරු බැහැරකොට අදහස් පරිදි නිදහස් ලබා සැපසේ මැ සයනය කොට නිදිගැට පියා සුපිරිසුදු සළු පැළඳ රජුවෙත පැමිණියේ යැ.

මහරජ්ජුරුවන්වහන්සේද ඔහු දැක සතුටු වැ බොහෝ යශ
ඉසුරු සැපත් දුන්හ. එසේ යශසට පත් අමාත්‍ය පුත්‍රතෙමේ
බොහෝ ජනයනට පිටුවහල් ඇත්තෙක් වැ ඇපසේ දවසැර
නිදුකින් විසූයේකැ'යි දත යුත්තේ යැ.

මෙහි උපමා උපමෙය සම්බන්ධය කෙසේදැ'යි යතහොත්:—
රහමෙර පානය කිරීමෙන් පීඩාවට පත් අමාත්‍ය පුත්‍රයා මෙන්
අනේක ව්‍යසනයෙන් පීඩාවට පත් කුලපුත්‍ර තෙමේ දතයුතුයි.
අඞ්ගවිද්‍යා පාඨකයා මෙන් තථාගතාර්හත් වහන්සේ දතයුතුයි.
මොහු මහාජනයනට අවශ්‍ය වූ කුලපුත්‍රයෙක, එබැවින් මනාව
පිළිදැගුම් කටයුතුය යන අඞ්ගවිද්‍යාපාඨකයාගේ සනිටුහන් කිරීම
මෙන් සර්වඥයන් වහන්සේගේ සනිටුහන් කිරීම හෙවත් මොහු
රහත්විය හැකි කුලපුත්‍රයෙක එබැවින් පැවිදි කටයුතුය, යන
නියොගය දතයුතු යැ. අමාත්‍ය පුත්‍රයාගේ මෘත්තිකාලේපන
යෙන් නැහැවීම මෙන් කුලපුත්‍රයාගේ ප්‍රව්‍රජ්‍යා ප්‍රතිලාභයද,
ස්ථූලවස්ත්‍ර හැඳවීම මෙන් දශසීල නමැති හෙරණ සිල්වත් පැළඳ
වීමද, සුවඳ පැනින් නැහැවීම මෙන් ප්‍රාතිමොක්ෂ සංවරාදී උප
සපන් ශීලසුගන්ධොදකයෙන් නැහැවීමද, සියුම් පට වස්ත්‍ර පැළඳ
වීම මෙන් ශීලවිශුද්ධි සම්පද නමැති වස්ත්‍රාච්ඡාදනයද, පහයට
නැංවීමමෙන් සමාධිභාවනා නමැති පහයට නැංවීමද, සුභොජන
රසානුභවය මෙන් සමාධි උපකාරක ස්මෘතිසංප්‍රඥාදී ධර්මාමෘතානු
භවයද, සයනාරොපණය මෙන් විතර්කාදීන් විසින් උපචාරධ්‍යානා
රොපණයද, පානාගාරයට යන ගමන් වලකනු සඳහා දෙඅත්පා
මැඩීම මෙන් කාමසංඥාභිමුඛ ගමන වලකනු වස් අරමුණෙහි සිත
පෙළන නෛෂ්ක්‍රම්‍ය විතර්කයද, පා පිරිමදින පුරුෂයා මෙන්
චිත්තානුපරිමාර්ජන ලක්ෂණ විචාරයද, සිහිල් පවන්සලන
පුරුෂයා මෙන් සිතට සිහිල් බව එළවන ප්‍රීතියද, සිත සනසන
ගායනාකරු මෙන් චිත්තානුග්‍රහක සොම්නසද, සයනාරූඪ
වීමෙන් පහවූ පීඩා ඇතිව මඳක් නිද්‍රොපගතවීම මෙන් උපචාර
ධ්‍යාන සන්නිශ්‍රයෙන් පහවූ නීවරණකලමථ ඇත්තහුගේ ප්‍රථම
ධ්‍යානයට පැමිණීමද, නිදා පිබිද දෙඅත් පා මැඩීම නොකමැතිව
ඔවුනට තර්ජනය කර පලවාහැර නැවත නිද්‍රොපගතවීම මෙන්
ප්‍රථමධ්‍යානයෙන් නැගීසිට චිත්තොත්පීලන ලක්ෂණ විතර්කදොෂ
දර්ශනයෙන් ඔහු ප්‍රහාණයකොට ද්විතීයධ්‍යානයට පැමිණීමද,
ඉක්බිති නැවත නැවතත් නින්දෙන් පිබිද යථොක්ත ක්‍රමයෙන්
පා පිරිමැදීම් ආදිය නොයිවසිය හැකිවනුයේ ඒ ඒ කෘත්‍යයෙහි
නියුක්තවූවන්ට තර්ජනය කොට ඔවුනොවුන් පහවගිය කල්හි
මද මඳ නිද්‍රොපගතවූවාක් මෙන් ද්විතීයධ්‍යානාදියෙන් නැගිට

විචාරාදි දෙෂදර්ශනයෙන් ඔවුනොවුන් ප්‍රහාණ කිරීමද, තෘතීය චතුර්ථ පඤ්චමධ්‍යානොපගමනද දතයුතුයි. යහනින් නැගිට රජු වෙත පැමිණීමෙන් ලැබුනු ඉසුරු සම්පත මෙන් පඤ්චමධ්‍යානයෙන් නැගිට විදර්ශනා මාර්ගයට පැමිණීමෙන් ලැබුනු අර්හත්වයද, ඉසුරු සම්පත් ලැබීමෙන් බෙහෝදෙනාට පිහිට ඇත්තෙකුවූවාක් මෙන් සකලක්ලෙශයන් ප්‍රහාණයකොට ලබාගත් අර්හත්වය හෙතුකොටගෙන නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රයක් වූ බවද සැලකියයුතුයි.

ඉක්බිති අරූපාවචරධ්‍යානය උපදවනු කැමැති යොගාවචර තෙමේ රූපයනිසා දණ්ඩාදාන ශස්ත්‍රාදාන කලහ විග්‍රහ විවාදදීන්ගේද චක්ෂුරෝගාදී ආබාධ සහශ්‍රයන්ගේද වශයෙන් කරජකායෙහි ආදීනව දැක මෙකී ආදීනව ආරූප්‍යයෙහි (රූපස්වභාවයක් නැතිකල්හි) සර්වප්‍රකාරයෙන් මැ නැතැයි රූපයාගේ සමතික්‍රමණය පිණිස පරිච්ඡින්නාකාශ කසිණය හැර සෙසු නවකසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථධ්‍යාන උපදවා ඒ ධ්‍යානයට අරමුණු වූ කසිණ රූපයෙහි උද්වෙග (කලකිරීම්) ඇතිව එයින් දුරුවනු කැමැත්තේ පඤ්චප්‍රකාර වශිතා ඇති එහෙයින් මැ ප්‍රගුණ වූ රූපාවචර චතුර්ථධ්‍යානයෙන් නැගී මවිසින් කලකිරෙනලද මේරූපය අරමුණුකරන්නේය'යිද ආසන්න සෞමනස්‍ය සංඛ්‍යාත ප්‍රතිපක්ෂයා ඇත්තේය'යිද ශාන්ත විමොක්ෂහෙයින් ඖදාරිකය'යිද ඒ ධ්‍යානයෙහි ආදීනව දැක එහි නිකාන්තිය දුරුකොට ආකාශානඤ්චායතනය ශාන්තහෙයින් මනස්කාරකොට ඒ කසිණය චක්‍රවාට පර්යන්තකොට හෝ තමා කැමති යම් කව්වලයක පතුරුවා එයින් ස්පෘෂ්ටවූ ආකාශය අරබයා "**ආකාසො-ආකාසො**" යිද "**අනන්තො ආකාසො-අනන්තො ආකාසො**" යිද නැවත නැවත මනස්කාර කරන්නාහට නීවරණයෝ ප්‍රහීණ වෙති. උපචාරයා සමග චිත්තය මනාකොට පිහිටන්නේය. එම නිමිත්ත නැවත නැවත ආසෙවනය කරන්නාහට පඨවිකසිණාදියෙහි රූපාවචර නිමිත්තයෙන් ආකාශය විෂය කොට "**ආකාශානඤ්චායතන චිත්තය**" පිහිටන්නේය. මෙහිදු පූර්වභාගයෙහි කාමාවචරචිත්තයෝ පරිකර්මාදි නාමයෙන් තුන්දෙනෙක් හෝ සතරදෙනෙක් උපෙක්ෂාවෙදනාසම්ප්‍රයුක්තවූවාහුමවෙති සතරවැනිව හෝ පස්වැනිව අරූපාවචර චිත්තය උපදනේයි. සෙස්ස පඨවි කසිණයෙහි කීපරිද්දෙන් දතයුතුයි. මෙසේ අරූපාවචර චිත්තය උපන් කල්හි ඒ යෝගාවචරතෙමේ පූර්වයෙහි කසිණමණ්ඩලය ධ්‍යානචක්ෂුසින් බලමින් වැස "ආකාසො ආකාසො" යි පරිකර්ම මනස්කාරයෙන් ඒ නිමිත්ත වනාදුරුකරනලදකල්හි ආකාශයම බලමින් වසන්නේයි.

එම ප්‍රථමාරූප්‍ය විඥානය අනන්ත වශයෙන් පරිකර්ම කරන්නාහට හෙවත් "අනන්තං විඤ්ඤාණං-අනන්තං විඤ්ඤාණං" යි භාවනා කරන්නාහට "**ද්විතීයාරූප්‍යය පිහිටන්නේය**"යි දතයුතු.

ඒ මේ ද්විතීයාරූප්‍ය සංඛ්‍යාත විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවනු කැමති යෝගාවචරතෙමේ පස් ආකාරයකින් ආකාශානඤ්චායතන සමාපත්තියෙහි පුරුදුකරනලද වශිතා ඇත්තේ මේ සමාපත්තිතොමෝ ආසන්නරූපාවචරධ්‍යාන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් අත්තිය'යිද විඤ්ඤාණඤ්චායතනය මෙන් නොමශාන්තය'යිද ආකාශානඤ්චායතනයෙහි ආදීනව දැක එහි නිකාන්තිය දුරුකොට විඤ්ඤාණඤ්චායතනය ශාන්ත හෙයින් මනස්කාර කෙරෙයි. ඒ ආකාශස්ඵරණයකොට සිටියාවූ විඤ්ඤාණය "විඤ්ඤාණං-විඤ්ඤාණං" කියා නැවත නැවත මනස්කාර කරන්නාහට නීවරණයෝ විෂ්කම්භිත වෙති. ස්මෘතිය එහිම පිහිටන්නේය. උපචාරය සමග චිත්තය සමාහිත වන්නේය. එම නිමිත්ත නැවත නැවත ආසේවන වශයෙන් බහුලකරන්නාහට ආකාශය විෂයකොට ආකාශානඤ්චායතනය මෙන් ආකාශයෙහි පතළාවූ විඥානය විෂයකොට "**විඤ්ඤාණඤ්චායතන චිත්තය**" පිහිටන්නේයි. අර්පණාක්‍රමය යටකී පරිද්දෙන් වේ.

ඉක්බිති තෘතීයාරූප්‍යය උපදවනු කැමති යෝගාවචරතෙමේ යටකී පරිද්දෙන් පඤ්චවශිතා ප්‍රාප්තවූයේ මේ සමාපත්තිතොමෝ ආසන්න ආකාශානඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තිය'යිද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මෙන් ශාන්ත නොවන්නීය'යිද විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැක එහි නිකාන්තිය දුරුකොට ආකිඤ්චඤ්ඤායතනය ශාන්තහෙයින් මනස්කාරකොට විඤ්ඤාණඤ්චායතනයට අරමුණුවූ ආකාශානඤ්චායතන විඤ්ඤාණයාගේ අභාවය '**නත්ථි කිඤ්චි-නත්ථි කිඤ්චි**" යි කියා හෝ "**සුඤ්ඤං-සුඤ්ඤං**" යි කියා හෝ '**විවිත්තං-විවිත්තං**" යි කියා හෝ නැවත නැවත මනස්කාර කරන්නාහට නීවරණයෝ විෂ්කම්භිත වෙති. ස්මෘතිය එහි මැ පිහිටන්නීය. උපචාරය සමග චිත්තය සමාහිත වන්නේ ය. මෙම නිමිත්ත නැවත නැවත ආසේවනය කරන්නාහට ආකාශයෙහි පතළාවූ මහද්ගත විඤ්ඤාණයෙහි විඤ්ඤාණඤ්චායතනය මෙන් ආකාශස්ඵරණයකොට පැවැත්තාවූ මහද්ගත විඤ්ඤාණයාගේ "සුඤ්ඤ-විවිත්ත-නාස්තිභාවය" විෂයකොට "**ආකිඤ්චඤ්ඤායතන චිත්තය**" පිහිටන්නේයි. මෙහිදු අර්පණාක්‍රමය යටකී පරිද්දෙන් දතයුතුයි.

චතුර්ථාරූප්‍ය විඥානය බැවියට යෝගාවචරතෙමේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි පරිචිතවූ පඤ්චවශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්නවිඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයක් ඇත්තීය'යිද නේවසඤ්ඤානාසඤ්ඤායතනය මෙන් ශාන්ත නොවන්නීය'යිද ආකිඤ්චඤ්ඤායතනයෙහි ආදීනව හා නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංස දැක ආකිඤ්චඤ්ඤායතන චිත්තයෙහි නිකාන්තිය දුරුකොට නේවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්තහෙයින් මනස්කාරකොට තිතියාරූප්‍යවිඥානයාගේ නාස්තිභාවය විෂයකොට පැවැත්තාවූ ආකිඤ්චඤ්ඤායතන චිත්තය', **සන්තමෙතං.- පණීතමෙතං''** කියා නැවත නැවත අවර්ජනාහට නීවරණයෝ විෂ්කම්භිත වෙති. එහි මැ ස්මෘතිය පිහිටන්නීයැ. උපචාරය සමග චිත්තය සමාහිත වන්නේයැ. මෙසේ ඒ නිමිත්ත ආසේවන බහුලීකරණය කරත් කරත් මැ විඥානාපගමය විෂය කොට උපන් ආකිඤ්චඤ්ඤායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතන සංඛ්‍යාත චතුඃස්කන්ධය විෂයකොට **"නේවසඤ්ඤා නාසඤ්ඤායතන චිත්තය"** පිහිටන්නේයි. මෙහිදු අර්පණාක්‍රමය යටකී පරිච්ඡෙදෙන් දතයුත්තේය.

මෙසේ විතර්කාදි අඞ්ගාතික්‍රමණ වශයෙන් රූපාවචරධ්‍යානයෝද ආරම්මණාතික්‍රමණ වශයෙන් අරූපාවචරධ්‍යානයෝද යන අෂ්ටසමාපත්ති ඉපදවීමෙන් නීවරණමලාපගමනය කොට චිත්ත විශුද්ධිය ඇතිකර ගනිත්. ඉක්බිති ලෞකික පඤ්චාභිඥා උපදවනු කැමැති යෝගාවචරයා විසින් ඔදාත කසිණය කෙළවරකොට ඇති අටකසිණයෙහි අෂ්ටසමාපත්ති උපදවා **"කසිණානුලෝමතො"** දිතුදුස් ආකාරයෙන් චිත්තය දමා **"එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ"** යනාදි අෂ්ටාඞ්ගයෙන් සමන්විත වූ අභිඥා ඉපදවිය යුතුවෙත්. මෙසෙයින් ඉපදවියයුතු අභිඥාවෝ නම්:-

"ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්තවිජානනං
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා"

**ඉර්ධි විධඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, පරචිත්ත විජානන ඥානය, පූර්වෙනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුරභිඥානය,** යන මොහුවෙත්. මෙකී ලෞකික පඤ්චාභිඥාවන් අතුරෙන් ඉර්ධිවිධඥානය කෙසේද? යත්:- අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැගී සියයක් හෝ දහසක් හෝ වෙත්වා 'යි අධිෂ්ඨාන කෙරෙයි. අධිෂ්ඨාන කරනුවත් සමගම එසේ වෙයි. තවද තමන් එක්කෙනෙක් වැ සිට බොහෝ

රූප මවා පෙන්වීමද, බොහෝ දෙනෙක් වැ සිට එක්කෙනෙකු මෙන් වීමද, අහස්කුස පලක් බැඳ හිඳිමද, පොළොතෙලෙ හිඳු ජලයෙහිමෙන් ගැලීම් මතුවීම් කිරිමද, දියපිට සක්මන් කිරීමද බිම සිට සඳහිරු මඬුළු අතින් පිරිමැදීමද, බඹලොව දක්වා හිමි අත්බව් දක්වමින් පෙනීසිටීමද, යනාදි අසිරිමත් කරුණු දක්වති. මෙකී නාක් කරුණු අධිෂ්ඨානය පරිද්දෙන් සිඬවන නිසා ඊට අධිෂ්ඨාණඉර්ධිය 'යි කියනු ලැබේ. නවද මෙහි විකුර්වණ ඉර්ධිය, මනොමය ඉර්ධිය 'යි ඉර්ධිප්‍රභෙද දෙකක් ඇත්තාහ. එහි විකුර්වණ ඉර්ධියයනු තමාගේ රූපයට වඩා වෙනස්වූ (විකෘති) රූප පෙන්වීමයි. නොවත් ප්‍රකෘතිවර්ණය හැර කුමරෙකු, නාගයෙකු, දෙවියෙකු, අසුරයෙකු, බ්‍රහමයෙකු, මෙන් පෙනී සිටීමද, ඇත් අස් සිංහ ව්‍යාඝ්‍රාදි සිවුපා සතුන් මවා දෘශ්‍යමානකරවීමද, පක්ෂි ගස් ගල් පර්වත දිය නිර්මිතකර දක්වීමද, යනාදියයි. මනොමය ඉර්ධිය යනු පාදකධ්‍යානයෙන් නැගීසිට ශරීරාභ්‍යන්තරය අවටින් ඉඩහැරේවා'යි අධිෂ්ඨාණ කොට එසේවූ කල්හී සිරුරතුළ අවකාශයෙහි අන්‍යවූ ආත්මස්වරූප මූර්තියක් මවා "ගසකින් ගොබයක් අදින කලක්මෙන්" ශරීරයෙන් නිර්ගතකොට තබයි. මෙසේ මවා තබනලද රූප තමා පිළිබිඹුහෝයි පරහට වැටහේ. මනොමය ඉර්ධිය ඇත්තහුගේ යම්බඳු වර්ණයක් සණ්ඨාණයක් ඉන්ද්‍රිය පරිපූර්ණත්වයක් ඇතද ඒ සියල්ලම ඒ වූ පරිද්දෙන් සිතින්නිපදවන ලද රූපයෙහි විද්‍යමාන හෙයින් ඊට මනොමය ඉර්ධිය'යි කියනු ලැබේ. මෙකී "**අධිෂ්ඨාණ ඉර්ධි, විකුර්වණ ඉර්ධි, මනොමය ඉර්ධි**" යන ත්‍රිවිධ ඉර්ධියම ඉර්ධි විධඥානය විෂයකොට පවත්නේය'යි දතයුතුයි.

දෙවැනිවූ දිව්‍යශ්‍රොත්‍රඥානය වනාහි දූරතර ශබ්දශ්‍රවණයට සමර්ථවූ අභිඥා විශෙෂයකි. හේ වූකලී "දෙවියන්ගේ පිත් සෙම් හුරිරුදියෙන් නුමුසුවූ එහෙයින් මැ. අති පරිශුඬවූ දූරස්ථ අරමුණු පිළිගැණීමෙහි සාමර්ථ්‍යය ඇති ප්‍රසාද ශ්‍රොත්‍රධාතුවමෙන්" වීර්‍ය භාවනා බලයෙන් නිපන් ඥානශ්‍රොත්‍රධාතුවකි. දූර අරමුණු පිළිගැනීම් වශයෙන් දෙවියන්ගේ ප්‍රසාදශ්‍රොත්‍රසට සමාන හෙයින් මෙම ඥාන විශෙෂයටද දිව්‍ය ශ්‍රොත්‍රඥානය'යි කියනු ලැබේ. මේ ඥානයෙන් දූරස්ථවූ (පිට සක්වළාදියෙහි පවත්නාවූද) සමීපස්ථවූ (ස්වදෙහ සන්නිශ්‍රිත කුඩාසතුන්ගේ පවාද) සියලු දිව්‍යමනුෂ්‍යාදීන්ගේ ලපිත ලාපිත ගීත ගායිතාදි ශබ්ද ධ්වනීහු ප්‍රකෘතියෙන් අසන්නෙකුටමෙන් වැටහෙයි. කෙසේද? යත්:— අභිඥාපාදකධ්‍යානයෙන් නැගිට පරිකර්ම සමාධි චිත්තයෙන් පළමුකොට වනගත සිංහාදීන්ගේ ශබ්දයෝද ආරාමයෙහි

සණ්ඨාර භෙරි සංඛ පණවාදි ශබ්දයෝද අසත පිරුවහන ශබ්දයෝද පක්ෂීන්ගේ රුවප්‍රතිරුවශයෝද වාතෝදකාදි ධ්වනීහුද තල්කොළ ආදිය වීයලෙතනඩ හා කුරුකුහුඹු ආදීන්ගේ ශබ්දයෝද'යි මෙසේ අනුක්‍රමයෙන් (ඖළාරික ශබ්දයන්ගේ පටන් සියුම් ශබ්ද දක්වා පිළිවෙළින්) ආවර්ජනා කරනුවහට දූන් දිව්‍යශ්‍රොත්‍රධාතුව උපදියයුත අවධියෙහි යඳොහෙන ශබ්ද අතුරෙන් එක්තරු ශබ්දයක් අරමුණුකොට මනොවරාවර්ජන සිතක් ඉපද තදනන්තරවැ සතර පස් ජවන් කෙනෙක් උපදිත්. ඔව්හු පරිකම්, උපචාර, අනුලෝම ගොත්‍රභූ, යන නම් ඇත්තාහු කම වැදරිමැවෙත්. සතර වැනිව හෝ පස් වැනිව රූපාවචර චතුර්ථධ්‍යාන අර්පණා සිත උපදී ඒ හා සමග උපන් ඥානය දිව්‍යශ්‍රොත්‍රධාතුනාම'යි දතයුතුයි.

තුන්වැනිවූ පරචිත්ත විජානනඥනය නම්:-අනුන්ගේ සිත් දූන ගන්නාවූ නුවණයි. මේ සඳහා කටයුතු පරිකර්මභාවනා නම දිව්‍යචක්ෂුඃඥනය මැයි. මොහුගේ වශයෙන් ආලෝක වර්ධනය කොට දිවැසින් පරපුද්ගලයන්ගේ (අන්‍යසත්ත්වයන්ගේ) හෘදයවස්තුගත ලෙංහිතවර්ණය ආවර්ජනා කෙරෙයි. යම් විටෙක විළිකුත් නුගඵලවත් රත් පැහැති ලොහිතය දකීද එකල්හි සොම්නස් හිතක් ඇතිබවද, ඉදුනු අඹඵලමෙන් කාල වණ් ලොහිතය දකිද එකල්හි දොම්නස් හිතක් ඇතිබවද, පහන් තලතෙල් බදු පැහැති ලොහිතය දක්නාවිට මැදහත් හිතක් ඇතිබවද, සලකා පරසිත් හඳුනත්. මෙසේ පුරුදු වූ පසු සිතින් සිත සක්මන් කරවීම් වශයෙනුදු සොළසවිධ චිත්තයන් දූන ගනිත්. අනෙකාධ්‍යාශ ඇති සත්ත්වයන්ගේ නානාවිධ මිශ්‍රවර්ණවත් ලොහිතය තත්ත්වාකාරයෙන් හැඳින ගැනීම සර්වඥගෝචර වෙතො පරිය ඥනය'යි. ප්‍රදෙශඥයන්ට එබදු තීක්ෂණාවබොධයක් නැතද මේ අවධියෙහි මොහුට සරග හිතක්ද සදෙස හිතක්ද සමොහ හිතක්ද පවත්නේය යනාදි ක්‍රමයෙන් සොළොස් පරිද්දකින් දූන ගැනිමේ ඥනයක් උපදී. ඒ මේ ඥනය පරචිත්ත විජානන ඥනය'යිද දතයුතු.

සිවුවැනිවූ විශුද්ධිඥනාවසරයෙහි "යම් සමෘතියකින් පෙරු විසූ කඳ පිළිවෙළ සිහිකෙරේද ඕ තොමෝ පූර්වෙනිවාසානුස්මෘති" නමුතත් සම්ප්‍රයුක්ත ඥනය "පූර්වෙනිවාසානුස්මෘති ඥනය'යි කියනු ලැබේ. (පෙරුවිසූ කඳපිළිවෙළ දන්නා නුවණය'යි යුසේයි) මෙම ඥනය ලද තැනැත්තේ අනතුරු අතීත භවයෙහි පටන් තත් අයුරින් පැවති වෘතසන්තතිය(කඳ පිළිවෙළ)සකන්ධාදීන්ගේ වශයෙන් එව් ච්‍යුතිප්‍රතිසන්ධින්ගේ වශයෙන් එව් අනුගමනය

කෙරෙමින් (නො පැන යෙමින්) සිහිකෙරෙයි. ඒ වනාහි සදෙනෙකුට ගොචර වැ පවත්නේය. එනම්:- "තිර්ථක, පියවිසව්, මහසව්, අගසව්, ප්‍රත්‍යකබුද්ධ, සර්‍වඥබුද්ධ" යන ඉමෙයි. මෙසිනුදු තීර්ථකයෝ දුර්වලඥනය ඇතියෙන් කප් සතලිසක් බන්ධපරිපාටියෙන් සිහි කෙරෙත්. (ඉන් ඔබ්බෙහි ඔවුනට අවිෂය 'යි දන්නේ) පියවි සව්වෝ කප් සියයක් හෝ දහසක්ද, මහා ශ්‍රාවකයෝ කප්ලක්‍ෂයක්ද, සිහිකිරිමට සමර්ථවෙත්. (යට කී දෙයාකාරයම රුස්නා තැති) අග්‍ර ශ්‍රාවක දෙනම එක් අසැකි කප් සුවහසක්ද පසේබුදුවරහු ඒහා දෙගුණයක්ද, ච්‍යුති ප්‍රතිසන්ධි නියායෙන් සිහිකෙරෙත්. විසදතර අනාවරණඥන ඇති සර්‍වඥබුදුවරයන් වහන්සේලාගේ ගොචරවිෂය අනන්තාපරිමාණ හෙයින් මෙතෙකැ'යි යන සීමා පරිච්ඡෙදයක් නැත්තේයැ. යම්තාක් කප් කෙළ ගණනකට පෙර යම් අත් බැවෙක් බැලියයි වීනම් අවජනා කෙණෙහි මැ තත්‍වාකාරයෙන් පැණේ. සකන්ධ පිළිවෙළින් හා ච්‍යුතිප්‍රතිසන්ධි පිළිවෙළින් බැලිම සම්බුදුනට නිරර්ථකය'යි දතයුතු. යම්සේ කෘතහස්ත ඇති වාලවෙධි ධනුර්ධරයෙකු විසින් විදුනාලද හිය අතරතුර ලිය රුක් ආදියෙහි නොපැකිල ඉලක්කයෙහිම වැදගනිද එමෙන් මැ යම් අත් බැවක් දක්නා කැමති සම්බුදුන්ගේ අභිඥවෙගය ඉන් මොබ අත් බැව්හි අනාශක්ත වැ ඊප්සිත ස්ථානයෙහි මැ ආරම්මණ ග්‍රහණය කෙරෙයි (මීට ජාතක දෙශනාගත අතීත කථාවෝ සාධක වෙත්.) එබැවින් සර්‍වඥයන් වහන්සේගේ පූර්‍වේනිවාශ ඥනාලොකය ශරදකාශයෙහි පැණෙන සුපරිසුද්ධ සූර්‍ය්‍යමණ්ඩලායතන ප්‍රභාමණ්ඩලානුකාරිය 'යි කිවද උපමිත නොවේ. කුමක්හෙයින් ද? ඊට ශත ගුණයෙන් සහස්‍ර ගුණයෙන් ප්‍රභාමත් හෙයිනි. කාරුණ්‍ය එසේ වුවත් මෙහිදී අදහස් කරනලද පූර්‍වේනිවාශඥනය ශ්‍රාවක විෂය වූවක් බැවින් එය දනවනු කැමැති යොගීතෙමේ අභිඥපාදක චතුර්ථධ්‍යානයෙන් නැගිට තමා හුන් අවදියේ පටන් සියලු ඉරියව් පැවැත්වූ අයුරුද ඒ ඒ ගම්වල කටයුතු කෘත්‍යද මෙසේ එදින හා පසු දිනද ඊට පෙර දිනද යනාදී ක්‍රමයෙන් දිවස පක්‍ෂ මාස ඍතු අයන සංවත්සරයන්ගේ වශයෙන් අතිතය ආවර්ජනා කෙරෙයි. මෙසේ හුනස්නේ පටන් ප්‍රතිසන්ධික්‍ෂණය තෙක් අරමුණුකොට පැවැති ඥනයද පූර්‍වේනිවාශඥනනම් නොවේ. පරිකර්ම සමාධි ඥන නමැයි දතයුතු. යම් කලෙක ප්‍රතිසන්ධිය ඉක්මවා ච්‍යුති ක්‍ෂණයෙහි පැවැති නාමරූපයන් අරමුණු කොට මනොවාරාවර්ජන සිතක් උපදීද ඒ චිත්තයාගේ නිරුද්ධියෙන් පසු එය ම අරමුණු කොට මන්‍දතික්‍ෂණ ප්‍රඥනුරූප වැ සතර පස් ජවන් කෙනෙක් දිවෙයි. ඔව්හු පරිකර්ම උපාර අනුලොම ගොත්‍රභූ නම්

වූවාහු කාමාවචර වෙත්. පස්වැනිව හෝ සවැනිව රූපාවචර චතුර්ථධ්‍යාන අර්පණ සිත දෙවරක් උපදී. ඒ සිත හා සම්ප්‍රයුක්ත ඥානය "පූර්වේනිවාසානුස්මෘති ඥානය"යි දතයුතුය. ඒ ඥානය හා එකොත්පාදයට පැමිණි ස්මෘතියෙන් නන් වැදෑරුම් පෙරනිවස් සිහිකෙරෙයි. කෙසේද? එක් ප්‍රතිසන්ධියක් මුල්කොට ඇති ච්‍යුතිය කෙළවර කොට ඇති එක් භවයකින් පිරිසුන් ස්කන්ධ පරම්පරාව සිහිකෙරෙයි. මෙසේ ක්‍රමයෙන් වැඩීමෙන් නානාවිධ සංවෘත විවෘත කල්පාදීන්ගේ වශයෙනුදු සිහිකෙරෙයි. එසේ සිහිකරන්නේ මැ භව යොනි ගති විඥානස්ථිති සත්වාවාස විසින් ද නම් ගොත් විසින් ද වර්ණ සංස්ථාන විසින් ද සුව දුක් ආයු වශයෙන් ද සිහිකරන්නේ ය'යි දතයුතු.

පස්වැනි වූ අභිඥා තොමෝ "දිව්‍යචක්ෂුරභිඥා" නම් වන්නීය. මෙහිදු ශබ්දාර්ථ පරිඥානාදිය දිව්‍ය ශ්‍රොත්‍රධාතු විස්තරානුසාරයෙන් දතුයුතු. මේ මැ ඥානයෙන් ච්‍යුතවනුලබන්නා වූද, උපදිනුලබන්නාවූද සත්වයන් දක්නා හෙයින් "ච්‍යුතූපපාතඥානය" යන නාමාන්තරයක්ද ප්‍රකරණාන්තරයන්හි පැණේ. එසේ වුවද ච්‍යුති ක්ෂණය හා උත්පාද ක්ෂණය දක්නට මේ ඥානීහු අසමර්ථයහ 'යි දතයුතුයි. යම් සත්වයෙක් කළුරිය කිරීමට අත්‍යාසන්න වැ සිටිනම් මොහු දැන් කළුරිය කෙරේය 'යිද, යම් සත්වයෙක් පිළිසිඳගත්තේ නම් දැන් මොහු උපන්නේය 'යිද මෙසේ ආසන්න ගතිකයන් දක්නට සමර්ථ වෙති. එහෙයින් ච්‍යුතූපපාතඥාන ය'යි කියනු ලැබේ. මෙකී ඥානීහු පහසුවෙන් දෘෂ්ටිවිශුද්ධිය ලබන්නෝ වෙති. කෙසේදැයි යතහොත් යමෙක් චුතිය පමණක් දකීද උත්පත්තිය නොදකීද ඔහු මරණින් මතු සත්වයානුපදින්නේ ය'යි කියා උච්ඡෙද දෘෂ්ටිය වැළඳගනී. යමෙක් උත්පත්තිය පමණක් දකීද චුතිය නොදකීද ඔහු නවසත්ත්ව පාතුභාවාදෘෂ්ටිය (අළුතෙන් අමුතු සත්වයෝ උපදිති යන වැරදි කල්පනාව හෝ නිෂ්කාරණොත්පත්තිය) වැළඳගනී. යමෙක් වනාහි චූති උත්පත්ති දෙකම දකීනම් ඔහු කිසිසේත් යථොක්ත මිථ්‍යාදෘෂ්ටි දෙකම නොවැළඳගන්නෙක් වේ. එබැවින් ච්‍යුතූපපාතඥාන ය'යි කියනලද දිවැස දෘෂ්ටිවිශුද්ධියට මූලකාරණ ය'යි දතයුතු. මේ ඥානයෙන් සමන්වාගත තැනැත්තෝ ලොකධාතුවෙහි චුතවනු ලබන්නා වූද උපදිනු ලබන්නා වූද සත්වයන් දකී. එසේම හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සත්වයන්ද සුගති දුර්ගති දෙක පිළිබඳ වැ හෝ ගති විශෙෂ බිළිබඳ වැ නානා කරුණුද දකී. මේ විනා කර්මානුරූප වැ පිළිසිඳගන්නා සත්වයන්ගේ විශෙෂ ඥානයකුදු "යථා කම්මූපගෙ සත්තෙ පජානාති" යනුවෙන් දක්වා තිබේ. චුතූපපාතඥානාවසරයෙහි මෙසේ අවිශෙෂයෙන්

වදාළ නමුදු නිස්පර්‍යාය වශයෙන් සලකා බලනකල කර්මානුරූප ප්‍රතිසන්ධි මනස්කාරය "යථා කර්මූපග ඥාන" කෘත්‍යය බව සැලකිය යුතුයි. ඒ මේ යථා කර්මෝපගඥානයාගේ උත්පත්ති ක්‍රමය මෙසේ දතයුතු:-දිවැස ලබාගත් යම් කිසිවෙක් ආලෝක පතුරුවා මහා කටුක දුක් විඳිනා නිරිසතුන් දක්නේද ඒ මේ දැක්ම "දිව්‍යං චක්ෂුරභිඥාන" කෘත්‍යයයි. ඉක්බිති කවරනම් අකුශලකර්මයක් කොට මේ සත්ත්වයෝ මෙබඳු දුඃඛානුභවය කෙරෙත්දැයි මෙනෙහි කරනුවනට මෙනම් කර්මායූහනයෙනැ'යි කියා ඒ කර්මාරම්මණයෙහි උපදනා ඥානය "යථා කම්මූපග ඤාණ" කෘත්‍යයයි සුගතිය පිළිබඳව ද ඥාන කෘත්‍ය විශේෂ කී නයින් සැලකිය යුතු. මේ ඥානයට වෙනම පරිකර්ම භාවනාවක් නැත. දිව්‍යචක්ෂුස්. ඥානය මැ මීට පාදක වන්නේයැ.

තවද මේ දිවැස මසැසට වඩා ශතගුණයෙන් සහශ්‍ර ගුණයෙන් දර්ශන කෘත්‍ය සාධක වේ. මසැසට අවිෂය වූ තමාගේ ම කුක්ෂිගතයන් ද හෘදයවස්තුගත රූපයන් ද අවනිතලාභ්‍යන්තරයෙහි වූ නිධානයන් හා කීටාදීහු ද භිත්ති පර්වත ප්‍රාකාරකුක්ෂිගත ද්‍රව්‍යාදිය ද භවාන්තරගත සජීවාජීව සංස්කාර පුද්ගලය ද මනාව දිවැසට ගොචර වේත්, මෙබඳු ප්‍රභාවත් විශිෂ්ට දර්ශනයක් ඇති බව දිව්‍යංචක්ෂුරභිඥාන කෘත්‍ය ය'යි දතයුතු.

මෙතෙකින් සත්ත්වයන්ගේපිරිසිදු භාවය පිණිස තුන්ලෝකාග්‍ර සර්වඥයන් වහන්සේ විසින් දක්වා වදාළ ශීලවිශුද්ධ්‍යාදී ක්‍රම සතෙන් දෙවැනි වූ චිත්ත විශුද්ධිය කියා නිමවන ලදී. ඒ මේ චිත්ත විශුද්ධිය නිසා ම ලෞකික ඍද්ධිවිධඥානාදී පංචාභිඥාවෝම සුලභ වූ හ'යි සලකා ඒ උත්තම ශ්‍රී ගුණ ධර්මයන් කාලාන්තරයකින් වත් ලබාගැනීම පිණිස සියලු සුධීන් මැ එක්වන් උත්සාහ වැඩිය යුත්තාහුයැ.

යස්මා සමාහිතො හි
සුධු යථත්ථං විජානතෙ යොගී
තස්මා චිත්ත විශුද්ධිං
විශුද්ධියා භාවයෙථ පණ්ඩිතතෙතා

ගුණරතන ප්‍රණීත විශුද්ධිදීපිකා නම්ලද ධර්ම ප්‍රකරණයෙහි
චිත්තවිශුද්ධි නම් තෘතීය පරිච්ඡේදය නිමි.

# දෘෂ්ටි විශුද්ධිය.

ලක්ඛණ රසාදි භෙද
රූපාදීනං විවෙචනං ඤාණො
අත්තාභිනිවෙස කලුස
සොධනතො දිට්ඨිසුද්ධි 'මාඛ්‍යාති.

**"නාම රූපානං යථාව දස්සනං දිට්ඨිවිසුද්ධි නාම"** යි වියු බැවින් නාම රූපයන් ලක්ෂණ රසාදි වශයෙන් පිරිසිඳ තත්වාකාර යෙන් දක්ම හෝ යථාභූත ඥානයෙන් දුඃඛසත්‍යය නිශ්චය කිරීම "ආත්ම දෘෂ්ටිමල විශොධනයට හෙතුවන්නේ ම" දෘෂ්ටි විශුද්ධිය 'යි කීහ. මෙය වනාහි නාමරූපයන්ගේ සරූපවිභාගානු දර්ශනයෙන් මැ ලැබිය යුත්තකි. මෙහි මූලාවට පැමිණි තැනැත් තේ සත්වයෙක් පුද්ගලයෙක් ඇතැ'යි සත්වොපලබ්ධිය වැළඳ ගෙන දෘෂ්ටිසංක්ලෙශයට පැමිණෙයි. අට වැදෑරුම් දෘෂ්ටිස්ථාන යන් නිසා අටළොස් ආකාරයකින් අභිනිවෙශ පරාමාශ දෘෂ්ටියට බැසගනී. එසේ බැසගත් තැනැත්තේ **ආශ්වාදදෘෂ්ටි, ආත්මානු දෘෂ්ටි, මිථ්‍යාදෘෂ්ටි, සත්කාය දෘෂ්ටි, ශාශ්වත දෘෂ්ටි, උච්ඡෙද දෘෂ්ටි, අන්තග්‍රාහික දෘෂ්ටි, පූර්වාන්තානු දෘෂ්ටි, අපරාන්තානු දෘෂ්ටි, සංයොජනික දෘෂ්ටි, අහන්තිමාන විනිබද්ධ දෘෂ්ටි, ආත්මවාද ප්‍රතිසංයුක්ත දෘෂ්ටි, ලොකවාද ප්‍රතිසංයුක්ත දෘෂ්ටි, භවදෘෂ්ටි, විභවදෘෂ්ටි"** යන ෂොඩශ විධ මිථ්‍යාදෘෂ්ටි පරාමර්ශනය කෙරෙයි. එහෙයින් මැ කාලත්‍රයවර්ති වූ දෙයාසූවක් (82) දෘෂ්ටීන් පහළ කෙරෙයි. නොහොත් දෘෂ්ටි ප්‍රවෙශ මාර්ග තුන්සියය (300) මොහවට ප්‍රකට කෙරෙයි. ඒ හෙතුවෙන් ස්වකීය දෘෂ්ටි ප්‍රවෙශ මාර්ගානුකූල වැ ගමන් ගත් අනන්ත ලොකයා දෘෂ්ටි විපත්තියට පැමිණ පරලොව හානි කරගනීත්. ඔවුනට ආත්ම දෘෂ්ටිමල බැහැර ලනතෙක් දෘෂ්ටිවිශුද්ධිය 'යි කියනලද පිරිසුදු භාවය නොලැබෙන්නේම යැ. එබැවින් දෘෂ්ටිමල විශොධනය සඳහා කටයුතු එකම ප්‍රතිපත්තිය නම ස්වකීය පඤ්චස්කන්ධය පිළිබඳ වැ නුවණින් සලකා බැලීමය 'යි දතයුතු. කෙසේද? යත්:-මාගේ මේ ශරීරය රන්රුවන් මුතු මැණික් ආදියකින් නිර්මිත වූවක්තොවෙයි. දෙවියෙකු මාරයෙකු බ්‍රහමයෙකු විසින් මවන ලද්දක්ද, කලකසිට පවතිනලද්දක්ද, අලුතෙන් ඇතිවූවක්ද, මෙයින් ච්‍යුත වැ නැවත උපදනා ස්වභාව ඇත්තක්ද, නූපදනා ස්වභාව ඇත්තක්ද

කෙනෙකුගේ නියමයක් පිට පවතිනු ලබන්නක්ද, හෙතු ප්‍රත්‍ය රහිත වූවක්ද, නොහොත් නිස්කාරණයේ සම්භවූවක්දැ'යි මෙසේ නුවණ මෙනෙහි සලකත් සලකත් ම දෘෂ්ටිවිශුද්ධිය සවයංසිද්ධ වන්නේයැ. ඒ මේ සැලකීම අනෙකප්‍රකාර වන්නාහ. එනම්:- නාම රූපයන්ගේ වශයෙන්ද, චතුර්විධ ධාතූන්ගේ වශයෙන්ද, අටලොස් ධාතූන්ගේ වශයෙන්ද, ද්වාදශායතනයන්ගේ වශයෙන්ද, පංචස්කන්ධයන්ගේ වශයෙන්දැ'යි මෙසේ පංචප්‍රකාරයකින් මනස්කාර කටයුතු වෙත්. මේ පංචප්‍රකාරය ඔවුනොවුන්ගේ මනස්කාර සෞකර්‍ය්‍යය පිණිස නියමකළ නමුදු අර්ථ විසින් සලකා බලනකල "නාමරූප" දෙකම මිස එයින් පිටත් සත්වයෙක් පුද්ගලයෙක් දෙවියෙක් මරෙක් බඹෙක් නැතැ'යි නිශ්චය කළ හැකි වේ. "ගෘහය-වළච්චය-ශාලිකාවය-ආවාසය-විහාරය" යන නාමයන්ගේ වශයෙන් ව්‍යවහාර ප්‍රාප්ත නමුදු අර්ථවශයෙන් තත්වය සලකන්නෙකුට ඒ සියල්ලම දැව දඬු ගල් ගඩොල් ආදි ද්‍රව්‍ය සමූහයෙන් පිරිවැරූ අවකාශ මාත්‍රයෝමය'යි වැටහෙන්නාක් මෙනැ'යි දතයුතුයි. තවද ලී වැල් මැටි සෙවිලි යන මෙයින් අවකාශ ස්ථානයක් පිරිවරා ඊට ගෘහය 'යි ව්‍යවහාරකරන්නාක් මෙන් ඇට නහර මස් සම් යන මෙයින් පරිවෘත වූ නාම රූපවයට සත්වයා'යි ව්‍යවහාර කෙරෙත්. (පංචවොකාරභව වශයෙනි.) ගෘහය යනු කුමක්දැ 'යි ලී වැල් මැටි සෙවිලි කොටස් කර කර සොයන්නෙකුට ගෘහය'යි පෙන්විය හැකි යමක් නැති බවත් එයින් ගහන වූ විට ගෘහය'යි ව්‍යවහාර ප්‍රාප්ත බවත් එයින් වෙන්වූ ගෘහයක් නැති බවත් වැටහේද එමෙන් ම සම් මස් ඇට නහර ආදිය සත්වයාදැ'යි කොටස්කරමින් බලන්නෙකුට ඔවුන්ගේම සමවායමුත් වෙන්කොට පෙන්විය හැකි සත්වයෙක් නැති බව නුවණින් කල්පනා කළහැකිවේ. තවද ඇඟිලි පහක් ඇති අතින් යමක් අල්වාගත්විට ඊට "මිටය"යි ලොකයා ව්‍යවහාර කෙරෙයි. නමුත් එකෙකී ඇඟිල්ල ක්‍රමයෙන් එසවූ විට මිටය'යි පෙන්විය හැකි යමක් නොපෙනේ. එමෙන්ම "රූප වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ" යන සකන්ධ පස ඒකාබද්ධ වැ පවත්නාවිට සත්වයාය යි කියන නමුත් එකෙකී සකන්ධය වෙන් වශයෙන් සලකන්නෙකුට පංචසකන්ධයම මිස සත්වයා'යි පෙන්විය හැකි යමක් නොලැබේ. මෙසේ ස්වකීය ශරීරය ගැනම නුවණින් මෙනෙහිකරන විට කුසලාකුසල කර්ම ප්‍රත්‍යයෙන් නොහොත් හෙතු ප්‍රත්‍යයෙන් පවත්නා නාමරූපවය මිස කිසිවෙකුගේ මැවීමක් හෝ නිර්මිතවූවක් හෝ නිස්කාරණයේ ඇතිවූවක් හෝ නොවේය'යි දෘෂ්ටිවිශුද්ධිය උපදනේ යැ.

ඒ මේ දෘෂ්ටි විශුද්ධිය උපදවන හටකී පංචප්‍රකාර විභාගය ගැඹුරු අදහස් ඇතිවුවත් ආධුනිකානුග්‍රහය පිණිස ලේසමාත්‍ර විස්තරයක් දක්වන්නෙමු. එහි ප්‍රථම විකල්පයෙහි ශීතොෂ්ණාදි යෙන් විකාරයට පැමිණෙන ශාරීරික ද්‍රව්‍ය සමූහය රූපය 'යිද අරමුණු කර නැමීම සවභාවකොට ඇති හිත ප්‍රධාන වැ පවත්නා අරූපස්කන්ධයෝ හෙවත් විඳිම හැඳිනීම ආයුහනය විජානනය යන කෘත්‍ය කාරී අද්‍රව්‍ය චිත්ත චෛතසිකයෝ නාමය යිද කියනු ලැබෙත්. මෙහි නාමරූප දෙදෙනාගේ සඞ්ගතියෙන් ගමනා ගමනාදි ඉරියව් පවත්නා සමයෙහි සත්ත්වයෙක් යන්නේය. සත්ත්වයෙක් එන්නේය'යි ව්‍යවහාර කෙරෙත්. එබැවින් නාමරූප දෙදෙනාගේ සමාගමය ඇති තැනම ක්‍රියා සිද්ධිය වේ. ඒ බව මේ මතු දැක්වෙන උදාහරණානුසාරයෙන් දතයුතුයි. පංචවොකාර භවයෙහි පවත්නා නාමරූප දෙක කොරෙකුටත් අන්ධයෙකුටත් සමාන වේ. කොරාට ඇස් ඇති හෙයින් මාර්ගය පෙණෙතත් ගමන්කිරීම නොහැකිය. අන්ධයාට පා ඇති හෙයින් ගමන් කළ හැකි නමුත් ඇස් නැති හෙයින් මාර්ගය නොපෙණෙයි. එබැවින් මොහු දෙදෙනාට තනි තනි වැ ගමන්නොකළ හැකි වෙත්. යම් විටෙක ඔවුන් දෙදෙන සමමුබවී මිත්‍ර වැ අන්ධයාගේ කරඋඩ කොරා වාඩිකරවාගත් පසු කොරාගේ නියමයේ හැටියට අන්ධයා ගමන් කෙරෙයි. එමෙන් මැ නාමස්කන්ධ සතර කොරාටත් රූපස්කන්ධය අන්ධයාටත් සමකර බලනවිට රූපයට හිතක් නැති නිසා ක්‍රියාකළ නොහැකිය. නාමයද ද්‍රව්‍යයක් නොවන නිසා ප්‍රකට ක්‍රියා පැවැත්වීමෙහි අසමර්ථය. එබැවින් ඒ දෙදෙනාගේ සමායෝගයෙන් ක්‍රියා පවත්වති. යමක් නාමයට අදහස් වූ පසු රූපයාගේ ආධාරයෙන් එය සිඩ කෙරෙයි. ඒ නිසා (මේ පංචවොකාර භවයෙහි) නාමයෙන් වෙන් වූ රූපයටත් රූපයෙන් වෙන්වූ නාමයටත් තනි තනි වැ ක්‍රියා නොකළ හැකි බවත් වෙන් වැ නොපවත්නා බවත් සැලකිය යුතුයි. තවද මිනිසුන් නිසා නැවද; නැව නිසා මිනිසුන්ද, සමුද්‍ර යාත්‍රා කරන්නාක් මෙන්ම නාමය නිසා රූපයද රූපය නිසා නාමයද සංසාර යාත්‍රාකරන බව දතයුතුයි. (එකවොකාරභව චතුවොකාර භව හැරයි.) මෙසේ සලකනවිට "නම්රූ" දෙකින් පිටත් සත්ත්වයෙක් නැතැ'යි අදහස උපදී. යම් කිසිවෙක් නාමරූප ගැන නොසලකා සත්ත්වයෙක් ඇතැ'යි සිතන අතරම ඔහුගේ සදාකාලික පැවැත්මක් හෝ මරණින් මතු විනාශවීමක් හෝ ඇති බව, කල්පනාවෙයි. එවිට සාශ්වත දෘෂ්ටිය වැළඳගනී. එසේ නොව හේතු ප්‍රත්‍යයෙන් පවත්නා නාම රූප දෙකොකැ'යි සලකනුව

හට ආතම දෘෂ්ටිමල බැහැරවීමෙන් දෘෂ්ටිවිශුද්ධිය ඇතිවේ. මෙ කියනලද්දේ නාම රූපයන්ගේ වශයෙන් විශුද්ධි දැනවීමයි.

චතුර්විධ ධාතූන්ගේ වශයෙන් දෘෂ්ටිවිශුද්ධිය ලැබෙන ක්‍රමය කෙසේද? යත්:- සථ්ථද්ධ ලක්ෂණ විංශතිවිධ වූ පෘථිවි ධාතුවද, ආබන්ධන ලක්ෂණ ද්වාදශවිධ වූ ආපොධාතුවද, පරිපාචන ලක්ෂණ චතුර්විධ වූ තෙජොධාතුවද, විත්ථම්භන ලක්ෂණ ෂඩ්විධ වූ වායොධාතුවද යන ධාතු සතර ප්‍රභෙදයන්ගේ වශයෙන් විසාළිස් (42) ආකාරවන්නාහ. මෙහි විංශද් ප්‍රභෙද ආධ්‍යාත්මික පෘථිවිධාතු නම්:— කෙස්-ලොම්-නිය-දත්-සම් මස්-නහර- ඇට-ඇටමිදුළු—වකුගඩු-හෘදයමාංශ—අක්මා-දලබු බඩදිව-පපුව-බඩවැල-අතුනුබහන්-උදරමල-හිස්මොල" යන මොහුයි. ද්වාදශවිධ ආපොධාතු නම්:—"පිත්-සෙම්-සැරව-ලේ-ඩහදිය මේදතෙල්-කඳුළු-වුරුණුතෙල්-කෙළ-සොටු-සඳමිදුළු-මුත්‍ර" යන මොහුයි. චතුර්විධ තෙජොධාතු නම්:- තෙජොධාතුවෙහි පවත්නා "තැවීම-දැවීම-දිරවීම-පැසවීම" යන කෘත්‍ය සතරයි. ෂඩ්විධ වායොධාතු නම්:- "උද්ධගම-අධොගම-කුච්ඡිසය-කොට්ඨසය-අඞ්ගමඞ්ගනුසාරී-අස්සාස පස්සාස" යන මොහුයි. මෙසේ පෘථිවිධාතු 20 ද, ආපොධාතු 12 ද, තෙජොධාතු 4 ද, වායොධාතු 6 ද, පිඩුකල කල්හි ආධ්‍යාත්මික ධාතු සතර විසාළිස් (42) ආකාරවන්නාහ 'යි දතයුතු. මොවුන්ගේ හටගැණීම "කර්ම චිත්ත-ඍතු-ආහාර" යන සමුඨානයන්ගේ වශයෙනි. එහි විභාග මෙහි පහත දක්වන ක්‍රමයෙන් දතයුත්තේ යැ.

යථොක්ත පෘථිවීධාතු විසිකොටසින් "උදර-මල" යන දෙකොටස හැර සෙසු අටළොසද; "පිත්-සෙම්-ලේ-මේදතෙල් වුරුණුතෙල්-සදමිදුළු" යන ආපොධාතු සකොටසද 'යි මෙසේ කොටස් සූවිස්ස (24) කර්ම-චිත්ත-ඍතු-ආහාර-" යන සමුඨාන සතරින් මැ හට ගන්නාහුයැ. එබැවින් එකෙකී කොටසක "පඨවි-ආපො-තෙජො-වායො-වණ්ණ-ගන්ධ-රස-ඕජා-ජීවිතෙන්ද්‍රිය කායපපසාද" සංඛ්‍යාත කායදශකයද, "අවිනිර්භොගරූපාෂ්ටකය හා ජීවිතෙන්ද්‍රිය-භාවරූප" යන භාවදශකයද 'යි මෙසේ කර්මජ රූප විස්සද; චිත්තජ රූප අටද; ඍතුජ රූප අටද; ආහාරජ රූප අටද; යන රූප සූසාළිස බැගින් පවත්නාහ. මේ ක්‍රමයෙන් චතුසමුඨානික පඨවිධාතු ආපොධාතු කොටස් සූවිස්සෙහි එකෙකී කොටසක රූප කලාප සූසාළිස (44) බැගින් කලාප රූප (24 × 44=1056) එක්දහස් සපණසක් වන්නාහ.

ඍතු චිත්ත යන දෙකින් උපදනා "ඩහදිය-කඳුළු-කෙළ සොටු" යන ආපොධාතු කොටස් සතරෙහි සොළොස් සොළොස් රූපයන් ලැබෙන හෙයින් සොළස සිවු ගුණ වැ (16 × 4=64 සූසැට රූප කෙනෙක් වන්නාහ.

ඍතුවෙන් පමණක් උපදනා "සැරව-මූත්‍ර" යන ආපොධාතු දෙකොටස හා "උදර-මල" යන පෘථුවිධාතු දෙකොටසද 'යි මෙකී සිවුකොටසෙහි රූපාෂ්ටකය බැගින් ලැබෙන හෙයින් අට සිවු ගුණ වැ (8 × 4=32) දෙතිස් රූප කෙනෙක් වන්නාහ. මෙසේ සංඛ්‍යාවශයෙන් බලන කල පෘථිවිධාතු ආපොධාතු දෙතිස් කුණු කොටස්හි රූප සංඛ්‍යාව (1152)) එක්දහස් එකසිය දෙපණසක් වෙති.

තෙජොධාතුව පිළිබඳ සිවුකොටසින් "පැසවීම" ලක්‍ෂණ කොට ඇති තෙජොධාතුව පමණක් කර්මයෙන් හටගත් බැවින් එහි කර්මසමුට්ඨාන ශුද්ධාෂ්ටකයත් ජීවිතෙන්ද්‍රියත් යන රූප නවයකි. එසේම ෂඩ්විධ වායොධාතු කොටස් අතුරෙන් "අස්සාස පස්සාස" වායොකොටස පමණක් චිත්තයෙන් හටගත් බැවින් එහි චිත්තාෂ්ටකයත් ජීවිතෙන්ද්‍රියත් යන රූප නවයකි. මෙකී තෙජො වායො දෙකොටසෙහි පවත්නා කලාප රූපයෝ අට ළොසෙක් (18) වන්නාහ.

තෙජොධාතුවෙහි "තැවීම-දැවීම-දිරීම" ලක්‍ෂණකොට ඇති අවශෙෂ කොටස් තුන හා වායොධාතුවෙහි "උද්ධඞ්ගමාදී" කොටස් පසද යන අට කොටසම චතුසමුට්ඨානික වේත්. එබැවින් එකෙකී කොටසක කර්ම සමුට්ඨාන ජීවිතනවකය චිත්තෘතුආහාරජ කලාප සුවිස්සද යි තෙතිස් රූපය බැගින් වන්නාහ. එක කොටසක තෙතිස බැගින් අටකොටස්හි රූප සංඛ්‍යාව (33 × 8=264) දෙසිය සූසැටක් වන්නාහ. මූලකී රූප අටළොසත් මෙම දෙසිය සූසැටත් එකතු වැ "තෙජො-වායො" කොටස් දශයෙහි රූප සංඛ්‍යාව (282) දෙසිය දෙඅසූවක් වන්නාහ.

සර්වසංග්‍රහික වශයෙන් සලකන විට චතුර්විධ ධාතූන්ගේම කලාප රූප සංඛ්‍යාව (1434) එක්දහස් සාරසිය සූතිසක් වන් නාහ 'යි දතයුතු. මෙකී සංඛ්‍යාව එකෙකී ධාතූන්ගේ වශයෙන් විභාගකොට බලත්හොත් පඨවි ධාතු විසිකොටසෙහි රූප (808) අටසිය අටක්ද, ආපොධාතු කොටස් දොළසෙහි (344) තුන්සිය සතළිසක්ද, තෙජොධාතු කොටස් සතරෙහි (108) එක්සිය අටක්ද, වායො ධාතු කොටස් සයෙහි (174) එක්සිය සිවු සැත්තෑ

එක්ද වෙති. සමුට්ඨාන විසින් බලත්හොත් චතුසමුට්ඨාන රූප 1320 ක්ද, ද්විසමුට්ඨාන රූප 64 ක්ද, එක සමුට්ඨාන රූප 50 ක්ද වෙති. තවද "චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කායවත්ථු "සංඛ්‍යාත දශක සයේ රූප හැටද කර්මයෙන් සමුද්භූත හෙයින් එක සමුට්ඨාන සංඛ්‍යාවට එකතුකර බලන විට ඉන්ද්‍රිය විකලත්වයක් නැති සියල්ලන්ගේම රූප සංඛ්‍යාව 1494 ක් වන්නාහ. මේ සියල්ලම හේතු ප්‍රත්‍යයෙන් ජනිත හෙයින්ද අනිත්‍යස්වභාවයෙන් යුක්ත හෙයින්ද සංස්කාරයන්ට අයත්වූයේ මැ ශීතෝෂ්ණාදියෙන් විකාරයට පැමිණෙන සුලු හෙයින් රූපය'යි කියනු ලැබේ. (ඔවුන් සමූහයක් හෙයින් රූපස්කන්ධ නමුදු වන්නාහ 'යි දතයුතු)

මෙසේ සතර ධාතූන්ගේ වශයෙන් රූපය පිළිබඳ විභාග දැනගත් පසු චක්ෂුරාදි සප්තවිධවාරයන්ගේ වශයෙන් නාමය සලකනු ලැබෙත්. කෙසේද? යත්:- කුශල විපාක විඥාන පස හා අකුශල විපාක විඥාන පසද යන අහේතුක විපාක විඥාන 10 ද; මනොධාතු ත්‍රිකයද; මනො විඥාන ධාතු 68 ද; යන ලෞකික සිත්එකාසූවහා තත්සම්ප්‍රයුක්ත "ස්පර්ශ-වේදනා-සංඥා-චේතනා-ජීවිතෙන්ද්‍රිය-චිත්තස්ථිති-මනස්කාර" යන චෛතසික සතද යන මේකී චිත්ත චෛතසිකයෝ "නාමය"යි සලකනු ලැබේ. මේසේ චතුර්විධ ධාතූන්ගේ වශයෙන් නාම රූප දෙක වෙන්කර ඉක්බිති අරමුණු කරා නැමෙන අර්ථයෙන් නාමය'යිද විකාරයට පැමිණෙන අර්ථයෙන් රූපය'යිද සැකෙවින් සලකා මේ නාම රූප දෙකින් පිට සත්වයෙක් පුද්ගලයෙක් නැතැ'යි නුවණින් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි. එසේ ප්‍රත්‍යවේක්ෂා කොට ආත්මයක් තිබේය යන වැරදි මතය බැහැර කෙරෙමින් නාම රූප මාත්‍රයෙහි නුවණ පිහිටුවා "දෘෂ්ටිවිශුද්ධිය" උපදවන්නේ යැ. මේ කියන ලද්දේ චතුර්විධ ධාතූන්ගේ වශයෙන් දෘෂ්ටි විශුද්ධි දැනවීමයි.

ඉක්බිති අටළොස් ධාතූන්ගේ වශයෙන් දෘෂ්ටි විශුද්ධිය නිපදවන අයුරු දක්වනු ලැබේ. මෙම ශරීරයෙහි "චක්ෂු-ශ්‍රොත-ඝ්‍රාණ-ජිහ්වා-කාය-මනඃ" යන ධාතු සයක්ද; "රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය-ධර්ම" යන ධාතු සයක්ද; 'චක්ෂුර්විඥාන-ශ්‍රොත විඥාන-ඝ්‍රාණවිඥාන-ජිහ්වාවිඥාන-කායවිඥාන-මනොවිඥාන" යන ධාතු සයක්ද 'යි මෙසේ අටළොස් ධාතුකොෂ්ඨතක් වන්නාහ. මෙම ධාතූහු නාම රූපවශයට විභාග කටයුතු අවස්ථාවෙහි සසම්භාර චක්ෂුරාදිය නොගැනෙන හෙයින් ප්‍රසාදයන්ගේ වශයෙන් "දෘෂ්ටුකාමතානිදාන කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද

ලක්ෂණ චක්ෂුප්‍රසාදාදි" පංචප්‍රසාදයෝද; රූපශබ්දාදී පංචවිධ විෂය රූපයෝද; යන දශය හා ප්‍රසාදායතන දෙසිය පස්පණස් (255) ප්‍රභෙද ධර්මධාත්වෙකදෙශයද යන අර්ධෛකාදශ ධාතූහු රූපන ස්වභාව ඇතිහෙයින් රූපය 'යි සලකනු ලැබේ.

මනස හෙවත් පංචද්වාරාවර්ජන; සම්ප්‍රතීච්ඡනයුගල; යන මොහු මනොධාතු නමැයිද, විඥාන පංචකය පංචවිඥානධාතු නමැ 'යිද, අවසැටක් මනොවිඥානයෝ මනොවිඥානධාතු නමැ 'යිද, චෙතොයුක්තාරූපී ධර්මයෝ ධර්මධාත්වෙක දෙශය 'යිද සලකා මෙකී අර්ධාෂ්ටමක ධාතූහු අරමුණු කරා අවනත ස්වභාව ඇති හෙයින් නාමය 'යි සලකනු ලැබේ.

මේ ක්‍රමයෙන් 10½ ක් ධාතූහු රූපය 'යිද; 7½ ක් ධාතූහු නාමය 'යිද අටළොස් ධාතූන් නාම රූපද්වයට විභාගකොට මෙයින් පිට සත්ව පුද්ගලාදි කිසිවෙක් නැතැ 'යි සත්වොපලබ්ධිය බැහැරකොට දෘෂ්ටි විශුද්ධිය උපදවන්නේය 'යි දතයුතු මේ කියන ලද්දේ අඨාරස ධාතූන්ගේ වශයෙන් දෘෂ්ටි විශුද්ධි නිපද වීමයි.

ද්වාදශායතනයන්ගේ වශයෙන් දෘෂ්ටි විශුද්ධිය උපදවන තැනැත්තේ "චක්ඛු-සොත- ඝාණ-ජිව්හා-කාය" යන සය හා "රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම" යන සයද 'යි මෙකී දොළස ෂට්විධ විඥානකායොත්පත්තියට ද්වාරාරම්මණිකත්වයෙන් ද්වාදශායතනය 'යි සලකා ඉක්බිති "නාමරූප" යන්ගේ වශයෙන් විභාග කෙරෙයි. කෙසේද? චතුස්සමුට්ඨානික දෙසිය සොළොස් රූපාත්මක "චක්ඛු-සොත-ඝාණ-ජිව්හා" යන චතුරායතනයන්ගේ නිරවශෙෂ ප්‍රසාදචතුෂ්කය හා සූසාළිස් රූපාත්මක කායායතනයාගේ ප්‍රසාද මාත්‍රයද 'යි මෙකී පංචප්‍රසාදයෝද; විසභාග ප්‍රත්‍යාදීන්ගේ වශයෙන් අනෙක ප්‍රභෙද ඇති "රූප-සද්ද-ගන්ධ-රස" යන සතර හා භූතත්‍රයාත්මක ස්ප්‍රෂ්ටව්‍යද 'යි මෙකී විෂය රූප පඤ්චකයද; නව සහ ජාත කාය භාව දශක සූවිසි සුද්ධාෂ්ටකයන්ගේ වශයෙන් හා නව සහ ජාත භාව දශක තිස මූලාතික අවිනිර්භොගයන්ගේ වශයෙනුත් විභාගප්‍රාප්ත ධර්මායතනෛකදෙශයද යන මොහු රූපය 'යි සලකනු ලැබේ.

මනායතනය සප්තවිධ විඥානධාතූන්ගේ නොහොත් එකාසූවක් ලෞකික චිත්තයන්ගේ වශයෙන්ද; ධම්මායතනෛකදෙශය නම් සම්ප්‍රයුක්තයන්ගේ වශයෙන් නොහොත් අරූපස්කන්ධත්‍රයාගේ වශයෙන්ද 'යි මෙසේ නාමය සලකනු ලැබේ. මෙසෙ

සින් 10½ ක් ආයතන රූපය 'සිද; 1½ ක් ආයතන නාමය 'සිද සම්මිශ්‍රණය කොට සංස්කාර පරිච්ඡෙදඥානය උපදවයි. මේ කියන ලද්දේ මාදශායතන විසින් දෘෂ්ටිවිශුද්ධි ඥානවිමසී.

ඇතැම් කෙනෙක් පඤ්චස්කන්ධයන්ගේ වශයෙන්ද දෘෂ්ටිවිශුද්ධිය උපදවත්. හේකෙසේදැ 'යි යතහොත්:- පළමුකොට මෙම ශරීර පිළිබඳ "රූප-වෙදනා-සංඥා-සංස්කාර-විඥාන" යන කොටස් පහක් විද්‍යමාන බවද එහි එකෙකී කොටසෙක්හි එනම් ධර්ම සමූහයක් අන්තර්ගත හෙයින් රාශිය හෙවත් ස්කන්ධය 'යි නම්කොට "රූපස්කන්ධය-වෙදනාස්කන්ධය-සංඥාස්කන්ධය-සංස්කාරස්කන්ධය-විඥානස්කන්ධය" යි ව්‍යවහාර ප්‍රාප්ත බවද සලකනු ලැබේ. ඉක්බිති රූපස්කන්ධය පමණක් ද්‍රව්‍ය සමූහයක් වශයෙන්ද සෙසු ස්කන්ධසතර අද්‍රව්‍ය නාම ධර්ම වශයෙන්ද සම්මිශ්‍රණය කෙරෙයි. ඒ මේ ද්‍රව්‍යමය රූපස්කන්ධයෙහි පවත්නා ද්‍රව්‍ය නිර්විශෙෂයෝ "භූතොපාදය" වශයෙන් විප්‍රකාර තමූදු විභාග විසින් අනෙක ප්‍රකාර වන්නාහ. ඔහු කවරහුද? යත්:- "පඨවී-ආපො-තෙජො-වායො" යන භූතරූප සතරද; "වර්ණ-ගන්ධ-රස-ඔජා" යන නිශ්‍රිතරූප සතරද; "චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය" යන ප්‍රසාදරූප පසද; "වත්ථු-භාව-ජීවිත" යන රූපත්‍රයද; විසමුඛාණික "ශබ්දය" ද; යන මෙකී නිෂ්පන්නරූප සත්ලොස (17) හා "පරිච්ඡෙදරූපය; කාය වචී විඤ්ඤත්තිවය, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන විකාරරූපත්‍රය, උපචය සන්තති අනිච්චතා ජරතා යන ලක්ෂණ රූප සතර යන අනිෂ්පන්න රූප දශයදැ'යි මෙසේ සත්විසි (27) රූප කෙනෙක් වන්නාහු යැ. මෙහි භූත රූපය සිවු වැදෑරුම් කොටද උපාදාරූපය තෙවිසි වැදෑරුම් කොටද දක්වූහ. මෙසේ වූ සත්විසි රූපය "රූපස්කන්ධය" යි දතයුතු.

මේ පිළිබඳ ඇතැම් ප්‍රකරණයන්හි "භූත-ප්‍රසාද-විසය-භාව හදය- ජීවිත- ආහාර" යන නිෂ්පන්න රූප අට ළොසක් හා අනිෂ්පන්න රූප දශයක්දැ'යි මෙසේ අට විසි රූපයක්ද; අන්තැනක "භූත- විසය- ප්‍රසාද- වත්ථු- භාව- ජීවිත-ආහාර' යන මොවුන්ගේ "විසය-භාව" රූපයෝ ඌනාතිරෙක කොට අටවිසි රූපයක්ද; තවත් තැනක "විසය-ප්‍රසාද-භාව-ජීවිත-ආහාර-ආප-ඵස්ස" යන මොවුන්ගේ වශයෙන් පස්විසි රූපයක්ද; එයම අන් තැනක සවිස්සක් වශයෙන්ද; "බල සම්භව ජාති රොග" රූපයන්ගේ සමායොගයෙන් සත්විසි අටවිසි එකුන්තිස්, සමතිස්, රූපයෝ වන්නාහුයයි' දක්වන

ලදහ. මේ රූපස්කන්ධය පිළිබඳ ප්‍රකරණාන්තරයන්හි පැණෙන විභාගාන්තරයන්ගේ සාම්‍යය නතිවද විෂයක හෙයින් ප්‍රථමකොට දක්වූ සත්විසි රූපය හෙයිම පරිච්ඡෙදයෙන් රූපස්කන්ධය'යි කියාද මධ්‍යම පුද්ගු වශයෙන් එක්සිය දෙයාසූරූපයෝ රූපස්කන්ධය'යි කියාද උපරිම සංඛ්‍යාවෙන් පන්සිය සපණස් රූපයෝ රූපස්කන්ධය'යි කියාද සලකනු ලැබෙත්,,

එකාසූවක් ලෞකික චිත්තයන් හා උපදනා වෙදනාවෝ වේදනාස්කන්ධ නමි. ඒ හා සම්ප්‍රයුක්තවූ සංඥාවෝ සංඥාස්කන්ධ නමි. සෙසු චෛතසිකයෝ සංස්කාරස්කන්ධ නමි එකාසූවක් ලෞකික චිත්තයෝ විඥානස්කන්ධ නමැ'යි දතයුත්තාහ, මෙසේ පඤ්චස්කන්ධයන්ගේ වශයෙන් නාමරූපයන් වෙන්කොට සලකා දෘෂ්ටි විශුද්ධිය උපදවනු ලැබෙත්.

එසේ උපදවන්නාවූ යොගීහුගේ ඥානයට සත්ව නිර්මාණය අසත්‍යවූවක් බවත් හෙතු ප්‍රත්‍යයෙන් පවත්නා නාමරූප මාත්‍රයක්ම බවත් වැටහී සංස්කාර පරිච්ඡේදඥානය උපදනේයැ. එබැවින් සියලු භවතුන් විසින්ම යථොක්ත ක්‍රම දැන ඉගෙනමෙනෙහිකරමින් මොවුන්ගෙන් පිට නාමරූපයක් හෝ නාමරූපයෙන් පිට ස්කන්ධ ධාත්වායතනාදියක් හෝ නැතැ,යි ආභොග මනස්කාර කටයුතු, එසේ කරනුවහට මුළු ලෝකයම හෙතු ප්‍රත්‍යය නිසා පවත්නා බවත් නාමරූපයෙන් පරිබාහිර සත්ව පුද්ගලාදි කිසිවෙක් නැති බවත් වැටහී දෘෂ්ටි විශුද්ධිය උපදනාහුය. මේ කියන ලද්දේ තුන්වැනිවූ දෘෂ්ටි විශුද්ධිය පිළිබඳ සංකෙත මාත්‍රයෙකැ'යි දතයුතු. යම් කිසිවෙක් සංස්කාර පරිච්ඡෙදඥානය උපදවාගැනීමෙහි අනභිරති වෙද්ද ඔව්හු තෘෂ්ණා අවිද්‍යාදියෙන් විගුණ්ඨිත වූවාහු සසරින් නොමිදෙත්ය'යි සලකා දෘෂ්ටි විශුද්ධි දැනවීමෙහි සියලු සුධීන්ම උත්සාහ වැඩියයුත්තාහුය.

දිට්ඨි විසුද්ධි අභාවා
තණ්හා'විජ්ජා විගුණ්ඨිතා ජනතා
වට්ටෙ [illegible]නුවත්තතීයං
දිට්ඨි විසුද්ධිං සමාරභෙථ තස්මා

ශ්‍රී [illegible] ප්‍රණීත විශුද්ධිදීපිකා නම්වූ ධර්මප්‍රකරණයෙහි දෘෂ්ටිවිශුද්ධි නම් චතුර්ථ පරිච්ඡේදය නිමි.

# කාංක්‍ෂා විතරණ විශුද්ධිය.

"ලොකො අහෙතුකො වෙ?"
"ඉස්සර" නිම්මානතො නුවෙ භවති?:
ඉති කංඛං තරතී'තී
කංඛා විතරණ විසුද්ධි මාහ මුනී

**"තෙසඤ්ඤෙව ච නාමරූපානං පච්චයපරිග්ගහෙන කඞ්ඛාවිතරණ විසුද්ධි නාම"** යනුවෙන් යථොක්ත නාමරූපයන්ගේම ප්‍රත්‍යය පරිග්‍රහණය කාංක්‍ෂාවිතරණයට හා අහෙතු විෂම හෙතුදෘෂ්ටි මල විශොධනයට හේතුවන්නේනුයි "කාංක්‍ෂා විතරණ විශුද්ධි"නමැයි කීහ. මෙම විශුද්ධිය උපදවාගනු කැමති විපස්සනා යාතිකතෙමේ පළමුකොට නාම රූප දෙදෙනාගේ පැවැත්ම පිළිබඳවැ, කාලත්‍රය විෂයකොට උපදනා ශොඩෂවිධ කාංක්‍ෂාවිතරණය කිරීමෙහි යත්න කෙරෙයි. කෙසේද? මා පිළිබඳ මෙම නාම රූප දෙක අතීතයෙහි වූයෙම්ද? නොවූයෙම්ද? උත්පත්තිවිසින් කවරෙක් වූයෙම්ද? සණ්ඨාන වශයෙන් කෙසේ ස්වරූප ඇත්තෙක් වූයෙම්ද? කෙබන්දෙක් වැ සිට කෙබඳු විකායකීකට පරිවර්තනයවූයෙම්ද? කියා මෙසේ අතීතය අරමුණුකොට පංචප්‍රකාර සැකයට බැසගනී.

මෙම නාමරූප දෙක අනාගතයෙහි ඇතිවන්නෙම්ද? නොවන්නෙම්ද? කවරෙක් වන්නෙම්ද? කෙසේ ස්වරූප ඇත්තෙක් වන්නෙම්ද? කෙබන්දෙක් වැ සිට කිනම් විශෙෂයකට පරිවර්තනය වන්නෙම්ද? කියා මෙසේ මතු කාලය අරමුණු කොටද පංචප්‍රකාර සැකයට බැසගන්නේ යැ.

වර්තමාන කාලවශයෙනුදු මෙම නාමරූප දෙක මමද? අනෙකෙක්ද? කෙබන්දෙක්ද? කෙසේ ස්වරූප ඇත්තෙක්ද? කොතැනෙකසිට මෙහිආයේද? මෙසින් කවරතැනකට යන්නෙක්වේද? කියා ෂඩාකාරයකින් සැකඋපදවයි. මෙසෙයින් කාලත්‍රයවිෂයක සොළොස් වැදෑරුම් සැකයට පැමිණී තැනැත්තේ යථොක්ත නාමරූප දෙක නිෂ්කාරණයේ හටගත්තේද නොහොත්විෂම හෙතුන්ගෙන් හටගත්තේදැයි "අහෙතු විසමහෙතු":යන දෘෂ්ටියුගලයටද බැසගනී. එසේ බැසගැනීම විශුද්ධිය අවිශුද්ධකරන නොමනා ප්‍රතිපදාවකැ'යි සලකාගත් යොගීතෙමේ විචාරණ බුද්ධියෙන් යෙදී යටකී සොළොස් ප්‍රකාර කාංක්‍ෂාවිතරණය කිරීමට හා අහෙතු විෂම හෙතු දෘෂ්ටිමල බැහැරකිරීමටද උත්සාහවඩයි, එසේ ප්‍රයත්න දරු විශුද්ධියට පැමිණෙන්නේය:

ඒ මේ විශුද්ධි සම්පාදකොපාය වූකලී නාමරූප දෙක පිළිබඳ හෙතු ප්‍රත්‍යයන්ගේ වශයෙන්ද සභාග විසභාග වශයෙන්ද පරිණත භංගත්වයෙන්ද (ජරා මරණ විසිතැයිසේයි) අනුලොම ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන්ද හෙතුඵලයන්ගේ වශයෙන්ද කර්ම විපාක වෘත්ත වශයෙන්ද ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන්ද වන්නේය. ඔවුන්ගේ වශයෙන් ප්‍රත්‍යපරිග්‍රහණයකොට ධර්මස්ථිතිඥානය ලබයි. තත්වාර්ථ පරිඥානයෙන් යථා භූතඥානය දනවයි. ඥාණ පරිඥානයෙන් සම්‍යක් දර්ශනය උපදවයි. කාංක්‍ෂාවතරණය කිරීමෙන් කාංක්‍ෂාවිතරණ විශුද්ධිය ලබයි. මෙයින් යුක්තවූ විදර්ශක තෙමේ සම්බුද්ධ සසුන්හි ලැබූ ප්‍රතිෂ්ඨා ඇත්තේ "චූල්ලසොතාපන්නය"යි කියනු ලැබේ, එබැවින් එබඳු උපාධි නාමයක් ලැබීමට තරම්වන ඵලානුමෙය කම්සරණියක් ඇති කාංක්‍ෂාවිතරණ විශුද්ධිය උපදවා ගැනීමෙහි අනුසස් පසක්නා සසර බිය තුරුස්නා සුධීහුම ඒ සඳහා කරනු ලබන විස්තරය පරිශීලනය කිරීමෙහි නිරතුරු ආශක්ත වෙත්වා'යි කාරුණාපූර්ණ ආයාචනා වෙන් මෙහෙයනු ලැබූ අස්මත්තෙමේ තදර්ථ සංසිද්ධියෙහි යථාශක්තීන් ව්‍යාපෘත වන්නෙමි.

මෙහි විශුද්ධි සම්පාදනය සඳහා නියම්කරනලද සප්තවිධ කාරණාවන් අතුරෙන් පළමුවැනිවූ හෙතු ප්‍රත්‍යයන්ගේ වශයෙන් කාංක්‍ෂා විතරණ විශුද්ධිය උපදවන අයුරු කෙසේද? යත්:- පළමුකොට නාමරූප දෙක හෙවත් පංචස්කන්ධය අහෙතුකවැ යිඡ්කාරණයේ ඇතිවූවක් නොව හෙතුප්‍රත්‍යයෙන් හටගන්නා ලදූ'යි සලකනු ලැබෙත්. කුමක්හෙයින්ද? සියලු කාලයෙහිම ඒ ඒ ජාතීහු ඔවුනොවුන් හා සමානත්වයකින් දෘශ්‍යමාන වන හෙයිනි. එසේම දෙවි බඹ ආදීන්ගේ මැවීමක්ද නොවෙයි, කුමක් හෙයින්ද? නාමරූප දෙකින් පිටත් දෙවි බඹ ආදි කිසිවෙක් නැති හෙයිනි. ඒ මතුද නොවෙයි. ඔවුන්ගේ උත්පත්තිය නිස්කාරණයේ හටගත්තේය යන අහෙතුක වාදයට නිමිති වන හෙයිනි. එබැවින් මෙහිදී සැලකිය යුතු ක්‍රමයනම්:— "කොස්-පොල්-පුවක්-අඹ-දෙල්" යනාදී වෘක්‍ෂයෝ ලොකයෙහි යම්කිසි හේතුවක් නැතිව නිස්කාරණයේ හටගන්නේය'යි යමෙක් කියානම් එය අභූතයෙක අහෙතුකවැ ඇතිවේනම් බිජුවට හටගැනීමක් හෝ රෝපණයක් උවමනානැත. එසේම විෂමහේතුවෙන් ඇතිවේය'යි යමෙක් කියානම් එයද අසත්‍යයෙක. කුමක් හෙයින්ද කොස් බිජුවට කින් පොල්ගසක් නොපැලවෙන හෙයිනි. මේ ක්‍රමයෙන් මෙනෙහි කරන්නෙකුට පවා අහෙතු විෂමහෙතු දෘෂ්ටීන්ගේ දුරලීම ස්වයංසිද්ධවේ. එමෙන්ම

"දිව්‍ය-මනුෂ්‍ය-නරක-තිර්‍ය්‍යක්-ප්‍රෙත" යන පංච ගතියෙහි උපදනා සත්ත්ව වර්ගයාද නිස්කාරණයේ අහෙතුකවූ උපදිත් නම් දෙවියෝ දෙවියන් හාද මනුෂ්‍යයෝ මිනිසුන් හාද කිසියේත් සණ්ඨාන අදහස් ක්‍රියා කර්මාදියෙන් සමාන නොවිය හැක්කේය. එසේ නොව ඒ. ඒ. ජාතීහු ඔවුනොවුන් හා සමානත්වයකින් පැණෙන හෙයින් සහෙතුකවම හටගත් බව පෙනේ. එසේම දිව්‍ය මනුෂ්‍යාදීහු විෂම හෙතුන්ගෙන් උපදනාහු නම් දෙවියන් අතර මිනිසුන්ගේද මිනිසුන් අතර තිරිසනුන්ගේද තිරිසනුන් අතර දෙව් මිනිසුන්ගේද උප්පත්තිය ඇතිවිය හැකිය. එසේ නොවන හෙයින් විෂම හේතුවෙන් නොහටගන්නා බව පෙනේ. තවද ඉහතකී දෙව් මිනිස් ආදීහු දෙවියන්ගේ මැවීමක් බව කියාතම පංචගතියට ඇතුලත් ඒ මැවුන්කාර දෙවියාගේ උප්පත්තිය කාගේ මැවීමක්ද? මැවීමක් නොවේනම් ඔහුගේ උප්පත්තිය නිස්කාරණයේ අහෙතුකවූ හටගත්තේ දැයි සලකන විට මැවීමක් නොවන නිස්කාරණයේ නොහටගත් බවත් වැටහෙයි. එපමණක්ද නොව පංචගතියෙහි වසන සියල්ලෝම නාමරූප දෙකින් යුක්ත බවත් එයින් පරිබාහිරවූ සත්වයෙක් නැති බවත් සලකන විට මැවීමක් නොවන බව හැගේ. නම් රූ දෙකින් යුත් මනුෂ්‍යයා මැවුවාය කියන දෙවියාගේත් ඒ නම් රූ දෙකම විද්‍යමාන හෙයිනි.

එබැවින් හෙතු ප්‍රත්‍යයෙන් පවත්නා "නාමරූප" දෙක දෙව්ලොව් හටගත් කාලයෙහි දෙවියා කියාද, මිනිසුන් අතර උපන් කාලයෙහි මනුෂ්‍යයා කියාද, තිරශ්චීනයන් අතර ඇතිවූ කාලයෙහි තිරිසනා කියාද, නරකයෙහි උපන් කාලයෙහි නිරිසතා කියාද ප්‍රෙතයොනියෙහි උපන්විට ප්‍රෙතයා කියාද, ව්‍යවහාර වන්නේය. මෙසේ හෙතු ප්‍රත්‍යයෙන් ඒ ඒ භවයෙහි නාමරූපයන්ගේ හටගැනීම තේරුම් ගත් පසු ඒ හෙතුප්‍රත්‍ය කවරේදැයි අදහස් උපදනා හෙයින් මින්මතු ඔවුන්ගේ විස්තරය දක්වනු ලැබේ.

යම්සේ රොගියෙක් දුටු වෛද්‍යාචාර්‍ය්‍යයෙකු මේරෝගය ඇතිවීමට හේතුප්‍රත්‍ය කවරේදැ'යි නිදානාදි පංචකය සොයාද එසේම යටකී ක්‍රමය දැනගත් විදර්ශක තෙමේද "නාමරූප" දෙකේ හටගැනීමට හෙතු ප්‍රත්‍ය කවරේදැ යි වෙන් වශයෙන් කල්පනා කෙරෙයි. කෙසේද? චක්‍ෂු ප්‍රසාදය හා රූපාරම්මණ යන දෙක හෙතු කොට ගෙන චක්‍ෂුර්විඥානය උපදී. ඒ ත්‍රිවිධ කාරණාවන්ගේ සංගතියෙන් (එකතුවීමෙන්) ස්පර්ශය හටගන්නේය. එම

ස්පර්ශ ප්‍රත්‍යය කොටගෙන වේදනාවද වේදනාව ප්‍රත්‍ය කොටගෙන තෘෂ්ණාවද උපදනේය. ඒ මේ තෘෂ්ණාතොමෝ පුනරුප්පත්තියට (දෙවෙනි උප්පත්තියට) හේතුවන්නේ ය'යි දතයුතු. මෙ නාමයාගේ සම්භවයට හෙතු ප්‍රත්‍ය ක්‍රමයයි.

ඉක්බිති රූපයාගේ හෙතුප්‍රත්‍ය ක්‍රමය දක්වනු ලැබේ. රූපය වනාහි "අවිද්‍යා–තෘෂ්ණා–උපාදාන–කර්ම" යන හෙතු සතරකින් හා ආහාර ප්‍රත්‍යයෙන් දැ'යි මෙකී කරුණු පසෙන් හෙවූ ප්‍රත්‍ය භාවය සාධ්‍යවූවකි. නාමය පිළිබඳ හෙතු පරපුරෙන් උපන් වේදනාතොමෝ අවිද්‍යා සහගත අයොනිසො මනස්කාරයෙන් මෙතෙකී කරනු භව භාවොත් පත්ති සාධක තෘෂ්ණා තොමෝ උපදීනු යි රූපය පිළිබඳ හේතූන්වම ඔවුන්ගේද සහායත්වය ඇතිවේ. එබැවින් නාමරූප දෙදෙනාගේම හෙතු ප්‍රත්‍යයන් පිළිබඳ සමාන්‍යය උපචාරයෙන් හැගේනු'යි ධර්මාන්තර සූක්ෂම ක්‍රම ඇතත් මෙහිදී නොවෙනස්ව සැලකිය යුතුයි. එසේ සලකන විට "අවිද්‍යා–තෘෂ්ණා–උපාදාන" යන ධර්මත්‍රය උපනිශ්‍රය වශයෙන්ද, "කර්මය" ජනකවශයෙන්ද මූලාර්ථයෙන් "හෙතු" වන බව හා "ආහාරය" උපකාරාර්ථයෙන් "ප්‍රත්‍ය" වනබවද සැකෙවින් දතයුතුයි. කරුණු වශයෙන් සලකන විට මවුකුස පිළිසිඳ ගන්නා සත්වයෙකුට ආධාර වන මවකමෙන් "අවිද්‍යා–තෘෂ්ණා–උපාදාන" යන ධර්ම තුනද; පුත්‍රොත්පාදනයෙහි කර්තෘත්වය උසුලන පියෙකුමෙන් "ජනක කර්මයද" හෙතුවන බව හා උපන් දරුවාට උපකාරී කිරිමවක මෙන් "ආහරය" ප්‍රත්‍යවන බවද දතයුතුයි. මෙසේ හෙතු ප්‍රත්‍යයන් නිසා මෙම නාමරූප දෙක යම්සේ පවතිත්ද එසේම අතීතකාලයෙහිද හෙතු ප්‍රත්‍යවශයෙන්ම පැවැතිණ, අනාගතයෙහිද්‍ද හෙතු ප්‍රත්‍ය යන් නිසාම පවත්නාහ'යි සිතනුවහට කාලත්‍රය පිළිබඳ වැ උපදනා සොළොස් වැදෑරුම් කාංක්‍ෂාව දුරුවන්නේය. අහෙතු විසම හෙතු දෘෂ්ටීන්ගේ ද දුරුවීම වන්නේයැ. මෙසේ නාමරූපවය කාලත්‍රයෙහි මැ හෙතුප්‍රත්‍ය යෙන් පවත්නා බව සැලකීමෙන් කාංක්‍ෂාව තරණයකොට අහෙතු විසම හෙතු දෘෂ්ටිමල විශොධනයෙන් විශුඞියට පැමිණි තැනැත්තේ ආදිභූත ක්‍රමයෙන් පිරිසුදුවූහ'යි දත යුත්තේයැ.

දෙවැනිවූ "සභාග විසභාග ප්‍රත්‍ය වශයෙන්" ලැබියයුතු ධර්මස්ථිතිඥානය මතුදක්වන ක්‍රමානුසාරයෙන් දතයුතු. එනම්:– කුශලාකුශල විපාක ක්‍රියා සංඛ්‍යාත නාමය පුනරුත්පත්තිභාවය ව සභාග වශයෙනුත් විසභාග වශයෙනුත් ප්‍රත්‍ය වන්නේය. එහි වාරූරම්මණයන් සියලු කුශලාකුශලාදීන්ට නොවෙනස්වැ

ප්‍රත්‍යවන හෙයින් ඔව්හු සධාරණ ප්‍රත්‍යනම් වෙත්. ජවන ප්‍රතිපාදක මනස් කාරය විසභාග ප්‍රත්‍යනම් වේ. යොනිසොමනස්කාර සද්ධර්මශ්‍රවණාදිය කුශලයට පමණක් ප්‍රත්‍යවන හෙයින්ද, අයොනිසොමනස්කාර අසද්ධර්මශ්‍රවනාදිය අකුශලයට පමණක් ප්‍රත්‍යවනහෙයින්ද, කර්ම සන්තතිය විපාක පරපුරටපමණක් ප්‍රත්‍යවන හෙයින්ද, විසභාග ප්‍රත්‍යනමැයිදතයුතු. රූපයාගේද "කර්ම-චිත්ත-ඍතු-ආහාර"කියා ප්‍රත්‍යසතරකි. එහි කර්මය කර්මසමුඨාන රූපයන්ට පමණක් සභාග ප්‍රත්‍යවේ. සෙස්සනට විසභාග ප්‍රත්‍යවේ. චිතෙතාතුහාර යන ප්‍රත්‍යතුනද ඔවුනට සභාග ප්‍රත්‍යවෙත්. ප්‍රවෘත්තියෙහි විසභාග ප්‍රත්‍යවත් නාහ. මේ කියනලද්දේ ඖදරික සභාග විසභාග ප්‍රත්‍යක්‍රමයයි. විසදතර ප්‍රාඥතෙමේ ඔවුනොවුන්ගේ තුල්‍යාතුල්‍ය ප්‍රත්‍යවත් භාවය මෙනෙහිකෙරෙයි. මෙසෙයින් සලකන්නහුද කාලත්‍රයෙහිමැ නාමරූපදෙක යථොක්ත සභාග විසභාග ප්‍රත්‍යවිසින් පවත්නා බව සලකා කාංක්ෂාව දුරුකොට සම්‍යක් දර්ශන සංඛ්‍යාත විශුද්ධිය උපද වන්නේයැ. මෙකියන ලද්දේ සභාග විසභාග විසින් විශුද්ධි දැනවීමයි.

තුන්වැනිවූ "පරිණත භාඞගත්වයෙන්" කාංක්ෂා විතරණය කෙසේද? යත්:- සංස්කාරයන්ගේ මුහුකිරීමය'යි කියනලද ජරාවද, භඞගය'යි කියනලද මරණය, දැන මේ ජරාමරණ දෙක වනාහි ජාතිනම් ලද උත්පත්තිය ඇතිකල්හිද, ඒ උත්පත්තිය කර්මභවය ඇතිකල්හිද, භවය උපාදානය ඇතිකල්හිද, උපාදානය තෘෂ්ණාව ඇති කල්හිදැ'යි මෙසේ අවිද්‍යාව තෙක් ප්‍රතිලෝම වශයෙන් හෙතු ප්‍රත්‍ය සලකා බලනුයේ අතීතයෙහි නාමරූප දෙක යථොක්ත හෙතු ප්‍රත්‍ය වශයෙන් පැවත ආයේය'යිද අනාගතයෙහිත් එසේමැ පවත්නේය'යිද වත්මනුයෙහිදු එසේමය'යි නිශ්චයකොට මෙනෙහි කරත් කරත්ම කාංක්ෂාවිතරණ විශුද්ධිය උපදනේයැ.

සිවුවැනිවූ "අනුලොම ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන්" විශුද්ධි දැනවීම කෙසේද? යත්:- මෙම නාම රූප දෙක "අවිද්‍යා-සංස්කාර-විඥාන-නාම රූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා-තෘෂ්ණා, උපාදාන-භව-ජාති" යන හෙතු ප්‍රත්‍ය ධර්මයන්ගේ වශයෙන් කාලත්‍රයෙහි මැ ච්‍යුති උත්පත්ති ක්‍රමය නොසිඳ පවත්නා බව මෙනෙහි කොට තදනුගත ඥානයෙන් විශුද්ධිය උපදවන්නේය.

පස්වැනිවූ "හෙතුඵල" ධර්මයන්ගේ වශයෙන් බැලීම කෙසේදැ'යි යතහොත්:-පූර්වභවයෙහි පැවති "අවිද්‍යා-සංස්කාර-තෘෂ්ණා උපාදාන-කර්මභව" යන හෙතු පචකය නිසා මේ භවයෙහි "ප්‍රතිසන්ධි-නාමරූප-සළායතන-ස්පර්ශ-වෙදනා" යන පල පච

කය ලැබේ. නැවත මේ භවයෙහි පවත්නා යථොක්ත ඵල පවකය නිසා ආයති භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යවන අවිද්‍යාදි හෙතු පවකය රැස්කෙරෙයි. මෙසෙයින් අතීතහෙතුන් නිසා වර්ත්මාන ඵලයන්ගේ ප්‍රතිලාභය ද ඔවුන්නිසා ආයති හෙතුන්ගේ සම්භවයද ඇතිවන බව සලකා යථෝක්ත ක්‍රමයෙන් සැකය පලහා විශුද්ධිය උපදවා ගනිත්. මේ හෙතුඵල වශයෙනැ'යි දතයුතු.

සවැතිවූ “කර්ම විපාක වෘත” වශයෙන් මානසික විශුද්ධිය උපදවන පරිදි කෙසේද ? යත්: ජනකාදි කර්ම සන්තතිය ඇතිකල්හි ප්‍රතිසන්ධ්‍යාදි විපාකශ්‍රේණිය ඇති බවද කාරණයාගේ අභාවයෙහි කාරකයාගේත් අසම්භවයද, න්‍යාය සිඬය'යි සැනෙවින් සලකා ඉක්බිති මාදශවිධවූ කර්මයන් කර්මවෘතයෙහි ඇතුලත් කොට මෙනෙහි කට යුතුවේ. එනම් :- කෘත්‍ය වශයෙන් සතර දෙනෙක් කර්මයෝ නැම'යිද, විපාක දනානු ක්‍රමයෙන් දෙළොස් දෙනෙක් කර්මයෝ “ කර්මවෘතය”යි දතයුතු.

මෙහි කෘත්‍ය වශයෙන් නියමිත කර්මයෝ සතර දෙන නම් :- “ජනක කර්ම-උපස්ථම්භක කර්ම උපපීඩක කර්ම. උපඝාතක කර්ම” යන මොහුවෙත්. ඔවුන් අතුරෙන් ප්‍රතිසන්ධි විපාකහා ප්‍රවෘත්ති විපාක දෙයනවූ කුශලා කුශල කර්ම ජනක කෘත්‍ය සාධක හෙයින් “ ජනක කර්ම”නම්වේ. සුගති දුර්ගති දෙක්හි ජනක කර්මයා විසින් උපදවන ලද විපාක සන්තානයට අතුරු අන්තරාවෙක් නොවැද්දදීමෙන් අධාරකෘත්‍ය සාධක වනුයේ “ උපස්ථම්භක කර්ම ”නම්. ජනිතවූ සැපදුක් දෙක බොහෝ කාලයක් නොපවතිනසේ බාධක කෘත්‍ය සාධකවූයේ “ උපපීඩක කර්ම ” නම්. කර්මාන්තරයෙන් ජනිතවූ විපාක සන්තානය දෙවදත්ත කලාබුරාජාදීන්ට මෙන් උපච්ඡේදන කෘත්‍ය සාධකවූ යේ “ උපඝාතක කර්ම “ නම්. මෙසෙයින් යථොක්ත කර්ම චතුෂ්ක “ ජනකාධාර බාධකොපච්ඡෙද කරහෙයින් “ තත් කෘත්‍යයන්ගේ වශයෙන් එක් වෘතයෙක් විය.

විපාකදනානු ක්‍රමයෙන් නියමිත කර්මයෝ නම් :-“ ගුරුකර්ම-ආසන්නකර්ම-ආචීර්ණක කර්ම-කෘතත්වාත් කර්ම”යන මොහුවෙත්. මෙහි මහානුභාවවූද, මහාසාවද්‍යවූද කුශලාකුශල කර්මය අන්‍යකර්මයකින් ප්‍රතිබාහිත නොවූයේ අනන්තර භවයෙහිමැ විපාකදන ස්වභාව ඇතියේ ' ගරුකර්ම “නම්. මෙද කුශලපක්ෂයෙහි අෂ්ටසමාපත්තීහුය. අකුශල පක්ෂයෙහි පංචානන්තර්‍ය්‍ය කර්මයි. මරණාසන්න කාලයෙහි කරණලද සිතනලද කුශලාකුශල කර්මය

තම්බදාඨික චෞරඝාතකාදීන්ට මෙන් ගරු කර්මයාගේ අභා
වයෙහි විපාක දෙනුයේ "ආසන්නකර්ම" නම්. නිරතුරු කරනලද්
දවූද එක්වාරයෙක්හි හෝ කොට එක්වන් ආසෙවනය කරන
ලද්දවූද කර්මය "ආචීර්ණකර්ම" නම්. ගරුකාදි භාවයට නොපැමි
ණියාවූ කෘතමාත්‍රවූම කර්මය "කෘතත්වාත් කර්ම" නම්. මෙහි
ආසන්නාදි කර්මයන් ඇති කල්හිද පරිත්ත උදකයන් මැඩගෙන
යන්නාවූ මහෞඝයක් මෙන් කුශලාකුශල භේද භින්න ගරුක
කර්මයම පළමුකොට විපාක දෙන්නේය. ඔහුගේ අභාවයෙහි
ආසන්න කර්මය පළමුකොට විපාක දෙන්නේය. ආසන්න කර්ම
යාගේ අභාවයෙහි ආචීර්ණකර්මය පළමුකොට විපාක දෙන්නේය.
මොවුන් තුන්දෙනාගේම අභාවයෙහි ලබන ලද ආසෙවන ඇති
කෘතත්වාත් කර්ම විපාක දෙන්නේය. මෙසේ යථොක්ත කර්ම චතුෂ්
කය විපාක දානානුක්‍රමයෙන් එක් වෘත්තයකැ'යි ද දතයුත්තේයැ.

විපච්‍යමාන කාලවශයෙන් නියමිත කර්මසතර නම්:- **"දෘෂ්ට
ධර්ම වේද්‍ය කර්මය-උපපද්‍යවේද්‍ය කර්මය-අපරාපර්‍ය්‍යායවේද්‍ය කර්මය-
අහෝසි කර්මය"** යන මොහු වෙත්. එහි ප්‍රත්‍යක්‍ෂවූ වර්තමාන
ආත්ම භාවයෙහි විපාක වශයෙන් අනුභව කටයුතුවූ කර්මය
'දෘෂ්ට ධර්මවේද්‍ය'' නම්වේ. අනන්තර භවයෙහි ඉපිද අනුභවකට
යුතුවූ විපාක ඇති කර්මය "උපපද්‍ය වේද්‍ය" නම්. දෘෂ්ටධර්මයෙන්
අන්‍යවූ යම්කිසි ආත්මභාවයෙක්හි අනුභව කටයුතු විපාක ඇති
කර්මය "අපරා පර්‍ය්‍යායවේද්‍ය" නම් ඒ ඒ නියමිත කාලාපගමයෙන්
දෘෂ්ටධර්මවේද්‍ය උපපද්‍යවේද්‍ය කර්ම දෙකද, සංසාර ප්‍රවෘත්තිය සුන්
කල්හි අපරාපර්‍ය්‍යායවේද්‍ය කර්මයද "අහෝසිකර්ම" නම්වේ. මෙහි
කුශලාකුශල ජවන වීථියෙහි ජවනයන් සත්දෙනා උපන් කල්හි
ප්‍රථම ජවන චේතනාතොමෝ එම අත් බැව්හිම විපාකදෙන
හෙයින් දෘෂ්ටධර්මවේද්‍ය නම්. සත්වැනි ජවන චේතනාව පරි
නිෂ්පිත කෘත්‍ය ඇති බව හෙතුකොටගෙන අනන්තර භවයෙහිම
විපාකදෙනහෙයින් උපපද්‍යවේද්‍ය නම්. ඒ මේ උපපද්‍යවේද්‍ය
කර්මය ප්‍රති සන්ධියේදීම ප්‍රවෘත්ති විපාක දෙන්නේය. එසේ නොදුන්
කල්හි ප්‍රවෘත්තිවිපාක නොදෙන්නේය'යිද ප්‍රති සන්ධිය දුන්කල්හි
ජාති ශතයකුදු ප්‍රවෘත්තිවිපාක දෙන්නේය'යිද මතාන්තර ඇත්
තාහ. (එහි විනිශ්චය විචාරණ බුද්ධිමතුන්ට පවරමි.) මධ්‍යයෙහි
පඤ්චජවන චේතනාවෝ සංසාර ප්‍රවෘත්තිය ඇතිකල්හි අපරාපරවූ
යම්කිසි ආත්මභාවයෙක්හි යථාවකාශ පරිදි විපාක දෙනහෙයින්
අපරාපර්‍ය්‍යායවේද්‍ය නම්වෙත්. බහුලකොට කරනලද දෘෂ්ටධර්මවේදනී
යාදී කර්ම අතුරෙහි යම්කිසි කර්මයෙක් අනවකාශත්වය හෙතු
කොටගෙන තම තමාගේ විපච්‍යමාන කාලය ඉක්මවන ලද්දේ

තත් තත් කාලාතීත බීජයමෙන් පසුව විපාක දානස්වභාවය නැත්තේ අහෝසිකර්ම නමැ'යි දතයුතු. මෙසේ යථෝක්ත කර්ම චතුෂ්කයම විපාක කාලානු ක්‍රමයෙන් සමාහනුයි එක්වෘතයෙක. ඒ මේ ද්වාදශවිධවූ වෘත්තත්‍රිකය කර්මවෘත්තය'යි සලකා ඒ හෙතුවෙන් ප්‍රතිසන්ධ්‍යාදි විපාක වෘත්තිය ඇතිවේය'යි නිශ්චයට බැසගනී. මෙසේ සලකන්නාහු කාලත්‍රය පිළිබඳ සැකය දුරලීමෙන් හා දෘෂ්ටිමල බැහැරලීමෙන් කාංක්ෂාවිතරණ විශුද්ධියට පැමිණෙන්නේය. මේ කර්ම විපාක වෘත්තවශයෙනි.

සත්වැනිවූ "ච්‍යුති ප්‍රතිසන්ධි" වශයෙන් විශුද්ධි සම්පාදනය කෙසේද? යත්:- අතීතයෙහි කර්ම ප්‍රත්‍යයෙන් හටගත් යම් ස්කන්ධයෝ වේද්ද ඔවුහු එහිම නිරුද්ධවූහ. අතීත කර්ම ප්‍රත්‍යයෙන් මේ භවයෙහි අන්‍යවූ ස්කන්ධ පහලවෙත්මය. අතීත භවයෙන් මේ භවයට පැමිණි එකම ධර්මයකුදු නැත. මේ භවයෙහි කර්මප්‍රත්‍යයෙන් හටගත් ස්කන්ධයෝ මෙහිම නිරුද්ධවන්නාහ. මේ භවයෙන් දෙවැනි භවයට එකම ධර්මයකුදු නොපැමිණෙන්නේය.

යම්සේ ආචාර්යවරයාගේ මුඛයෙන් කිසිම ද්‍රව්‍යයක් ශිෂ්‍යයාගේ මුඛයට නොපැමිණෙන්නේද එහෙත් ඔහුගේද පාණ්ඩිත්‍යය ඇතිවන්නේද ආචාර්ය උපාශනයෙන් තොරවැ ශිෂ්‍යයාගේ පණ්ඩිතභාවය නොවන්නේද එමෙන්ම මේ භවයෙහි ස්කන්ධධාත්වායතනාදි කිසිවක් දෙවැනි භවයට නොයන්නේය. එසේ වුවත් දෙවැන භවයෙහි එහි ස්කන්ධධාත්වායතනාදිය පහල වන්නේය. මේ භවයෙහි කර්ම ප්‍රත්‍යයෙන් තොරවැ දෙවැනි භවයෙහි ස්කන්ධධාත්වායතනාදිය පහල නොවන්නේය'යිද සලකනු ලැබේ. මෙසේ සලකා කාංක්ෂාවිතරණ විශුද්ධියට පැමිණවුලල සෝතාපන්නයන ගෞරව නාමය ලබන්නේයැ. එබැවින් විදර්ශක තෙමේ කාංක්ෂාවිතරණ විශුද්ධිය උපදවා ගතිනියතව අංයර්‍ය භාවය සිද්ධ කටයුත්තේයැ.

හෙතුප්පච්චය මූලහා-
-අහෙතුකා විසම්හෙතුකා හොන්ති;
තස්මා කඞ්ඛාවිතරණ-
-සුද්ධිං යොගී විපස්සකො සෙවෙ.

ගුණරතන ප්‍රණීත විශුද්ධ දීපිකා නම් ලද ධර්මප්‍රකරණයෙහි කාංක්ෂාවිතරණ විශුද්ධි නම් පවම පරිච්ඡේදය නිමි.

# මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධිය.

ඔභාසාදී දසවිධ-
-විපස්සනුපක්කිලෙස විසයම්හි;
අවිමොහො මග්ගාම-
-ග්ග ඤාණ දස්සනවිසුද්ධි'මාහ මුනි.

**"අයං මග්ගො අයං නමග්ගො'ති එවං මග්ගං ච අමග්ගං ච ඤත්වා ඨිතං ඤාණං පන මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි නාම"** යනුවෙන් මග නොමග දෙක දැන සිටි ඥානය "මාර්ගාමාර්ගඥාන දර්ශන විසුද්ධි" නමැයි කීහ. ඉහතින් කියනලද ක්‍රමානුරූපවූ නාමරූප පරිග්‍රහණයෙන් දෘෂ්ටිවිශුද්ධිය ඉපදවූ විදර්ශකයාහට ඔභාසාදි දශවිධ විදර්ශනොපක්ලෙශයන් උපන්කල්හි මොවුහු මාර්ගයෝ නම් නොවෙති. මෙයින් විමුක්තවූ වීථි ප්‍රතිපන්න විදර්ශනා ඥානය මැ මාර්ග නමැයි ආභොග මනස්කාර කරනුවත් මැ විශද තර ඥානයක් පහළවේ. එය වනාහි "මාර්ගාමාර්ගඥාන" නමි. ඒ කාරණකොටගෙන අමාර්ගයෙහි මාර්ගය යන අවිශුද්ධ සංඥතොමෝ ශුද්ධකෙරේනුයි= මාර්ගාමාර්ගඥාන දර්ශන විශුද්ධි නම්වේ.

ඒ මේ විශුද්ධිය උපදවනු කැමති විදර්ශකතෙමේ පළමු කොට කලාප සම්මර්ශනය'යි කියනලද නයවිදර්ශනාවෙහි යෙදෙයි හෙවත් අතීතාදි නයවිසින් එකාදශප්‍රකාරවූ අවිද්‍යාදි ප්‍රත්‍ය සහිත ලොකොත්තර වර්ජිතවූ ත්‍රෛභූමික සංස්කාරයන් ස්කන්ධාදි වශයෙන් හකුළුවා අනිත්‍යාදි ත්‍රිලක්ෂණායත්ත කොට විදර්ශනා කෙරෙයි. කෙසේද? යත්:- **"යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා"** යනාදි දෙශනා ක්‍රමයෙන් දක්වෙණ රූපස්කන්ධය අතීත වර්තමාන අනාගත වශයෙන්ද, ආධ්‍යාත්මික වාහ්‍යවශයෙන්ද, සුඛුමෞලාරික වශයෙන්ද, හීන ප්‍රණීත වශයෙන්ද, දූරසන්තික වශයෙන්ද'යි මෙසේ එකාදශ ප්‍රකාරයෙකින් විභාගකොට මේ අතීතාදි රූපයෝ ක්ෂයට පැමිණෙන හෙයින් අනිත්‍යයහ. භයට කාරණාහෙයින් දුඃඛයහ. ආත්ම සාරාදියක් නොමැති හෙයින් අනාත්මයහ'යි පිළිවෙළින් විදර්ශනා කෙරෙයි. සෙසු අරූපස්කන්ධ සතරද යටකී ක්‍රමයෙන් මැ විදර්ශනා කරන්නාහ. මෙසේ එකෙකී ස්කන්ධය තෙතිස්

තෙතිස් ආකාර විසින් පංචස්කන්ධය එක්සිය හැටපස් (165) ක්‍රමයකින් විදර්ශනා කරන්නාහ. කාලත්‍රයට නගා විදර්ශනා භාවනා කරන තැනැත්තේ හාරසිය අනූපස් (495) ක්‍රමයකින් සලකන්නේය.

මෙසේම චක්ෂුරාදි ෂට්ද්වාරයෝද, රූපාරම්මණාදි ෂඩාරම්මණයෝද, චක්ෂුර් විඥානාදි ෂට්විඥානයෝද, චක්ෂු ස්පර්ශාදි ෂට් ස්පර්ශයෝද, චක්ෂුස්පර්ශජ වේදනාදි ෂට්වේදනාවෝද, රූපසංඥාදි ෂට් සංඥාවෝද, රූපසංචේතනාදි ෂට් චේතනාවෝද, රූප තෘෂ්ණාදි ෂට්තෘෂ්ණාවෝද, රූප විතර්කාදි ෂට් විතර්කයෝද, රූප විචාරාදි ෂට් විචාරයෝද, රූපධාත්වාදි ෂට් ධාතුහුද යන එකාදශ ෂට්කයන්ට අන්තර්ගතවූ සසැටක් (66) ධර්මයෝම පිළිවෙළින් විදර්ශනා කරන්නාහු එකෙකි ධර්මයක් අනිත්‍යාදි ත්‍රිලක්ෂණ වශයෙන් බලමින් එක්සිය අනූඅට (198) ක්‍රමයකින්ද කාලත්‍රයට නගා සම්මර්ශනය කරන්නාහු පන්සිය අනූසතර (594) ක්‍රමයකින්ද විදර්ශනා කරන්නාහුය.

තවද පෘථිවි කසිණාදි දශකසිණයෝද, කෙශ ලොමාදි දෙතිස් කුණුකොටස්ද, චක්ෂුරාදි ද්වාදශායතනයෝද, චක්ෂු ධාත්වාදි අටළොස් ධාතුහුද, චක්ෂුරින්ද්‍රියාදී ද්වාවිංශතීන්ද්‍රියයෝද, මෛත්‍රී කරුණාදි සතර අප්‍රමාණ්‍යයෝද කාමධාත්වාදි ත්‍රිවිධ ධාතුහුද, කාමභවාදි නවවිධ භවයෝද, ප්‍රථමධ්‍යානාදි චතුර්විධ ධ්‍යානයෝද, ආකාසානඤ්චායතනාදි සතර අරූපධ්‍යානයෝද, අවිද්‍යාදි ද්වාදශ ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෝද, යන මෙකී එක්සිය තිසක් (130) ධර්මයෝ අනිත්‍යාදි වශයෙන් සලකමින් තුන්සිය අනූවක් (390) සම්මර්ශනයෝද ඔවුහුම කාලත්‍රය වශයෙන් බලන්නාහු එක්දහස් එකසිය සැත්තෑවක් (1170) සම්මර්ශනයෝද වන්නාහ'යි දතයුතු.

මෙසේ දෙසිය එක්පණසක් (251) ත්‍රෛභූමික ධර්මයෝ ත්‍රිලක්ෂණයන්ගේ වශයෙන් සත්සිය තෙපණස් (753) සම්මර්ශනාවන්ට ඇතුළත් කොටද ඔවුහුම අතීතාදි කාලත්‍රයට නගා දෙදහස් දෙසිය එකුන් සැටක් (2259) සම්මර්ශනාවන්ට අයත් කොටද විදර්ශනා භාවනා කරන්නාහුය. සර්වසංග්‍රාහිත වශයෙන් මෙසේ නමුදු සම්මර්ශනයට අවිෂය ලොවුතුරු දහම් හැර සංඛ්‍යාපරිකල්පනය කටයුත්තාහ.

තවද යමක් අනිත්‍යනම් ඒ සියල්ලක්ම සංඛත භෙදයට ඇතුළත් හෙයින් "යංකිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං

අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං ඛය ධම්මං වය ධම්මං විරාග ධම්මං නිරොධ ධම්මං" යන ක්‍රමයෙන් සම්මර්ශනාවින්ගේ උත්තරොත්තර සංඛ්‍යා පරිපිණ්ඩනයෙහි වෛකල්පික විධානයෝද ඇත්තාහ.

මෙසේ භාවනාකරන විදර්ශකතෙමේ රූපාදි පංචස්කන්ධයෙහි නයවිදර්ශනා සංඛ්‍යාත ත්‍රිලක්ෂණ මනස්කාරය සජිරත්වයට පමුණුවා ගැනුම්වස් විසත (200) ප්‍රභෙදකොටද භාවනා කෙරෙයි. කෙසේද?යි යතහොත්:- "අනිච්චතො-පලොකතො-චලතො-පභඞ්ගුතො-අධුවතො-විපරිණාමධම්මතො-අසාරකතො-විභවතො-සංඛතතො-මරණධම්මතො" යන ඊ වචන දශය එකෙක් සකන්ධයක් පාසා යොදමින් පංචස්කන්ධයෙහි අනිත්‍යානුදර්ශනාවෝ පණසක් (50) ද; "පරතො-රිත්තතො-තුච්ඡතො-සුඤ්ඤතො-අනත්තතො" යන වචන පස එකෙකී සකන්ධයක් පාසා යොදමින් පංචස්කන්ධයෙහි අනාත්මානුදර්ශනාවෝ පස්විස්සක් (25)ද; "දුක්ඛතො-ගණ්ඩතො-රොගතො-සල්ලතො-අඝතො-ආබාධතො-ඊතිතො-උපද්දවතො-භයතො-උපසග්ගතො-අතාණතො-අලෙණතො-අසරණතො-ආදීනවතො--අඝමූලතො-වධකතො-සාසවතො--මාරාමිසතො--ජාතිධම්මතො-ජරාධම්මතො-ව්‍යාධිධම්මතො--සොකධම්මතො--පරිදෙවධම්මතො--උපායාසධම්මතො-සංකිලෙසිකධම්මතො" යන වචන විසිපහ එකෙකී සකන්ධයක් පාසා යොදමින් පංචස්කන්ධයෙහි දුඃඛානුදර්ශනාවෝ එක්සිය පස්විස්සක් (125) දැයි මෙසේ සකන්ධපංචකය පිළිබඳ අනිත්‍ය දුඃඛ අනාත්මානුදර්ශනාවෝ දෙසියයක් (200) වන්නාහ'යි දතයුත්තේය. මෙසේද නය විදර්ශනාව මුදුන් පමුණුවා නොගතහැකි විදර්ශකයා විසින් නවාකාරයකින් ඉන්ද්‍රියයෝ තියුණුකොට සප්පාය අසප්පාය විභාගය සලකා කාලක් රූපයද කාලක් අරූපයද'යි රූපාරූපධර්මයන්ගේ හටගැනීම සම්මර්ශණය කටයුතුයි. එසේ සම්මර්ශණය කොට පිළිවෙළින් තිලකුණු නගා භාවනා කෙරෙමින් විදර්ශනාව මුදුන් පමුණුවා ගන්නේය.

තවද ත්‍රිලක්ෂණ මනස්කාරය උපමා වශයෙන් සලකන තැනැත්තේ මේ පංචස්කන්ධය "නුබකුස්හි පහළ විදුලියක් සෙයින්ද, තණ අග පිනිබිඳක් සේයින්ද, දියෙහි ඇඳි රේඛාවක් සෙයින්ද, මිරිඟුදිස්නක් සෙයින්ද මුහුදු රළපෙළක් සෙයින්දැ ඇතිව නැතිවන අර්ථයෙන් අනිත්‍යය'යි කියාද; "ගජ පියවරට හසුවූ කිතිළි බිජුවටක් සෙයින්ද, දෙකෙළවර ගිනිගත් හුණ පුරුකකට මැදිවූ සුහුනුබිලිඳක් සෙයින්ද, කඩිසිති රළෙක්හි හසුවූ ගැඩවිල් බිලිඳක් සෙයින්ද, දළ හසුවූ මෙසෙකු සෙයින්ද, අත් පා

සිද හල දරුබිළිඳක් සෙයින්ද,, පරිපීලනාවියෙන් දුකැ'යි කියාද; 'සිහිනෙන් වැළඳූ බොජුනක් සෙයින්ද, සිහිනෙන් දුටු රූපයක් සෙයින්ද, දියෙහි නැගි බුබුලක් සෙයින්ද, අත ගිළිහුනු ශරයක් සෙයින්ද, සම් මායාමය කරණ්ඩයක් සෙයින්ද,, තුච්ඡාවී යෙන් අනාත්මය'යි කියාද මනස්කාර කෙරෙයි. එසේ සලකන්නහුට වහ වහාම තිලකුණු භාවනාව සමෘද්ධවන්නේය.

එසේත් මුදුන් නොපැණිය හොත් ඉක්බිති "රූප සත්තක අරූප සත්තක" වශයෙන්ද තිලකුණු නඟා සංස්කාරයන් සම්මර්ශණය කටයුතුවෙත්. ඒ බව දක්වන්නාහු:-

"ආදානනික්ඛෙපනතො-වයොවුඩ්ඪත්ථගාමිතො
ආහාරතො ච උතුතො-කම්මතොවාපි චිත්තතො
ධම්මතා රූපතො සත්ත-විත්ථාරෙන විපස්සති"

යනු කීහ. මෙහි "ආදානනික්ඛෙපන" වශයෙන් විදර්ශනා නම්:- ච්‍යුති ප්‍රතිසන්ධි දෙකින් පරිච්ඡින්න එකෙකී භවයෙහි රූපයෝ අනික් භවයකට නොගොස් ඒ ඒ භවයෙහිමැ නිරුද්ධ වෙති. එබැවින් අනිත්‍යයහ. අනිත්‍යහෙයින්ම දුඃඛයහ. දුක් හෙයින්ම අනාත්මයහ'යි මෙසෙයින් විදර්ශනා වැඩීමයි.

"වයොවුඩ්ඪත්ථගාමි" වශයෙන් විදර්ශනා කෙසේද? යත්:- හවුරුදු සියයක් ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් අවස්ථා තුනකට බෙද තෙතිස් හවුරුද්දකින් පරිච්ඡින්නවූ ප්‍රථම අවස්ථාවෙහි පැවැති රූපයෝ ද්විතීයාවස්ථාවට නොපැමිණ එහිම නිරුද්ධවන හෙයින්ද, සූතිස් හවුරුද්දකින් පරිච්ඡින්නවූ ද්විතීයාවස්ථාවෙහි පැවැති රූපයෝ තෘතීයාවස්ථාවට නොපැමිණ එහිම නිරුද්ධවන හෙයින්ද, තෙතිස් හවුරුද්දකින් පරිච්ඡින්නවූ පශ්චිම අවස්ථාවෙහි පැවැති රූපයෝ මරණින් මත්තට නොගොස් එහිම නිරුද්ධවන හෙයින්ද, අනිත්‍යයහ දුඃඛයහ අනාත්මයහ'යි මෙසෙයින් වයස් වශයෙන් වැඩිහිටි රූපයන්ගේ අස්තඞ්ගමය ලක්ෂණත්‍රයට නගා විදර්ශනා කෙරෙයි. නැවත එම වර්ෂ ශතයම:-

"මන්දා ඛිඩ්ඩා ච වණ්ණා ච බලා පඤ්ඤා ච හායනා
පබ්භාරා ච පවඞ්කා ච මොමූහා සයනා දස" යි

කියනලද දශකයන්ගේ වශයෙන් දශකොටසක් කොට (දශදශකයන්ගේ වශයෙන්) විදර්ශනා කෙරෙයි. කෙසේද? යත්:- සියක් හවුරුද්දට ආයු ඇති කාලයෙහි උපන්නහුගේ මුළු ආයුෂ දශකොටසක් කොට එයින් ප්‍රථම කොටසෙහිවූ දශ හවුරුද්ද

ළදරු අවස්ථාව හෙයින් "මන්ද දශකය" නම්වේ. දශ හවුරුද්දෙහි පටන් විසිවයස දක්වා මෙදතුරෙහිවූ දශ වර්ෂය ක්‍රීඩා රතියෙහි යෙදී බැඳී සිටින හෙයින් එකී අවස්ථාව "ක්‍රීඩා දශක" නම්. විසි හවුරුද්දෙහි පටන් තිස්වැනි වර්ෂය දක්වා මෙදතුරෙහිවූ දශ වර්ෂය වර්ණසෞන්දර්‍ය්‍යයි ඇතිකරමින් ශරීර ලක්ෂණ වැඩෙන හෙයින් "වර්ණදශක" නම්. තිස්වැනි වර්ෂයෙහි පටන් සතළිස් වයස දක්වා පැවැති දශ වර්ෂය ශරීර ශක්තිය වැඩෙන කාලයක් හෙයින් "බල දශක" නම්. සතළිස පටන් පණස් වර්ෂය දක්වා අතුරෙහිවූ දශවර්ෂය ප්‍රඥ ප්‍රභාව වැඩෙන හෙයින් "ප්‍රඥා දශක" නම් පණස් වර්ෂයේ පටන් හැට වයස් පිරීම දක්වා මෙදතුරෙහිවූ දශවර්ෂය ක්‍රීඩාරතියෙහි ඇල්ම, ශරීරවර්ණය, කායබලය, ප්‍රඥාව, යන මෙ සියල්ලම පිරිහෙණ හෙයින් "හායන දශක" නම්. හැට වයසෙහි පටන් හැත්තෑව දක්වා පැවැති දශවර්ෂය ශරීර පෙරමුනට අවනතවැ බරව පවත්නා හෙයින් "පබ්භාර දශක" නම්. හැත්තෑවෙහි පටන් අසූ වයස් දක්වා අතර දශවර්ෂය නගුල් ඇදයක් සෙයින් නැමී කුදුව ගිය ශරීරය ඇතිහෙයින් "පවංක දශකය" නම්. ඉක්බිති අසූවෙහි පටන් අනූව දක්වා පැවැති දශවර්ෂය කළකිදේ වහ වහා අමතකවෙන මූළාසිහි ඇති හෙයින් "මොමූහ දශක" නම්. අනූවෙහි පටන් මත්තෙහිවූ දශ වර්ෂය හුනස්නෙහි හෝ සයනාශනයෙහි මැ කාලය ගත කරන හෙයින් "සයන දශක" නමැයි; දතයුත්තේය.

මෙසේ දශක වශයෙන් දශකොටස් කොට ප්‍රථම දශකයෙහි පැවැති රූපයෝ දෙවැනි දශකයට නොපැමිණ එහිම නිරුඬවූ හෙයින් අනිත්‍ය දුඃඛ අනාත්මය'යි කියාද, දෙවැනි ක්‍රීඩා දශකයෙහි පැවැති රූපයෝ වර්ණදශකයට නොපැමිණ එහිම නිරුඬවූ හෙයින් අනිත්‍ය දුඃඛ අනාත්මය'යි කියාද, එසේම වර්ණදශකයෙහි පැවැති රූපයෝ බල දශකයටද, බල දශකයෙහි පැවැති රූපයෝ ප්‍රඥදශකයටද, එහි පැවැති රූපයෝ හායන දශකයටද, හායන දශකයෙහි පැවැති රූපයෝ පබ්භාර දශකයටද, එහි පැවැති රූපයෝ පවඞ්ක දශකයටද, පවඞ්කදශකයෙහි පැවැති රූපයෝ මොමූහදශකයටද එහි පැවැති රූපයෝ සයන දශකයටද, නොපැමිණ ඒ ඒ අවස්ථාවලම නිරුඬවන හෙයින් අනිත්‍යයහ දුඃඛයහ අනාත්මයහ'යි මෙසේ සල කන්නේය.

උක්තප්‍රකාර "දශ දශකයන්ගේ වශයෙන් වයොවුඩ්ඪත්ථගාමී" භාවයෙන් තිලකුණු වඩා ඉක්බිති එම වර්ෂ ශතයම පස්පස් හවුරුදු හෙයින් විසිකොටසක්කොට තුන්තුන් හවුරුදු වශ

යෙන් තෙතිස් කොටසක් කොට දෙහවුරුද්ද වශයෙන් පණස් කොටසක් කොට එකෙකි හවුරුදු වශයෙන් සියක් කොටසක් කොට ඒ ඒ කොටස්හි පැවැති රූපයෝ අන්‍ය කොටස් කරා නොපැමිණ ඒ ඒ තන්හිම නිරුද්ධවූ හෙයින් අනිත්‍ය දුඃඛ අනාත්මය'යි කියා විදසුන් වඩත්. ඉක්බිති තවතවත් සියුම් වශයෙන් වඩනුවෝ එකෙකි හවුරුද්ද "හෙමන්ත-ගිම්හ-වස්සාන" යන තුන් සෘතූන්ගේ වශයෙන් තුන්කොටසක් කොට නැවත "ශිශිර-වසන්ත-ග්‍රීෂ්ම-වර්ෂා-ශරත්-හෙමන්ත" යන සෘතූන්ගේ වශයෙන් සකොටසක් කොට නැවත එකෙකි මස් බැගින් දොළොස් කොටසක් කොට යටකී පරිද්දෙන් තිලකුණු වඩත්නාහ. තවද එකෙකි මස් කෘෂ්ණපක්ෂය ශුක්ලපක්ෂය වශයෙන් දෙකොටසක් කොට නැවත එක් පක්ෂයක් දවස් වශයෙන් පසළොස් කොටසක් කොට නැවත එක් දිනක් දිවාරාත්‍රි වශයෙන් දෙකොටසක් කොට නැවත යාමයන්ගේ වශයෙන් සකොටසක් කොට අනිත්‍යාදීන්ගේ වශයෙන් භාවනා කරන්නාහ. ඉක්බිති "අභික්කම-පටික්කම-ආලෝකිත-විලෝකිත-සම්මිඤ්ජන-පසාරිත" යන ඉදිරිපසු ගමන බැලීම හා අත්පා නැමීම දිගහැරීම පිළිබඳ විදසුන් වඩන්නාහු අභික්‍රමණයෙහි හෙවත් ඉදිරියට ගමන් කිරීමේදී පැවැති රූපයෝ ප්‍රතික්‍රමණයට නොපැමිණ එහිම නිරුද්ධවූහ'යි යනාදි ක්‍රමයෙන් වෙන් වෙන් කොට කියූපරිදි නොසික්මවා භාවනා කරන්නාහුය. මෙසේ ක්‍රමක්‍රමයෙන් සියුම් කෙරෙමින් භාවනාකරන්නහුගේ විදර්ශනාඥානය විශදතරවේ. තිලකුණු මනාව වැටහෙයි, තදාරම්මණයෙහි සිත පවතී.

තවද එකෙකි පදවාරය "උද්ධරණ-අතිහරණ=වීතිහරණ-වොස්සජ්ජන-සන්නික්ඛේපන-සන්නිරුම්භන" වශයෙන් සකොටසක් කොට එකෙකි කොටස්හි පැවැති රූපයන්ගේ වශයෙනුදු විදසුන් වඩන්නාහ. ඒ කෙසේද? යත්:–යම් කිසිවෙක් පියවර තබා ගමනා ගමනය කරන සියලු අවස්ථාවලම උද්ධරණාදි කෘත්‍ය සයක් සිද්ධවන්නාහුය එසේත් නොරවා කිසිවෙකුට පියවරක් ඔසවා නොතැබිය හැක්කේමය. ඒ කෘත්‍ය සයනම්:–භූමියෙන් එසවීමය'යි කියනලද උද්ධරණයද, ඉදිරියට ගැනීමය'යි කියනලද අතිහරණයද, කණු කටු ආදි යමක් දක පියවා යථාස්ථානයෙහි නොතබා ඒ මේ අත හැසිරවීමය'යි කියනලද වීතිහරණයද, අඩිය පොළොවලයට පහත් කිරීමය'යි කියනලද වොස්සජනයද, පියවර පොළෝ මතුයෙහි තැබීමය'යි කියනලද සන්නික්ඛේපණයද, අනික් පියවර උද්ධරණය කිරීමට වියදී

ගැනුම් වස් තැබූ පියවර 'භූමිය හා පෙළීම හෝ පොළොවට බර ගැස්වීමය'යි කියනලද සන්නිරුම්භනයද යන මොහු වෙත්. පියවරක් පාස පවත්නාවූ මේකී කෘත්‍යයන් පිළිබඳව රූප ධර්මයන්ගේ අනිත්‍යාදිය මෙනෙහි කරමින් භාවනා කරන විදර්ශක තෙමේ පළමුකොට "උද්ධරණ-අතිහරණ-වීතිහරණ" කෘත්‍යයන් පවත්නා විට "පඨවී-ආපෝ" යන ධාතු දෙක සියුම් වශයෙන් හා "තේජෝ-වායෝ" යන ධාතු දෙක ඖදරික වශයෙනුත් පවත්නා බවද "වොස්සජ්ජන-සන්නික්ඛේපන-සන්නිරුම්භන" යන කෘත්‍යයන් පවත්නා කල්හි "තේජෝ-වායෝ" යන ධාතු දෙක සියුම් වශයෙනුත් "පඨවී-ආපෝ" යන ධාතු දෙක ඖදරික වශයෙනුත් පවත්නා බවද මෙනෙහි කෙරෙයි. ඉක්බිති උද්ධරණයෙහි පැවැති භූතොපාදය රූපයෝ අතිහරණයට නොගොස් එහිම නිරුද්ධවූවෝය. අතිහරණයෙහි පැවැති රූපයෝ වීතිහරණයට නොගොස් එහිම නිරුද්ධවූවෝය. එහි පැවැති රූපයෝ වොස්සජ්ජනයට නොගොස් එහිම නිරුද්ධවූවෝය. වොස්සජ්ජනයෙහි පැවැති රූපයෝ සන්නික්ඛේපනයට නොගොස් එහිම නිරුද්ධවූවෝය, එහි පැවැති රූපයෝ සන්නිරුම්භනයට නොගොස් එහිම නිරුද්ධවූවෝය, එහෙයින්ම අනිත්‍ය වන්නාහ දුක්වන්නාහ, අනාත්ම වන්නාහ'යි මෙසේ ත්‍රිලකුණු වඩා භාවනා කරන්නේය. මෙසේ ආදියෙහි කියනලද සියක් වර්ෂයෙහි පටන් ක්‍රම ක්‍රමයෙන් සංක්ෂෙපාති සංක්ෂෙප තරම් පදවාරයක් තබා කාලයාගේ සයෙන් කොටස තෙක් සියුම්කොට විදර්ශනා කරන්නාහුගේ රූප සම්මර්ශනය ඉතා සියුම් වන්නේය. මෙකීතාක් කරනලද විදර්ශනා තෙමේ "වශෝ වුට්ඨාන ගාමී" වශයෙනැයි දතයුතු.

ඉක්බිති "ආහාර වශයෙන්" විදර්ශනා කිරීම නම්:- සුහිත කාලයෙහි හෙවත් ආහාර වැළඳූ වේලෙහි පැවැති ආහාරජ රූපයෝ ක්ෂුධා දුඃඛයෙන් පීඩිත අවස්ථාවට නොපැමිණ ඒ ඒ තැනම නිරුද්ධ වෙති. ක්ෂුධා දුඃඛයෙන් පීඩිත අවස්ථාවෙහි පැවැති රූපයෝ සුහිත කාලයට නොපැමිණ ඒ ඒ තැනම නිරුද්ධවෙති'යි කියා මෙසේ විදර්ශනා කරනුවත් මැ යථොක්ත රූප ධර්මයෝ අනුප්‍රබන්ධ වශයෙන් නොපවත්නා හෙයින් අනිත්‍යය'යි කියාද, එහෙයින්ම දුක'යි කියාද, දුක් හෙයින්ම අනාත්මය'යි කියාද මෙනෙහි කරමින් භාවනා කරන්නේය. මේ ආහාර හෙයිනැ'යි දතයුතු. ...

"ඍතු වශයෙන්" විදර්ශනා කරන තැනැත්තේ ශීතකාලයෙහි පැවැති ඍතුජ රූපයෝ උෂ්ණ කාලයට නොපැමිණ එහිම

නිරුද්ධවෙති. උෂ්ණ කාලයෙහි පැවැති රූපයෝ ශීත කාලයට නොපැමිණ එහිම නිරුද්ධ වෙතැ'යි ඍතු සමුට්ඨාන රූපයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කෙරෙයි. කර්මජ රූපයන්ගේ වශයෙන් විදර්ශනා කරන තැනැත්තේ චක්ෂුර්ද්වාරයෙහි පවත්නා කර්මජ රූපයෝ අනිත් ද්වාරයකට නොපැමිණ එහිම නිරුද්ධ වෙති. එසේම ශ්‍රොත්‍රද්වාර ඝ්‍රාණද්වාර ජිහ්වාද්වාර කායද්වාර හෘදය වස්තු යන මෙහි පවත්නා රූපයෝද ඒ ඒ ද්වාරවලම නිරුද්ධ වෙතැයි මෙසේසින් විදර්ශනා කෙරෙයි. චිත්තයන්ගේ වශයෙන් විදර්ශනා කරන තැනැත්තේ සොම්නස් සිතක් උපන්කල්හි හටගත් චිත්ත සමුට්ඨාන රූපයෝ දොම්නස් කලට නොපැමිණ එහිම නිරුද්ධ වෙති, දොම්නස් කල්හි හටගත් රූපයෝ සොම්නස් කලට නොපැමිණ එහිම නිරුද්ධ වෙතැ'යි මෙසේ තිලකුණු වඩා විදර්ශනා භාවනා කරන්නේය.

ඉක්බිති අනිත්‍ය සන්තාන ප්‍රතිබද්ධ "ධර්මතා රූප වශයෙන්" මෙනෙහි කොට භාවනා කරන තැනැත්තේ ආම්‍ර වෘක්ෂාදියෙහි වැඩෙන අඞ්කුර පල්ලවාදිය කලින් කල වර්ණ වශයෙන්ද සණ්ඨාන වශයෙන්ද වෙනස්වන බව සලකා අඞ්කුර අවස්ථාවෙහි පවත්නා ශුද්ධාෂ්ටක රූපයෝ පල්ලවාවස්ථාවට නොපැමිණ එහිම නිරුද්ධ වන්නාහ'යි මේ ක්‍රමයෙන් විටින් විට වෙනස් වන බවත් ඒ ඒ අවස්ථාවල පවත්නා රූපයන්ගේ විනාශයත් සලකා අනිත්‍යාදි වශයෙන් විදර්ශනා වඩයි. මෙතෙකින් රූප සප්තක ක්‍රමයෙන් විදසුන් වැඩීම කියා නිමවනලදී අරූප සප්තක වශයෙන් විදර්ශනා කරන ක්‍රමය දක්වන්නාහු:–

"කලාපතො යමකතො ඛණතො පටිපාටිතො
දිට්ඨි උග්ඝාටනා මාන සමුග්ඝාටනතො පිච
නිකන්තිපරියාදානා සත්තාරූප විපස්සනා" යනු කීහු.

මෙහි යට කියනලද රූප සප්තකයෙහි ආදානනික්ෂේපාදි සත්තැන්හි පැවැති විදර්ශනා සිත් එක්කොට ඒ සියලු චිත්තයෝම අනිත්‍යාදි වශයෙන් සැලකීමක් වේද? ඒ මේ සැලකීම **"කලාප වශයෙන්"** විදර්ශනා කිරීම නම් වේ. ආදානනික්ෂේප විසින් රූපයන් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කොට ඒ රූපයන් විදර්ශනා කළසිත්ද විදර්ශනා කෙරෙයි. මෙසේ එකෙකී රූප විදර්ශනාවකට අනතුරුව ඒ ඒ රූපයන් විදර්ශනා කළ චිත්තයෝද විදර්ශනා කිරීමෙන් රූපාරූප විදර්ශනා යුගල නොසික් මවා ක්‍රමයෙන් පවත්වනුයේ **"යුගමවශයෙන් හෝ යමකවශයෙන්"** විදර්ශනා කිරීම නම්. ආදානනික්ෂේප වශයෙන් රූප

යන්ගේ අනිත්‍යාදිය සලකා ඉක්බිති ඒ රූපයන් අනිත්‍යාදි වශයෙන් සැලකූ දෙවැනි තුන්වැනි සතරවැනි පස්වැනි චිත්තයන්ගේද අනිත්‍යතාවය විදර්ශනා කෙරෙයි. මෙසේ රූප සත්තකයෙහි කියනලද සප්තප්‍රකාර විදර්ශනාවන්ට අනතුරුව තදාරම්මණිකව උපදනා චිත්තයන්ගේ අනිත්‍යතාව සතරවන චිත්තය දක්වා පවත්වනුයේ "ඛණ හෙඩින්" විදර්ශනා කිරීමයි. ඒ මේ විදර්ශනාව ම ක්‍රමයෙන් දශවන චිත්තය දක්වා අනිත්‍යාදි වශයෙන් සලකනුයේ "පටිපාටි හෙඩින්" විදර්ශනා කිරීම නම්. අනාත්මානුදර්ශනා වශයෙන් විදර්ශනා කොට ආත්මදෘෂ්ටිය උගුළුවනු ලැබේද ඒ මේ විදර්ශනා තොමෝ "දෘෂ්ටිඋද්ඝාටන වශයෙන්" පවත්නා විදර්ශනා නමු. අනිත්‍ය වශයෙන් මනස්කාර කරනුයේ මානයට වස්තු කිසිවක් නොදක්නේ මැ මානය නැතේද තදපිය පිණිස පවත්නා විදර්ශනාව "මානසමුද්ඝාතන වශයෙන්" පවත්නේය. දුඃඛානුදර්ශනා වශයෙන් මනස්කාර කරන්නාහට පැවතියයුතු වස්තුවක් නැතැයි ආභොග මනස්කාරය උපන්නේ මැ පෙර පැවැති වස්තු විෂයක තෘෂ්ණානිකාන්තිය ක්ෂය වේද ඒ වූකලි "නිකාන්තිපර්‍යාදාන වශයෙන්" විදර්ශනා කිරීම නම්වේ.

මෙසේ සප්තප්‍රකාර අරූප විදර්ශනාවෙන් සම්මර්ශණඥානය පහළවූ කල්හි ත්‍රෛභූමික සංස්කාරයන්ගේ උදය ව්‍යය දෙක දක්නේය. කෙසේද? යත්:– "අවිජ්ජා සමුදයා රූපසමුදයො, තණ්හා සමුදයා රූපසමුදයො, කම්ම සමුදයා රූපසමුදයො, ආහාර සමුදයා රූපසමුදයො"යි කියනලද ක්‍රමයෙන් "අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ආහාර" යන ප්‍රත්‍ය සම්භවයෙන් රූපයන්ගේ හටගැන්ම වන්නාහ'යි මෙසේ රූපස්කන්ධයෙහි නිර්වෘත්ති ලක්ෂණ දක්නේ මැ උදය දක්නේයි. මෙසේම "අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ආහාර" යන චතුර්විධ ප්‍රත්‍යයන්ගේ නිරොධයෙන් රූපයන්ගේද නිරුද්ධිය වන්නාහ'යි රූපස්කන්ධයෙහි විපරිණාම ලක්ෂණ දක්නේ මැ ව්‍යය දක්නේයි ඉක්බිති "වේදනා-සංඥා-සංස්කාර" යන අරූපස්කන්ධ තුනෙහිද ඉහත කී ප්‍රත්‍ය සතරින් "ආහාර" ප්‍රත්‍ය හැර ඒ වෙනුවට "ඵස්ස සමුදයා වෙදනා සමුදයො"යි දක්වනලද ක්‍රමයෙන් "ස්පර්ශය" බහා නිර්වෘත්ති ලක්ෂණ හා විපරිනාම ලක්ෂණයන් සමගද; විඥානස්කන්ධයෙහි "ස්පර්ශ" ප්‍රත්‍යය හැර ඒ වෙනුවට නාමරූප සමුදයා විඤ්ඤාණ සමුදයො"යි කියනලද ක්‍රමයෙන් "නාමරූප" බහා නිර්වෘත්ති ලක්ෂණ හා විපරිණාම ලක්ෂණයන් සමගද; පඤ්චස්කන්ධයෙහි සම්පූර්ණ ආකාරයකින් උදය ව්‍යය දක්නේය. හෙවත්

පූර්වෝක්ත "අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ" අභාවය ඇති කල්හි රූපාදීන්ගේ වීමය අභාවයෙහි නොවීමය'යි කියනලද චතුර්විධ ප්‍රත්‍යයන්ගේ වශයෙන් හා නිර්වෘත්ති ලක්ෂණ විපරිණාම ලක්ෂණයන්ගේ වශයෙන්ද'යි මෙසේ ප්‍රත්‍ය වශයෙන් සතරෙක ලක්ෂණ වශයෙන් එකෙකැ'යි පචප්‍රකාර උදය හා පචප්‍රකාර ව්‍යයදැයි දශ ප්‍රකාර වූයේම පචස්කන්ධයෙහි සමපණස් ආකාර "උදය-ව්‍යය" දකින ඇත්තාහ. මෙසේ උත්පත්ති විනාශයන් සල කන්නාවූ ආරබ්ධ විදර්ශනා යෝගාවචරයාහට:-

ඕභාසෝ පීති පස්සද්ධි
අධිමොක්ඛො ච පග්ගහො;
සුඛං ඤාණ මුපට්ඨාන-
මුපෙක්ඛා ච නිකන්ති ච"යි

කියනලද විදර්ශනා චිත්තයෙන් සංජාත ශරීරයෙන් නික්මෙන ආලෝක සංඛ්‍යාත "ඕභාසය" ද; විදර්ශනා චිත්ත සහජාත ඛුද්දකාදි භේදභින්න පචප්‍රකාර "ප්‍රීතිය" ද; කාය චිත්ත දෙදෙනාගේ (සතර අරූපස්කන්ධයාගේ'යි සේයි) දරථයන් සන්සිඳවීම ලක්ෂණකොට ඇති "ප්‍රශ්‍රබ්ධිය" ද; බලවත් ශ්‍රද්ධාවය'යි කියනලද විදර්ශනා සම්ප්‍රයුක්ත "අධිමොක්ෂය" ද; සම්‍යප්‍රධාන කෘත්‍ය සාධක වීර්යසම්බොධ්‍යාංගය'යි කියනලද "ප්‍රග්‍රහය" ද; අති ප්‍රණීතවූ කායික චෛතසික "සැපය" ද; තියුණුවූ විදර්ශනා "ඤාණය" ද; ස්මෘති ප්‍රස්ථානය'යි කියනලද චිරකෘතෘදීන් අනුස්මරණයෙහි සමර්ථවූ "ස්මෘතිය" ද; සම්ප්‍රවෘත්ත විදර්ශනා සහජාතවූ උපේක්ෂා සම්බොධ්‍යාංගය'යි කියනලද "තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ව" ද; (මනොද්වාරයෙහි ආවර්ජනොපෙක්ෂාවද මීටම ඇතුළත්වේ) යන මෙකී නවදෙනා උපන් කල්හි "මීට පෙර කිසිවිටක නූපන් විරූ මෙබඳු සන්ත උපන ඒකාන්තයෙන් මාර්ගයට පැමිණියේ වන ඵලයට පැමිණියේ වනැ'යි එහි ආලය කෙරෙමින් උපදනා සූක්ෂම තෘෂ්ණා ස්වරූප "නිකාන්තිය" ද යන දශවිධ විදර්ශනොපක්ලේශයන් පහළවන්නාහ.

විදර්ශනා ප්‍රඥව කිළිටි කරන මෙකී උපක්ලේශ ධර්මයන් "තෘෂ්ණා දෘෂ්ටි මාන" යන මොවුන්ට වස්තු වන හෙයින් මාර්ගයට පරිපන්ථය හ'යි මාර්ගාමාර්ග ලක්ෂණ ව්‍යවස්ථාව හෙවත් ඕභාසාදි දශවිධ උපක්ලේශයෝ මාර්ග නම් නොවෙති, තත් විනිර්මුක්ත වීථි ප්‍රතිපන්න විදර්ශනාඥානයම මාර්ගනමැයි මෙසේ මග නොමග

නිශ්චය කරන ඥානය පහළවන්නේය. ඉක්බිති එම ඥානයම අමාර්ගයෙහි මාර්ගය යන අවිශුද්ධ සංඥාව පිරිසිදු කෙරේනු’යි “මාර්ගාමාර්ගඥාන දර්ශන විශුද්ධි” නම් වන්නාහ. මෙපමණකින් විශුද්ධියට පැමිණි විදර්ශක තෙමේ ස්වකීය ලෞකිකඥානයෙන් සත්‍ය ධර්ම තුනක් පිළිබඳ නිශ්චයට බැසගත් තැනැත්තෙක් වන්නේය. කෙසේද? යත්:— දෘෂ්ටි විශුද්ධියෙන් නාමරූපයන් පිළිබඳ ව්‍යවස්ථානය කළ හෙයින් “දුඃඛසත්‍යය” ද; කාංක්ෂාවිතරණ විශුද්ධියෙන් නාමරූප දෙදෙනාගේ පැවැත්මට හෙතු ප්‍රත්‍ය සැලකූ හෙයින් ‘සමුදය සත්‍යය” ද; මෙමමාර්ගා මාර්ගඥාන දර්ශන විශුද්ධියෙන් මොනවට මාර්ගය නිශ්චයකරගත් හෙයින් “මාර්ග සත්‍යය” ද; යන සත්‍යතුන පිළිබඳ වැ අනුබොධඥානය ඉපදීමෙන් එහි නිශ්චයට බැසගත් බව ද දත යුතුයි.

යම් හෙයකින් ශරීරාවභාෂාදි දශවිධ විදර්ශනොපක්ලෙශයන්හි මූලාවට පැමිණි අධිමානී තෙමේ තෘෂ්ණා දෘෂ්ටි මාන යන්ගේ වශයෙන් ත්‍රිගුණිතවූ සමතිස් ප්‍රභෙද මිථ්‍යාග්‍රහණයට පැමිණියේ විදර්ශනාවට අසමර්ථවේද, එහෙයින් එසේ ග්‍රහණය නොකොට විදර්ශකයා විසින් මාර්ගා මාර්ග දෙක්හි දර්ශන විශුද්ධියට පැමිණ ප්‍රීති විඳිනය කටයුත්තාහුයැ

ඔභාසාදීසු මූළ්හා-
අධිමානී නහි විපස්සිතුං ඛමන්තෙ;
තස්මා මග්ගා මග්ග-
දස්සනසුද්ධිං විපස්සකො විනෙද.

---

ඥාණරතන ප්‍රණීත විශුද්ධි දීපිකා නම්වූ ධර්ම ප්‍රකරණයෙහි
මාර්ගා මාර්ගඥාන දර්ශන විශුද්ධි නම් ජඨම පරිච්ඡෙදය නිමි.

---

# ප්‍රතිපදා ඥානදර්ශන විශුද්ධිය.

මග්ගාධිගමෙ උදය-
-ව්‍යයාදි නවවිධ විපස්සනා ඤාණං;
පටිපදා ඤාණදස්සන-
-විසුද්ධි පුබ්බාසයෙන ආඛ්‍යාතා.

ලෝකෝත්තරමාර්ග සංඛ්‍යාත ඥාන දර්ශන විශුද්ධියට ප්‍රතිපදා වන හෙයින්ද අනිත්‍යාදි ලක්ෂණත්‍රය ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා හෙයින්ද ප්‍රතිපක්ෂ ධර්මයන් ගෙන් මොනවට පිරිසිදු වන හෙයින්ද "නවමහා විදර්ශනඥානයෝ" ප්‍රතිපදා ඥාන දර්ශන විශුද්ධි නමැයි කීහු. එහි නව මහා විදර්ශන ඥානයෝ නම්:- "උදය ව්‍යයානුදර්ශන ඥානය, භඞ්ගානුදර්ශන ඥානය, භයතුපස්ථාන ඥානය ආදීනවානුදර්ශන ඥානය, නිර්වේදනදර්ශන ඥානය, මුඤ්චිතුකාම්‍යතා ඥානය, ප්‍රතිසංඛ්‍යානුදර්ශන ඥානය, සංස්කාරෝපෙක්ෂා ඥානය, සත්‍යානුලෝමික ඥානය" යන මොහු වෙත්.

මෙකී නව මහා විදර්ශන ඥාන අතුරෙන් පළමුවැනි "උදය ව්‍යයානු දර්ශන ඥානය" වනාහි යට කියනලද දශවිධ විදර්ශනෝපක්ලේශ ධර්මයන් උපදනා සමයෙහි විද්‍යමානවූයේ නමුදු ඔවුන් විසින් කෙලෙසන ලදූව තත්වාකාරයෙන් තිලකුණු සැලකීමෙහි අසමර්ථවීය. මෙහිවූකලී උප ක්ලේශයන් ගෙන් මිදුනාවූ වීථි ප්‍රතිපන්න විශදතර ඥානය ඇත්තේම ලක්ෂණ සැලකීමෙහි සාමර්ථ්‍යය ඇති හෙයින් දෙවෙනි වරද එකී ඥාන කෘත්‍යයෙහි නිරත වන්නාහ.

ස්කන්ධයන්ගේ හෙවත් රූපාරූප ධර්මයන්ගේ උත්පත්ති විනාශ දෙක නන් අයුරින් නැවත නැවතත් බැලීම හෝ සැලකීම හෝ යම් ඥානයකින් කරනුලැබේද ඒ මේ ඥානය "උදය ව්‍යයානු දර්ශනඥාන" නමි. මෙයින් සමන්විතවූ විදර්ශක තෙමේ පළමුකොට අනිත්‍යය, අනිත්‍ය ලක්ෂණය, දුඃඛය, දුඃඛලක්ෂණය, අනාත්මය, අනාත්ම ලක්ෂණය" යන කරුණු සය මෙනෙහි කෙරෙයි එහි අනිත්‍යය නම් ස්කන්ධපඤ්චකයයි කුමක් හෙයින් ද? යත්:- ස්කන්ධපඤ්චකය නම්, උත්පාද ස්වභාවයැ, විනාශ ස්වභාවයැ, විපරිණාම ස්වභාවයැ, යන

මෙයින් යුක්ත හෙයින්, නොහොත් ඇතිව නැතිවන හෙයිනි අනිත්‍ය ලක්ෂණය නම් ඇතිව නැතිවීමයයි කියනලද ආකාර විකාරත්වය අභවන බවයි දුඃඛය නම් "යදනිච්චං තං දුක්ඛං" යි යමක් අනිත්‍ය නම් එයම දුකැ'යි වදාළ හෙයින් අනිත්‍යවූ ස්කන්ධපඤ්චකයම දුක් නමි. කුමක් හෙයිනැ? යත්:- නිරතුරු ශීතොෂ්ණ ජිඝච්ඡා පිපාසාදීයෙන් පෙළෙන හෙයිනි දුඃඛ ලක්ෂණය නම් ශීතොෂ්ණාදීයෙන් පීඩාකරණ ආකාර වෙශෙෂයයි අනාත්මය නම් "යං දුක්ඛං තදනත්තා" යි යමක් දුක නම් එයම අනාත්මයයි වදාළ හෙයින් දුක්වූ ස්කන්ධපඤ්චකයම අනාත්ම නමි. කුමක් හෙයිනැ? යත්:- තමා වසඟයෙහි නොපවත්නා හෙයිනි. අනාත්ම ලක්ෂණය නම් තමා වසඟයෙහි නොපවත්නා ආකාර විශෙෂයයි. මෙකී අනිත්‍ය දුඃඛ අනාත්ම ස්වභාව ස්කන්ධපඤ්චකයෙහි ලක්ෂණත්‍රය කුමක් හෙයින් නොවැටහෙන්නේද? යත්:- අනිත්‍ය ලක්ෂණය වනාහි උත්පත්ති විනාශ දෙදෙනාගේ නොමෙනෙහි කිරීමෙන් හා සන්තති ප්‍රබන්ධයෙන් පිළිසත් හෙයින් නොවැටහෙයි. දුඃඛලක්ෂණය නිරතුරු භාග්පස පෙළීම් නොමෙනෙහි කිරීමෙන් හා ඊර්‍ය්‍යාපථයන්ගෙන් පිළිසත් වීමෙන් නොවැටහෙයි. අනාත්ම ලක්ෂණය නානාධාතූන්ගේ වශයෙන් වෙන්කොට බැලීම නොමෙනෙහි කිරීමෙන් හා සමූහ සම්බන්ධයෙන් පිළිසත් හෙයින් නොවැටහෙයි. යම් කලෙක යම් කිසි විදර්ශකයෙක් උපක්ලේශයන්ගෙන් මිදුනාවූ වීථිප්‍රතිපන්න විදර්ශනා නම්ලද උදය ව්‍යයානුදර්ශන ඥානයෙන් මෙනෙහි කෙරේද, එකල්හි ඔහට රූපාරූප ධර්මයන් පිළිබඳ ලක්ෂණත්‍රය මනාව වැටහෙයි, ඥානය අතිශයින් තීක්ෂණවෙයි, සංස්කාරයන්ගේ ස්වභාවය වහ වහා ළඟුව වැටහෙයි. මේ කියනලද්දේ ස්කන්ධයන් පිළිබඳ උදය ව්‍යයානුදර්ශන ඥානයෙන් සැලකීමය'යි දතයුතු.

උදය ව්‍යයානුදර්ශන ඥානයයි.

———

යම් ඥානයකින් සංස්කාරයන්ගේ බිඳීම අනුව බලන්නේද ඒ මේ ඥානය "භඞ්ගානුදර්ශනඥාන" නමි. මෙමැ ඥානය උපදවන විදර්ශක තෙමේ සංස්කාරයන් පිළිබඳ "උත්පාද-ස්ථිති-ප්‍රවෘත්ති-නිමිත්ත" සංඛ්‍යාත කිසිවක්හට නොපැමිණ "ක්ෂය ව්‍යය භෙද නිරොධ" මාත්‍රයෙහි සිහිය පිහිටුවන්නේය. ඉක්බිති මේ මේ සංස්කාරයෝ මෙසේ ඉපිද මෙසේ නිරුද්ධවන්නාහ'යි සලකන අතර "භඞ්ගානුපස්සනා" නම් විදර්ශන' ඥානය

උපදී යම් විට චක්ෂුර්වාංශයට ගොචරවූ රූපාරම්මණයකි උපදනා සිත නිරුද්ධවූද ඔහුගේ විනාශය වෙන සිතකින් දැන ඒ විඥානයාගේද භඞ්ගය අනික් සිතකින් දකී මෙසේ වස්තු සංක්‍රමණ වශයෙන් සංස්කාරයන්ගේ විනාශය පිළිවෙළින් සලකන්නේය’යි දත යුතුයි.

එසේ සලකන යෝගී තෙමේ අනිත්‍යය අනුව බැලීමෙන් නිත්‍ය සංඥාවද; දුඃඛය අනුව බැලීමෙන් සැප සංඥාවද; අනාත්මය අනුව බැලීමෙන් ආත්ම සංඥාවද; නිර්වේදය අනුව බැලීමෙන් නන්දිය=(සප්‍රීතික තෘෂ්ණාව) ද; නොඇලීම අනුව බැලීමෙන් රාගයද; විනාශය අනුව බැලීමෙන් සමුදයද; බැහැරලීම අනුව බැලීමෙන් දැඩි ග්‍රහණයද; දුරලන්නේය. එබැවින් ලෞකික ඥානයෙන් රාගය නිරුද්ධ කිරීමද තදඞ්ග වශයෙන් කෙලෙසුන් බැහැරලීමෙන් නිර්වාණය කෙරෙහි සිත අවනත වීමද මෙහිදී සිදුවන්නේය.

තව්ද මෙම ඥානයෙහි ‘පටිසංඛාවිපස්සනා-වයලක්ඛණ-විපස්සනා-අධිපඤ්ඤාවිපස්සනා’’ යන මෙ වුන්ගේ වශයෙන් ප්‍රභේද තුනක් ඇත්තාහුය. එහි ‘පටිසංඛා විපස්සනා’’ නම් කවර? යත්:-

‘‘වත්ථු සංකමණා චෙව-පඤ්ඤාය ච විවට්ටනා
ආවජ්ජනා බලඤ්චෙව-පටිසංඛා විපස්සනා’’

පූර්ව වස්තුවෙන් අනන්තර වස්තුවට පැමිණීම හෙවත් රූපාරම්මණික විඥානයාගේ බිඳීමදැක ඔහුගේද භේදය දක්නා පිණිස කටයුතු වස්තුසංක්‍රමණයද; උදය සංඥාව හැර ව්‍යය සංඥාවගේ පිහිටීමද; රූපයාගේ නිරුද්ධය දැක ඒ දුටු විඥානයාගේද භේදය දක්නා පිණිස ඉවහල්වූ ආවර්ජනා බලය=(සැලකීමේ සාමර්ථ්‍යය) ද; යන මොහු වෙත්. මෙසේ භඞ්ගය අනුව සලකන්නී ‘‘පටිසංඛාවිපස්සනා’’ නමි.

‘‘ආරම්මණන්වයෙනා පි-උභො එක ව්වත්ථනා’’
නිරොධෙ අධිමුත්තතා-වයලක්ඛණ විපස්සනා

ව්‍යයලක්ෂණ විදර්ශනාව දක්වන්නාහු:- එකෙණෙහි සම්භාවූ ප්‍රත්‍යක්ෂ සංස්කාර අරමුණේ භේදය හා අනුගමනය කිරීමෙන් අතීතානාගත උභය සංස්කාරයන්ගේද තදනුකූල ප්‍රවෘත්තිය නිශ්චය කරගැන්මද. එහිමැ ඓශ්‍යෙනෝ හොගොසා භේදය නම් වූද නිරොධයෙහි මැ අවනත ස්වභාවයද; යන මෙයින් යුක්ත වූවා ‘‘වයලක්ඛණවිපස්සනා’’ නම් වන්නීය

"ආරම්මණඤ්ච පටිසඞ්ඛා=භඞ්ගඤ්ච අනුපස්සති"
සුඤ්ඤතොච උපට්ඨානං-අධිපඤ්ඤා විපස්සනා

ඉක්බිති අධි ප්‍රඥා විදර්ශනාව දක්වන්නාහු:- පළමුකොට රූපාදි අරමුණු දැන ගැනීමද; පසුව ඔවුන්ගේ භේදය දැන තදාරම්මණික චිත්තයන්ගේද භඞ්ගය අනුව බැලීමද; සංස්කාරයන්ගේ භේදයවූකලී මරණය'යි ව්‍යවහාර බවක් මුත් සත්ත්ව පුද්ගලාදි කිසිවෙක් නැතැ'යි ශූන්‍යතා වශයෙන් එළඹ සිටීමද; යන මොහු "අධිපඤ්ඤාවිපස්සනා" නමු.

මෙකී ත්‍රිවිධ විදර්ශනාවන්ගෙන් විශිෂ්ටවූ "භඞ්ගානු දර්ශන ඥානය" හේතුකොට ගෙන ක්ෂය ව්‍යය ශූන්‍යතා ප්‍රතිපක්ෂ ශාශ්වතාදි දෘෂ්ටින් පිළිබඳ කම්පාවීමකට නොපැමිණ භඞ්ගමාත්‍රයෙහි ඔසිත පවත්නේය'යි දතයුතු.

භඞ්ගානු දර්ශන ඥානයයි.

---

භවත්‍රය පිළිබඳ සියලු සංස්කාරයන් භය වශයෙන් එළඹ සිටින්නාවූ ඥානය "භයතූපට්ඨාන ඤාණය"යි කියනු ලැබේ. ඒ මේ ඥානය කවරෙකුට කිනම් සමයෙක උපදීද? යත්:- සංස්කාර ධර්මයන්ගේ ක්ෂය ව්‍යය භෙද නිරෝධය අරමුණු කොට උපන් භඞ්ගානු දර්ශන ඥානය ඇති'විදර්ශකයාහට කාලත්‍රයවර්ති සංස්කාරයන් ප්‍රතිභය සහිත වූවින් සෙයින් වැටහෙන කල්හි උපදනේය'යි දතයුතු. එකල්හි "සැපසේ ජීවත්වනු කැමති බියසුලු මිනිසක්හට නා පොලොන් යක් රකුසු ආදීන්ගෙන් ගහණවූ සුසාන භූමියක්මෙන්" ඕහට තුන්භවය භය වශයෙන් වැටහෙයි. එතෙණෙහි මැ "අතීත සංස්කාරයෝ බිඳිණ; දැන් පවත්නාහු බිඳෙති; මතු ඇතිවන්නාහුද බිඳෙන්නාහ" යි සමාන ධර්මතා වශයෙන් හඟී.

ඒ බව මෙහි දැක්වෙණ උපමාවෙන් දත යුතුයි:- එක්තරා ස්ත්‍රියාවකට රාජද්‍රෝහි පුත්‍රයෝ තුන්දෙනෙක් සිටියෝය. ඒ බව දැනගත් රජතෙමේ "අසවළුන් වධස්ථානයට ගෙණ ගොස් හිස්ගසා දමව"යි වධකරුව නියොග කෙළේය. ඉක්බිති වධකයෝ ඔවුන් වධස්ථානයට ගෙනයන කල්හි පුත්‍රශොකයෙන් මඩනාලද සිත් ඇති ස්ත්‍රීද පසු පස්සෙහි ගමන් කළාය. එකියත ස්ත්‍රියාව බලා සිටියදීම වධකරු තෙමේ 'වැඩි

මහල්ලාගේ හිස සිඳපියා මධ්‍යමයාගේද ගෙල සිඳීමට තැත් කරන අතර ඒ දුටු ස්ත්‍රී තොමෝ 'වැඩිමහළු පුතු නසාපියැ; මධ්‍යමයාත් මරයි; මේ බාලයාටද එසේ කරන්නේ වනැ''යි ජීවත්ව සිටි බාලයා කෙරෙහිදු ආලය බැහැර කළාය. මේ උපමාවෙහි වැඩිමහල්ලාගේ මරණය සිඳිකිරීම මෙන් අතීත සංස්කාරයන්ගේ භඞ්ගය සැලකීමද; මධ්‍යමයාගේ මරණය මෙන් වර්තමාන සංස්කාරයන්ගේ භෙදයද; බාලයාද රාජද්‍රෝහි හෙයින් ඔහුගේද මරණය නියතයයි සැලකීම මෙන් අනාගත සංස්කාරයෝද එසේම බිඳෙන්නාහයි සැලකීමද; දත යුතුයි.

මේ භයතූපස්ථාන ඥානයෙන් යුත් විදර්ශක තෙමේ බියවේද? නොවේද? යත්:- බිය නොවේ. කාලත්‍රය වර්ති සංස්කාරයන්ගේ නොපැවැත්ම පිළිබඳ තිරණයට බැසගනී. යම්සේ නුවර දොර සමීපයෙහි පිළිවෙළින් පිහිටි ගිනිඟුරු වළවල් තුනක් දුටු පුරුෂයෙක් භීතියට නොපැමිණේද, එහි පතිත වූවන් අපමණ දුක් විඳින්නේය යන තීරණයට බැසගන්නේද එමෙන්ම තෙමේ බිය නොවන්නේය. සංස්කාරයන්ගේ අප්‍රවෘත්තිය පිළිබඳ තීරණයට බැසගන්නේය.

එසේ තීරණයට පැමිණි සංස්කාරයන්ගේ අනිත්‍ය ස්වභාවය මෙනෙහි කරනකල්හි ''සංස්කාර නිමිත්ත'' භය වශයෙන් එළඹ සිටින්නේය. දුඃඛ ස්වභාවය මෙනෙහි කරනකල්හි ''රූපාරූප භවයන් පිළිබඳ ප්‍රවෘත්තිය'' භය වශයෙන් එළඹ සිටින්නේය. අනාත්ම ස්වභාවය මෙනෙහි කරනකල්හි ''නිමිත්ත ප්‍රවෘත්ති දෙකම'' භය වශයෙන් එළඹ සිටින්නේය. එබැවින් ඔහට භවත්‍රය ජනශූන්‍ය ග්‍රාමයක් මෙන් වැටහෙන්නේය'යි දතයුතුයි.

භයතූපස්ථාන ඥානයයි.

---

භය වශයෙන් එළඹසිටියාවූ සංස්කාර පුඤ්ජය ආදීනවාකාරයෙන් දක්නා නුවණ ''ආදීනවානු දර්ශනඥාන'' නම්. මෙහි ආදීනව වශයෙන් සැලකීම කෙසේද? යත්:- කාමරූපාරූප සංඛ්‍යාත භවත්‍රය ගිනිඟුරු පිරූ වළක්මෙන්ද; සතර මහාභූතයෝ ආශිර්විෂයන් මෙන්ද; පඤ්චස්කන්ධයෝ කඩුගත් අත් ඇති වධකයන් මෙන්ද, අධ්‍යාත්මිකායතනයෝ ජනශූන්‍යග්‍රාමයක් මෙන්ද; බාහිරායතනයෝ ගම්පහරණ සොරුන් මෙන්ද; සැලකීමය'යි දතයුතු.

ඉක්බිති ඕහට භවත්‍රය 'සැපසේ ජීවත්වනු කැමති බියසුලු මිනිසක්හට රමණීයාකාරයෙන් පිණිටි ව්‍යාලමෘගයන් සහිත ගුහාවක් මෙන්ද; රාක්ෂාධිගෘහීත විලක් මෙන්ද; ගිනි ඇවිල ගත් ගෙයක් මෙන්ද"යි මෙලෙස් මහා ආදීනව රාශියක් වශයෙන් වැටහෙන්නේය. "උත්පාදප්‍රවෘත්ති නිමිත්තායූහන ප්‍රතිසන්ධි" යන කාරුණු පසට අනුව ඥානය වඩන්නේය. එයින් කීහ:-

"උප්පාදංච පවත්තංච නිමිත්තං දුක්ඛන්ති පස්සති"
ආයූහනං පටිසන්ධිං-ඤාණං ආදීනවෙ ඉදං;

පූර්වකර්ම ප්‍රත්‍යයෙන් මේ ලොකයෙහි ඉපදීමද; එසේ උපන්නහුගේ පැවැත්මද; තද්ගත සංස්කාර නිමිත්තද; ආයති ප්‍රතිසන්ධියට හෙතුභූත කර්මායූහනයද; ඒ හෙතුයෙන් මතුභවයෙහි ඇතිවන ප්‍රතිසන්ධියද; යන මේ සියලු සංසාරික දුකැ'යි දක්නාවූ ආදීනවානුදර්ශනඥානය පහළවූයේය'යි දතයුතු.

ආදීනවානුදර්ශන ඥානයයි.

---

ආදීනවාකාරයෙන් දුටු සංස්කාරයන් කෙරෙහි මැ කලකිරීම අනුව දක්නා නුවණ "නිර්වේදානු දර්ශන ඥාන" නම්. කෙසේ නම් කලකිරීම අනුව දක්නේද? යත්:- චිත්‍රකූට පර්වත පාදයෙහි ඇලුම්ඇති ස්වර්ණහංසරාජ තෙමේ සැඬොළුන්ගේ ගම්දොර ගවරවළෙහි යම්සේ නොඇලේද; සප්තමහා විල්හිමැ චිත්තාභිරමණය කෙරේද; එපරිද්දෙන් මැ මේ යෝගී හංසරාජ තෙමේද මනාව දක්නාලද ආදීනවයන් ඇති සංස්කාරයන් කෙරෙහි නහමක් ඇලෙයි, සප්තමහා අනුපස්සනාවන්හි මැ චිත්තාභිරමණය කෙරෙයි. එසේ හෙයින් උත්පාදාදි කාරුණු පිළිබඳව කලකිරෙයි, නොඇලෙයි, අනුත්පාදාදි ශාන්ති පදයෙහි චිත්තාභිරමණය කෙරෙයි. සතුටුවෙයි.

"භයතූපට්ඨානං එකමෙව තීණි නාමානි ලභති" යනුයෙන් භයතූපට්ඨාන ඥානයම දර්ශන ප්‍රදේශ වශයෙන් නාමත්‍රයක් ලබන බව කීහ= සර්වත්‍රෛභූමක සර්ව සංස්කාර ධර්මයන් භයවශයෙන් දක්නා කල්හි "භයතෝපට්ඨානඥාන"යි කියාද; ආදීනවාකාරයෙන් දක්නා කල්හි "ආදීනවානුදර්ශන ඥාන"යි කියාද; කලකිරීම් වශයෙන් දක්නා කල්හි "නිර්වේදානු දර්ශන ඥානය"යි කියාද; නාමත්‍රයක් ව්‍යවහාර කරන බැව් මුත් ඥානත්‍රයක් නොවැති බව සැලකිය යුතුයි. අර්ථවශයෙන් එකම ඥානයක් වන්නේය.

නිර්වේදානු දර්ශන ඥානයයි.

සර්ව සංස්කාර ධර්මයන් කෙරෙන් මිදෙනු කැමැතියේ උපදනා නුවණ "මුඤ්චිතුකම්‍යතා ඤාන" නම් වන්නේය. යටකී පරිද්දෙන් "භය වශයෙන් දොස් වශයෙන් කලකිරීම් වශයෙන් දුටු 'සංස්කාරයන් කෙරෙහි ලෙශ මාත්‍රවූද ඇලීමක් හෝ බැඳීමක් නොකෙරෙයි. ශුහුසුළුව මිදෙනු කැමති වෙයි. කෙසේද? යත්:- දැලකට අසුවූ මසෙකු මෙන්ද; සර්ප මුඛයට අසුවූ මැඩියෙකු මෙන්ද; අහිතුණ්ඩියෙකුට අසුවූ සර්පයෙකු මෙන්ද; එකී යෝගීහුගේ සිත වහ වහා සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැම්තියේ උපදී. එහෙයිනි ඔහුට මුඤ්චිතුකම්‍යතා ඤානය පහළවූයේය'යි දතයුතු.

## මුඤ්චිතුකම්‍යතා ඤානය.

---

පූර්වෝක්ත ක්‍රමයෙන් නැවත නැවතත් සංස්කාර ධර්මයන් ත්‍රිලක්ෂණයනන කොට නන් අයුරින් සලකන්නාවූ නුවණ "ප්‍රතිසංඛ්‍යානු දර්ශනඥානය"යි කියනු ලැබේ. නැවතත් එසේ සැලකීම කුමක් පිණිසද? යත්:- මිදීමට උපාය සලකනු සඳහාමය. සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැතිසේ අදහස් පහළවූයේ නමුදු කෙසේ මිදීයන්නෙම්දෝ හෝයි සලකන විදර්ශකයා හට ඔවුන්ගේම අනිත්‍යස්වභාවය දුකට කාරණාබව අනාත්ම ස්වභාවය යන කරුණු සැලකීමෙන් මිස අන් පරිද්දෙකින් නොහැකියයි වැටහෙන්නේය. එකල්හි තදර්ථ සංසිද්ධිය පිණිස ව්‍යායාම කරනුවෝ "සර්වසංස්කාරයෝ මැ මේ මේ නිසා අනිත්‍යයහ. මේ මේ නිසා දුඃඛයහ. මේ මේ නිසා අනාත්මයහ"යි නැවත නැවතත් නිමිත්ත ප්‍රවෘත්තීන් අනුව බලන්නහුට "පටිසංඛානු පස්සනාඤාණය" උපදනේය යි දතයුතුයි.

මෙකී ඥානත්‍රයයන් පිළිබඳ තත්වාර්ථය මෙහි පහත දක්වෙන උපමා කථාවෙන් පැහැදිලිවන්නේය.:- එක් දිනක් මස් මරණ පුරුෂයෙක් මසුන් අල්ලනු පිණිස කෙමණක් ගෙන දියට බටුයේය. ඔහු ස්වල්පවේලාවකට පසු කෙමණෙහි අතලා මත්ස්‍යයෙක යන සංඥාවෙන් එහි හුන් කෘෂ්ණසර්පයාගේ ග්‍රීවය තර කොට අල්වාගෙන මසෙකු ලදිමි යි සතුටුවූයේය. ඉක්බිති මහත් සිත් ලදුයේ එකාන්තයෙන් මහා මත්ස්‍යයෙකැ"යි සතුටුවූ වැ දියෙන් ඔසවා බලනුයේ සෝවැති තුණ දැක "සර්පයෙකැ"යි භය

පත්ව ඉදුස් දැක කලකිරී ගැලවී යනු කැමතිව හරණට නිසි උපාය සලකන්නාහු වාලධිය අග පඳින් අත ඉද්ලාගත් දරණ මූදු අත ඔසවා වාලධියගෙන දෙතුන් වරෙක හිස වට කරකවා දුබලකොට "ගොදුරට සපීය" යි දුරදමා සුහුසුළුව ගොඩනැගී මහත් විෂඝොර සර්ප මුඛයෙකින් අහෝ! ගැලවිණැයි ආපසු බලමින් හුන්නේය.

මේ උපමාවෙහි දියාටදී සර්පයෙකු අල්වා මසෙකු අල්වා ගතිමි යි සතුටුවූවාක් මෙන් යොගාවචරයා පළමුවෙන් ආත්ම භාවය ලැබ සතුටුවූ කාලයද; සෝවැනිතුන දුටුවාක් මෙන් අනිත්‍යාදි ලක්ෂණත්‍රය දැකීමද; සර්පයා බව දැන භයගත් කාලය මෙන් සංස්කාරයන් කෙරෙහි භයඥානය පහළවීමද; සර්පයාගෙන් වන උපද්‍රවය දුටුවාක්මෙන් ආදීනවානු දර්ශනඥානයද; සර්පයා කෙරෙහි කලකිරුණාක් මෙන් නිර්වේදඥානයද; සර්පයා කෙරෙන් මිදෙනු කැමති වූවාක් මෙන් භවයෙන් මිදෙනු කැමති මුංචිතු කාම්‍යතාඥානයද; සර්ප මුඛයෙන් මිදීමට උපාය සැලකූකලක් මෙන් පටිසංඛානුපස්සනාඥාණයද; දතයුතුයි.

පටිසඞ්ඛානුපස්සනාඥාණයයි

---

සර්ව සංස්කාර ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් උපදනා නුවණ "සංස්කාරොපෙක්ෂාඥානය" යි කියනු ලැබේ. යම්සේ ගින්නට දැමූ කුකුළු පියාපත ආපසු කරකැවෙනු මිස ගිනි දශාවට නොයේද එපරිද්දෙන්ම මේ ඥානයෙන් යුත් විදර්ශකයාගේ සිතද සංස්කාරයන් කෙරෙහි නොඇලී මධ්‍යස්ථාකාරයෙන් පවත්නේය. එසේහෙයින් සංස්කාරයන් පිළිබඳ නිමිත්ත ප්‍රවෘත්ති දෙක්හි භය නන්දිදෙකට නොපැමිණෙයි. කිසිම සංස්කාරයක් මමය කියා හෝ මාගේය කියා හෝ නොගනී. බිරින්ද බැහැර කළ පුරුෂයා යම්සේ නම් එසේයි. හේ කෙසේද? යත්:-

එක්තරා පුරුෂයෙකුට ප්‍රිය මනාපවූ භාර්‍යාවක් සිටියාය. ඕතොමෝ යහපත් රූප සෞන්දර්යයෙන් යුක්තවූවා දුටුවන් පහදවන්නීය. එසේ හෙයින් ඈ කෙරෙහි දර්ශන සංසර්ගයෙන් බැඳුනාවූ ස්වාමිපුරුෂ තෙමේ මොහොතක් පමණ කාලයකුදු ඈගෙන් තොර වැ නොසිටින්නේය. යම්විටෙක ඒ ස්ත්‍රියාව වෙන කිසි පිරිමියෙකු හා සමඟ සිනාසෙන බවක් හෝ කථාකරන බවක් හෝ සමීපව සිටින බවක් හෝ එකයානාවක හිඳින බවත්

හෝ දුටුයේ නම් නොසතුටු සිත් පහළ කෙරෙයි, කෝප උපදවයි. රළු බසින් කථා කෙරෙයි. මෙසේ මමත්වයෙන් කල්යවන අතර එකී ස්ත්‍රියාවගේ යම් යම් වැරදි නොයෙක් වර දකින්නට ලැබීමෙන් ඇය කෙරෙහි කලකිරෙයි. ඇගෙන් මිදෙනු කැමති වෙයි. ඉක්බිති තමා කෙරෙන් බැහැර කොට මාගේ ස්ත්‍රිය යැ යන මමත්වයක් නැතිව කල්යවන අතර යම්කිසි පුරුෂයෙකු හා සමග නොකටයුතු ක්‍රියාවක් කරන බව දුටුයේ නමුදු දෙම්නසට නොපැමිණෙයි, කෝප නූපදවයි. මධ්‍යස්ථ බවට පැමිණෙයි'

එපරිද්දෙන්ම මේ විදර්ශකයාද මමත්වය ඇතිව සිටි සංස්කාරයන්ගේ දෝෂ දැක කලකිරී මිදෙනු කැමතිව අනිත්‍යාදිවශයෙන් එක්වසිටින්නාහු මමය මාගේයයි ගතයුතුසේ යමක් නොදැක භය නන්දිදෙක දුරලා මැදහත් බවට පැමිණෙන්නේයයි දතයුතුයි.

ඒ මේ සංස්කාරොපෙක්ෂාඥානය උපන් කල්හි විදර්ශක තෙමේ ශාන්තිපද නම් ලද නිවන ශාන්තහෙයින් දක්නේය. ඉදින් එසේ නොදකීනම් "සාමුද්‍රික කාකයෙකු" මෙන් ඔහුගේ සිත නැවත නැවතත් සංස්කාර අරමුණෙහි මැ පවත්නේය. මේ අර්ථය මෙහි පහත දක්වනු ලබන "සාමුද්‍රික කාකොපමාවෙන්" දතයුතුයි. සමුද්‍රයෙහි යාත්‍රා කරන්නාවූ නාවිකයෝ නැව්නැගී යන දිනයෙහි දිශාකාකය යි සම්මතවූ කවුඩෙකු නැවට ගනිත් යම් විටක නැව වාත වේගයෙන් පහරනා ලදුව විදෙශයන් බලා ගමන් කෙරේද; ඒ මේ අත ගොඩබිමක් නොපෙනේද; එකල්හි නාවිකයෝ දිශාකාකයා මුදාහරිත්. ඉක්බිති ඒ කවුඩා කුඹගසින් අහසට පැන නැගී සියලු දිශානුදිශාවන් බලා පියාසර කරනුයේ යම් දිශාවක ගොඩබිමක් පෙනේනම් ඒ දිගටම පියාසර කෙරෙයි. ඉදින් නොපෙනේනම් නැවත නැවතත් ආපසු හැරී අවුත් කුඹගසෙහිම ලගනවෙයි. එපරිද්දෙන්ම සංස්කාරොපෙක්ෂාඥානය නිවණ ශාන්ත හෙයින් දක්නේද එකල්හි සංස්කාර ප්‍රවෘත්තිය හැර නිවණ කරාම ගමන් කෙරෙයි. ඉදින් එසේ නොදකිනම් නැවත නැවතත් සංස්කාරාරම්මණෙහිම සිත පවත්නේයයි දතයුත්තේය.

එසේ පවත්නාකල්හි ත්‍රිවිධ අනුපස්සනාවන්ගේ වශයෙන් සිත වඩා ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ අධිපති භාවය හේතුකොට ගෙන ත්‍රිවිධ විමොක්ෂයට පැමිණිය යුත්තේය. එහි විස්තර කෙසේද? යත්:- අනිත්‍යානුදර්ශනාවෙන් මෙනෙහිකරන්නාහට සර්වසංස්කාර ධර්මයන් ක්ෂය වශයෙන් එළඹසිටින්නේය. එකල්හි අධිමොක්ෂ-

බහුලකොට ඇත්තේ අනිමිත්ත විමොක්ෂය ලබන්නේයයි දතයුතුයි. එසේම දුඃඛානුදර්ශනාවෙන් මෙනෙහිකරන්නාහට සර්වසංස්කාර ධර්මයන් භය වශයෙන් එළඹ සිටි එක්ලේහි ප්‍රශ්‍රබ්ධිය බහුලකොට ඇත්තේ අප්‍රණිහිත විමොක්ෂය ලබයි. අනාත්මානුදර්ශනාවෙන් මෙනෙහි කරන්නාහට සර්වසංස්කාර ධර්මයන් ශූන්‍ය වශයෙන් එළඹ සිටි එකල්හි ප්‍රඥාව බහුලකොට ඇත්තේ ශූන්‍යතා විමොක්ෂය ලබන්නේය. මෙහි අනිමිත්තවිමොක්ෂය යනු අනිමිත්තාකාරයෙන් නිවන් අරමුණුකොට පවත්නා "ආර්ය මාර්ගය"යි. සංස්කාරයන් නිත්‍යනිමිත්තාදීන්ගේ වශයෙන් නොගැනීම හෙතුකොටගෙන උපන්නේ අනිමිත්ත නම්, එයම කෙලෙසයන්ගෙන් මිදුනේ විමොක්ෂ යි කියනු ලැබේ. එසේම තෘෂ්ණා ප්‍රණිධිවශයෙන් සංස්කාරයන් නොගැනීම හෙතුකොට ගෙන උපන් අප්‍රණිහිතයම කෙලශයන්ගෙන් මිදුණේ විමොක්ෂයයි කියාද; ආත්මාභිනිවෙශ වශයෙන් සංස්කාරයන් නොගැනීම හෙතුකොටගෙන උපන් ශූන්‍යතාවම කෙලශයන්ගෙන් මිදුනේ විමොක්ෂය යි කියාද දතයුතුයි. මේ කියනලද්දේ පර්‍යාය වශයෙනි.

නිෂ්පර්‍යාය වශයෙන් වනාහි ඵලෝකොත්තර මාර්ගයට "ශූන්‍යතා-අප්‍රණිහිත"ය යි විමොක්ෂවයක්ම නොහොත් නාම වයක්ම වදාළහ බුදුහු. ඒ නාමයෝ "ආගමන වශයෙන්ද, සගුණ වශයෙන්ද, ආරම්මණවශයෙන්ද"යි මෙසේ ත්‍රිවිධාර්ථයන්ට අනුරූප පරිච්ඡෙදන් වන්නේ නමුදු මේ අවධියෙහි ආගමන වශයෙන් ලැබෙන අර්ථයන් භාවය මැ ප්‍රමුඛ වන්නේය යි දතයුතුයි.

මෙහි කියනලද ආගමනය නම් අභිමුඛ වැපැමිණීමයි. කුම කට අභිමුඛ වැ කාවරෙකුගේ පැමිණීමක්ද? යත්:-මාර්ග-ඵලයන්ට අභිමුඛ වැ විදර්ශනා-මාර්ගප්‍රඥාවන්ගේ පැමිණීමය'යි දතයුතුයි ඒ මේ ආගමනයවනාහි "විදර්ශනාගමනය-මාර්ගාගමනය"යි විප්‍රකාර වන්නාහ. එහි මාර්ගයට අභිමුඛ වැ පැමිණි විදර්ශනාප්‍රඥාව= විදර්ශනාගමනයයි කියාද, ඵලයට අභිමුඛ වැ පැමිණි මාර්ග ප්‍රඥාව= මාර්ගාගමනය'යි කියාද සැලකිය යුතුයි. එසේ වුවත් මෙහිදී අදහස් කරනු ලබන්නේ පූර්වභාග ව්‍යුත්ථානගාමිනී විදර්ශනා ප්‍රඥාව බැවින් "විදර්ශනාගමනය" සමනක් ආගමනාර්ථ විකල්පනයෙහි ලා අර්ථ තේරුම් ගතයුතු.

යම්කිසි විදර්ශකයෙක් අනාත්ම වශයෙන් භාවනාභිනිවෙශ කොට අනාත්ම වශයෙන් මැ සර්වසංස්කාරයන් දක්නේවේද; එපමණකින් මාර්ගව්‍යුත්ථානය නොවේ. අනිත්‍ය-දුඃඛ වශයෙනුදු දක්ක

යුතු වෙත්. එබැවින් ත්‍රිවිධ අනුපස්සනා වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන කල්හි උපදනා ව්‍යුත්ථානගාමිනී විදර්ශනා ප්‍රඥාවෙන් ත්‍රෛභූමික සංස්කාර පුඤ්ජය ශූන්‍යතා වශයෙන් දක්නේය. ශූන්‍යතානුදර්ශනා සංඛ්‍යාත මේ විදර්ශනාව ආගමනීයස්ථානයෙහි (මාර්ගයට අභිමුඛව තන්හි) සිට ස්වකීය නාමානුරූප වූ ලෝකෝත්තර මාර්ගයට "සුඤ්ඤත" යන නාමය දෙන්නේය. මෙසේ "මාර්ගය" ආගමණ වශයෙන් සුඤ්ඤත නාමය ලබයි.

යම් හෙයකින් ඒ මාර්ගය මැ රාගාදියෙන් ශූන්‍යද; එහෙයින් සගුණත්වයෙන් හෙවත් ගුණසමායෝගත්වයෙන් 'සුඤ්ඤත' නාමය ලබයි. "රාගක්ඛයො" යනුවෙන් ප්‍රකාශිත නිර්වාණයද රාගාදියෙන් ශූන්‍ය හෙයින් ඒ නිර්වාණය අරමුණු කොට උපන් මාර්ගය ආරම්මණ වශයෙන් "සුඤ්ඤත" නාමය ලබයි. මෙකී "සගුණ-ආරම්මණ" යන දෙය කාරණයෙන් "සුඤ්ඤත" නාමය ලැබීම සූත්‍රාන්තික ක්‍රමයෙනැ'යි දතයුතුයි.

ලෝකෝත්තර මාර්ගයට දක්වන ලද "අප්පණිහිත" යන දෙවැනි නාමයද යටකී ත්‍රිවිධාකාරයෙන්ම වන්නේය. එනම්:- යම්කිසි විදර්ශකයෙක් පළමුකොට දුඃඛානුදර්ශනා වශයෙන් භාවනාභිනිවේශකොට එසේයින්ම සර්වසංස්කාරයන් දක්නේවේද; එපමණකින් මාර්ගව්‍යුත්ථානය නොවේ. "අනිත්‍ය-අනාත්ම" වශයෙනුදු දක්ක යුතු වෙත්. එබැවින් ත්‍රිවිධ අනුපස්සනා වශයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන කල්හි උපදනා ව්‍යුත්ථානගාමිනී විදර්ශනා ප්‍රඥාවෙන් ත්‍රෛභූමික සංස්කාර රාශිය කෙරෙහි තෘෂ්ණා ප්‍රණිධිය බැහැර කෙරේද ඒ මේ අප්පණිහිත නම්වූ විදර්ශනාව ආගමනීය ස්ථානයෙහි සිට ලෝකෝත්තර මාර්ගයට "අප්පණිහිත" යන නාමය දෙන්නේය. මෙසේ "මාර්ගය" විපස්සනාගමණ වශයෙන් අප්‍රණිහිත නාමය ලබන්නේය.

යම් හෙයකින් ඒ මාර්ගයෙහි රාගද්වේෂ මෝහ ප්‍රණිධීහු නැත්තේද ඒ හෙයින් සගුණත්වයෙන් අප්‍රණිහිත නාමය ලබයි. නිර්වාණයද තෘෂ්ණා ප්‍රණිධි රහිත වූයේ තදාරම්මණික වැ උපදනා මාර්ගයත් අප්‍රණිහිත නාමය ලබයි. මෙකී "සගුණ-ආරම්මණ" වශයෙන් අප්පණිහිත නාමය ලැබීම සූත්‍රාන්තික ක්‍රමයෙනැ'යි දතයුතුයි.

ත්‍රිවිධ විමෝක්ෂයන්ගේ වශයෙන් "සුඤ්ඤත-අනිමිත්ත-අප්පණිහිත" කියා ලෝකෝත්තර මාර්ගයට නාමත්‍රයක් ඇත්තේ නමුදු නිෂ්පර්යාය වශයෙන් "අනිමිත්ත" නාමය දෙශනා නොකිරීමට හේතු කවරේද? යත්:- ආගමනාවවත් භාවයක් නැති

හෙයිනි. අනිමිත්ත විදර්ශනා තොමෝ ආගමනීයස්ථානයෙහි සිට ලෝකෝත්තර මාර්ගයට ස්වකීය නාමය නොදියහැකි වන්නීමය. මෝතොමෝ හුදෙක් "නිත්‍ය-ධ්‍රුව-සුඛ-ආත්ම" සංඛ්‍යාත නිමිති උද්ඝාටනය කරන්නී නමුදු එහිම හැසිරෙන බැවින් සනිමිත්තකා නම් වන්නීය. එබැවින් අනිමිත්ත නාමය පරමාර්ථ වශයෙන් නොදිය හැකිබව දතයුතුයි.

තවද අනිමිත්ත විමොක්ෂය දක්වනලද්දේද අනිත්‍යානුදර්ශනා වශයෙනි. එයින් ශ්‍රද්ධෙන්ද්‍රිය අධිකමාත්‍රව ලැබේ. ඒ මේ ශ්‍රද්ධෙන්ද්‍රිය ආර්යමාර්ගධර්මයන්ට ඇතුළත් නොවේ එසේ මාර්ගාඞ්ගයක් නොවන හෙයින් අනිමිත්ත නාමය නොලබන බවද සැලකිය යුතුයි.

සුඤ්ඤත විමොක්ෂය අනාත්මානුදර්ශනා වශයෙනුත් අප්‍රණිහිත විමොක්ෂය දුඃඛානුදර්ශනා වශයෙනුත් දක්වනලදහ. එයින් "ප්‍රඥෙන්ද්‍රිය-සමාධීන්ද්‍රිය" යනදෙක අධික මාත්‍රව ලැබෙත්. ඔවුහු මාර්ගාඞ්ග හෙයින් "සුඤ්ඤත-අප්පණිහිත" යන නාමවය පමණක් පරමාර්ථ වශයෙන් වදළ බව දතයුත්තේය.

විමොක්ෂකථා නිමි.

---

යම්කිසි සංස්කාරොපෙක්ෂා ඥානය "සප්තාර්ය පුද්ගල විභාගයටද" ප්‍රත්‍යය වන්නේය. මෙහි කියනලද සප්තාර්ය පුද්ගලයෝ කවරහුද? යත්:- "ධම්මානුසාරී සැ-සද්ධානුසාරී සැ-කායසක්ඛී සැ-දිට්ඨිප්පත්ත සැ-සද්ධාවිමුත්ත සැ-උභතොභාගවිමුත්ත සැ-පඤ්ඤාවිමුත්ත සැ" යන මේ සත්දෙනවෙත්. යම්කිසි යොගාවචර කෙනෙක් අනිත්‍ය වශයෙන් සංස්කාරයන් මෙනෙහි කිරීමෙන් අධිමොක්ෂය බහුලකොට ඇත්තාහු ශ්‍රද්ධෙන්ද්‍රිය ලබත්ද ඔව්හු ශ්‍රොතාපත්ති මාර්ගක්ෂණයෙහි "සද්ධානුසාරී" නම්, සෙසු සත් තැන්හි "සද්ධාවිමුත්ත" නම් වෙත්. අනිමිත්ත විමොක්ෂයෙන් කෙලෙසුන් කෙරෙන් මිදුනාහුය'යි දතයුතු. යමෙක් දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන් ප්‍රශ්‍රබ්ධිය බහුලකොට ඇත්තේ සමාධින්ද්‍රිය ලබාද හෙතෙම සියලුතන්හි "කායසක්ඛී" නම්. අරූපධ්‍යාන ලබා රහත් ඵලයට පැමිණියේ "උභතොභාග විමුත්ත" නම්. අප්‍රණිහිත විමොක්ෂයෙන් කෙලෙසුන් මිදුනෝය'යි දතයුතු ඇතැම් කෙනෙක් අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන් වෙද බහුලකොට ඇත්තාහු ප්‍රඥෙන්ද්‍රිය ලබත්ද ඔව්හු

ප්‍රථම මාර්ගක්ෂණයෙහි "ධම්මානුසාරී" නම, සෙසුසතැන "දිට්ඨිප්පත්ත" නම්. රහත් ඵලයෙහි 'පඤ්ඤාවිමුත්ත" නම් වෙත්. ශූන්‍යතා විමෝක්ෂයෙන් මිදුනාහුය'යි දතයුතුයි.

සියලු ලෝකෝත්තර මාර්ග ඵලයන් නිපදවීමෙහි ධුර දෙකක් හා අභිනිවෙශ දෙකක්ද වන්නාහ. එනම්:- ශ්‍රද්ධාධුර-ප්‍රඥාධුර යන දෙකද, සමථාභිනිවෙස විපස්සනාභිනිවෙස යන දෙකද, උභතොභාගවිමුත්ත-පඤ්ඤාවිමුත්ත යන දෙකද, වෙත්. මේ ශාසනයෙහි අෂ්ටසමාපත්තිලාභී යම්කිසි යෝගාවචරයෙක් ප්‍රඥාව ධුර කොට ඇත්තේ සමථාභිනිවෙශ වැ අරූපධ්‍යානයක් පාදක කොට විදසුන් වඩා රහත් ඵලයට පැමිණේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි "ධම්මානුසාරී" නම, සෙසු සතැන "කායසක්ඛි" නම, රහත් ඵලයෙහි "උභතොභාග විමුත්ත" නමැ'යි දතයුතු. ඇතැම් යෝගාවචරයෙක් ප්‍රඥාවධුරකොට ඇත්තේ මැ විදර්ශනාභිනිවෙශ වැ සුද්ධසංස්කාර ධර්මයන් හෝ රූපාවචරධ්‍යානයක් හෝ පාදක කොට විදසුන් වඩා රහත් ඵලයට පැමිණේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි "ධම්මානුසාරී" නම, සෙසු සතැන "දිට්ඨිප්පත්ත" නම්, රහත් ඵලයෙහි "ප්‍රඥාවිමුක්ත" නමැයි දතයුතු.

එසේ මැ අෂ්ටසමාපත්තිලාභී යම්කිසි යෝගාවචරයෙක් ශ්‍රද්ධාව ධුරකොට ඇත්තේ සමථාභිනිවෙශ වැ අරූපධ්‍යානයක් පාදකකොට විදසුන් වඩා රහත් ඵලයට පැමිණේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි "සද්ධානුසාරී" නම; සෙසු සතැන "කාය සක්ඛි" නම්; රහත් ඵලයෙහි "උභතොභාගවිමුත්ත" නමැයි දතයුතු. ඇතැම් යෝගාවචරයෙක් ශ්‍රද්ධාව මැ ධුරකොට ඇත්තේ විදර්ශනාභිනිවෙශ වැ සුද්ධ සංස්කාර ධර්මයන් හෝ රූපාවචරධ්‍යානයක් හෝ පාදක කොට විදසුන් වඩා රහත් ඵලයට පැමිණේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි "සද්ධානුසාරී" නම, සෙසු සතැන සද්ධාවිමුත්තා" නම්; රහත්ඵලයෙහි "පඤ්ඤාවිමුත්ත නමැයි දතයුත්තේ

මෙකී නාමයන් ව්‍යවහාර කිරීමෙහි හේතුකවරේද? යත්:- තදනුකූලවෘත්ති ඇතිහෙයිනි. යම් කිසිවෙක් ශ්‍රද්ධා පූර්වඞ්ගම ආර්ය මාර්ගය වඩමින් මාර්ග ප්‍රතිවෙධය කෙරේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි සද්ධානුසාරී නම, ඵලයට පැමිණියේ සද්ධාවිමුත්ත නම්. යමෙක් ප්‍රඥා පූර්වාඞ්ගම ආර්ය මාර්ගය වඩමින් මාර්ග ප්‍රතිවෙධය කෙරේද හේ තෙමේ ප්‍රථම මාර්ගක්ෂණයෙහි ධම්මානුසාරී නම, ඵලයට පැමිණියේ දිට්ඨිප්පත්ත නම්. යමෙක් අෂ්ටවිමෝක්ෂයන් නාමකායින් ස්පර්ශකොට පසුවයේ ප්‍රඥාචක්ෂුසින් දැක ආශ්‍රවයන් සමහරක් ක්ෂයකෙළේද හේ කායසක්ඛි නම්. යමෙක් අෂ්ට

විමොක්ෂයන් ස්පර්ශ නොකොට ප්‍රඥාවශයෙන් දක සියලු ආශ්‍රවයන් ක්ෂය කෙළේද හේ ප්‍රඥාවිමුක්ත නම්. යමෙක් නාමකායින් හා රූපකායින් මිදුනේද හෙවත් අරූපධ්‍යාන උපදවා රූපකායින් හා අර්හත්මාර්ගවිපස්සනායෙන් නාමකායින් මිදුනේද හේ තෙමේ දෙභාගයෙන් මිදුනු හෙයින් උභතොභාගවිමුක්ත නමැයි දක්වන ලදී.

ආර්ය පුද්ගල කථා නිමි.

---

තවද මෙම සංස්කාරොපෙක්ෂා ඥානය මැ ආර්ය මාර්ගයෙහි උපදනා "බොධ්‍යාඞ්ග- මාර්ගාඞ්ග- ධ්‍යානාඞ්ග" සඞ්ඛ්‍යාවද නියම කෙරෙයි. විදර්ශනා නියමයෙන් ශුෂ්ක විදර්ශකයාහට උපදනා ලොවුතුරු මඟද, සමාපත්තිලාභියෙකු ධ්‍යානය පාදක නොකොට උපදවන මාර්ගයද, ප්‍රථමධ්‍යානය පාදක කොට ප්‍රකීර්ණක සංස්කාරයන් සම්මර්ශනය කිරීමෙන් උපදවන මාර්ගයද, ප්‍රථමධ්‍යානික මැ වෙත්. ඒ සියලු තන්හි මැ බොධ්‍යාඞ්ග සතද මාර්ගාඞ්ග අටද ධ්‍යානාඞ්ග පසද උපදනා හුය. පවත නය 'ද්විතීය තෘතීය චතුර්ත්ථ' ධ්‍යානයන් පාදක කොට උපදවන මාර්ගයන්හි පිළිවෙලින් ධ්‍යානාඞ්ග සතරක්ද තුනක්ද දෙකක්ද උපදනාහුය. මෙකී සියලු තන්හි මාර්ගාඞ්ග සතක්ද චතුර්ථධ්‍යානික ස්ථානයෙහි බොධ්‍යාඞ්ග සයක්ද උපදිති. පඤ්චමධ්‍යානය පාදක කොට උපන් මාර්ගයෙහි ධ්‍යානාඞ්ග දෙකක්ද බොධ්‍යාඞ්ග සයක්ද මාර්ගාඞ්ග සතක්ද වන්නාහ. මේ නියමයද පූර්වභාග විදර්ශනා සංඛ්‍යාත සංස්කාරොපෙක්ෂා ඥානයෙන් මැ වන්නේයයි දතයුතු.

මේ සඳහා ආචාර්ය මත තුනක් ඇත්තාහ. ඇතැම් ආචාර්ය කෙනෙක් "පාදකධ්‍යානය" නියම කෙරෙති කියාද, ඇතැම් කෙනෙක් "විදර්ශනාලම්බනීක ස්කන්ධයෝ" නියම කෙරෙති කියාද, තව කෙනෙක් "පුද්ගලධ්‍යාශය" නියම කෙරෙති කියාද, ස්වකීය මත භෙද පහළ කළහ. බුද්ධඝොෂාචාර්යහු යථොක්ත මත භෙදත්‍රයම පිළිගත් නමුදු ඔවුනට පූර්වභාග විදර්ශනාව මැ මූලාධාර වන හෙයින් ව්‍යුත්ථානගාමිනී නම් ලද සංස්කාරොපෙක්ෂා ඥානය මැ අභිමත කළහ.

සංස්කාරොපෙක්ෂාඥානය යි.

---

මෙකී සංස්කාරොපෙක්ෂා ඥානයට අනතුරුව මැ අනුලොම ඥානය උපදනේය. කුමක් හෙයින් අනුලොමඥානය යි කියනු ලැබේද? යත්:–පූර්වාපර භාගදෙකට අනුකූල පරිද්දෙන් "හෙවත්

පූර්වෝක්ත උදයව්‍යයාදි අෂ්ට විදර්ශනාඥානයන්ටද මතු මාර්ග චිත්ත සහජාතව උපදනා සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ටද අනුලෝම වූ" උපදනා හෙයින් "අනුලෝමඥානය"යි කියනු ලැබේ. කවරෙක් කවරකට අනුකූලවන්නාක් මෙන්ද? යත්:— යම්සේ ධාර්මික රජෙක් විනිශ්චය ස්ථානයෙහි සිටැ අධිකරණ නායකයන් අටදෙනෙකු විසින් කරනලද යුක්ති යුක්ත විනිශ්චයක් ශ්‍රවණය කොට අගතිගාමී නොවූ මැදහත් වැ එසේ වේවා යි අනුමෝදන් වනුයේ ඔවුන්ගේ විනිශ්චයට හා පෞරාණික රාජධර්මයටත් අනුලෝම වේද, එමෙනි. මෙහි අනුලෝම ඥානය රජු මෙන්ද, අෂ්ටවිදර්ශනා ඥානයෝ අධිකරණ නායකයන් අටදෙනා මෙන්ද, බෝධිපාක්ෂික ධර්මයෝ පැරණි රජදහම මෙන්ද, යම්සේ රජතෙමේ එසේ වේවා යි කියනුයේ ඔවුන්ගේ විනිශ්චයට හා රාජ ධර්මයටත් අනුලෝම වේද එපරිද්දෙන් අනිත්‍යාදි වශයෙන් සංස්කාරයන් අරමුණු කොට උපදනා අනුලෝමඥානයද දතයුතුයි.

උදයව්‍යය ඥානය පටන් සංස්කාරෝපෙක්ෂාඥානය තෙක් විදසුන් වැඩූ යම්කිසි විදර්ශකයෙක්හට "දැන් අර්පණා සංඛ්‍යාත මාර්ගය උපදින්නේය"යි කියයුතු අවධියෙහි යට ඥානයන්ගෙන් ආසේවන ප්‍රත්‍යය ලැබූ සංස්කාරෝපෙක්ෂාඥානය සංස්කාරයන්ගේ අනිත්‍යාදි ලක්ෂණයන් සම්මර්ශනය කොට භවාඞ්ගයට බැසගනී. ඉක්බිති එම ඥානයෙන් සම්මර්ශනය කළ පරිදි සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් මැ අරමුණු කරමින් "උපෙක්ෂා සහගත ක්‍රියාහේතුක මනෝඥානධාතුය"යි කියනලද මනෝද්වාරාවර්ජනය භවාඞ්ගස්‍රොතස සිඳගෙන උපදී. භවාඞ්ගය පෙරළා උපන් ඒ ක්‍රියා චිත්තයට අනතුරු වැ නොසිඳැ පවත්නා චිත්තසන්තානය ලුහුබඳිමින් දෙතුන් විදර්ශනා සිත් කෙනෙක් යටකී පරිදි අනිත්‍යාදි ලක්ෂණයන්ගෙන් යමක් අරමුණුකොට "පරිකර්ම-උපචාර-අනුලෝම" නාමයෙන් උපදිත්. මෙකී අර්පණා චිත්තවීථියෙහි ලැබෙන ජවන් සිත් සතෙන් ප්‍රථම ජවනය පරිකර්ම කියාද දෙවැනි ජවනය උපචාර කියාද තුන්වැනි ජවනය අනුලෝම කියාද ව්‍යවහාර කරනත් අවිශේෂයෙන් සලකනවිට "අනුලෝමඥානයෝමය"යි දතයුතු. මෙකී අනුලෝමයෝ මහාප්‍රාඥයෙකුට දෙකක්ද මධ්‍යමප්‍රාඥයෙකුට තුනක්ද උපදින්නාහුය.

එබැවින් මධ්‍යම ප්‍රාඥයෙකුට උපදනා මාර්ගවුත්ථාන වාරයෙහි ප්‍රථම අනුලෝම ජවනය සංස්කාරයන් පිළිබඳ අනිත්‍යතාදි යමක් අරමුණුකොට චතුස්සත්‍යය වසා සිටිනා ස්ථූලමෝහඳුරු

දුරුකෙරෙමින් තිලකුණු වඩවඩා ප්‍රකට කොට නිරූඪවෙයි. ඉක්බිති දෙවැනි අනුලොමය ඉපිද පළමු ඥානයාගේ ආසෙවනය ලැබ එයටත් වඩා තියුණුවැ ඒ අරමුණෙහි එලෙසින් මැ පැවත මධ්‍යම ප්‍රමාණ මොහඳුරු නසා තිලකුණු වඩ වඩා ප්‍රකට කොට නිරූඪවෙයි. තදනන්තර වැ තුන්වැනි අනුලොමය ඉපිද දෙවරක් ලද ආසෙවන ඇතිහෙයින් අතිශයින් තියුණුවූයේ ඒ අරමුණෙහි එලෙසින්ම පැවත ඉතා සියුම්වූ සත්‍යප්‍රතිච්ඡාදක මොහඳුරු නසා නිරවශෙෂයෙන් තිලකුණු පහළ කෙරෙමින් නිරූඪ වේ. මෙසේ උපදනා ඥානත්‍රිකයට අනුලොම නමැයි කිහ. මේ ඥානය වනාහි වුට්ඨානගාමිනි විදර්ශනාවගේ හෙවත් සඞ්ඛාදි නිමිත්තාරම්මණයෙන් නැගිට මාර්ගය කරා ගැටෙන විදර්ශනාවගේ අවසානය වෙයි. (සර්වප්‍රකාරයෙන් සලකත් හොත් ගොත්‍රභූඥාණය මැ අවසානය'යි දක්වන ලදහ.

සත්‍යානුලොමිකඥානයයි.

---

මේ නවමහා විදර්ශනඥානය'යි කියනලද වුට්ඨානගාමිනී විදර්ශනාව දක්වා වදාළාවූ සර්වඥයන් වහන්සේ නොයෙක් සූත්‍රයන්හි නොයෙක් පරිද්දෙන් වදාළහ. එනම්:– සළායතන විභඞ්ග සූත්‍රයෙහි "අතම්මයතා" යන නාමයෙන්ද; අලගද්ද සූත්‍රයෙහි "නිබ්බිදා" යන නාමයෙන්ද; සුසිම සූත්‍රයෙහි "ධම්මට්ඨිතිඤාණං" යන නාමයෙන්ද; පොට්ඨපාද සූත්‍රයෙහි "සඤ්ඤග්ගං" යන නාමයෙන්ද; දසුත්තර සූත්‍රයෙහි "පාරිසුද්ධි පධානියඞ්ගං" යන නාමයෙන්ද; ප්‍රතිසම්භිදා මාර්ගයෙහි "මුඤ්චිතුකම්‍යතා-පටිසංඛානුපස්සනා-සංඛාරුපෙක්ඛා" යන නාමත්‍රයෙන්ද; පට්ඨාන පාළියෙහි "අනුලොමං ගොත්‍රභුස්ස අනුලොමං වොදානස්ස" කියා නාමත්‍රයකින්ද; රථවිනීත සූත්‍රයෙහි "පටිපදාඤාණදස්සනවිසුද්ධි" යන නාමයෙන්ද ප්‍රකාශ කළසේක. එබැවින් ඒ ඒ තැන්හි එකි එකි ක්‍රමයෙන් අර්ථය තෙරුම්ගෙන මාර්ග ඵල ප්‍රතිවෙධයෙන් පරමොත්තර විශුද්ධිය කැමති සාධුජන සත්පුරුෂයන් විසින් තදුපනිශ්‍රයවූ නවමහා විදර්ශනාඥාන නමිලද ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධිය වැඩිය යුත්තාහුය.

---

තස්මා මග්ග ඵලත්ථී-
විපස්සනා ඤාණ භාවනෙ යතෙය්‍ය;
යං සම්භතා පටිපදා-
මග්ගාය විවට්ටනෙත්‍ර වරඤාණං.

---

ප්‍රතිපදාඥාන දර්ශන විශුද්ධිය නිමි.

---

ගුණරතන ප්‍රණීත විශුද්ධි දීපිකා නම්ලද ධර්ම ප්‍රකරණයෙහි
ර්ශන විශුද්ධි නම්වූ සප්තම පරිච්ඡේදය නිමි.

# ඥානදර්ශන විශුද්ධිය

—— ೦)(೦ ——

නිබ්බාණ නින්න පොතං
සොතා පත්‍යාදි නාමතො සිද්ධං;
ලොකුත්තර චතුමග්ගං
බ්‍රූතෙ සො "ඤාණ දස්සනං" භගවා.

---

සොතාපත්තිමග්ගො සකදාගාමිමග්ගො අනාගාමිමග්ගො අරහත්තමග්ගො'ති ඉමෙසු පන චතුසු මග්ගෙසු ඤාණං ඤාණදස්සන විසුද්ධි නාම; යනුවෙන් ශ්‍රොතාපත්‍යාදි චතුර්විධ ලොකොත්තර මාර්ගඥානය "ඥානදර්ශන විශුද්ධි" නමැයි කිහ. මෙහි චත්තාරි සච්චානි ජානාති පටිවිජ්ඣතී ති=ඤාණං, ඤාණමෙව දස්සනං=ඤාණදස්සනං; රාගාදීහි කිලෙසමලෙහි විසුජ්ඣනං=විශුද්ධි, ඤාණදස්සනමෙව විශුද්ධි=ඤාණදස්සන විශුද්ධි" යනු පදනාමයෙන් සමාස විග්‍රහ හෙයින් දුඃඛාදි චතුසත්‍ය ධර්මයන් අනුබොධඥාන ප්‍රතිවෙධඥාන විසින් සත්‍යඥානාදි ක්‍රමයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම "ඥානදර්ශන' නමි. එය මැ රාගාදි කෙලෙස මලයෙන් විශුද්ධවූයේ "ඥානදර්ශන විශුද්ධිය"යි කියනු ලැබේ. විස්තර විසින් වනාහි "සොවාන්මාර්ගඥානය-සකෘදාගාමිමාර්ගඥානය- අනාගාමිමාර්ගඥානය- අර්හත්මාර්ගඥානය" යන සතර මාර්ගඥානය'යි දතයුතු.

"ඡබ්බි සුද්ධික්කමෙනෙවං-භාවෙතබ්බො චතුබ්බිධො
ඤාණදස්සන විසුද්ධි-නාම මග්ගො පවුච්චති"

යන ආචාර්යොක්තියෙන් සතර මාර්ගඥාන සංඛ්‍යාත ඥානදර්ශන විශුද්ධිය ශීලවිශුද්ධි ෂට්විශුද්ධි ක්‍රමයෙන් සම්පාදනය කටයුතුබව හැගෙන හෙයින් මේ අර්ථය සුවසේ දැනගැනුම් වස් නැවතත් මාර්ගවීථිය පිළිබඳ අනුපූර්විකථා තොමෝ සැකෙවින් දතයුත්තීය. ඒ මෙසේයි:- දුශ්චරිතමල විශොධනයෙන් ශීල විශුද්ධියද, නිවරණමල විශොධනයෙන් චිත්තවිශුද්ධියද; දෘෂ්ටිමල විශොධනයෙන් දෘෂ්ටි විශුද්ධියද, සංශයමල විශොධනයෙන් කාංක්ෂාවිතරණ විශුද්ධියද, විදර්ශනොපක්ලේශයන්හි නහමක් මුලාවට පැමිණීමෙන් මාර්ගාමාර්ග ඥානදර්ශන විශුද්ධියද, සම්පාදනයකොට උදයව්‍යයඥානය පටන් සංස්කාරොපෙක්ෂාඥානය

නෙක් වීදසුන් වැඩූ විදර්ශකයාහට ජවන් සතක් පරම කොට ඇති අර්පණාචිත්ත වීථියක් පහළවේ. එහි අනුලෝමඥානය පිළිවෙළින් ජවන් තුනක "පරිකර්ම-උපචාර-අනුලෝම" යන නාමයන්ගෙන් යුක්ත වැ උපදී (මේ කියන ලද්දේ මධ්‍යම ප්‍රාඥයෙකුට උපදනා ක්‍රමයයි. මහා ප්‍රාඥයෙකුට නම් "උපචාර-අනුලෝම" යන නමින් දෙවරක් උපදී) මෙසේ උපදනා අනුලෝම ඥානය සත්‍යප්‍රතිච්ඡාදක= (සිවුසස් වසා සිටින) මෝහාන්ධකාරය දුරුකොට තිලකුණු ප්‍රකට කෙරෙමින් නිරුද්ධවේ. ඉක්බිති එම චිත්තවීථියෙහිවූ සතරවැනි ජවනය නිවන් අරමුණු කෙරෙමින් "ගෝත්‍රභූ" යන නාමයෙන් උපදී. (මහාප්‍රාඥයෙකුට තුන්වැනි ජවනය ගෝත්‍රභූ නම් වේ)

## ගෝත්‍රභූ ඥානය.

පෘථග්ජන ගෝත්‍රය අභිභවනය කරමින් ආර්‍ය ගෝත්‍රයට බැස ගනිමින් උපදනා ගෝත්‍රභූ ඥානය නම් ආවර්ජනයක් නොවූයේද ආවර්ජනස්ථානයෙහි සිට මාර්ගය ආවර්ජනය කරන හෙයින් ප්‍රතිපදා ඥානදර්ශන විශුද්ධියද නොවේ, මාර්ගය නොවන හෙයින් ඥානදර්ශන විශුද්ධියද නොවේ. මේදෙකුර අව්‍යවහාරිකවේ. විදසුන් ගොය හුනුහෙයින් විදර්ශනා සංඛ්‍යාවට යෙයි. ඒ මේ ගෝත්‍රභූ ඥානය වනාහි අනුලෝම ඥානයාගේ ආසේවනානන්තරයෙහි උපදිමින් "සඞ්ඛත නිමිත්ත නොවන හෙයින් අනිමිත්තවූ මතු ස්කන්ධයන්ගේ පැවැත්මක් නැති හෙයින් අප්පවත්තවූ අනිත්‍ය ලක්ෂණ දුඃඛලක්ෂණ නැති හෙයින් විසඞ්ඛාරවූ දුඃඛස්කන්ධයන්ගේ පුනරුත්පත්තිය වළහන හෙයින් නිරෝධයවූ" නිර්වාණය අරමුණු කෙරෙමින් පුහුදුන්ගොත ඉක්මවමින් අරියගොතට බැසගණිමින් නිවන් අරමුණ පළමුකොට මැ හුනතිවිදිමින් විදර්ශනාවෙහි අන්තිම කෙළවරට මැ පැමිණැ නැවත ආපසු නොපෙරළෙන්නක්ව මැ උපදී.

මෙසේ එකම ආවර්ජනයක් ඇති එකම චිත්තවීථියෙහි පවත්නාවූ "අනුලෝම- ගෝත්‍රභූ" දෙදෙනා අනුපෙරෙහි අනුලෝමසිත සංස්කාරාලම්බනයෙහිත් ගෝත්‍රභූසිත නිර්වාණාලම්බනයෙහිත් පවත්නේය'යි දතයුතු. මේ බව මෙහි පහත දක්වෙන උපමාවෙන් මනාව දතහැකිවේ:- යම්සේ මහ ඇලක් පැන එතරවනු කැමැති පුරුෂයෙක් අදූරස්ථානයක සිට වේගයෙන් දුවගෙනවුත් මෙතෙර රුක්ශාඛාවක බැඳි එල්බෙන වැලක් හෝ රිටක් අල්ලාගෙන පැනනැගී පරතෙරට නැඹුරුවූ කයින්

පරතෙර මතුවම පැමිණෑ ඒ රිට හෝ වැල අත හැර වෙවුල මින් පරතෙර වැටී එහා නැගී සිටිද එමෙන් යෝගාවචරයාත් සසරින් එතෙරවූ නිවනෙහි පිහිටනු කැමති වැ උදයව්‍යයාදි විදර්ශනා වෙගයෙන් දුවගෙනවුත් අත්බැව් නැමැති රුක් අත්තේ බැඳී එල්ලෙන රුවල හෝ වෙදනාදිය නමැති වෙනයම් රිටක් හෝ අනිත්‍යය දුක්ඛ අනාත්මය යන ආවර්ජන නමැති අතින් ගෙන එය අත හැරම පලමුවන අනුලොමයෙන් උල්ලඞ්ඝිත වැ දෙවන අනුලොමයෙන් පරතෙරට නැමුනු බරවූ කයින් මෙන් නිවන්කරා නැමුනු බරවූ සිතින් තුන්වන අනුලොම යෙන් එවෙලෙම පැමිණියයුතු නිවණට ලංවී ඒ අනුලොම් චිත්ත නිරොධයෙන් සංස්කාරවූ අරමුණ අත් හැර ගොත්‍රභූසිතින් විසංස්කාරවූ පරතීර සංඛ්‍යාත නිවණෙහි වැටෙයි. එක්වරක් ගත් අරමුණෙහි ආසෙවනයක් නොලදින් වෙවුලන පුරුෂයා මෙන් තවම හොඳට නොපිහිටි යේ වෙයි. මාර්ගඥානයෙන්ම පිහිටයි.

මෙහි අනුලොම ඥානය සත්‍යප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය හරනට හැකිවෙයි. නිවන් අරමුණුකරන්ට නොහැකිවෙයි. ගොත්‍රභූඥානය නිවන් අරමුණු කිරීමටම හැකිවෙයි කෙලෙස් අඳුරු හරනට නොහැකිවෙයි. මේ බවද මතු දක්වන උපමා වෙන් සුවසේ දත හැකිවේ. ඇස් ඇති එක්තරා පුරුෂයෙක් නැකැත් යොගයක් දැනගනු පිණිස රෑය එළිවහනවිත් සඳ බලනට උඩබැලීය. වලාකුලින් වැසුනු හෙයින් ඔහුට සඳ නොපෙනෙයි. ඉක්බිති මහාසුළඟක් නැගී මහ වලාකුල් ඉවතලීය. අනික් සුළඟක්විත් මැදුම් වලාකුල් ඉවතලීය. තවත් සුළඟක් විත් සියුම්වලා ඉවතලීය. එවිට ඒ පුරුෂ තෙමේ ඉවත්වූ වලා ඇති අහස සඳ දැක නැකත දැන ගත්තේය. එහි වලාකුල් මෙන් සත්‍ය ප්‍රතිච්ඡාදක ස්ථූල මධ්‍යම සූක්ෂම කෙලෙසාන්ධකාරද වාතයන් මෙන් අනුලොම යන්ද ඇස්ඇති පුරුෂයා මෙන් ගොත්‍රභූඥානයද චන්ද්‍රයා මෙන් නිර්වාණයද දතයුතුයි. මෙහි සුළඟින් වලාකුල් නැසීමමෙන් එක් එක් අනුලොමයෙන් කෙලෙස් තම නැසීමද වලා නැති අහස සඳදැක්ම මෙන් ගොත්‍රභූඥානයෙන් නිවන් දැක්මද දතයුතු. යම්සේ වාතයෝ වලාහරනට මුත් සඳ දක්නට නොහැකි වෙද්ද. එමෙන් අනුලොම යෝ කෙලෙස් තම හරනට මුත් නිවන් දක්නට නොහැකි වෙත්. යම්සේ ඒ පුරුෂ තෙමේ සඳ දක්නට මුත් වලාහරනට නොහැකි වේද

එමෙන් ගොත්‍රභූඥානය නිවන් දක්නට මුත් කෙලෙස්නම හර නට නොහැකිවේ. එසේහෙයින් ම ගොත්‍රභූඥානය මාර්ගාවර්ජන ය'යි කියනුලැබේ.

## I. ශ්‍රොතාපත්ති මාර්ගඥානය.

---

මේ වනාහි කෘත්‍යවශයෙන් ආලම්බනවශයෙන් විසදෘශවූ "අනුලොමගොත්‍රභූ මාර්ගඵල"යන ලොවිලොවුතුරා ජවන්සිත් සතක් පරමකොට ඇති එකාවර්ජන වූ අර්පණා චිත්තවීථියෙහි සතරවන හෝ පස්වන ජවනස්ථානයට පැමිණි ප්‍රථම මාර්ගඥාන යයි. මෙම මාර්ගඥානයට ආවර්ජනස්ථානයෙහි සිටි (ඉහතකී) ගොත්‍රභූඥානය "මෙසේ උපදුව"යි මාර්ගයට සංඥදෙන්නාක් මෙන් නිරුඬවූපසු මාර්ගචිත්තයද ගොත්‍රභූ සිතෙන් දුන් සංඥලෙස අවිච්ඡින්නසන්තති වශයෙන් ඒ ඥානය අනුබඳමින් ඒ වීථියේ අනුලොම ජවන් උපන් ගණනට සතරවන හෝ පස්වන ජවනස්ථානයෙහි පෙර නොවිද්දවිරූ නොපැළවිරූ ලොභ වෙෂ මොහස්කන්ධයන් විදගෙන පලාගෙන සජොතනාහයෙන් බලත් හොත් අවිද්‍යාගුවූ සංසාරදුඃඛ සමුද්‍රය වියලවමින් මෙප මණක් මැ දුකය මෙයින් අඩු වැඩි නැතැයි දුකපිරිසිඳිමින් සමුදය ප්‍රහාණය කරමින් නිර්වාණය අරමුණු වශයෙන් සාක්ෂාත් කෙරෙමින් උත්පත්ති වශයෙන් මාර්ග භාවනාකෙරෙමින් සියලු අපාය දොර වසමින් සත්‍යාර්ථධන රැස්කෙරෙමින් මිථ්‍යාමාර්ගය දුරුකෙරෙමින් ආර්යභාවය සිඬකෙරෙමින් ප්‍රථම මාර්ගඥානය වැ උපදී. එය නිවන්මුහුදකරා යන සැඩපහර වැනි මාර්ගශ්‍රොතසට පැමිණි හෙයින් ශ්‍රොතාපත්තිමාර්ග නම්වේ. එයින්යුත් පුද්ගල තෙමේ **"ප්‍රථමආර්ය්‍යපුද්ගල"** නමැයි දතයුතු.

ඉක්බිති මාර්ගඥානයට අනතුරුවැ ඒ ඥානයාගේ විපාකයවූ ඵල සිත් දෙකක් හෝ තුණක් උපදීත්. ලොකොත්තර කුසල යත් ආනන්තරික (=මාර්ගයට අනතුරු විපාකඇති) අකාලික (=කල්නොයවා දෙන විපාකඇති) හෙයින් මාර්ගයට අනතුරු වැ ඵලය ලබයි. එහෙයින් "සමාධිමානන්තරිකඤ්ඤමාහු"=යම සමාධියක් ලොකොත්තර ද ඒ ආනන්තරික සමාධිය'යි කීහු. මෙහි අනුලොම ජවන් දෙකක් වීනම් තුන්වන ජවනය ගොත්‍රභූනමි. සතරවන ජවනය මාර්ගඥාන නමි. සෙසු ජවන්තුණ ඵලඥාන වෙත්. අනුලොම තුණක් වීනම් සතරවැන්න ගොත්‍රභූඥාන

නම. පස්වැන්න මාර්ගඥාන නමි. සෙසු ජවන් දෙක ඵලඥාන වෙත්. මෙසින් යුක්තවූ පුද්ගලතෙමේ "සදවැනි ආර්ය්‍ය පුද්ගල" නමැයි දතයුතු.

## ප්‍රත්‍යවේක්ෂා ඥාන.

---

මෙසේ ජවන්සතක් පරමකොට ඇති මේ එකාවර්ජන වීථිය අවසානයෙහි භවාඞ්ගපාතය වේ. ඉක්බිති භවාඞ්ගය සිඳ ගෙන මාර්ගප්‍රත්‍යවෙක්ෂණය පිණිස මනොද්වාරාවර්ජනය උපදී. ඉක්බිති පිළිවෙළින් මාර්ගප්‍රත්‍යවෙක්ෂා ජවන් සතක් පහළවෙත්. නැවත භවාඞ්ගපාත වැ ඵලනිර්වාණාදිය ප්‍රත්‍යවෙක්ෂා කිරීම පිණිස ක්‍රමයෙන් ආවර්ජනාදීහු ඉපිද නිරුද්ධවෙත්. ශ්‍රොතාපන්නය හට "මාර්ග-ඵල-නිර්වාණ-නැසූ කෙලෙස්-ඉතිරි කෙලෙස්" යන මොවුන් පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂාඥාන පසක් උපදිත්. සකෘදාගාමි අනාගාමි දෙදෙනාටත් එසේම ඥාන පස පස උපදනාහුය. රහත්හට වනාහි අවශිෂ්ට කෙලෙශයන් නැත්හෙයින් එපමණක් හැර සෙසු ඥානසතර උපදිත්. මේ ක්‍රමයෙන් උපදනා ඥානයන්ට "එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝය"යි කියනු ලබත්.

ශ්‍රොතාපන්නාදි ශෛක්‍ෂයන්ට වනාහි "පැහුකෙලෙස් ශෙෂ කෙලෙස්" යන දෙක පිළිබඳ ප්‍රත්‍යවෙක්ෂාවෝ ඇතැම්විටෙක උපදිත් ඇතැම්විටෙක නූපදිත්. ඒ බව දක්වන්නාහු -

මග්ගං ඵලඤ්ච නිබ්බාණං
පච්චවෙක්ඛති පණ්ඩිතො
හීනෙ කිලෙසෙ සෙසෙච
පච්චවෙක්ඛති වා නවා 'ති" යන ගාථාව කීහ.

මේ ශ්‍රොතාපන්නතෙමේ "දෘෂ්ටිසම්ප්‍රයුක්ත ලොභසහගත සිත් සතරද විචිකිත්සාසම්ප්‍රයුක්ත සිතද" යන මෙකී අකුශල් සිත් පස නොහොත් "සත්කායදෘෂ්ටි-විචිකිත්සා-ශීලව්‍රතපරාමර්ෂ" යන සංයොජනත්‍රය හා අපායගාමී "රාග-ද්වෙෂ-මොහ" යන් සමූලොච්ඡෙදනය කොට සම්බුද්ධශාසනයෙහි ලැබූ ප්‍රතිෂ්ඨා ඇති ගතිනියතවූ ප්‍රථම ආර්ය්‍යපුද්ගල භාවයෙන් විශුද්ධියට පැමිණියේය"යි දතයුතු.

## මෙහි තත්ත්වාවබෝධය පිණිස
## අභිඥාවීථිවින්‍යාස දක්වමු:-

---

එහි සංකේතාක්ෂර මෙසේයි:- ප=පරිකර්ම; උ=උපචාර; අනු=අනුලෝම; ගෝ=ගෝත්‍රභූ; මග=මාර්ග; ඵ=ඵල; වෝ=වෝදාන; සෙස්ස යටකී ක්‍රමයෙනි.

සංඛතා'සංඛත අරමුණු කෙරෙසි.

| සංඛාරාලම්බති. | | | | | | | ශ්‍රෝතාපත්ති මාර්ග වීථිය. | | | | | | | | නිර්වාණාලම්බති- | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ඝ | භ | භ | භ | ල | ජේ | ම | ප | උ | නු | ගෝ | මග | ඵ | ඵ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

ප්‍රථම මාර්ගය අරමුණු කෙරෙසි.

මාර්ගප්‍රත්‍යවේක්ෂා වීථිය.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ල | ජේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

---

සෙසු "ඵලප්‍රත්‍යවේක්ෂා වීථියද, නිර්වාණ ප්‍රත්‍යවේක්ෂා වීථියද, හීන කෙලශප්‍රත්‍යවේක්ෂා වීථියද, ශේෂ කෙලශප්‍රත්‍යවේක්ෂා වීථියද, යන වීථි සතරම මෙහි දැක්වූ මාර්ගප්‍රත්‍යවේක්ෂා වීථියට සමානය. වෙනස නාමය පමණකි. එබැවින් සෙස්ස එසේ දතයුතුයි.

### II. සකෘදාගාමි මාර්ගඥානය.

---

යටකී පරිදි ප්‍රත්‍යවේක්ෂාකළ ශ්‍රෝතාපන්න ආර්‍යශ්‍රාවක තෙමේ සෝවාන් මාර්ගය ලැබූ අස්නෙහි හෝ වෙනයම් සුදුසු තැනක හිඳ සකෘදාගාමි මාර්ගය පිණිස විදර්ශනාවඩයි. හේ තෙමේ "ඉන්ද්‍රිය බල-බොධ්‍යාඞ්ග" ධර්මයන් එක්තැන්කරගෙන යටකී පරිදි "රූප-වේදනා-සංඥා-සංස්කාර-විඥාන" යන ප්‍රභේද වත් සංස්කාර අරමුණක් "අනිත්‍ය-දුඃඛ-අනාත්ම" වශයෙන් සම්මර්ශනය කොට ප්‍රතිපද්ඥානදර්ශන විශුද්ධියෙන් විදසුන් නැංව බස්නේය. ඔහට සංස්කාරොපෙක්ෂාඥානයාගේ අවසානයෙහි

එකම ආවර්ජනයකින් අනුලොම ගොත්‍රභූ ඥානයන්ට අනතුරුව, සිවුසස් පිළිවිදිමින් උපන් මාර්ගඥානයෙන් 'දෘෂ්ටිසම්ප්‍රයුක්ත ලොභසහගත සිත් සතර හා දොම්නස් සහගිය දෙසිතය" යන සිත් සයද ඖදරිකවූ කාමරාග ව්‍යාපාදයන්ද දුර්වලකෙරෙමින් එක්වරක් කාමධාතුවෙහි උපදවන ශක්ති ඇතිහෙයින් සකෘදාගාමි නම්වූ විතීය ආර්යපුද්ගල භාවයෙන් විශුද්ධිය ලැබෙන්නේය"යි දතයුතු.

| සංඛාරමාලම්බනි. | | | | | | | සකෘදාගාමිමාර්ග වීථිය. | | | | | | | | නිබ්බාණමාලම්බනි | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ල | ජේ | ම | ප | උ | නු | වො | මග | ඵ | ඵ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

මාර්ග ප්‍රත්‍යවෙක්ෂා වීථිය.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ල | ජේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

---

**සෙසු ප්‍රත්‍යවෙක්ෂා වීථිසතරද මේ මාර්ගප්‍රත්‍යවෙක්ෂා වීථිය මෙනැයි දතයුතු.**

---

## III. අනාගාමි මාර්ගඥානය.

---

මෙසේ කාමරාග ව්‍යාපාදයන් තුනීකරගත් ආර්යයතෙමේ ඔවුන්ගේ නිරවශෙෂ ප්‍රහාණය පිණිස විදසුන් වඩයි. යටකී සංස්කාර නිමිත්ත ම අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනා කෙරෙයි. ඕහට සංස්කාරොපෙක්ෂාවගේ අවසානයෙහි උපන් මනොවාර වර්ජනයට අනතුරුව අනුලොම ගොත්‍රභූ ඥානයන් ඉපිද නිරුද්ධ වූ පසු අනුසහගත කාමරාග ව්‍යාපාදයන්ගේ වශයෙන් යටකී සිත් සය ම මුලොච්ඡින්නවීමෙන් කාමධාතුවට පිළිසඳ වශයෙන් නොඑන හෙයින් අනාගාමි නම්වූ විශුද්ධ පුද්ගලභාවය ලැබේය'යි දතයුතු. මොහු තෘතීය ආර්යපුද්ගලයා නම්වේ.

| සංඛාරමාලම්බනි. | | | | | | | අනාගාමී මාර්ගවීථිය. | | | | | | | | නිබ්බාණමාලම්බනි | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ල | ජේ | ම | ප | උ | නු | වො | මග | ඵ | ඵ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

### මාර්ගප්‍රත්‍යවේක්ෂා වීථිය.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

අවශේෂ ප්‍රත්‍යවේක්ෂා වීථීන්ද මේ මාර්ගප්‍රත්‍යවේක්ෂා වීථිය මෙනැයි සැලකියයුතු.

## IV. අර්හත් මාර්ගඥානය.

යථෝක්ත අනාගාමි ආර්‍ය්‍යපුද්ගල තෙමේ ප්‍රත්‍යවේක්ෂණ ඥානයෙන් දැනගත් අවශිෂ්ට ක්ලේශ නම්වූ ''රූපරාග-අරූපරාග-මාන-ඖද්ධත්‍ය-අවිද්‍යා'' යන මොවුන්ගේ ප්‍රහාණය පිණිස නැවතත් විදර්ශනා වඩයි. ඉන්ද්‍රියබල බෝධ්‍යාඞ්ග ධර්මයන්ගේ සමවධානයෙන් යටකී සංස්කාරනිමිත්ත ම අනිත්‍ය දුඃඛ අනාත්ම විසින් ඥානයෙන් පිරිමැද විදර්ශනා වඩත් වඩත් ම සංස්කාරෝපෙක්ෂා ඥානාවසානයෙහි අනුලෝමාදීන්ට අනතුරුව, සිවුසස් පිළිවිදිමින් යටකී උද්ධම්භාගිය සංයෝජනයන් සහිත මානානුශය භවරාගානුශය අවිද්‍යානුශය යන ක්ලේශයන්ගේ නිරවශේෂ ප්‍රහාණියෙන් අර්හත් නම්වූ චතුර්ථ ආර්‍ය්‍යපුද්ගල නාමයෙන් පරමතර විශුද්ධියට පැමිණෙන්නේය. ඒ මහෝත්තමයාණන්වහන්සේ මහාක්ෂීණාශ්‍රව නම් වූ අන්තිම දේහධාරී වූ බැහැරකරනලද ස්කන්ධාදී සියලු බර ඇත්තාවූ මාර්ගපිළිවෙළින් තිවත් පැමිණියාවූ දෙවියන් සහිත සර්‍වලෝකයාහට දක්ෂිණෙය්‍ය වූ ත්‍රිවිධ ලෝකයෙන් එතර වූ එහෙයින් ම ලෝකෝත්තර වූ පුණ්‍යක්ෂේත්‍රයකැ'යි දතයුතු.

| සංඛාරමාලම්බති. | | | | | | | අර්හත්මාර්ග වීථිය. | | | | | | | | නිබ්බාණමාලම්බති | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ච | ඡේ | ම | ප | උ | නු | ගෝ | මග | ඵ | ඵ | භ | භ | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

### මාර්ගප්‍රත්‍යවේක්ෂා වීථිය.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ච | ඡේ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | හි | භ | භ | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

අවශේෂ ප්‍රත්‍යවේක්ෂාවීථි තුනද මෙසේමැයි.

රහත් මාර්ගයෙන් සකලක්ලේශයන් ප්‍රහාණයකළ බැවින් "ශේෂක්ලේශප්‍රත්‍යවේක්ෂා" නම් විත්තවීථිය මෙහි නූපදනාබව සැලකියයුතුයි. එබැවින් "මාර්ග-ඵල-නිර්වාණ-ප්‍රහීණක්ලේශ" යන ප්‍රත්‍යවේක්ෂාවීථි සතරක් පමණකි. එයින් මෙහි දක්වූ මාර්ග ප්‍රත්‍යවේක්ෂා වීථියේ ක්‍රමයටම සෙසු වීථීන්ද අවබෝධ කටයුතු. මෙකී සතර මාර්ගඥානයෝ ඥානදර්ශන විශුද්ධි නම්වෙත්. ඒ මේ ඥානදර්ශන විශුද්ධිය උපදවා සත්‍යප්‍රතිච්ඡාද මෝහඳුරු නසා තෘෂ්ණාක්ෂය කිරීමෙන් සසර දුකින් නිදහස් වූ සුවිසුද්ධ විශුද්ධි සංඛ්‍යාත නිර්වාණ ධර්මය සාක්ෂාත් කාත කටයුත්තාහුයි.

ලෝකප්පමෝහ නාසං
තණ්හාච්ඡේදිං නිරෝධ'මාලම්බිං
මග්ගස්ස භාවිකං තං
මග්ගං භාවේය්‍ය නිස්සරේ දුක්ඛං.

---

ගුණරතන ප්‍රණීත විශුද්ධිදීපිකානම් ධර්මප්‍රකරණයෙහි
ඥානදර්ශන විශුද්ධි නම්වූ අෂ්ටම පරිච්ඡේදය නිමි.

---

# පරිශිෂ්ටාධිකාරය.

---

චතුමග්ගානු'භාවස්ස-සුබෝධාය ස'මීරිතං
පරිසිට්ඨාධිකාරෙන-ත'දත්ථ'මපි දීපයෙ;

---

ඥානදර්ශනවිශුද්ධි නම් වූ සතරමාර්ගඥානයාගේ ආනුභාව විශේෂය හඳුන්වනු වස් පරිශිෂ්ට සංග්‍රහ නම් පරිච්ඡේදයක් කියම්හ. සතරමාර්ගඥානය වූකලී බෝධිපාක්ෂික ධර්මයන්ගේ පරිපූර්ණත්වයෙන්ද, ව්‍යුත්ථානබල සමායෝගයෙන්ද, ක්ලේශමලාපගමත්වයෙන්ද, සත්‍යා'භිසමයක්ෂණයෙහි පරිඥා ප්‍රහාණාදි කෘත්‍යවිශේෂිතත්වයෙන්දැ'යි මෙකීතාක් ගුණසමායෝගිත්වයෙන් විශිෂ්ටවන්නේය. එබැවින් ක්‍රමෝද්දිෂ්ට ගුණප්‍රබන්ධය යථා ස්වභාවයෙන් දතයුත්තාහු වෙත්.

ඔවුනතුරෙන් ආදියෙහි කී "බෝධිපාක්ෂික ධර්මයන්ගේ පරිපූර්ණත්වය" නම්:-සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගෙන් සමුපේත බවයි. ඔහු කවරහුද ? යත්:-සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චේන්ද්‍රියය, පඤ්ච

බලය, සප්තබොජ්ඣාඞ්ගය, ආය්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්‍ගය; යන මොහු වෙත්. මේ ධර්‍මසමූදව සතර මාර්‍ගඥානයන් අවබොධ කරන ආය්‍ය්‍යීයන්ගේ පක්ෂයෙහිවූ හෙයින්ද ඔවුනට නදැඩි සං සිඩිය සඳහා උපකාරත්‍වයෙන් එලඹ සිටිනාහෙයින්ද බොධි පාක්ෂික නම්වෙත්. මොවුහු ෂට්විශුඩ්‍යාවසරයෙහි ලෞකික වූවෝ නානාචිත්තක්‍ෂණික වැ උපදනාහු නමුදු මෙහිදී ඥාන දර්‍ශන විශුඩියට අයත් ලොවීලොව්තුරා ජවන් සතක් පරම කොට ඇති අභිඥාවීථියෙහි සතරවැනිව හෝ පස්වැනිව උපදනා ලොකොත්තර මාර්‍ගසංඛ්‍යාත ජවනක්‍ෂණයෙහි ලැබෙන සත්තිස් ධර්‍මයෝ බැවින් පූර්‍වභාග ලෞකික විදර්‍ශනා සතිපට්ඨානාදිය මෙහිලා විභාගකිරීම අනුචිත බව විශෙෂයෙන් මැ සැලකිය යුතුයි.

**"සතිපට්ඨාන නිද්දෙසෙ" තෙසු තෙසු ආරම්මණෙසු ඔක්ඛන්දිත්වා පක්ඛන්දිත්වා උපට්ඨානතො පට්ඨානං, සතියෙව පට්ඨානං=සතිපට්ඨානං, කායවෙදනාචිත්තධම්මෙසු පනා'ස්ස අසුභදුක්ඛා නිච්චා නත්තාකාරගහණවසෙන සුභසුඛනිච්චත්ත සඤ්ඤා පහාණකිච්චසාධනවසෙන ච පවත්තිතො චතුධ භෙදා හොති. එතානි පුබ්බභාගෙ නානාචිත්තෙසු ලබ්භන්ති, මග්ගක්ඛණෙ පන එකා එව සති චත්තාරි නාමානි ලභති.**

සතිපට්ඨාන නිර්‍දේශයෙහි කායාදි ඒ ඒ ආරම්මණයන්හි අවක්‍රමණයකොට පැනගොස් එලඹ සිටිනහෙයින් "පට්ඨානය"යිද සිහියම එසේ එලඹ සිටිනහෙයින් "සතිපට්ඨානය"යිද කියනු ලැබේ. ඒ මේ ස්මෘතිතොමෝ "කායවෙදනාචිත්ත ධර්‍ම" යන මෙහි "අශුභදුඃඛ අනිත්‍ය අනාත්ම" සංඛ්‍යාත ආකාර ගැනීම් වශයෙනුත් "ශුභ සුඛනිත්‍ය ආත්ම" යන විපරීත සංඥාවන්ගේ ප්‍රහාණකෘත්‍ය සාධන වශයෙනුත් පවත්නාහෙයින් සතරාකාර වන්නීය. මෝවුහු පූර්‍වභාග විදර්‍ශනා සමයෙහි නානාචිත්තක්‍ෂණයන්හි ලැබෙත්. මාර්‍ගචිත්තක්‍ෂණයෙහි වනාහි එකම ස්මෘති චෛතසිකය නාම සතරක් ලබත්. එබැවින් "සතර සති පට්ඨානය"යි වදාළහ.

**"සම්මප්පධාන නිද්දෙස" සම්මා පදහනන්ති එතෙනාති සම්මප්පධානං, විරියස්සෙතං අධිවචනං, උප්පන්නානුප්පන්නානං අකුසලානං පහානානුප්පත්තිකිච්චං අනුප්පන්නුප්පන්නානං ච කුසලානං උප්පාදට්ඨිති කිච්චං සාධයතීති චතුබ්බිධං, එතානිපි පුබ්බභාගෙ නානාචිත්තෙසු ලබ්භන්ති, මග්ගක්ඛණෙ පන එකමෙව විරියං චත්තාරි නාමානි ලභති.**

"සම්‍යප්‍රධාන නිර්දේශයෙහි" මේ කාරණකොටගෙන මොනවට වීර්‍ය්‍යකෙරෙත්නුයි= සම්‍යප්‍රධාන නම්. වීර්‍ය්‍යයට මේ නමෙකි. උපන් නූපන් අකුශලයන්ගේ ප්‍රහාණ-අනුත්පාද යන කෘත්‍ය දෙක හා නූපන් උපන් කුශලයන්ගේ උත්පාද-ස්ථිති දෙකද සිඩකෙරේනුයි= කෘත්‍යභෙදයෙන් චතුර්විධවෙත්. මොවුහුද පූර්වභාග විදර්ශනා කමයෙහි නානාචිත්තයන්හි ලැබෙත්. මාර්ග චිත්තක්ෂණයෙහි වනාහි එකම වීර්‍ය්‍යචෛතසිකය නාම සතරක් ලබත්. එබැවින් "**සතරසම්‍යප්‍රධානය**"යි වදාළහ.

"**ඉද්ධිපාද නිද්දෙසෙ**" ඉජ්ඣතීති=ඉද්ධි, උපරූපරි විසෙස සංඛාතං ඉද්ධිං පජ්ජන්ති පාපුණන්තීති=පාදො, ඉද්ධි එව පාදො=ඉද්ධිපාදො: අථවා ඉජ්ඣන්ති සත්තා එතාය උක්කංසගතා හොන්තීති=ඉද්ධි, තාය ඉද්ධියා පාදොති=ඉද්ධිපාදො; ඡන්ද චිත්ත විරිය විමංසා, එතෙ පුබ්බභාගෙ අධිපතිවසෙන නානාචිත්තෙසු ලබ්භන්ති, මග්ගක්ඛණෙ පන සහ'ව ලබ්භන්ති, ඉමෙ ලොකුත්තරාව.

"ඉර්ධිපාද නිර්දේශයෙහි" සමෘඬවේනුයි= ඉර්ධි නම්. මතුමත්තෙහි විශෙෂාධිගමයයි කියනලද සමෘඩියට පැමිණෙත්නුයි-පාද නම්. යථොක්ත සමෘඩියට අධිගමූපාය වූයේ "ඉර්ධිපාද" නම්වේ. (සොවාන්මාර්ගයෙහි පටන් අර්හත්ඵලය තෙක් කී තියා යි) දෙවැනි විකල්පයෙහි සත්වයෝ මොවුන් කාරණකොටගෙන සමෘඬවෙත්. උත්කර්ෂයට පැමිණෙත්නු'යි ඉර්ධිනමු. ඒ සමෘඩිය පිළිබඳ ප්‍රතිෂ්ඨා තොමෝ. ඉර්ධිපාද නම්වේ. ඡන්දය චිත්තය වීර්‍ය්‍යය ප්‍රඥාවය යන මොහුයි මොවුහු ලෞකික අවධියෙහි අධිපතිවශයෙන් නොයෙක් චිත්තයන්හි ලැබෙත්. මාර්ගක්ෂණයෙහි වනාහි ඉර්ධිපාදයෝම ලැබෙත්. මොවුහු ලොකොත්තරමයැ. ඡන්දාදීන්ගේ වශයෙන් සතරක් ඇතිනිසා "**සතරඉර්ධිපාදයෝය**"යි වදාළහ.

"**ඉන්ද්‍රිය නිද්දෙසෙ**" අස්සද්ධියකොසජ්ජපමාදවික්ඛෙප සම්මොහානං අභිභවනතො අභිභවන සංඛාතෙන අධිපතියට්ඨෙන ඉන්ද්‍රියං; අස්සද්ධියාදීහි ච අනභිභවනීයතො අකම්පියට්ඨෙන බලං; තදුභයම්පි සද්ධාදිවසෙන පඤ්චවිධං හොති-තස්මා පඤ්චින්ද්‍රියානි පඤ්චබලානී'ති වුච්චන්ති.

"ඉන්ද්‍රියනිර්දෙශයෙහි" අශ්‍රද්ධාව-කුසීතබව-ස්මෘතිවිප්‍රවාස නම් ප්‍රමාදය-චිත්තවික්ෂෙපය-සම්මූළ්හතාව යන කරුණු පස මැඬලන හෙයින් ඒ මැඬලීම යි කියනලද ආධිපත්‍යාර්ථයෙන් (අධිපති භාවයෙන්) ඉන්ද්‍රිය නම්. (බලනිර්දෙශයෙහි) අශ්‍රද්ධාදීන් විසින් අනභිභවනීය වූ ශ්‍රද්ධාදීහු ම අකම්පාර්ථයෙන් (නොසෙල්වියහැකි අර්ථයෙන්) බලනම්. ඒ දෙපක්ෂයෙහි ම "ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-සති-සමාධි-ප්‍රඥා" යන ධර්මපඤ්චකය වේ. මොවුහු ලෞකික අවස්ථාවෙහි නානාචිත්තක්ෂණයන්හි පහළවන නමුදු මාර්ග චිත්තක්ෂණයෙහි තත්සම්ප්‍රයුක්ත ව උපදනාහුය. එබැවින් "පඤ්චින්ද්‍රිය-පඤ්චබලය"යි වදාළහ.

"බොජ්ඣඞ්ගනිද්දෙසෙ" බුජ්ඣතීති=බොධි, බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණං, බොධියා බොධිස්ස වා අඞ්ගාති=බොජ්ඣඞ්ගා; යා හි අයං ධම්මසාමග්ගී යාය ලොකුත්තර මග්ගක්ඛණෙ උප්පජ්ජමානාය ලීනුද්ධච්චපතිට්ඨානායූහනකාම සුඛත්තකිලමථානුයොගඋච්ඡෙදසස්සතාභිනිවෙසාදීනං අනෙකෙසං උපද්දවානං පටිපක්ඛභූතාය සතිධම්මවිචයවීරියපීතිපස්සද්ධිසමාධි උපෙක්ඛා සංඛාතාය ධම්මසාමග්ගියා අරියසාවකො බුජ්ඣතීති කත්වා බොධීති වුච්චති. තස්සා බුජ්ඣන්ති අනුබුජ්ඣන්ති පටිබුජ්ඣන්ති සම්බුජ්ඣන්ති ති වුත්තං.

"බොධ්‍යාඞ්ග නිර්දෙශයෙහි" අවබොධ කෙරේනු යි= බොධි නම්. "බුධ-අවගමනෙ" යන ධාතුවෙන් සිඩවූ බොධි ශබ්දයෙන් "ආර්‍ය්‍යමාර්ගාඞ්ගය-නිර්වාණය-සර්වඥතාඥානය-ද්‍රුමේන්ද්‍රය" යන අර්ථ සතරක් වාච්‍යවන්නේ නමුදු මෙතැන්හි ආර්‍ය්‍යමාර්ගාඞ්ග වාච්‍යය. බැවින් සතර මාර්ගඥානය බොධියයි දතයුතු. ඒ සතර මාර්ගඥානයාගේ නොහොත් ඥානීහුගේ අඞ්ග=බොජ්ඣඞ්ග නම්. ඒ එසේමැයි. යම් මේ ධර්මසමූදවක් හෙතුකොටගෙන එනම්:-ලොකොත්තර මාර්ගක්ෂණයෙහි උපදිනු ලබන්නාවූ ලීනොද්ධත්‍ය ප්‍රතිෂ්ඨාන ආයූහන කාමසුඛ අත්තකිලමථානුයොග-දෘෂ්ට්‍යාභිනිවෙශාදී අනෙකොපද්‍රවයන්ට ප්‍රතිපක්ෂවූ "ස්මෘති-ධර්මවිචය-වීර්‍ය්‍ය-ප්‍රීති-ප්‍රශ්‍රබ්ධි-සමාධි-උපෙක්ෂා" සංඛ්‍යාත ධර්මසමූහය හෙතුකොටගෙන මාර්ගඥානාවබොධය කෙරේනුයි=ආර්‍ය්‍ය ශ්‍රාවකයනමේද බොධියයි කියනුලැබේ. ඕහට අඞ්ග වූවෝද බොජ්ඣඞ්ග නම්. එබැවින් සොවාන් සකෘදාගාමි අනා-

නාමි අභීත් යන සතර මාර්ගඥානය සඳහා (බුජ්ඣන්ති අනුබුජ්ඣන්ති පටිබුජ්ඣන්ති සම්බුජ්ඣන්ති) යනු වදාළහ"යි දතයුතු. මෙසේ මාර්ගවිඥානක්ෂණයෙහි උපදනා ස්මෘති ආදි ධර්මසතට "සප්තබොධ්‍යඞ්ගයෝය"යි වදාළහ.

"මග්ගඞ්ගනිද්දෙසෙ" අරියො'ති කිලෙසානං ආරකත්තා අරියො, අට්ඨ අවයවභූතානි අඞ්ගානි එතස්ස අත්ථීති= අට්ඨඞ්ගිකො, කිලෙසෙ මාරෙන්තො ගච්ඡතීති මග්ගො. "සම්මාදිට්ඨි-පෙ-සමාධි" තත්ථ ලොකියමග්ගෙ සබ්බානෙව මග්ගඞ්ගානි යථානුරූපං ඡසු ආරම්මණෙසු අඤ්ඤතරාරම්මණානි හොන්ති, ලොකුත්තරමග්ගෙ පන චතුසච්චප්පටිවෙධාය පවත්තස්ස අරියසාවකස්ස නිබ්බානාරම්මණං අවිජ්ජානුසයසමුග්ඝාතකං පඤ්ඤාචක්ඛු සම්මාදිට්ඨි, තථා සම්පන්නදිට්ඨිස්ස තං සම්පයුත්තො තිවිධමිච්ඡාසඞ්කප්පසමුග්ඝාතකො චෙතසො නිබ්බානපදාභිනිරොපනො සම්මාසඞ්කප්පො; තථා පස්සන්තස්ස විතක්කෙන්තස්ස ච තං සම්පයුත්තාව චතුබ්බිධවචීදුච්චරිතසමුග්ඝාතිකා මිච්ඡාවාචාය විරති සම්මාවාචා, තථාවිරමන්තස්ස තං සම්පයුත්තාව තිවිධමිච්ඡාකම්මන්තසමුච්ඡෙදිකා මිච්ඡාකම්මන්තා විරති සම්මාකම්මන්තො, තස්සෙව වාචාකම්මන්තානං වොදානභූතා තං සම්පයුත්තාව කුහනාදිසමුච්ඡෙදිකා මිච්ඡාආජීවා විරති සම්මාආජීවො, තස්සායෙව වාචාකම්මන්තාජීවසඞ්ඛාතාය සීලභූමියං පතිට්ඨහන්තස්ස තදනුරූපො තං සම්පයුත්තොව කොසජ්ජසමුච්ඡෙදකො අනුප්පන්නුප්පන්නානං අකුසලකුසලානං අනුප්පාදප්පහානුප්පාදට්ඨිතිසාධකො ච වීරියාරම්භො සම්මාවායාමො, එවං වායමන්තස්ස තං සම්පයුත්තොව මිච්ඡාසතිවිනිද්ධුනනකො කායාදීසු කායානුපස්සනාදිසාධකො ච චෙතසො අසම්මොසො සම්මාසති, එවං අනුත්තරාය සතියා සුවිහිතචිත්තාරක්ඛස්ස තං සම්පයුත්තාව මිච්ඡාසමාධිවිද්ධංසිකා චිත්තෙකග්ගතා සම්මාසමාධීති. එස ලොකුත්තරො අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

"මාර්ගාඞ්ග නිර්දෙශයෙහි" ආර්ය යනු රාගාදි කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවින් ආර්ය නම්වේ. තමාගේ අවයවවූ සම්‍යක්දෘෂ්ටි ආදී අඞ්ගයෝ ඒ මාර්ගවූ මොහට ඇත්තුයි අෂ්ටාඞ්ගික නම්වේ. කෙලශයන් මරමින් යන්නේනුයි මාර්ග නම්වේ. පිණ්ඩාර්ථ වශයෙන් ගත්කල කෙලෙස් නසමින් ආර්යභාවය සිද්ධකරදෙන අඞ්ග අටකින්යුත් ප්‍රතිපදාව "ආර්ය අෂ්ටාඞ්ගික

මාර්ග" නම්වේ. එහි අඞ්ග අටනම්:-"දිට්ඨි-සංකප්ප-වාචා-කම්මන්ත-ආජීව-වායාම-සති-සමාධි" යන මොහුයි. මෙකී මාර්ගාඞ්ගයෝ පූර්වභාගයෙහි ලෞකික වෙත්. මාර්ගක්ෂණයෙහි ලෝකෝත්තර වෙත්මය. එහි ලෞකික මාර්ගයෙහි සියලු මාර්ගාඞ්ගයෝම සුදුසුපරිද්දෙන් ෂඩාලම්බනයන් අතුරෙන් යම්කිසිවක් අරමුණුකොට පවත්නාහු වෙත්. ලෝකෝත්තර මාර්ගයෙහි වනාහි දුඃඛාදි චතුස්සත්‍ය ප්‍රතිවෙධයකරන ආර්යශ්‍රාවකයාගේ නිවන් අරමුණුකොට ඇති අවිද්‍යානුශය සමූලඝාතනය කරන්නාවූ ප්‍රඥාචක්ෂුස "සම්‍යක්දෘෂ්ටි"නම්. එසේ ප්‍රඥාසම්පන්නාවූවහුගේ ඒ හා සම්ප්‍රයුක්තව පවත්නාවූ ත්‍රිවිධ මිථ්‍යාසංකල්පනාවන් සමූලඝාතනය කරන්නාවූ නිර්වාණාරම්මණයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් මනාව රොපණය කරන්නාවූ කුශලසංකල්පනාව "සම්‍යක් සංකල්පනා"නම්. එසේ දක්නහුගේද විතර්කණය කරන්නහුගේද ඒ හා සම්ප්‍රයුක්තවූම චතුර්විධ වාග්දුශ්චරිතයන් සමූලඝාතනයකරන්නාවූ මිථ්‍යාවචීවිරතිය "සම්‍යක්වචන" නම්. එසේ වෙන්වූවහුගේ තත්සම්ප්‍රයුක්තවූ ත්‍රිවිධ මිථ්‍යාකර්මාන්තයන්ගේ මුල්සිඳිම ඇති මිථ්‍යාකර්මාන්තවිරතිය "සම්‍යක් කර්මාන්ත"නම්. එකී වචීකර්මාන්ත දෙකින් පවිත්‍රවූවහුගේ ඒ හා සම්ප්‍රයුක්තවූ කුහනාදීන්ගේ සමූලඝාතනය ඇති මිථ්‍යා ආජීව විරතිය සම්‍යක් ආජීව"නම්. ඒ විරති තුනෙන් යුක්තව ශීලභූමියෙහි පිහිටන්නහුගේ තදනුකූලවූ තත්සම්ප්‍රයුක්තවූම කුසීතබව මුල්සිඳින්නාවූ නූපන් උපන් අකුශල කුශලයන්ගේ නොඉපැද්ම ප්‍රහාණය ඉපැද්ම ස්ථිතිය යන කරුණු සිද්ධකරන්නාවූ වීර්යාරම්භය "සම්‍යක් ව්‍යායාම"නම්. එසේ ව්‍යායාම් කරන්නහුගේ ඒ හා සම්ප්‍රයුක්තවූ මිථ්‍යාස්මෘතිය විනාශකරන්නාවූ කායාදියෙහි කායානුපස්සනාදිය සිද්ධකරන්නාවූ චිත්තයාගේ අසම්මෝහය "සම්‍යක් ස්මෘති"නම්. මෙසේ නිරුත්තරවූ සිහියෙන් මොනවට සිත ආරක්ෂාකරන්නහුගේ තත්සම්ප්‍රයුක්තවූ මිථ්‍යාසමාධිය විනාශකරන්නාවූ කුශලචිත්තෛකාග්‍රතා තොමෝ "සම්‍යක් සමාධි"නමි. මේ කියනලද්දේ ලෝකෝත්තර ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි.

යථොක්ත සතර මාර්ගඥානය මෙකී සත්තිස් බොධිපාක්ෂික ධර්මයන්ගෙන් යුක්තවන්නේය. මේ කියනලද්දෙ සාමාන්‍ය වශයෙනි. විශෙෂවශයෙන් සලකනවිට බොධිපාක්ෂික ධර්මයන්ගේත් සමහරක් අනියත යොගීහු වෙත්. එනම්:-ශුෂ්කවිදර්ශකවූ හෝ ප්‍රථමධ්‍යානය පාදකකොට විදර්ශනා වඩා මාර්ගාධිගමය ලැබූ හෝ ආර්යයන්ට "සත්තිස් ධර්මයෝම"ලැබෙත්. විතියධ්‍යාන

ලාභීව මාර්ගාවබෝධය කළ ආර්යයන්ට "සතිසක්"ද; තෘතීය ධ්‍යානය හෝ චතුර්ථ පඤ්චමධ්‍යානලාභී ව මාර්ගාවබෝධයකළ ආර්යයන්ට "පන්තිසක්"ද; එකචිත්තක්ෂණික වූ උපදනාහුය. එලක්ෂණනෙහිවූකලි "සතර සම්‍යප්‍රධාන වීර්යයන්ගේද" නො ලැබීම සැලකිය යුතුයි.

මෙකී සතතිස් ධර්මයෝ අසම්භින්න ව ගත්කල්හි තුදුස්ධර්ම කෙනෙක් වෙති. එනම්:-"ඡන්ද-පීති-චිත්ත-පස්සද්ධි-උපෙක්ඛා-සංකප්ප-වාචාකම්මන්ත ජීව විරති" යන නවය හා "සද්ධා-සමාධි පඤ්ඤා-සති-විරිය"යන මොහුයි. මෙම තුදුස්ධර්මයන් අතුරෙන් මුල කී ඡන්දදී නවය එකෙකි. කෘත්‍යකාරීහෙයින් නව තැනෙක්හි බෙදුන. සෙසු ධර්මයන්ගෙන් ශ්‍රද්ධාව 'සද්ධින්ද්‍රිය-සද්ධාබල"කියා දෙතැනෙක්හිද: සමාධිය "සමාධින්ද්‍රිය-සමාධිබල-සමාධිසම්බොජ්ඣඞ්ග-සම්මාසමාධි"කියා සිවුතැනෙක්හිද; ප්‍රඥාව "වීමංසිද්ධිපාද-පඤ්ඤින්ද්‍රිය-පඤ්ඤාබල-ධම්මවිචය සම්බොජ්ඣඞ්ග-සම්මාදිට්ඨි" කියා පස්තැනෙක්හිද; ස්මෘතිය "සතිපට්ඨාන (4)-සතින්ද්‍රිය -සතිබල- සතිසම්බොජ්ඣඞ්ග- සම්මාසති" කියා අට තැනෙක්හිද; වීර්යය "සම්මප්පධාන (4)-විරියිද්ධිපාද-විරියින්ද්‍රිය-විරියබල—විරියසම්බොජ්ඣඞ්ග-සම්මාවායාම"කියා නවතැනෙක්හිද; විභාගකළ හෙයින් සත්තිස් ධර්මයෝය'යි වදළහ.

ඉක්බිති "ව්‍යුත්ථානබල සමායෝගය" කෙසේද? යත්:- මෙහි ව්‍යුත්ථානනම් "නිමිත්ත ප්‍රවෘත්තිදෙකින්" නැගීසිටීමයි. බලනම් "සමථවිදර්ශනා"යන බලදෙකයි. සතරමාර්ගඥානයෝ මෙයින් යුක්තහෙයින් ව්‍යුත්ථානබල සමායෝගයයි කීහ. ලෞකික විදර්ශනාව වනාහි යම්කිසි සංස්කාරයක්ම අරමුණුකොට පවත්නාහෙයින් "සංස්කාරනිමිත්ත" කෙරෙන්ද, සසර පැවැත්මට හේතුවූ සමුදය සංඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහාණය නොකළ හෙයින් "සංසාරප්‍රවෘත්තිය" කෙරෙන්ද; නැගී නොසිටියායයි දතයුතු. ගොත්‍රභූඥානය වූකලී නිර්වාණය අරමුණුකොට පවත්නාහෙයින් අනිමිත්තාරම්මණිකවූයේ ම සංස්කාරනිමිත්ත කෙරෙන් පමණක් නැගී සිටියේ නමුදු සමුදය සංඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහාණය නොකළහෙයින් ප්‍රවෘත්තියෙන් නොනැගිටියේමය. "එබැවින් "එකතොවුට්ඨානය"යි වදළහ. ශ්‍රොතාපත්‍යාදි ලොකොත්තර සතර මාර්ගඥානය වනාහි අනිමිත්තාරම්මණික හෙයින් සංස්කාරනිමිත්තකෙරෙන්ද; සමුදය නම්ලද තෘෂ්ණාව ප්‍රහාණයකළ හෙයින් සංසාරප්‍රවෘත්තිය කෙරෙන්ද; යන "නිමිත්තප්‍රවෘත්ති" දෙකින්ම නැගීසිටියේ ව්‍යුත්ථාන සමායොගය'යි දතයුතු.

**බලසමායොගය නම්**:-සමථ බලය හා විදර්ශනාබලය යන දෙක ම සම්සම් වැ යුගනද්ධ වශයෙන් පැවැත්මයි. පූර්වභාග ලෞකිකභාවනා සමයෙහි එසේ නොපවතී. යම්විටක සමථ කර්මස්ථාන වඩා ද එකල්හි සමථබලයද; විදර්ශනාකර්මස්ථාන වඩා ද එකල්හි විදර්ශනා බලයද; වෙන වෙනම අධිකව පවතී. ලෝකොත්තර සතරමාර්ගක්ෂණයෙහි වූකලි සමථ විදර්ශනා දෙකම සමානාඞ්ගකින් ක්‍රියාකරන හෙයින් උභයබල සමායොගය ඇත්තේමය. කෙසේද? යත්:-ඖද්ධත්‍ය සහගත කෙලශයන් කෙරෙන් හා සකන්ධයන් කෙරෙන් නැගී සිටින්නහුගේ චිත්තෛකාග්‍රතායයි කියනලද අවික්ෂෙප සමාධිය නිරොධගොචරවැ පවත්නේය. එක්ෂණෙහිම අවිද්‍යාසහගත කෙලශයන් හා සකන්ධයන් කෙරෙන්ද නැගී සිටිනුවස් තදනුදර්ශන කෘත්‍යකාරී විදර්ශනාඥානයෝ ද නිරොධගොචර වැ පවත්නිය. එබැවින් සමථ විදර්ශනා දෙකම සම්සම් ව පවත්නේය යි සැලකියයුතුයි.

තවද සතරමාර්ගඥානයන්ගේ "කෙලශමලාපගමනය" කෙසේද? යත්:-සානුශය සන්තානගත 'සංයොජන-කෙලශ-මිච්ඡත්ත නිශ-ආසව-ඔඝ-යොග-නීවරණ-අනුශය-අකුශලකර්මපථ-චිත්තොත්පාද" යන මොවුන් පිළිබඳ කෙලශමල එකෙකි මාර්ගඥානයෙන් ප්‍රහාණය කළහ. එහි දශසංයොජනයන් අතුරෙන් "සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස"යන තුන ප්‍රථම මාර්ගයෙන්ද; "කාමරාග-ව්‍යාපාද" යන දෙදෙනාගේ ඖළාරික අවස්ථාව ද්විතීය මාර්ගයෙන්ද; සුඛුම අවස්ථාව තෘතීය මාර්ගයෙන්ද; "රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා" යන පස චතුර්ථ මාර්ගයෙන්ද; ප්‍රහාතව්‍යවෙත්. දශකෙලශයන් අතුරෙන් "දිට්ඨි-විචිකිච්ඡා" දෙක ප්‍රථම මාර්ගයෙන්ද; "දොස" දෙවැනි තුන්වැනි මාර්ග දෙකින්ද; "ලොභ-මොහ-මාන-ථින-උද්ධච්ච-අහිරික-අනොත්තප්ප" යන සත සිවුවැනි මාර්ගයෙන්ද; ප්‍රහාතව්‍ය වෙති. දශ මිච්ඡත්තනීය ධර්මයන් අතුරෙන් "මිච්ඡාදිට්ඨි-මුසාවාද-මිච්ඡා කම්මන්ත-මිච්ඡාආජීව"යන මොහු ප්‍රථම මාර්ගයෙන්ද; "මිච්ඡා සංකප්ප-පිසුනාවාචා-ඵරුසාවාචා-' යන මොහු ද්විතීය තෘතීය මාර්ග දෙකින්ද; "සම්ඵප්පලාප-මිච්ඡාවායාම සතිසමාධි විමුත්ති" යන මොහු චතුර්ථ මාර්ගයෙන්ද; ප්‍රහාතව්‍යවෙති. චතුරාශව ඔඝ යොගයන් අතුරෙන් "දිට්ඨාසව ඔඝ යොග"යන මොහු ප්‍රථම මාර්ගයෙන්ද; "කාමාසව ඔඝයොග" යන මොහු ද්විතීය තෘතීය මාර්ග දෙකින්ද, "භවාසව-අවිජ්ජාසව-ඔඝයොග"යන මොහු චතුර්ථ මාර්ගයෙන්ද ප්‍රහාතව්‍යවෙති. පඤ්චනීවරණයන්ගෙන්

'විචිකිච්ඡාව" ප්‍රථම මාර්ගයෙන්ද; "කාමච්ඡන්ද—ව්‍යාපාද— 'කුක්කුච්ච"යන මොහු දෙවැනි තුන්වැනි මාර්ග දෙකින්ද; "ථීන-මිද්ධ-උද්ධච්ච"යන මොහු සිවුවැනි මාර්ගයෙන්ද ප්‍රහාතව්‍යවෙති. සප්තානුශය ධර්මයන්ගෙන් "දිට්ඨිවිචිකිච්ඡානුසයන්" ප්‍රථම මාර්ගයෙන්ද; "කාමරාග පටිඝානුසයන්" දෙවැනි තුන්වැනි මාර්ග දෙකින්ද; "මාන භවරාග අවිජ්ජානුසයන්" සිවුවැනි මාර්ගයෙන්ද ප්‍රහාතව්‍යවෙති. දශඅකුශලකර්මපථයන් අතුරෙන් "පාණඝාත-අදත්තාදාන-කාමමිච්ඡාචාර-මුසාවාද-මිච්ඡාදිට්ඨි"යන මොහු ප්‍රථම මාර්ගයෙන්ද; "පිසුනාවාචා-ඵරුසාවාච -ව්‍යාපාද" යන මොහු ද්විතීය තෘතීය මාර්ග දෙකින්ද; "සම්ඵප්පලාප-අභිජ්ඣා"යන මොහු චතුර්ථමාර්ගයෙන්ද ප්‍රහාතව්‍යවෙති. ද්වාදශඅකුශලචිත්තොත්පාදයන්ගෙන් "දෘෂ්ටිසම්ප්‍රයුක්ත ලෝභමූලික සිත් සතර හා විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතද යන සිත් පස ප්‍රථම මාර්ගයෙන්ද; ප්‍රතිඝසම්ප්‍රයුක්ත දෙසිත ද්විතීය තෘතීය මාර්ග දෙකින්ද; දෘෂ්ටිවිප්‍රයුක්ත සිත් සතර හා උද්ධච්ච සහගත සිතද යන සිත් පස" චතුර්ථමාර්ගයෙන්ද ප්‍රහාතව්‍යවෙති. එබැවින් සතර මාර්ගඥානය ප්‍රහාසම්පත්තය'යි දතයුතු.

තවද සත්‍යාභිසමය ක්ෂණයෙහි පරිඥා ප්‍රහාණාදි කෘත්‍ය විභාග කෙසේද? යත්:-"දුක්ඛං පරිඤ්ඤාභිසමයෙන අභිසමෙති සමුදයං පහානාභිසමයෙන අභිසමෙති නිරොධං සච්ඡිකිරියාභිසමයෙන අභිසමෙති මග්ගං භාවනාභිසමයෙන අභිසමෙති', යනුවෙන් ලොකොත්තර මාර්ගචිත්තක්ෂණයෙහි "දුඃඛ-සමුදය-නිරොධ=මාර්ග" සංඛ්‍යාත චතුස්සත්‍ය ධර්මයන් "පරිඥා-ප්‍රහාණ-සච්ඡිකිරියා-භාවනා"යන චතුර්විධ කෘත්‍යයන්ගේ වසයෙන් අවබොධය වන්නේය. ඒ මේ අවබොධය එනාහි පෙරපසු නොවැ එකම මාර්ගචිත්තක්ෂණයෙහි ලැබේ. යම්සේ ප්‍රදීපයක් දල්වීම සමගම "වැටියදැවීම-අඳුරනැසීම-ආලොක පැතිරීම-තෙලපැහැරගැනීම"යන කෘත්‍යසතර සිද්ධකෙරේද; එපරිද්දෙන්ම ලොකොත්තර මාර්ගචිත්තොත්පාදය සමග "දුක දැනගැනීමය-සමුදය ප්‍රහාණකිරීමය-නිර්වාණප්‍රත්‍යක්ෂකිරීමය-මාර්ග වැඩීමය' යන කෘත්‍යයන්ගේ සිද්ධියවේ. හෙද එකෙකී සත්‍යයක් පිළිබඳවැ පවත්නා චතුර්විධ තථාර්ථයන්ගේ වශයෙන් සොළොස් ප්‍රකාරයක් ඇත්තාහුය'යි දතයුතු.

ඒ ෂොඩශවිධ තථාර්ථයෝ නම්:-

"දුක්ඛස්ස = පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො
සමුදයස්ස = ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පළිබොධට්ඨො
නිරොධස්ස = නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො
මග්ගස්ස = නිය්‍යානට්ඨො හෙතුට්ඨො දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො"

යන මොහු වෙත්. මෙහි එකෙකී සත්‍යයක් පාසාම අර්ථ සතර බැගින් දක්වන ලද්දේ කුමක්පිණිසද? යත්:- "යො දුක්ඛං පස්සති සො දුක්ඛසමුදයම්පි පස්සති දුක්ඛනිරොධම්පි පස්සති දුක්ඛනිරොධගාමිනිං පටිපදම්පි පස්සති" යනු වදාළ බැවින් යම් කිසි විදර්ශකයෙක් පීලනාර්ථයෙන් දුඃඛසත්‍යය දකීද හෙතෙමේම එහි සංඛතාර්ථයෙන් සමුදයසත්‍යයද සන්තාපාර්ථයෙන් මාර්ගසත්‍යයද විපරිණාමාර්ථයෙන් නිරොධසත්‍යයද යි මෙසේ එක සත්‍යයක පවත්නා අර්ථ සතරෙන් චතුස්සත්‍යාවබොධය වන පරිදි අඟවනු සඳහා දක්වන ලදහයි දතයුතු.

මේ අර්ථය විස්තරවශයෙන් දක්වන ප්‍රවීණ බුද්ධිමත් ටීකාචාර්‍ය්‍ය තෙමේ:-

---

"පඨමං සලක්ඛණ මෙකපදං
දුතියාදි පදස්ස නිදස්සනතො
සමනි-දුනිමා-සමදු-සනිදු-
කමතො විභජෙ පඨමෙන විනා" යනු කීහු.

---

චතුස්සත්‍යයන් පිළිබඳ වැ පවත්නා ෂොඩශවිධ තථාර්ථයන් අතුරෙන් ආදියෙහි වූ "පීලනාර්ථ-ආයූහනාර්ථ-නිස්සරණාර්ථ-නිර්‍ය්‍යාණාර්ථ" යන සතර (ඒ ඒ සත්‍යයන්ගේ) ස්වකීය ලක්ෂණාවබොධය සඳහා හෙවත් දුඃඛයෙහි පීලනලක්ෂණය හා සමුදයෙහි ආයූහන ලක්ෂණය හා නිරොධයෙහි නිස්සරණ ලක්ෂණය හා මාර්ගයෙහි නිර්‍ය්‍යාන ලක්ෂණයත් පහළකරනු පිණිස දක්වන ලදී.

මෙකී ප්‍රථමාර්ථ සතර හැර දුඃඛසත්‍යයෙහි පටන් පිළිවෙළින් පවත්නා දෙවැනි තෙවැනි සිවුවැනි පදාර්ථයන්ගෙන් "සමනි-දුනිමා-සමදු-සනිදු" යන සතර් තුන තුන දක්වන ලදහයි දතයුතු.

තවද මෙහි ප්‍රථම විකල්පයෙහි ස්වභාව සසර හා එක්කොට පීඩාකරන දුඃඛරාශිය දක්මෙන් (දුඃඛසත්‍යයෙහි) පීලනාර්ථයද, එකී දුක් රැස්කර දෙන සමුදය දක්මෙන් එහි සංඛතාර්ථයද,

සියලු කෙලෙස් විඩා හරණ සුශීතල මාර්ගය දුක්මෙන් එහි සන්තාපාර්ථයද, අවිපරිණාම ස්වරූප නිරොධය දුක්මෙන් එහි විපරිණාමාර්ථය ද යි මෙසේ දුඃඛදර්ශන මාත්‍රයෙන් චතුශ්ශත්‍යාවබොධය වේ.

එසේම ද්විතීය විකල්පයෙහි කුශලාකුශල කර්මයෙන් රැස්කර දෙන සමුදය දුක්මෙන් (සමුදය සත්‍යයෙහි) ආයූහනාර්ථයද, සමුදයෙන් රැස්කළ දුඃඛරාශිය දුක්මෙන් එහි නිදානාර්ථයද, දුක්ඛා විසංයොගවූ නිරොධය දුක්මෙන් එහි සංයොගාර්ථයද, නිවනට පමුණුවන මාර්ගය දුක්මෙන් එහි පලිබොධාර්ථය දුයි මෙසේ සමුදය දර්ශන මාත්‍රයෙන් ද චතුශ්ශත්‍යාවබොධය වන්නේය.

තෘතීය විකල්පයෙහි සත්ත්වයාගේ සංසාර චාරකත්වය නිරුද්ධ කරන්නාවූ නිර්වාණය දුක්මෙන් (නිරොධ සත්‍යයෙහි) නිස්සරණාර්ථයද, අවිවෙකවූ සමුදය දුක්මෙන් එහි විවෙකාර්ථයද, සංඛතවූ මාර්ගය දුක්මෙන් එහි අසංඛතාර්ථයද, විෂප්‍රතිභාගවූ දුඃඛරාශිය දුක්මෙන් එහි අමෘතාර්ථය දු යි මෙසේ නිරොධ දර්ශන මාත්‍රයෙන් ද චතුශ්ශත්‍යාවබොධය වන්නේය.

චතුර්ථ විකල්පයෙහි සත්ත්වයා නිවන් පුරට පමුණුවන මාර්ගය දුක්මෙන් (මාර්ග සත්‍යයෙහි) නිය්‍යාණාර්ථයද, නිවන් සැපතට අහෙතුවූ සමුදය දුක්මෙන් එහි හෙත්වර්ථයද, අතිශයින් දුර්දර්ශවූ නිරොධය දුක්මෙන් එහි දර්ශනාර්ථයද, දුර්ගී ජනයෙකුවැනි දුක්ඛ දුක්මෙන් එහි උළාරයෙකු වැනි ආධිපත්‍යාර්ථ දු යි මෙසේ මාර්ග දර්ශන මාත්‍රයෙන්ද චතුශ්ශත්‍යාවබොධය වන්නේය යි දතයුතුයි. මෙතෙකින් සතර මාර්ගඥානාවසරයෙහි සිවුසස් අවබොධ වන පරිදි කීයා සමාප්තයි. මෙසේ තාක් ධර්මවිභාග දැනගත් සාධූන් විසින් විධිවූ පරිදි ප්‍රතිපත්ති සංරක්ෂණයෙහි ආශක්ත වැ ස්වර්ගාපවර්ග සම්පත් සිඹනට යුත්තාහුය.

ගුණරතන ප්‍රණීත විශුද්ධි දීපිකා නම් ධර්ම ප්‍රකරණයෙහි
පරිශිෂ්ටාධිකාරනම් නවම පරිච්ඡෙදය නිමි.

---

සීලාදි 'නෙක ගුණ සුවක කිත්ති යස්ස
ථෙරස්ස "සීලක්ඛන්ධා" චරියස්ස තස්ස'
පුඤ්ඤෙසු 'දයාය ච හිතාය සදෙසිකානං
යං වණ්ණිතං පකරණං පරිනිට්ඨිතන්තං.

පුඤ්ඤෙන තෙන ඉධ "රාජමහා විහාරං"
විජ්ජා විභූති නිකරෙන සමුජ්ජලන්ත.
සම්බුද්ධ සාසන චිරට්ඨිතිකා සමානා
සෙවන්තු භික්ඛු විහරෙවා'දය මිඩගලාය

~ සිද්ධම ~

# කර්තෘනාම සන්දර්ශනය.

වික්ඛ්‍යාත යසසා ලඞ්කා වධූ තිලක සන්නිභෙ
“ජොතිගාමපපුර රාජ මහා විහාර” වාසිනා

“මාකුර” නාම ගාමම්හි සුජාතෙන යසස්සිනා
සත්ථාගම සුවිඤ්ඤූත පඤ්ඤොදාතාය බුද්ධියා

“ගුණරතනා”භිධානෙන ථෙරෙන පීර චෙතසා
ගරු ගාරව යුත්තෙන පජාය අමිතොපමං

4. “විසුද්ධිදීපිකා”නාම ජබ්බි සුද්ධත්ථ සංගහං
සම්බුද්ධපරිණිබ්බානා “වණ්ණයසක්ඛාති” සම්මිතෙ

5. එසෙස නිට්ඨාපිතං සම්මා යථාධම්මනයානුගං
තථාපි තමසා සබ්බෙ සම්මූයහන්ති පුථුජ්ජනා

6. තස්මා’ත්‍ර යදි විජ්ජෙථ ඛලිතානි තහිං තහිං
සද්ධම්මට්ඨිතිකාමෙහි කවිහි සමවෙක්ඛිය

7. පරිසුද්ධි මභිනන්දන්තු මොදයන්තු ඉමූස්සයෙ
විසුද්ධිකාමා’නුස්සන්තු පිබන්තු මුනී භාරතිං

8. වස්සන්තු සමයෙ වස්සං ලොක සන්තා’නුකම්පයා
රක්ඛන්තු ධම්මතෙජෙන රාජානො සකලං පජං

9. දිබ්බන්තු දෙවා පාලෙන්තු ලොකානුසාසනං චිරං
බුජ්ඣන්තු ගුණ වන්තාහි දුක්ඛක්ඛය මසංඛතං

10. ආචාරිය වරා සබ්බෙ මාතා පිතාච ඤාතකා
ලභන්තු විධිනා ධම්මං සබ්බ සඤ්ඤොජනක්ඛයන්ති.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු